රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

වාර්ෂික වාර්තාව 2020

තිරසාර වර්ධනයක් පවත්වා ගැනීම





අන්තර්ගතය

මූල්‍ය විශේෂතා 04 | මූල්‍ය සමාලෝචනය 06 | සභාපති තුමාගේ සමාලෝචනය 11 |
සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි.ගේ සමාලෝචනය 13 | අධ්‍යක්ෂ මණ්ඩලය 16 | ආයතනික හා ජ්‍යේෂ්ඨ කළමනාකරණය 19 |
ආයතනික පාලනය 21 | අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව 65 |
අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටු වාර්තාව 67 | අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව 68 |
අධ්‍යක්ෂ මණ්ඩල වේකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව 69 | වේකාබද්ධ අවදානම් කළමනාකරණය 73 |
මානව සම්පත් කළමනාකරණය 85 | ආයතනික සමාජ වගකීම 87 | අපගේ නිපැයුම් හා සේවාවන් 88 |

මූල්‍ය තොරතුරු

අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව 90 | මූල්‍ය වාර්තාකරණය පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ අභ්‍යන්තර පාලන ප්‍රකාශනය 94 |
අභ්‍යන්තර පාලනය පිළිබඳ විගණකාධිපති වාර්තාව 96 | මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම 98 |
විගණකාධිපති වාර්තාව 100 | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය 105 | ලාභ හෝ අලාභ ප්‍රකාශනය 106 |
ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය 107 | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 108 | ගිණුම්කරණ ප්‍රතිපත්ති 109 |
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් 127 | දස වසරක සංඛ්‍යාත්මක සාරාංශය 164 |

තිරසාර වර්ධනයක් පවත්වා ගැනීම

ව්‍යාපාර කටයුතු මෙන්ම ලෝක ආර්ථිකයන්ට පවා අවහිරතා පමුණුවමින් ගෝලීය වසංගතය එහි විනාශකාරී ගමන්මගෙහි ඉදිරියටත් ගමන් ගනිමින් සිටින හෙයින් අප රටේ ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීම සඳහා රජයට සහයෝගය පළ කරන අතර අපගේ කාර්යසාධනය පවත්වාගෙන යෑමටත්, වර්ධනය කිරීමටත් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව චීම ගමන් මග වෙනස් කිරීමට නිර්භීත, සෘජු පියවර ගෙන තිබිණි.

පසුගිය වසර තුළ මුහුණ දුන් පෙර නොවූ විරූ අභියෝග අපගේ යථා ස්වභාවයට පත්වීමේ හැකියාව, දූරදර්ශීභාවය සනාථ කරමින් අපගේ ගනුදෙනුකරුවන්ට වටිනාකමක් ලබාදීමේ අපගේ හැකියාව සනිටුහන් කර ඇත.

අපගේ ලාභදායිත්වය ඉහළ නැංවීමට බැංකුවේ රජය සතු සන්නාමය මත ආයෝජන සිදුකිරීම හා නව මංපෙතකට විවිධාගීකරණයවීම මගින් ආර්ථික තත්ත්වයේ තිබූ දරුණු විපත්තිකාරී බව පවතින විටදීත් ස්ථාවර වර්ධනයක් පවත්වා ගැනීමට හා අපගේ කාර්යසාධනය ඉහළ නැංවීමට පවා අපගේ බැංකුවට හැකියාව ලැබී තිබිණි.

සම්ප්‍රදායික නිවාස මූල්‍ය හා කෘෂිකර්මය පදනම් කරගත් බැංකුවක් වන අපි ව්‍යාපාරික ණයවල නව අංශයන් සඳහා සේවා සැපයීමට අපගේ දිශානතිය පුළුල් කෙළෙමු.

අපගේ විශ්වාසනීය ගනුදෙනුකරුවන් පිරිසට සහයවීම සඳහා බැංකුව “සෞභාග්‍ය” යෝජනා ක්‍රමය යටතේ ණය සහන කාලසීමා හා සහනදායි ණය ලබා දී ඇත.

බැංකුව සඳහා වැඩි දියුණු කරන ලද තුලනාත්මක නිෂ්පාදන කළඹක් නුදුරු අනාගතයේ දී නිර්මාණය කිරීමට අපේක්ෂා කරන අතර ගම්බද හා නගරබද විවිධ ආදායම් ප්‍රමාණයන් ලබන කණ්ඩායම් වල අවශ්‍යතා සපුරාලීමට මූල්‍ය සේවා සැපයීමේ අපගේ නව ප්‍රවේශයේ අපි ඉදිරියටත් නිරත වෙමු.



දැක්ම

**පාරිභෝගික මූල්‍ය කටයුතුවල වෙළෙඳපොල පෙරගමන්කරුවෙකු වීම සමගින්
සංවර්ධන බැංකුකරණයේ ජාතියේ අගනා කොටස්කරුවෙකු වීම**

මෙහෙවර

**රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ජාතියේ විශිෂ්ඨ නිවාස බැංකුව ලෙස ඉදිරියටත් පවත්වාගෙන යමින්
සංවර්ධන බැංකුකරණයේ අගනා කොටස්කරුවෙකු වීම;**

ගනුදෙනුකරු : විශිෂ්ඨ පාරිභෝගික සේවාව, නවෝත්පාදනය, ගුණාත්මක බව හා අති නවීන තාක්ෂණය මගින් අපගේ සියළුම ගනුදෙනුකරුවන්හට ඔවුන්ගේ නිවාස හා සංවර්ධන මූල්‍ය අවශ්‍යතාවයන්ට සරිලන පරිදි ආකර්ෂණීය මූල්‍ය විසඳුම් ලබා දෙමින් සේවය කිරීමට අපි ඇපකැපවී සිටිමු.

ව්‍යාපාර හවුල්කරුවන් : ඉහළ ආරක්ෂාවකින් හා නම්‍යතාවයකින් යුතුව ආයෝජන සඳහා විශිෂ්ඨ ප්‍රතිලාභ ප්‍රදානය කරන්නෙමු.

සේවකයා : කණ්ඩායම් හැඟීමෙන් සේවය කළ හැකි යහපත් පරිසරයක් නිර්මාණය කරමින් අපගේ සේවකයින්ගේ කුසලතා උපරිම අයුරින් වර්ධනය කරගැනීම වෙනුවෙන් හා ඔවුන්ගේ ජීවන තත්ත්වය නගාසිටුවීම සඳහා ද අපි අවස්ථා ලබා දෙන්නෙමු.

කොටස්හිමියන් : පාර්ශ්වකරුවන්ගේ ප්‍රතිලාභ ආරක්ෂා කරමින් ලාභදායීත්වයේ වර්ධනය මගින් කොටස්කරුවන්ගේ තත්ත්වය ඉහළ නැංවීමට අපි කැපවී සිටින්නෙමු.

තාක්ෂණය : වේගවත්බව, ගුණාත්මක බව හා පහසුව ඇතිකරලීම සඳහා ස්වයංක්‍රියකරණ සහ තාක්ෂණික යෙදුම් මගින් අපගේ බාහිර ගනුදෙනුකරුවන් සඳහා අඟය එකතුකළ සේවාවන් ලබාදීමට අපි බැඳී සිටිමු. තීරණ ගැනීමේ ක්‍රියාවලියේ කාර්යක්ෂම බව හා සඵලතාවය වැඩිකරලීම සඳහා අපගේ අභ්‍යන්තර ගනුදෙනුකරුවන්ට වේගවත් හා නිවැරදි තොරතුරු ලබා දෙන්නෙමු.

සමාජය : ජාතික සංවර්ධනයේ කොටස්කරුවෙකු ලෙස අපගේ ප්‍රජාවගේ ජීවන රටාව නගා සිටුවීම සඳහා සේවය කිරීමට අපි පොරොන්දු වෙමු.

ආයතනික වටිනාකම්

අප පෙනී සිටින්නේ

- ගෞරවය පුදකරමින් විශ්වාසනීයව කටයුතු කරමු
- අප ඉටුකරන සියළුම කාර්යයන්වලදී වෘත්තීයවේදීත්වය හා විශිෂ්ඨත්වය ප්‍රදර්ශනය කරමු
- අප කරන කාර්යයන් ඉතා කැපවීමෙන් ඉටුකරමින් වගකීම ආරක්ෂා කරමු
- අපි විවෘතභාවය ප්‍රදර්ශනය කරමින් කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමට උත්සාහ කරමු
- අපි නවෝත්පාදන අදහස් සහ සක්‍රීය විසඳුම් බලාපොරොත්තු වෙමු
- ඉගෙනුම සඳහා බලවත් කැමැත්ත සහ බැංකුව සමඟ වර්ධනයවීම සඳහා මහත් ලැදියාව අපි සතු වෙමු

මූල්‍ය විශ්ලේෂනා

මූල්‍ය ප්‍රකාශන විශ්ලේෂණය	2020 රු.මිලි.	2019 රු.මිලි.	වෙනස %
පොළී ආදායම	6,077	5,982	1.58
පොළී වියදම්	(3,960)	(3,951)	0.23
ශුද්ධ පොළී ආදායම	2,116	2,030	2.92
බදු පෙර ලාභය	572	500	17.51
බදු	216	81	187.28
බදු පසු ලාභය	356	419	(15.52)
රාජ්‍ය සුරැකුම් ආයෝජන	2,415	2,549	5.20
ණය හා අත්තිකාරම් ශුද්ධ	36,857	35,561	3.64
මුළු වත්කම්	52,802	46,980	12.39
ගනුදෙනුකාර තැන්පතු	45,388	38,872	16.76
ණයගැනීම්	348	1,612	(78.41)
පාර්ශ්වකරුවන්ගේ අරමුදල	6,020	5,659	6.37
අනුපාත විශ්ලේෂණ			
ලාභදායිතා මට්ටම	%	%	
ශුද්ධ පොළී ආන්තිකය	4.24	4.52	(6.19)
ස්කන්ධය මත ඉපයීම් (ROE)	6.09	7.73	(21.22)
වත්කම් මත ඉපයීම් (ROA)	1.15	1.11	3.60
ප්‍රාග්ධන ප්‍රමාණාත්මකභාවය			
ස්කන්ධය/ මුළු වත්කම්	11.41	12.04	(5.23)
ස්කන්ධය/ ණය හා අත්කිකාරම්	16.34	15.91	2.70
	බාසල් (III)	බාසල් (III)	
පළමු පෙළ	20.17	21.04	4.13
පළමු හා දෙවන පෙළ	20.90	21.77	(4.00)
ද්‍රවශීලතාව			
ද්‍රවශීල වත්කම් අනුපාතය	37.29	25.09	48.62
තැන්පතු /ණය හා අත්කිකාරම්	81.20	91.48	11.23
ණය ගැනීම් /ණය හා අත්කිකාරම්	0.94	4.5	79.11
ශ්‍රේණිගතකිරීම			
වත්කම් ගුණාත්මකභාවය			
අක්‍රීය ණය /ණය හා අත්කිකාරම්	22.94	21.21	8.16
මුළු වත්කම්වලට ණය හා අත්කිකාරම්	72	77.47	7.06

රු. බිලියන 12.4

ණය මුදාහැරීම


රු. බිලියන 12.4
රු. බිලියන 6.6
රු. බිලියන 2.6
රු. බිලියන 1.84

මූල්‍ය සමාලෝචනය

පාස්කු ඉරු දින ප්‍රහාරය හා 2020 වසර තුළ පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ඇතිවී තිබූ ආර්ථික පසුගාමිත්වය හමුවේ වුවද දිවයිනේ මූල්‍ය ආයතන ප්‍රකෘති තත්ත්වයට පත්වී තිබිණි. කොවිඩ් 19 පැතිරීම හා මහජන සෞඛය පිළිබඳ කරුණු දේශීය ආර්ථිකයට හා ව්‍යාපාර කටයුතුවලට සැලකියයුතු බලපෑමක් ඇති කිරීමට හේතුවිය. දිවයිනේ ගෘහස්ථ හා ආයතනික අංශයේ ආදායම සැලකියයුතු ලෙස පහල යෑමට දිස්ත්‍රික් අතර සංචරණ සීමා සහ ආර්ථික අගුලු දැමීම් හේතුවී තිබිණි. එවැනි තත්ත්වයක් යටතේ මූල්‍ය ආයතනවල වත්කම් ගුණාත්මකභාවය හා ලාභදායීත්වය පිරිහීමකට ලක්වී තිබිණි. සාර්ව ආර්ථිකයේ පැවැති දැඩි සෘනාත්මක තත්ත්වය පවතිනවිටදීත් සැලකියයුතු කාර්ය සාධනයක් හා සතුටු දායක තත්ත්වයක් පවත්වාගෙන යෑමට බැංකුවට හැකිවී තිබිණි. 2020 වර්ෂය අවසානයේ දී රුපියල් මිලියන 572 ක බදුපෙර ලාභයක් වාර්තාකර තිබූ අතර එය පසුගිය වසර හා සැසඳීමේදී 14% ක වර්ධනයක් පෙන්වයි.

පොළී පිරිවැයෙහි වැඩිවීමේ බලපෑම සහ එහි ප්‍රතිඵලයක් ලෙස ශුද්ධ පොළී ආන්තිකය වෙනස්වීම ව්‍යාපාර පරිමාවන්හි ආකර්ෂණීය වර්ධනය. පසුව පොළී ආදායම රු. මිලියන 6076.77 ක් දක්වා වැඩි විය. එය 1.59% ක වැඩිවීමක් විය. වත්කම් පදනම රු. මිලියන 52,802 ක් විය. මෙය විශිෂ්ඨ වත්කම් ගුණාත්මකභාවය හා ණය කළඹේ යහපත් කළමනාකරණය විදහා දැක්වෙන සුවිසල් ජයග්‍රහණයකි.

පොළී ආදායම

2019 වසර හා සැසඳීමේදී පොළී ආදායම 1.58% කින් ඉහළ ගොස් ඇත. පොළී ආදායමේ වැඩිවීම ප්‍රධාන වශයෙන් ණය දීමෙන් ලත් ඉහළ ආදායම, අතිරික්ත ද්‍රවශීලතාවය සහ බැංකුවල ඇති තැම්පත් නිසා සිදුවිය. ඉකුත් වසර හා සැසඳීමේදී ණය හා අත්තිකාරම් මත ලැබෙන පොලිය සහ ණය හා අනෙකුත් මූල්‍ය උපකරණ වලින් ලැබෙන පොලියෙහි සුළු පහළ බැසීමක් තිබුණද 2019 වසර හා සැසඳීමේදී බැංකුවල ආයෝජන මගින් ලැබෙන පොලිය 21.42% ක විශිෂ්ට වැඩිවීමක් වාර්තාකර ඇත.

.

ශුද්ධ පොළී ආදායම

ආදායම් ප්‍රකාශනයේ දක්වා තිබූ ශුද්ධ පොළී ආදායම 2020 වසර සඳහා රු. මිලියන 2,116 ක් විය. එය 2019 වසරට වඩා 4.24% ඉහළ යෑමකි. ඇප තබා ඇති ගිවිසුම්, අනෙකුත් පොළී උපයන වත්කම් හා බැංකුවල ඇති තැම්පතු මගින් අනුබලයක් ලද ආයෝජන කළඹේ ඇති අනුපාත සංවේදී වත්කම් මත සැලකියයුතු ප්‍රතිලාභ නිසා ආයෝජන කටයුතුවල පොළී ආදායමේ වැඩිවීම මෙමගින් නිරූපණය වෙයි. පොළී ආදායමේ වැඩිවීම මූලික වශයෙන් වසරේ අග භාගයේදී ආයතනික නොවන තැම්පතු පදනම ඉහළ යාමෙන් ලබාගත් අතිරික්ත ද්‍රවශීලතාවය හේතුවෙන් ඉහළ පොළී වියදමකින් අර්ධ වශයෙන් හිලව් කරන ලදී.

පොළී නොවන ආදායම

ගාස්තු හා කොමිස් ආදායම, මූල්‍ය ආයෝජනවලින් ශුද්ධ ලාභය /අලාභය, සහ අනෙකුත් මෙහෙයුම් ආදායම්වලින් පොළී නොවන ආදායම සමන්විත වේ. ගාස්තු හා කොමිස් ආදායම පොළී නොවන ආදායමේ ප්‍රධාන සංරචකය වන අතර, එයට ණය දීමේදී අයකරන ගාස්තු ඇතුළත්ය. 2020 වසර තුළ, 30.70%කින් වර්ධනය වූ ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම 2019 දී පැවති රු. මිලියන 113.33ට සාපේක්ෂව රු. මිලියන 148.12 ක් විය. ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී මූල්‍ය වත්කම් 2020 දී රු. මිලියන 1.87 දක්වා ලඟාවිය. එමෙන්ම ලාභාංශ සහ විවිධ ආදායම ඇතුළත් අනෙකුත් මෙහෙයුම් ආදායම රු. මිලියන 33.85ක් විය.


මුළු මෙහෙයුම් ආදායම

වසර සඳහා ගාස්තු හා කොමිස් ආදායම තරමක් වෙනස් වී තිබුනද, ශුද්ධ පොළී ආදායම හා අනෙකුත් මෙහෙයුම් ආදායම තුළ වැඩිවීම් මුළු මෙහෙයුම් ආදායමේ වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. 2020 වසර අවසානයේදී, වාර්තාකළ මුළු මෙහෙයුම් ආදායම රු. මිලියන 2,300.08ක් වූ අතර, පසුගිය වසර හා සැසඳීමේදී 5.82%ක සැලකියයුතු වැඩිවීමක් පෙන්නුම් කරයි.

ආදායම් ප්‍රකාශනය පිළිබඳ විශ්ලේෂණය
ආදායම් ප්‍රකාශනයේ සාරාංශය

	2020	2019	වෙනස
	රු. (මිලි.)	රු. (මිලි.)	%
පොළී ආදායම	6,076.77	5,981.51	1.59%
මුළු මෙහෙයුම් ආදායම	2,300.08	2,173.66	5.82%
බදු පෙර ලාභය/(අලාභය)	572.07	499.65	14.49%


මූල්‍ය සමාලෝචනය (ඉතිරි කොටස)...



ලාභදායිත්වය

2020 වසර සඳහා බදු පෙර ලාභය රු. මිලියන 572.07 ක්වූ අතර 2019 වසර හා සැසඳීමේ දී මෙය 14% ක විශිෂ්ට වැඩිවීමක් විදහා දක්වයි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිර්දේශකර ඇති මට්ටමට වඩා වැඩි ප්‍රමාණයකින් ද්‍රවශීලතාවය හා ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවයේ අනුපාතයන් පවත්වාගෙන ගොස් ඇත. අපි ඒ පිළිබඳව ආඩම්බර වෙමු.

මූල්‍යමය වටිනාකම් නිර්මාණය කිරීමේදී ස්කන්ධය මත ඉපයීම් (ROE) ප්‍රධාන උපාය මාර්ගික ප්‍රතිඵලයකි. කළමනාකරණ ප්‍රවේශයේ ඵලදායිත්වය පිළිබඳ දර්ශකයක් ලෙස එමගින් සේවාවක් සැපයෙයි. බැංකුව 6.09% සාපේක්ෂ වැදගත්කමකින් යුත් ස්කන්ධය මත ඉපයීම් පවත්වා ගනී. 2020 වසර අවසානයේ දී බැංකුවේ ස්කන්ධය මත ප්‍රතිලාභ 1.15% ක මට්ටමක තිබූ අතර ඉකුත් වසර හා සැසඳීමේදී මෙය 4.50% ක වර්ධනයක් පෙන්වයි.



ජාතිය සඳහා දායකත්වය

ජාතියේ පැරණිතම බැංකුව ලෙස, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කරන ලද ද්‍රවශීලතා හා ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවයේ අනුපාත පවත්වාගෙන යන අතර බදු හා අයබදුවලට අමතරව ජාතික රක්ෂණාභාර අරමුදලට දායකත්වය, භාණ්ඩාගාරය වෙත ලාභාංශ සහ විශේෂ ගාස්තු ලෙස ජාතියේ ප්‍රගමනය උදෙසා බැංකුව විහි දායකත්වය අඛණ්ඩව ලබාදෙයි.

කෙසේ නමුත් 2020 වසරතුළ වැට් හා ආදායම් බදු වැනි බදු ලෙස රජයට රු. මිලියන 305.81 ක දායකත්වයක් ලබා දී ඇත.

	රු. මිලි.
එකතු කළ අගය මත බදු	184.65
ආදායම් බදු	121.16
එකතුව	305.81

මූල්‍ය තත්ත්ව විශ්ලේෂණය

වත්කම්

මුළු වාර්තාගත වත්කම් පදනම රු. 52,801,92 ක් වූ අතර එය 2019 වසරට සාපේක්ෂව 12%ක ඉහළ යාමකි. මුළු වත්කම් පදනමට දායකවන අපගේ ඉලක්කගත වත්කම් වර්ධනය, ප්‍රධාන ව්‍යාපාර කටයුතු කෙරෙහි අවධානයේ ශක්තිමත්කම, පොළී උපයන ණය කළඹ සහ මූල්‍ය ආයෝජන අඛණ්ඩව ඉදිරියට ගෙන ගිය බැවින් අපි අපගේ ශේෂ පත්‍රයේ ශක්තිය පවත්වා ගෙන ඇත.

ණය සහ අත්තිකාරම්

ණය සහ අත්තිකාරම් (ශුද්ධ) රු.මි.36,856,88 ක් ලෙස ඉහළ ගිය අතර, එය 2019 පසුගිය වසරට සාපේක්ෂව 3.64% ක වෙනසකි. මෙය පූර්ණ වශයෙන් නිවාස ණය සඳහා වන සිල්ලර ණය යෝජනාක්‍රම, පුද්ගල ණය, ප්‍රතිමූල්‍ය ණය හා අනෙකුත් ණය ඉල්ලුම සඳහා තිබූ වැඩිවූ ණය ඉල්ලුමේ හේතුවෙන් සිදුවිය. ණය හා ලැබීම්, කෘෂිකර්ම ණය කළඹ, සංචාරක කර්මාන්තය, සුළු හා මධ්‍ය පරිමාණ සහ ක්ෂුද්‍ර මූල්‍ය සහ නිවාස මූල්‍ය යන අංශ කෙරෙහි අවධානය යොමුකරමින් විවිධ අංශ කිහිපයක් හරහා විවිධාංගීකරණය කරන ලදී.

මූල්‍ය සමාලෝචනය (ඉතිරි කොටස)...

දළ ණය සහ අත්තිකාරම්

	2020	2019	වෙනස
	රු.	රු.	%
නිෂ්පාදන අනුව			
උකස්	9,942,813,267	9,460,622,900	5.10%
සේ.අ.අ	7,685,291,335	8,282,816,696	-7.21%
රථ වාහන	485,400	5,799,377	-91.63%
කාර්ය මණ්ඩල ණය	1,367,929,889	1,234,564,642	10.80%
පුද්ගලික ණය	18,232,060,924	16,648,653,558	9.51%
වෙනත්	1,136,699,561	1,096,396,335	3.68%
දළ ණය හා අත්තිකාරම්	38,365,280,376	36,728,853,508	4.46%

වගකීම්


2020 වසර තුළ, මුළු වගකීම් රු.මි. 46,782 ලෙස වාර්තා වූ අතර 2019 දී එය රු.මි. 41,321 ක් විය. මෙය පසුගිය 2019 වසර හා සැසඳීමේදී 13.22%ක වැඩිවීමකි. නව සේවාදායකයින් දිනාගැනීම, දැනට සිටින ගනුදෙනුකරුවන්ගේ ශේෂ සහ ආයතනික තැන්පතු අප විසින් වර්ධනය කළ බැවින් 2019 වසරට සාපේක්ෂව 16.76%ක සැලකියයුතු වැඩිවීමක් පෙන්නුම් කරමින් රු.මි.45,388කින් වැඩි වූ ගනුදෙනුකාර තැන්පතු මෙයට දායක විය. ඒ අතරම අනෙකුත් වගකීම්වල අඩුවීමක් පෙන්නුම් කළ අතර ණය සුරැකුම්පත් ශූන්‍ය අගයක පැවතිනි.

තැම්පතු පදනම

නිකේතන වෙළෙඳපලෙහි පැවති තරඟකාරිත්වය උච්චාවචනය වන ආර්ථිකය (කොවිඩ්-19 වසංගතය නිසා) සමග ඉතුරුම් තැම්පතු, ස්ථාවර තැම්පතු සහ අනෙකුත් තැම්පතු (යෝජනා ක්‍රම) තුළ සැලැකිය යුතු ස්ථානයනට ළඟාවීමට අපට හැකිවී තිබූ අතර ඒ අනුව බැංකුවේ සමස්ථ තැම්පතු පදනම ඉකුත් වසර හා සැසඳීමේ දී 16.76% ක විශිෂ්ට වැඩිවීමක් සනිටුහන් කරමින් රු. මිලියන 45,388 ක් දක්වා වැඩිවී තිබිණි. එමගින් ගනුදෙනුකාර තැම්පතු රඳවා තබා ගැනීම හා නව ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ගැනීම සඳහා ඵලදායී කළමනාකරණ ප්‍රතිපත්ති මගින් සිදුකර තිබූ විචක්ෂණශීලී කළමනාකරණ පරිචයන් විදහා දක්වයි.

ද්‍රවශීලතා ආවරණය

බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් (LSB) ලෙස, 20% ක අවම ව්‍යවස්ථාපිත ද්‍රවශීල අනුපාතයක් පවත්වා ගැනීම අනිවාර්යය. 1988 අංක 30 දරණ බැංකු පනතේ 86 වගන්තියට අනුකූලව ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් බැංකුව විසින් ගණනය කළ යුතුවන අතර, ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය 2020 වසර අවසානය වන විට 37.29% මට්ටමේ පැවතින. බාසල් III අනුකූලව, ද්‍රවශීලතා ආවරණ අනුපාතය මගින් අරමුණු කරන්නේ දින දර්ශනයේ දින 30ක ද්‍රවශීලතා පීඩන ක්‍රියාදාමය තුළ එහි ද්‍රවශීලතා අවශ්‍යතා සපුරාලීමට ප්‍රමාණවත් බාධාවක් නැති ඉහළ තත්ත්වයේ වත්කම් බැංකුවක් සතුවන බව සහතික කිරීමයි. ඉහළ තත්ත්වයේ ද්‍රවශීලතා වත්කම් වටිනාකමේ සුළු අඩුවීමක් හෝ යම් අලාභයක් නොමැතිව මුදල් බවට පරිවර්තනය කරගත හැකි මුදල් හෝ වත්කම්වලින් සමන්විත වන අතර, ඒ අනුව, 2020 වසර අවසානයේදී 116% ක් වූ බැංකුවේ ද්‍රවශීලතා ආවරණ අනුපාතය 100%ක ව්‍යවස්ථාපිත අවමයට වඩා ඉහළ අගයක් ගනී. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියමකළ නිර්වචන පරිදි ස්ථාවර අරමුදල් කරා පිවිසීමට බැංකුවට ශක්තිමත්ව සහයවන අතර, 100%ක අවම අවශ්‍යතාවයට අනුව ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය (NSFR) 2019 දෙසැම්බර් 31 දිනට 138% ක් විය.





නිරසාරත්වය

සභාපතිතුමාගේ සමාලෝචනය	11
වැඩ බලන සාමාන්‍යාධිකාරීතුමාගේ සමාලෝචනය	13
අධ්‍යක්ෂ මණ්ඩලය	16
ආයතනික සහ ජ්‍යේෂ්ඨ කළමනාකරණය	19
ආයතනික පාලනය	21



“ඉකුත් වසරේදී ලබාගත් රු. මිලියන 499.65 ට සාපේක්ෂව රු. මිලියන 572.07 ක බදුපෙර ලාභයක් ලබාගනිමින් මූල්‍ය වර්ෂය තුලදී රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව 14.49% ක ලාභයේ වර්ධනයක් වාර්තා කරමින් ධනාත්මක කාර්යසාධනයක් පෙන්වා ඇත. අපගේ සමස්ත වත්කම් පදනම රු. බිලියන 52.80 ක් ලෙස 12.39% ක වර්ධනයක් පෙන්වා ඇත.”

සභාපතිතුමාගේ සමාලෝචනය

2020 මූල්‍ය වර්ෂය සඳහා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් ඉදිරිපත් කරන්නේ ඉමහත් සතුටිනි. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් අඩාලවූ මෙහෙයුම් පරිසරයක් මධ්‍යයේ බැංකුවේ සමස්ත ධනාත්මක කාර්යසාධනයක් විදහා දක්වන සත්‍ය සටහනක් සමග වර්ෂය සම්පූර්ණකල බව සතුටින් දන්වා සිටිමි.

ආර්ථිකය

වසංගතයේ ප්‍රධාන බලපෑම ගෝලීය ආර්ථිකයේ හා මූල්‍ය වෙළෙඳපලේ දැඩි අවිනිශ්චිතතාවයන් නිර්මාණයකළ අතර එය ගෝලීය නිෂ්පාදනය 3.5% කින් හැකිලීයෑමත් සමග ගෝලීය ක්‍රියාකාරකම්වල පසුබෑමකට හේතු විය. පසුව මෙම ප්‍රවණතාවය දේශීය ආර්ථිකය වෙතද පැතිර ගොස් තිබිණි. දළ දේශීය නිෂ්පාදිතයේ 1.3% ක අඩු වර්ධනයක් හා වාර්තාවී තිබූ 3.4% ක ණය වර්ධනයේ හැකිලීම සනිටුහන් කරමින් ශ්‍රී ලංකාවටද මේ හා සමාන තත්ත්වයකට මුහුණ දීමට සිදුවිය. වර්ෂය තුළදී දේශීය මූල්‍ය අංශයට දැඩි බලපෑමක් එල්ල කරමින් කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ඇතිවී තිබූ සර්ව ආර්ථික අස්ථාවරත්වය ආර්ථික කැලඹීමකට හේතු විය. ප්‍රතිපත්ති පොලී අනුපාත අඩුකිරීම මගින් ආර්ථිකය නගා සිටුවීම අරමුණු කරගත් පහසු මූල්‍ය ප්‍රතිපත්තියක් ලෙස විවිධ වර්ගයේ දිරිගැන්වීම් සිදුකරන පැකේජයන් හා සහයෝගාත්මක ක්‍රියාමාර්ග හරහා ආර්ථිකය යථාතත්ත්වයට පත්කිරීමට රජය ආරම්භකළ ක්‍රියාමාර්ග මගින් ලබාගත් පොලී අනුපාත තන්ත්‍රයේ අඩුවීම කාලානුරූපව සිදුකළ ණය සහන ක්‍රියාමාර්ග හා සහන ණය යෝජනාක්‍රම නිසා තවදුරටත් සිදුවූ අතර බලපෑමට ලක්වූ ව්‍යාපාර හා පුද්ගලයින් සඳහා සහයෝගය ලබාදීම හේතුවෙන් ව්‍යාපාර කටයුතු වර්ධනය වේගවත් විය.

ආර්ථික ප්‍රතිස්ථාපනය සඳහා සඳහා උපකාරී වන අත්‍යවශ්‍ය කාර්යභාරය රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ක්ෂණිකව හඳුනාගෙන තිබිණි. බලපෑමට ලක්වූ ව්‍යාපාර හා පුද්ගලයින් වෙනුවෙන් ණය සහන කාල සීමා ලබාදීම මෙන්ම "සෞභාග්‍යා" සහනදායී ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබා දීමත්, අක්‍රීය ණය සඳහා වීවා නැවත අයකර ගැනීම් සහ නෛතික පියවර ගැනීම නවතා දැමීම මගින් අපි රජයේ වැඩපිළිවෙළට ක්ෂණික අනුග්‍රහයක් ලබා දී ඇත්තෙමු.

බැංකුවේ කාර්යසාධනය

ඉකුත් වසරේදී ලබාගත් රු. මිලියන 499.65 ට සාපේක්ෂව රු. මිලියන 572.07 ක බදුපෙර ලාභයක් ලබාගනිමින් මූල්‍ය වර්ෂය තුලදී රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව 14.49% ක ලාභයේ වර්ධනයක් වාර්තා කරමින් ධනාත්මක කාර්යසාධනයක් පෙන්වා ඇත. 2019 දෙසැම්බර් 31 දිනට වාර්තා වී තිබූ රු. බිලියන 46.97 සිට 2020 දෙසැම්බර් 31 දින රු. බිලියන 52.80 ක් දක්වා 12.39% ලෙස අපගේ සමස්ත වත්කම් පදනමේ වර්ධනයක් පෙන්වා ඇත.

ණය කලඹ සහ ද්‍රවශීල වත්කම් ගුණාත්මකභාවය පිළිබඳ ක්‍රමෝපායික අධීක්ෂණ කටයුතු බැංකුව ඉදිරියටත් සිදුකරමින් පැවතිනි. ඉතුරුම් තැන්පතු ගිණුම්වලින් සහ ස්ථාවර තැම්පතු මගින් 16.76% ක තැම්පතු වර්ධනයක් ළඟාකරගෙන තිබූ අතර එය අපගේ රාජ්‍ය සතු සන්නාමය හා තැම්පත්කරුවන්ගේ විශ්වාසය පෙන්නුම් කරයි. සේවක අර්ථසාධක අරමුදල් ණය හැර දළ අක්‍රීය ණය අනුපාතය 2020.12.31 දිනට 10.72% ක් ලෙස පැවති අතර එය පසුගිය වසරේ වාර්තාවූ 7.73% ට සාපේක්ෂව වැඩිවීමක් පෙන්නුම් කරයි.

රජයේ ප්‍රතිපත්ති සමඟ පෙලගැසෙමින් අපගේ ලාභදායිත්වය ඉහළ නැංවීම සඳහා බැංකුවේ රජය සතු සන්නාමය මත ප්‍රාග්ධනීකරණය කිරීමට අපි අවධානය යොමු කළෙමු. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතින් අවසර ලබාදී ඇති අප මෙතෙක් අවධානය යොමු නොකල ක්ෂේත්‍රයන්ට විවිධාංගීකරණය වීමට ඇති හැකියාව අප සොයාබලා ඇත. නිවාස මූල්‍ය හා කෘෂිකාර්මික යන පටු ක්ෂේත්‍රයන් ඇතුළත බැංකුව ක්‍රියාත්මකවන බැවින්, වෙළෙඳපලේ අලෙවිය සඳහා කිසියම් කාර්මික හෝ කෘෂිකාර්මික නිෂ්පාදනයක් පිළියෙල කිරීම හෝ නිෂ්පාදනය වැනි ක්ෂේත්‍ර සඳහා මූල්‍ය සැපයීම ඇතුළුව ව්‍යාපාරික ණය අංශයේ අපගේ ගනුදෙනුකාර පදනම නගාසිටුවීමට ඇති හැකියාව අපි ගවේෂණය කළෙමු. නාගරික හා ග්‍රාමීය ප්‍රදේශයන්හි විවිධ ආදායම් මට්ටම් වලින් යුත් කණ්ඩායම්වල අවශ්‍යතාවයන් වෙනුවෙන් අවශ්‍ය විවැනි නිෂ්පාදන වැඩි දියුණු කිරීමට මූල්‍ය සේවා සැපයීම මගින් අවම වශයෙන් වසරකට එක් නිෂ්පාදනයක් හෝ එළිදක්වමින් බැංකුව සඳහා තුලනාත්මක නිෂ්පාදන කළඹක් නිර්මාණය කිරීමට අපි අපේක්ෂා කරමු.

ආයතනික පාලනය

බැංකුවේ දිගුකාලීන සාර්ථකත්වය තහවුරු කිරීම සඳහා උසස් ප්‍රමිති අනුගමනය කිරීමට හා ආයතනික පාලනයේ විශිෂ්ටත්වය සඳහා අපි කැපවී සිටිමු. අපගේ අධ්‍යක්ෂ මණ්ඩලය හා කමිටු ත්‍රිත්වය වන අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩලය ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් කමිටුව පිළිවෙලින් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ යහපත් ආයතනික පාලන ක්‍රමයක් සඳහා පදනමක් නිර්මාණය කරයි. අදාළ නීති රෙගුලාසි, පාලන ආයතන සහ බැංකුවේ අභ්‍යන්තර ප්‍රතිපත්ති රාමුව තුළ බැංකුවේ විචක්ෂණ කළමනාකරණය ඔවුහු තහවුරු කරති.

අභියෝග

බැංකුවේ සීමිත ශාඛා ජාලය නිසා ගනුදෙනුකරුවන්ට සිදුවන සංසන්දනාත්මක තරඟකාරී අවාසි

ණය ලබාදීමේ කළඹේ දිගුකාලීන ස්වභාවය හා සැසඳීමේදී ණයට ගැනීම්වලින් බහුතරයක් කෙටිකාලීන වන හෙයින් අවුරුදු 1ට වඩා අඩු කාණ්ඩගත කිරීම් සැලකියයුතු සමුච්චිත අවගැලපුම් මගින් බැංකුවේ වත්කම් හා බැරකම් කල්පිරීම් පැතිකඩ නිරූපණය කරයි. මෙය මූලික වශයෙන් බැංකුවේ අවසරලත් සීමිත ක්ෂේත්‍රය නිසා සිදුවෙයි.

තවදුරටත් උසස් තාක්ෂණය හා සම්බන්ධවී ඇති ඉහළ තාක්ෂණයෙන් යුත් ණය නිෂ්පාදන මගින් නිර්මාණයවන දැඩි තරඟකාරිත්වය මෙන්ම ගනුදෙනුකරු කේන්ද්‍ර බැංකුවේ ඩිජිටල් නිපැයුම් සඳහා වසංගතය නිසා ඇතිවී තිබෙන හදිසි වෙනස්වීම් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව වෙත සැලකිය යුතු බලපෑමක් එල්ල කර ඇත.

සභාපතිතුමාගේ සමාලෝචනය (ඉතිරි කොටස)...

ඉදිරිමග

අපගේ ගනුදෙනුකරුවන් වෙත වටිනාකම් ලබාදීමේ අපගේ කැපවීම හා ප්‍රකෘති තත්ත්වයට නැවත පත්වීමේ අපගේ හැකියාව සහ ඩිජිටල් තාක්ෂණය වැළඳ ගැනීම සඳහා හා ව්‍යාප්තිය සඳහා යොමු කරනු ලැබූ ශක්තිමත් උපයමාර්ගික දූරදර්ශිභාවය මගින් පිටුවහලක් ලබමින් ඉදිරියට ගමන්කර තිරසාර වර්ධනයක් ලබා ගැනීම අපගේ විශ්වාසයයි. ණය කළඹ තවදුරටත් විවිධාංගීකරණය කිරීම, ඒහි ප්‍රතිඵලයක් ලෙස බැංකුවේ වෙළෙඳපල පංගුව වැඩිකිරීම මගින් බැංකුවේ වත්කම් මත ප්‍රතිලාභ හා ස්කන්ධය මත ප්‍රතිලාභ කර්මාන්තයේ සාමාන්‍ය අනුව වැඩි කිරීම සිදුකරන අතරතුර අපගේ පද්ධති හා ක්‍රියාවලි ඩිජිටල් කරණය කිරීම සිදුකරමින් පවතින අතර එමගින් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට කර්මාන්තයේ නැගී එන ප්‍රවණතා සමඟ ගැලපීම සඳහා මෙන්ම වර්ධනය සඳහා නිවැරදි වේදිකාවක් නිර්මාණය කිරීමට හැකිවනු ඇත.

කෙටිකාලීන තොග තැම්පතු මත සංකේන්ද්‍රණ අවදානම හා කල්පිරීම් අවගැලපුම් අඩුකිරීම සඳහා අපි තවදුරටත් දිගුකාලීන අරමුදල් සොයමින් සිටිමු. 2022 දෙසැම්බර් 31 දිනට පෙර රු. බිලියන 7.5 ක අවම නියාමන ප්‍රාග්ධනයක් තබා ගැනීම වෙනුවෙන් අපි කටයුතු කරමින් සිටිමු. 2021 වසරේදී ආදායමට පිරිවැය අනුපාතය 51% සිට 50% දක්වා අඩු කිරීමටත් එතැන් සිට වසරක් පාසා 3% කින් අඩු කිරීමත් සිදු කරන අතර අක්‍රිය ණය අනුපාතය 6% දක්වා අඩුකරමින් (අර්ථසාධක හැර) 2021 වසරේදී කර්මාන්තයේ සාමාන්‍යට සමානව පවත්වාගෙන යෑමටත් අපි ඉලක්ක කර සිටිමු.

ස්තුතිය

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්, ඔවුන් ලබාදුන් සහයෝගය හා උපදෙස් වෙනුවෙන් ඔවුන් වෙත ස්තූතිය ප්‍රකාශ කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ පොදු දැක්ම වෙත ළඟාවීම සඳහා සාමාන්‍යාධිකාරිතුමා, ජ්ෂ්ඨ කළමනාකරණය හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ කාර්යමණ්ඩලය වෙහෙස නොබලා කටයුතුකර ඇත.

අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා, ගරු අග්‍රාමාත්‍ය හා මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා, මුදල් ප්‍රාග්ධන හා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යතුමා, භාණ්ඩාගාර ලේකම්තුමා, මහ බැංකු කාර්ය මණ්ඩලය, නීතිපති දෙපාර්තමේන්තුව හා විගණකාධිපති දෙපාර්තමේන්තුව සහ අනෙකුත් නියාමන ආයතන ප්‍රධානීන් මූල්‍ය වර්ෂය තුලදී ඔවුන් ලබාදුන් මගපෙන්වීම් හා සහයෝගය වෙනුවෙන් මම මාගේ අවංක කෘතඥතාවය ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි.



ආචාර්ය උදයශ්‍රී කාරියවසම්
සභාපති

සාමාන්‍යාධිකාරීතුමාගේ සමාලෝචනය

අපගේ ප්‍රධාන මෙහෙයුම් හා ව්‍යාපාරික කාර්යශූර්යභාවයේ ශක්තියෙන් පිටුවහලක් ලද ආකර්ෂණීය කාර්යසාධනයක් වාර්තා කරමින් 2020 වර්ෂය සඳහා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ වාර්ෂික වාර්තාව ඔබ වෙත ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳව මම ඉමහත් සතුටට පත්වෙමි. අපගේ සියලුම පාර්ශවකරුවන්ට වටිනාකමක් නිර්මාණය කිරීම හා ලබාදීම, ඵලදායී කණ්ඩායම් ක්‍රියාකාරකම් සහ සේවා විශිෂ්ඨත්වය සඳහා අපගේ කැපවීම මගින් අපි මෙහෙයුම් පරිසරයේ ඇතිවී තිබූ පෙර නොවූවිරූ විපත්ති අවස්ථාවක ප්‍රත්‍යාස්ථභාවය සහ විශ්වාසය සමඟ බාධක විඳදරා ගත්තෙමු.

සාර්ව ආර්ථික සංවර්ධනය

කොවිඩ්-19 වසංගතය හා ඒ හේතුවෙන් සිදුවූ අගුලු දැමීම් නිසා සමස්ථ ලෝකයම නැවතීමකට ලක්වූ සමාලෝචිත වර්ෂය ඉතිහාසය තුළ දක්නට ලැබුණු ඉතාමත් පීඩාකාරී වසරක් විය. පසුව ලොවපුරා විවිධ රටවලට බලපෑම් ඇතිකරමින් එහි පිටාර ගැලීමේ බලපෑම සමග ගෝලීය ආර්ථිකය 3.5% කින් සංකෝචනයවී ගියේය. නවාතැන් පහසුකම්, ආහාර, බීම වර්ග, සේවා කටයුතු සහ ප්‍රවාහනය වැනි සංචාරක කර්මාන්තය හා සම්බන්ධ කටයුතු, රෙදිපිළි හා ඇඟලුම් මෙන්ම ඉදිකිරීම් වැනි ප්‍රධාන කර්මාන්තවල වර්ධනයේ පසුගාමිත්වයක් මේ කාලය තුළදී පෙන්නුම් කරමින් දේශීය ආර්ථිකය 3.6% කින් හැකිලී ගියේය. මාර්තු මස මැද භාගයේ සිට මැයි මස මැද භාගය දක්වා කොවිඩ්-19 පැතිර යන අතරේ දීප ව්‍යාප්ත අගුලු දැමීම් හේතුවෙන් අඩු කම්කරු සහභාගිත්ව අනුපාතයක් හා ඉහළ විරැකියා අනුපාතයක් 2020 වසරේ මුල් භාගය තුළදී ඇතිවී තිබිණි. ඉහළ ගිය විරැකියා හා ආදායම් අහිමිවීම පුද්ගලික පරිභෝජනයට බාධාවක් වූ අතර, ආර්ථික අවිනිශ්චිතභාවය ආයෝජන සඳහා බාධාවක් විය. ආහාර උද්ධමනය නිතරම ඉහළට ගමන් කිරීම පවතින විටදීත් 2020 වසරේ දී සියයට 4 - 5 අතර පරාසයක උද්ධමනය පවත්වා ගැනීමට අඩු ඉල්ලුම් තත්ත්වයන් හා හොඳින් තහවුරුකර තිබූ උද්ධමන අපේක්ෂාවන් උපකාරීවිය.

කොවිඩ්-19 ආසාදනයේ දෙවන රැල්ල පවතින විටදීත් ආර්ථිකය පුළුල් ලෙස විවෘතව තබා තිබූ හෙයින් හතරවන කාර්තුව දක්වා පැවතුනු වසංගතයේ පළමු රැල්ල සාර්ථක ලෙස පාලනය කිරීම හා පැතිරීම වැළැක්වීමට කටයුතු කිරීමෙන් පසුව තුන්වන කාර්තුවේදී දේශීය ආර්ථිකය යථාතත්ත්වයට පත්වීම ආරම්භවිය. වසංගතය හේතුවෙන් දැඩි බලපෑමට ලක්වූ ව්‍යාපාර හා පුද්ගලයින්ට ඵලදායී සහයෝගිත්වය ක් ලබාදීම සඳහා පුළුල් ප්‍රතිපත්ති හා උපකාරක ක්‍රියාමාර්ග හඳුන්වාදීම මගින් රජයත්, ශ්‍රී ලංකා මහ බැංකුවත් මෙම තත්ත්වය තවදුරටත් පැතිර යෑම වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගෙන තිබිණි.

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් පැනනැඟී තිබූ ආර්ථික අස්ථාවරත්වය හමුවේ වුවද මූල්‍ය අංශයේ කාර්යසාධනය ප්‍රකෘති තත්ත්වයක පැවතිණි. පවතින අභියෝගාත්මක ආර්ථික වාතාවරණයෙන් පැනනගින අවදානම් නොතකා බැංකු අංශය මධ්‍යස්ථ වර්ධනයක් පෙන්වා තිබිණි. කෙසේ වෙතත් වසංගතය හේතුවෙන් ණය ගුණාත්මකභාවයේ පිරිහීම සහ විදේශ විණිමය ගලා ඒම අඩුවීම බැංකු අංශයේ මෙහෙයුම්වල සාර්ව විචක්ෂණ කටයුතු ලෙස පැවතිණි. මේ හැරුණුවිට වත්කම් පදනමේ, ණය හා තැම්පතු සහ ලාභදායිත්වයේ පසුගාමිත්වය සහ ප්‍රධාන වශයෙන් වසංගතය නිසා ඇතිවූ හේතු අක්‍රිය ණය අනුපාතය වැඩිවීමට සහ වර්ෂය තුළදී මහජන විශ්වාසය බිඳවැටීමෙන් සැලකියයුතු බලපෑමක් මෙම අංශය වෙත එල්ලවිය. වසංගතය නිසා විපතට පත්වූ පුද්ගලයින් හා ව්‍යාපාර සඳහා සහන සැපයීමට අතිවිශේෂ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ඇතුළු ණය ආපසු ගෙවීම් තාවකාලිකව කල් දැමීම වැනි නියාමන ක්‍රියාමාර්ග මෙම දැඩි බලපෑම කළමනාකරණය කිරීම සඳහා මහ බැංකුව විසින් හඳුන්වා දී තිබිණි.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ කාර්ය සාධනය

මූල්‍ය හා මෙහෙයුම් කටයුතු යන ද්විත්වයෙහිම ස්ථායිතාවයක් ප්‍රදර්ශනය කරමින් වර්ෂය තුළදී රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ආකර්ෂණීය කාර්ය සාධනයක් වෙත ළඟා වී ඇත. අපගේ වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය (ROA) හා ස්කන්ධය මත ප්‍රතිලාභ අනුපාතය (ROE) පිළිවෙලින් 1.15% ක් හා 6.09% ලෙස තබාගත් අතර ඉකුත් වසර හා සැසඳීමේදී වර්ධනයක් විදහා දක්වයි. එසේම උසස් ගුණාත්මක ද්‍රවශීල වත්කම් ස්ථාවර සංචිතයක් විදහා දක්වමින් අවම අවශ්‍යතාවය වන 90% ට සාපේක්ෂව 113.8% ක ද්‍රවශීල ආවරණ අනුපාතයක් (LCR) බැංකුව පවත්වාගෙන ගිය අතර අපගේ ද්‍රවශීලතා ආවරණ අනුපාතය අවම අවශ්‍යතාවය වූ 100% ට සාපේක්ෂව අපගේ ද්‍රවශීලතා ආවරණ අනුපාතය 137% ක (වාර්ෂික සාමාන්‍ය) අගයක පැවතිණි.

ඉකුත් වසරේ පැවති රුපියල් බිලියන 5.9 යේ සිට රු.බිලියන 6 දක්වා 1.59% කින් අපගේ පොලී ආදායම අපි සාර්ථක ලෙස ඉහළ නංවා ඇත්තෙමු. බැංකුවේ බදු පෙර ශුද්ධ ලාභය රු. මිලියන 572 ක් ලෙස වැඩි වී තිබූ අතර එය 2019 වසර හා සැසඳීමේදී 14% ක වර්ධනයක් පෙන්වයි. එමෙන්ම ණය හා අත්තිකාරම් කැපී පෙනෙන වර්ධනයක් අත්පත් කරගෙන තිබූ අතර එය 2020 වසර අවසානයේ දී රු. බිලියන 36.85 ක් ලෙස දැක්විනි. පසුව බැංකුවේ සමස්ථ වත්කම් පදනම රු. බිලියන 52.8 ක් දක්වා වර්ධනයවී තිබූ අතර එම වැඩිවීම 12.39% කි. අක්‍රිය ණය අනුපාතය කර්මාන්තයේ සාමාන්‍යට වඩා ඉහළින් තබා ගැනීමට බැංකුවට හැකිවී තිබූ අතර 2020.12.31 දිනට අර්ථසාධක අරමුදල් හැර දළ අක්‍රිය ණය අනුපාතය 10.72% ක් ලෙස දැක්විනි.

අපගේ විෂය පථය පුළුල් කිරීම සඳහා දේශීය, නිෂ්පාදන කර්මාන්ත සඳහා විශේෂ සුළු හා මධ්‍ය පරිමාණ සහ ව්‍යාපාරික ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම මගින් සුළු හා මධ්‍ය පරිමාණ මෙන්ම ව්‍යාපාර සඳහා මූල්‍ය සහන පිරිනැමීම පිළිබඳ ඇති හැකියාව රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව නිරීක්ෂණයකර ඇත. පසුගිය වසර හා සැසඳීමේදී මෙම අංශ සඳහා බැංකුවේ ණය හා අත්තිකාරම් 156% ක් දක්වා වැඩිවී ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ කොවිඩ්-19 මූල්‍ය සහන ණය යෝජනා ක්‍රමයට සහභාගීවූ බැංකුවක් ලෙස තවදුරටත් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව වසංගතයෙන් බලපෑමට ලක්වූ ව්‍යාපාර ආයතන සඳහාද මූල්‍ය සහන සපයා ඇත.

සාමාන්‍යාධිකාරීතුමාගේ සමාලෝචනය (ඉතිරි කොටස)...

මෙම කාලය තුළ මුහුණදුන් අභියෝග අතුරින් ඉහළ අක්‍රිය ණය අනුපාතය සහ පුද්ගල ඇප මත ණය වැඩිවීම හේතුවෙන් වත්කම් ගුණාත්මකභාවය අඩු වීම අපගේ ණය අයකරගැනීම සහ අවදානම් කළමනාකරණ ක්‍රියාකාරිත්වය ශක්තිමත් කිරීම මගින් මෙම අභියෝග තුලනය කර ගැනීමේදී ප්‍රධාන වශයෙන් සැලකිල්ලට ලක්විය.

ප්‍රධාන ජයග්‍රහණය

වසංගතයේ දැඩි බලපෑම නොතකා අපට ප්‍රධාන ජයග්‍රහණ කීපයක් වාර්තා කිරීමට හැකිවී තිබිණි. මෙම කාලය තුළදී කර්මාන්තයේ ඉතා අඩු ණය වර්ධනයක් යටතේ වුවද වර්ෂය සඳහා අපගේ සමස්ථ ණය ලබාදීම රු. බිලියන 12.5 දක්වා වැඩිවීමක් හා 12.39% ක අපගේ වත්කම් පදනමේ සැලකියයුතු වැඩිවීමක් පෙන්වා තිබීම සැලකිය යුතු ජයග්‍රහණයකි. බැංකුවේ ආයතනික නොවන තැම්පතු පදනම රු. බිලියන 6.2 කින් වැඩි වූ අතර එය අයවැය ඉලක්කවලට එරෙහිව 106% ක වැඩිවීමකි.

ශ්‍රී ලංකා මහ බැංකුවෙ විසින් කොවිඩ්-19 වසංගතයෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාර හා පුද්ගලයින් සඳහා ණය සහන ලබාදීමට ගත් පියවර හා සමගාමීව ගනුදෙනුකරුවන් 27,865 ක ප්‍රමාණයකට ණය සහන ලබාදී ඇත.

අනාගතය

කොවිඩ්-19 වසංගතයෙන් දැඩි ලෙස විනාශ වී ඇති පරිසරයක වර්ධනය තිරසාර ලෙස පවත්වාගෙන යෑමේදී ඉදිරියේ ඇති අභියෝගය පිළිබඳව අපි දැනුවත්වී සිටිමු. එබැවින් ඉදිරියට පියනගමින් බැංකුවේ තිරසාර ප්‍රගමනය සහතික කිරීම සඳහා අභියෝගාත්මක ව්‍යාපාරික වටපිටාවට අනුගතවීමේ අපගේ උපාය මාර්ගය අපි නිතරම නැවත ඇගයීමට ලක් කරන්නෙමු.

2022 වනවිට අපගේ සමස්ථ බැංකු ශාඛා ජාලය නවතම බැංකුකරණ පද්ධතිය විසඳුම් සමඟ ඒකාබද්ධ කිරීමෙන් අපි අපගේ සේවා ප්‍රමිතීන් තවදුරටත් ඉහළ නංවන්නෙමු. මෙයට අමතරව වෙබ් අඩවි පාදක දැනුම බෙදා ගැනීමේ හා යාවත්කාලීන කිරීමේ ක්‍රමය වැඩි දියුණු කිරීම, අපගේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ප්‍රති ස්ථානගත කිරීම, බැංකුවේ අභ්‍යන්තර හා බාහිර ප්‍රතිරූපය නගා සිටුවීම්ට කටයුතු කරන අතර 2022 දෙසැම්බර් අවසන්වීමට පෙර රු. බිලියන 7.5 ක් වන අවම නියාමන ප්‍රාග්ධන අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමට අදහස්කර ඇත.

ස්තුති පණිවිඩය

සභාපතිතුමා සහ අධ්‍යක්ෂ මණ්ඩලය ලබාදුන් අගනා මග පෙන්වීම් හා ඔවුන්ගේ දුරදක්නා නුවණ බැංකුව තිරසාර වර්ධනයක් කරා ඉදිරියට මෙහෙයවීමට සහයවූ අතර ඒ පිළිබඳව මම ඔවුන් වෙත මාගේ අවංක කෘතඥතාවය පිරිනැමීමට කැමැත්තෙමි. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ජ්‍යේෂ්ඨ කළමනාකරණයට සහ සේවක මණ්ඩලයට ඔවුන්ගේ කැපවීම වෙනුවෙන් මාගේ ස්තුතිය පුදකිරීමට කැමැත්තෙමි. ශ්‍රී ලංකා මහ බැංකුව, රේඛීය අමාත්‍යංශය සහ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අනෙකුත් අගනා පාර්ශවකරුවන්ට ඔවුන්ගේ අඛණ්ඩ සහයෝගය හා මගපෙන්වීම් වෙනුවෙන් මාගේ කෘතඥතාවය පුදකරමි. නිවාස මූල්‍ය අවශ්‍යතා වෙනුවෙන් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව වෙත වසර ගණනාවක් පුරා විශ්වාසය තබා ඇති අපගේ ගනුදෙනුකරුවන් වෙතද තවදුරටත් මාගේ කෘතඥතාවය ප්‍රකාශ කරමි.



එල්.අයි රණසිංහ
වැඩබලන සාමාන්‍ය සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි



“අපගේ පොලී ආදායම සාර්ථක ලෙස ඉහල නංවා ගැනීමට අපහට හැකිවී තිබූ අතර එය ඉතිහාසයේ ප්‍රථම වරට රු. බිලියන 6 ක කඩඉම පසුකර ගොස් ඇත. බැංකුවේ බදු පෙර ශුද්ධ ලාභය රු. මිලියන 572 ක් ලෙස වැඩිවී තිබූ අතර එය 2019 වසර හා සැසඳීමේදී 14% ක වර්ධනයක් පෙන්වයි.”

අධ්‍යක්ෂ මණ්ඩලය



1



2



3

01. ආචාර්ය කේ. ඩබ්. ඒ. යූ. කාරියවසම් සභාපති

ආචාර්ය උදයශ්‍රී කාරියවසම් මහතා 2020 වසරේ ජනවාරි 13 දින රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ සභාපතිවරයා ලෙස පත්කර ඇති අතර ඔහු අද දක්වා සේවය කරමින් සිටියි.

ආචාර්ය කාර්යවසම් මහතා ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ආචාර්ය උපාධිය ඕස්ට්‍රේලියාවේ නිව් කාසල් විශ්ව විද්‍යාලයෙන් ද ව්‍යාපාර (ගිණුම්කරණය) පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් නුවර RMIT විශ්ව විද්‍යාලයෙන් ද ව්‍යාපාර පරිපාලන (විශේෂ) විද්‍යාවේදී උපාධිය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ද ලබාගෙන ඇත. ආචාර්ය කාරියවසම් මහතා ඕස්ට්‍රේලියාවේ සී පී ඒ ආයතනයේ සහ ඇමරිකා එක්සත් ජනපදයේ සී එෆ් ඊ ආයතනයේ සාමාජිකයෙකි. ඔහු ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ අධිසාමාජිකයකු වන අතර ශ්‍රී ලංකා සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සමාගම් ලේකම්වරයෙකි. ආචාර්ය කාරියවසම් මහතා ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයකු වන අතර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධිසාමාජිකයකු වේ.

ආචාර්ය කාරියවසම් ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ, ලංකා කර්මාන්ත සංවර්ධන මණ්ඩලයේ, ශ්‍රී ලංකා විනිමය හා සුරුකුම්පත් කොමිෂන් සභාවේ, ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ, ලංකා විදුලිබල මණ්ඩලයේ, ලංකා බැංකුවේ, ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුවේ, ශ්‍රී ලංකා මර්චන්ට් ක්‍රෙඩිට්, සීමාසහිත බී.ඕ.සී. ට්‍රැවල්ස්, සීමාසහිත හොටෙල්ස් කලම්බු 1963, සීලනීස් ෆිනෑන්ෂල් සර්විස් ප්‍රයිවට් ලිමිටඩ්, සීමාසහිත දේපල සංවර්ධන කළමණාකරන සමාගම යන ආයතනවල සභාපතිවරයා ලෙස සේවයකර ඇත.

ඔහු රාජ්‍ය වැවිලි සංස්ථාවේ වැඩබලන සභාපති වරයා ලෙස ද, ලංකා හෝස්පිටල් කෝපරේශන් පීවිල්සී (ඇපලෝ රෝහල) හි නියෝජ්‍ය සභාපතිවරයා ලෙස ද, සේවය කර ඇත. ආචාර්ය කාරියවසම් මහතා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ තත්ත්ව සහතික හා ප්‍රතිපාදන ස්ථාවර කමිටුවේ සහ ආර්ථික සංවර්ධනය සඳහා වන ජාතික කවුන්සිලයේ ආර්ථික ප්‍රතිපත්ති කණ්ඩායමේ සාමාජිකයෙකු විය.

අධ්‍යක්ෂ මණ්ඩලය (ඉතිරි කොටස)...



4



5

02. එස්.කේ.ඒ. ගලප්පත්ති මහතා
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

සමන් ගලප්පත්ති මහතා ඔහුගේ ද්විතීක අධ්‍යාපනය ගාල්ලේ මහින්ද විද්‍යාලයෙන් ලබාගෙන ඇත. ඔහු කොළඹ විශ්ව විද්‍යාලයේ නීති පීඨයට ඇතුලත්වී ගෞරව උපාධියක් ලබාගෙන ඇත. 1994 වර්ෂයේදී ඔහු නීතිඥ වෘත්තියට අවතීර්ණවී ඇත. ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ හිටපු අගවිනිසුරු හා හිටපු නීතිපති ජනාධිපති නීතිඥ මොහාන් පීරිස් මහතාගේ නිල මැදිරියේ සිය නීති වෘත්තිමය ජීවිතය ආරම්භකර තිබිණි.

වසර කීපයක් පුද්ගලිකව සේවයේ නියැලෙමින් පසුව ඔහු මර්කන්ටයිල් ඉන්වෙස්මන්ට් ඇන්ඩ් ෆයිනෑන්ස් සමාගමට බැඳී ඇත. එම සමාගමේ නීති අධ්‍යක්ෂවරයා ලෙස සේවය කර තිබිණි. ඔහු මූල්‍ය ආයතන සංගමයේ නීති කවයේ සභාපතිවරයා ලෙස තේරී පත්ව සිටි අතර 2007 වසරේ සිට වසර දෙකක කාලයක් එහි සේවය කර ඇත.

ඔහු 2010 වසරේ සිට 2015 වසර දක්වා ජාතික ලොතරැයි මණ්ඩලයේ හා 2013 වසරේ සිට 2015 වසර දක්වා ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ අධ්‍යක්ෂ තනතුරු දරා තිබිණි.

ඔහු වාණිජ නීතිය, සමාගම් නීතිය, ඉඩම් නීතිය, දිස්ත්‍රික් අධිකරණ, වාණිජ මහා අධිකරණ, සිවිල් අභියාචනා මහ අධිකරණ සහ කම්කරු විනිශ්චය සභාවල කම්කරු නීතිය, රිට් අයදුම් කිරීම, පරිපාලන නීතිය සහ අභියාචන අධිකරණයේ හා ශ්‍රේෂ්ඨ අධිකරණයේ මූලික අයිතිවාසිකම් පිළිබඳව වසර 25 කට අධික පරිචයක් ලබා ඇත.

සමන් ගලප්පත්ති මහතා ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ නියෝජිතයකු වන අතර කොළඹ නීති සමාජයේ සාමාජිකයෙකුද වේ. ඔහු ශ්‍රී ලංකා වෘත්තිය වේදීන්ගේ සංගමයේ ද සාමාජිකයෙකු වෙයි.

03. ඩබ්ලිව්.සී.එන්. කුරේ මැතිණිය
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

වෘත්තියෙන් වරලත් ගනකාධිකාරිවරියක වූ චමිලා කුරේ මැතිණිය ජනවාරි 02 දින රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂවරියකු ලෙස පත් කරනු ලැබූ අතර ඇය විසින් අද දක්වාම එම තනතුර උසුලනු ලබයි.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ පාලන සභාවේ සමාජිකයකු ලෙස ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ අවුරුදු 60 ක ඉතිහාසය තුල ආයතනික අංශයෙන් (වෘතියේ නොයෙදෙන) පත්වූ පළමුවන කාන්තාව චමිලා කුරේ මැතිණිය වේ. මෑතකදී ඇය ශ්‍රී ලංකා ගණකාධිකාරී ශිල්පීය සංගමයේ පාලක සභාවට පත්කර ඇත. උසස් අධ්‍යාපන තාක්ෂණ නවෝත්පාදන අමාත්‍යාංශයේ උසස් තාක්ෂණය අධ්‍යාපන පාලක සභාවේ සාමාජිකාවක් ලෙසද කටයුතු කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය (ඉතිරි කොටස)...

2021 වසරේදී දෙවනවරටත් ඇය ශ්‍රී ලංකා වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA) රටතුළ ඇති ජාලයේ කම්ටුවට පත්කර ඇත. ඇය කොළඹ විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනවේදී ආදී ශිෂ්‍ය සංගමයේ භාණ්ඩාගාරිකවරිය වන අතර ශ්‍රී ජයවර්ධන විශ්වවිද්‍යාලයේ ගණකාධිකාරී ආදි ශිෂ්‍ය සංගමයේ විධායක සාමාජිකාවකි. දකුණු ආසියානු ගණකාධිකාරී සම්මේලනයේ කාන්තා කම්ටුව නියෝජනය කිරීමටත් සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ කාන්තා නායකත්ව වැඩසටහනට නායකත්වය ලබාදීම සඳහාත් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ කාන්තා බලගැන්වීම් හා නායකත්ව සංවර්ධන කම්ටුවේ සාමාජිකාවක ලෙස පත්කරනු ලැබීමට කාන්තා බලගැන්වීම් සඳහා ඇගේ තිබූ දැඩි කැපවීම හේතුවිය.

චමිලා කුරේ මැතිණිය දැනට ඩබ්ලිව් එන් එස් ග්ලෝබල් සර්විස් ප්‍රයිවට් ලිමිටඩ් හි සාමාන්‍යාධිකාරී මෙහෙයුම් ලෙස කටයුතු කරයි.

දේවි බාලිකා විද්‍යාලයේ ආදී ශිෂ්‍යාවක් වන චමිලා කුරේ මැතිණිය සිය වෘතිය ජීවිතය KPMG ආයතනයෙන් ආරම්භකළ අතර විවිධ ආයතනවල අවුරුදු 20 ට අධික ඇයගේ සේවා කාලය තුල ජේෂ්ඨ තනතුරු දරා ඇත.

ඒවා අතර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධ්‍යක්ෂ / ප්‍රධානී තාක්ෂණික ලෙස 2009-2010 කාලය තුළ සේවයකර ඇති අතර IFRS කන්වර්ජන්ස් ව්‍යාපෘතියට නායකත්වය ලබා දී ඇත. මෙම නිලකාලය තුළදී ඕස්ට්‍රේලියාවේ සී පී ඒ ආයතනයෙන් ශිෂ්‍යත්වයක් ලබා ගැනීමට හා ඕස්ට්‍රේලියාවේ ආධාර මත පරිපූර්ණ අධ්‍යාපන වැඩ සටහනකට සහභාගිවීමට අවස්ථාවලත් ප්‍රථම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතන සාමාජිකයා ඇය විය.

චමිලා කුරේ මැතිණිය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී (FCA) ආයතනයේ හා චක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකාවකි. ඇය ඕස්ට්‍රේලියාවේ සහතිකලත් වෘත්තියේ නියැලී ගණකාධිකාරී ආයතනයේ පූර්ණ සාමාජිකත්වය දරයි. ඇය ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ වරලත් වෘතිය කළමනාකරුවන්ගේ ආයතනයේ සහ ගණකාධිකරණ ශිල්පීය සංගමයේ අධි සාමාජිකාවකි. ඇයට ශ්‍රී ජයවර්ධනපුර සරසවියෙන් ලබාගත් ගිණුම්කරණය පිළිබඳ (විශේෂ) පළමු පන්තියේ විද්‍යාවේදී ගෞරව උපාධියක් හිමිවී ඇත. ඇයට කොළඹ විශ්වවිද්‍යාලයෙන් ලබාගත් ව්‍යාපාර පරිපාලනවේදී උපාධියක් ද හිමිව ඇත.

04. එච්. සී. ඩී. එල්. සිල්වා මහතා
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

අධ්‍යක්ෂ එච්. සී. ඩී. එල් සිල්වා මහතා මුදල් අමාත්‍යාංශයේ භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස කටයුතු කරන අතර 2020 ජනවාරි 11 දින රාජ්‍ය උකස් ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට අධ්‍යක්ෂවරයකු ලෙස පත්වීම් ලබා අද දක්වාම එම ධූරයේ කටයුතු කරමින් සිටියි.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ව්‍යාපෘති කලමනාකරණයේ රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිධාරියෙක් වන අතර ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් රාජ්‍ය පරිපාලනය පිළිබඳ (විශේෂ) විද්‍යාවේදී ගෞරව උපාධියක් ලබාගෙන ඇත. ඔහු ලන්ඩනයේ රාජ්‍ය මූල්‍ය හා ගණකාධිකරණ වරලත් ආයතනයේ සහ ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීන්ගේ සංගමයේ ආශ්‍රිත සාමාජිකත්වය දරයි.

1992 වසරේ සිට ශ්‍රී ලංකා ගණකාධිකාරීන්ගේ සේවයේ ගණකාධිකාරීවරයෙකු ලෙස වසර 28 ට අධික කාලයක පළපුරුද්දක් ලබා ඇති ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් 1992 වසරේ දී පැවැත්වූ විභාගයෙන් (පැරණි නිර්දේශය) පළමු කොටසින් සමත්වී ඇත. විවිධ දැනුම් සම්භාරයක් ලබා ඇති උපායමාර්ගික මට්ටමේ නිලධාරියෙකුවන ඔහු විශේෂයෙන්ම රාජ්‍ය මූල්‍ය කළමනාකරණය, භාණ්ඩාගාර මුදල් කළමනාකරණය, රාජ්‍ය ණය කළමනාකරණය, විගණනය ගිණුම්කරණය සහ රාජ්‍ය ප්‍රසම්පාදන කළමණාකරණය යන ක්ෂේතවල දැනුමක් ලබා ඇත.

05. ඒ. ජේ. පී. එච්. බී. එම්. ආර්. සේනක බණ්ඩාර
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

ඒ.ජේ.පී.එච්.බී.එම්.ආර්.සේනක බණ්ඩාර මහතා 2020 ජනවාරි 02 දින රාජ්‍ය උකස් ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්කර ඇති අතර ඔහු අද දක්වාම එම සේවයේ නිරතව සිටියි.

සේනක බණ්ඩාර මහතා වෘත්තියෙන් නීතිඥයෙකි. අවසාන නීතිඥ විභාගයෙන් දෙවන පන්තියේ ගෞරව උපාධියක් ලබාගෙන ඇති අතර 2010 වසරේ දී නීතිඥ කටයුතු ආරම්භ කර ඇත. අපරාධ සහ සිවිල් නීති ක්ෂේත්‍රයේ ක්‍රියාකාරිව නියලෙමින් වසර 10 ක් සම්පූර්ණ කර ඇත. ආයතනික හා පුද්ගල ගනුදෙනුකරුවන් වෙනුවෙන් ප්‍රථමවර උසාවිවල සහ ඇපල් අධිකරණයන්හි වෘත්තියෙහි නියැළෙමින් සිටියි. ලංකා බැංකුව, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සමාගම, මහජන බැංකුව, බනිජතෙල් සංස්ථාව සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම වැනි බොහෝ රාජ්‍ය ආයතනයන්ගේ අධිකරණ කටයුතු සඳහා ඔහුගේ නියෝජනය ලබා දී ඇත.

ඔහු නීති වෘතියේ කටයුතු කිරීමට ප්‍රථම පරිවාස හා ළමා ආරක්ෂණ දෙපාර්තමේන්තුව සහතික ලත් පාසලක විදුහල්පති ලෙස සේවය කර ඇත. දෙවන පන්තියේ ඉහල සමාර්ථයක් සහිත අපරාධ විද්‍යාව පිළිබඳ විශේෂ ශ්‍රාස්ත්‍රපති උපාධියක් ඔහු ලබාගෙන ඇත. මාධ්‍ය වේදියෙකු ලෙස ඔහු විද්‍යුත් ජනමාධ්‍ය කීපයක සේවයකර තිබිණි. සේනක බණ්ඩාර මහතා ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ අපරාධ යුක්ති පරිපාලනය පිළිබඳව LLM උපාධියක් සඳහා සූදානම් වෙමින් සිටියි.

ආයතනික සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණය



01



02



03



04



05



06



07



08



09



10



11

01 **එල්. අයි රණසිංහ මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ණය)
MBA (Fin), B. Sc. Mkt. Mgt, AIB, ACIM

02 **ටී. එම්. ජේ. වික්‍රමසේකර මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී (ණය, සේ.අ.අ./වතු/සුළු හා මධ්‍ය පරිමාන/ක්ෂුද්‍ර)
B. Com (Special), PGD in BF

03 **කේ. එල්. එන්. ඒ. පෙරේරා මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය)
MBA (Fin), FCA, B. Com. (Sp), SAT, HNDA, Dip. in RM

04 **නිෂානි පී. කේ. ලොකුගේ මහත්මිය**
සහකාර සාමාන්‍යාධිකාරී (නීති/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්)
LLB, Attorney-at-Law, Notary Public and Commissioner for Oaths, Company Secretary

05 **බී. එම්. ඩී. ප්‍රියන්ග බී. බස්නායක මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ)
MSc (Mgt & IT), B. Sc. (MIS), MBCS UK

06 **කේ. කේ. කපිල කීරවැල්ල මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී (අයකර ගැනීම්)
B.Com (Sp) Hons (USJ), PG.EX.Dip. in Bank Mgt (IBSL)

07 **අශ්මි එස්. කේ. අමරසිංහ මහත්මිය**
සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා ප්‍රවර්ධන)
MBA, PQHRM, Dip in Psychology, AMCIPM

08 **එන්. ඒ. ආර්. නිරෝශණී ද සිල්වා මහත්මිය**
ප්‍රධාන අභ්‍යන්තර විගණක
FCA, B. Sc. (Acc) Sp. (Hons.)

ආයතනික සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණය (ඉතිරි කොටස)...



12



13



14



15



16



17



18

09 **එල්. ඩබ්ලිව්. සමරවික්‍රම මහතා**
වැඩ බලන සහකාර සාමාන්‍යාධිකාරී (ණය/ප්‍රධාන කළමනාකරු-ණය)
B. Sc. (Sp) Estate Management & Valuation, AIV, ACBF - (IBSL)

10 **ඩී. එම්. ආර්. දිසානායක මහතා**
ප්‍රධාන කළමනාකරු (වතු, සේ.අ.අ./කුඩා හා මධ්‍ය පරිමාන සහ ක්ෂුද්‍ර ණය)
MA, B. Sc. -EMV (Sp) Hons, DBF, Dip in MC, Dip in CE, AIV, AIB

11 **එස්. වික්‍රමසිංහ මහතා**
ප්‍රධාන කළමනාකරු (ණය)
B. Sc. EMV (Sp) Hons., AIV

12 **ඩබ්ලිව්. කේ. පෙරේරා මහත්මිය**
ප්‍රධාන කළමනාකරු (නීති)
LLB, Attorney - at - Law, Company Secretary

13 **ඩබ්ලිව්. ජී. එස්. එස්. කේ. අබේවික්‍රම මහත්මිය**
ප්‍රධාන කළමනාකරු (අනුකූලතා)
Attorney at Law and Notary of Public, Commissioner for Oaths,

14 **ඩී. බී. ප්‍රසාද් විල්ලාරච්චි මහතා**
අභ්‍යන්තර විගණක
MBS, P.G. Dip. In Business & Finance, B.Com. (Sp), CBA, MAAT

15 **ආර්. එම්. යූ. ඩී. බණ්ඩාර ගාමිණි මහතා**
ප්‍රධාන කළමනාකරු (මානව සම්පත් හා සැපයුම්)
MHRM, B. Sc. BA (Sp), NDHRM. , AMCIPM

16 **එස්. ඒ. කේ. ඒ. කේ. සුරියආරච්චි මහතා**
ප්‍රධාන කළමනාකරු (අවදානම් කළමනාකරණ)
MA Econ ,, PGD-App. Stat, BA Econ, ACCA - UK (part)

17 **අයි. එදිරසූරිය මහතා**
ප්‍රධාන කළමනාකරු (තක්සේරු)
M. Sc. (REMV), B. Sc. (EMV) (Sp) Hons. MRICS (UK), AIV

18 **එම්. එම්. ලක්ෂ්මන් පෙරේරා මහතා**
තොරතුරු තාක්ෂණ උපදේශන (මූලික බැංකු විසඳුම්)
M. Sc. (CS), MBA, B. Sc., BCS, FCS

ජායා රූපයේ පෙනි නොසිටින

අයි. කේ. ගාමිණි මහතා
ප්‍රධාන කළමනාකරු (ණය)
BA. Hons, CBF

ආයතනික පාලනය

ආයතනික පාලනය තුළින් විධායක කලමනාකරණයේ කාර්යසාධනය, ක්‍රමෝපායික තීරණ කොටස් කරුවන් වෙත ඔවුන්ගේ වගවීම සම්බන්ධයෙන් අධීක්ෂණය සහ පාලනය පිළිබඳ වැදගත් මූලධර්ම ඉස්මතු කර දක්වයි.

ආයතනික කාර්යසාධනය සහ අනාගත සංවර්ධනය සඳහා පදනමක් ලබා දෙන යහපත් ආයතනික පාලනයේ වැදගත්කම පිළිබඳ සාධකයට බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් ලෙස රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව එහි උපරිම සැලකිල්ල දක්වයි.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ තීරණ ගැනීමේ ඉහළම බලධාරීන්වන අධ්‍යක්ෂ මණ්ඩලයට බැංකුවේ මෙහෙයුම් හා මූල්‍යමය යහපත්බව සඳහා සමස්ත වගකීම පැවරී ඇති අතර, තැම්පත්කරුවන්, ණයහිමියන්, සේවකයින් සහ අනිකුත් පාර්ශවකරුවන්ගේ අවශ්‍යතාවයන් සපුරාලීම සහතික කිරීම සඳහා වගකිව යුතු වෙයි.

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුකරණය, මූල්‍ය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, නීතිය සහ අලෙවිකරණය යන අංශයන්ගේ ප්‍රායෝගික පළපුරුද්දක් ලබා ඇති වෘතිකයින් පිරිසකගේ සක්‍රීය එකතුවකි. ක්‍රමෝපායික, කාර්යසාධන සහ සම්පත් පිළිබඳව ගැටළු සම්බන්ධයෙන් ස්වාධීන, අපක්ෂපාතී සහ සෘජු තීරණ ගැනීමට අවශ්‍යවන දක්ෂතා සහ පළපුරුද්ද ඔවුන් සතුව ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය ආයතනයේ ක්‍රමෝපායික අරමුණු ක්‍රියාවට නැංවීම සඳහා නායකත්වය ලබා දීම, ව්‍යාපාර පිළිබඳ කළමනාකරණය අධීක්ෂණය කිරීම සහ කොටස් හිමියන්ට ඔවුන්ගේ කළමනාකාරිත්වය පිළිබඳ වාර්තා කිරීම සම්බන්ධ කටයුතු පිළිබඳ එහි පාලන වගකීම් අඛණ්ඩව ශක්තිමත් කරයි.

බැංකුවේ පාලන මූලධර්ම හා ව්‍යුහය ඵලදායී තීරණ ගැනීම ශක්තිමත් කරන අතර, ඉන් වඩා ඉහළ විනිවිදභාවය දිරිගන්වමින් ව්‍යාපාරයේ සෑම දිශාවක් තුළම වගවීම සිදුකරයි. බැංකුව විචක්ෂණශීලීව සහ දිවයිනේ හා පාලන අධිකාරීන්හි නීති හා රෙගුලාසි සහ බැංකුවේ අභ්‍යන්තර ප්‍රතිපත්ති පිළිබඳ රාමුව තුළ පාලනය කෙරෙන බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි.

බැංකුවේ තත්ත්වය සහ අනාගත කටයුතු සභාපතිතුමාගේ සමාලෝචනය/පණිවිඩය සහ සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි.ගේ සමාලෝචනය තුළ විස්තරාත්මකව සාකච්ඡා කර ඇත.

කෙසේවෙතත්, සාදාචාර ආකාරයකින් බැංකුවේ ව්‍යාපාරය වර්ධනය කිරීම අත්‍යවශ්‍යයෙන් කළයුතු බැවින්, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව වගවීම, අවංකකම, සාධාරණත්වය, ආචාරවිධි සහ සදාචර, නෛතික/නියාමන අනුකූලතාව, විනිවිදභාවය හා අනාවරණය සහ විශිෂ්ඨ කාර්යක්ෂමතා වැනි පදනම් තත්ත්වයන් සහ උපලක්ෂණ සහිත මූලික පදනම මත කටයුතු කිරීම ඉතා වැදගත් ය.

වගවීම

වගවීමේ ක්‍රමවේදයක් ඇති කිරීම ආයතනයක සාර්ථකත්වයට හේතුවන එක් ප්‍රධාන සාධකයක් වන හෙයින් බැංකුව ඉහත කරුණ පිළිබඳව මනා වැටහීමක් සහිතව එහි ක්‍රියාකාරකම් සඳහා වගකීම් බාර ගැනීමේ සංස්කෘතියක් සංවර්ධනයකර ඇත.

වගවීම පිළිබඳ සංකල්පය යහපාලනයේ එක් අඩිතාලමක් වන බව අවබෝධ කරගනිමින්, බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විගණන කමිටුවේ නිර්දේශ මත බැංකුවේ වාර්ෂික සහ අතුරු මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කර අනුමත කරන අතර, මූල්‍ය ප්‍රකාශන මත තොරතුරු විනිවිදබාවයෙන් සහ නිසි ආකාරයෙන් බැංකුවේ පාර්ශ්වකරුවන්ට සහ පොදු මහජනතාවට වාර්තා කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් විගණනය කරන අතර, බැංකුව පුවත්පත්වල කාර්තුමය සහ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ප්‍රකාශයට පත් කරයි. මේ මගින් බැංකුව එහි වගවීම මුදාහැරීමේදී එහි ප්‍රතිපත්ති සහ ක්‍රියාවලිවල විනිවිදභාවය සහ විශ්වාසනීයත්වය වැඩි කරයි.

බැංකුවේ ව්‍යාපාරයට අදාළ කරුණු සම්බන්ධයෙන් සියලුම නියාමන බලධාරීන් විසින් පනවනු ලබන අවශ්‍යතාවන්ට බැංකුව අනුකූල වී ඇත.

සාධාරණත්වය

ජාතියේ නිවාස බැංකුව බවට පත්වෙමින්, බැංකුව එහි උනන්දුවක් දක්වන සියලුම පාර්ශ්වයන්ට නිවැරදි සහ සාධාරණ ආකාරයකින් සලකනු ලබයි. බැංකුව යහපත් තීරණ ගන්නා අතර, එම තීරණ ගනුදෙනුකරුවන්, සේවකයින්, කොටස්හිමියන්, සැපයුම්කරුවන් සහ අවසාන වශයෙන් ප්‍රජාව වැනි යම් අයෙකුට පීඩාවත් නොමැතිව ව්‍යාපාර අවශ්‍යතාවන්ට සේවය කරන තීරණ වේ.

බැංකුව සියලුම ගනුදෙනුකරුවන් සඳහා වටිනා දෑ සිදුකරයි. ණය පහසුකම් ලබාදීමේදී, බැංකුව මාසිකව ගෙවීමේ හැකියාව වන එහි ගනුදෙනුකරුවන්ගේ ආපසු ගෙවීමේ හැකියාව තක්සේරු කරයි. බැංකුව අවසාන උපාය ලෙස පමණක් පැහැරහැරි ගනුදෙනුකරුවන් සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගන්නා අතර, අනපේක්ෂිත දුෂ්කරතාවන්ට ඔවුන් මුහුණපාන අවස්ථාවක සෑමවිටම ගනුදෙනුකරු සමඟ සිටීම මගින් ඉතා තරගකාරී බැංකුකරණ කර්මාන්තයක් ලෙස ජාතියේ නිවාස බැංකුව වෙමින් බැංකුවේ දැක්ම සහ මෙහෙවර නගා සිටුවයි.

ආයතනික පාලනය (ඉතිරි කොටස)...

විනිවිදභාවය සහ අනාවරණය

ප්‍රාග්ධනය වෙන්කිරීම, ආයතනික ගනුදෙනු සහ මූල්‍ය කාර්යසාධන නියාමනය සම්බන්ධයෙන් කොටස්හිමියන්ට, පාර්ශ්වකරුවන්ට සහ අනාගත ආයෝජකයින්ට දැනුවත් තීරණ ගැනීම සඳහා ඔවුන්ට පදනම් ලබාදෙන බැවින්, විනිවිදභාවය සහ අනාවරණය ශක්තිමත් ආයතනික පාලන රාමුවක අත්‍යවශ්‍ය අංග වෙති. මූල්‍ය අර්බුදයට හේතුවන ප්‍රධාන දෝෂය මූලිකව ඇති වන්නේ මූල්‍ය අනාවරණයේ අඩුපාඩුව සහ ප්‍රමාණවත් නොවන පාලන ව්‍යවහාරය මගින් බවට පොදුවේ විකඟ වී ඇත.

ආයතනික පාලනය සඳහා විනිවිදභාවය මූලික පියවරක් වන අතර, කළමනාකරණය අවිධිමත් හෝ නීති විරෝධී හැසිරීම් තුළ නොයෙදෙන බව සහතික කිරීමට කළමනාකරණයේ හැසිරීම සියුම්ව පරීක්ෂා කළ හැකි වේ. විනිවිදභාවය අත්කර ගැනීම පිණිස, බැංකුව නිවැරදි ගිණුම්කරණ ක්‍රම යොදාගැනීම, සමාගමේ තොරතුරු සම්පූර්ණයෙන් හා කඩිනමින් අනාවරණය කිරීම සහ අධ්‍යක්ෂවරුන්ගේ හෝ පාලන කොටස්හිමියන් යනාදියගේ බැඳියා පිළිගැටුම් අනාවරණය කිරීම කළයුතු බව බැංකුව තරයේ විශ්වාස කරයි. ඒ අනුව, බැංකුව එහි වාර්ෂික වාර්තාව, ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව, මූලික කාර්යසාධන දර්ශක, ව්‍යාපාර සංකේන්ද්‍රණ, ආයතනික පාලන ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශන අනාවරණය තුළින් එහි කටයුතුවල විනිවිදභාවය අනාවරණය කරන බව බැංකුව සහතික කරයි.

එමෙන්ම, බාසල් 111 රෙගුලාසි සහ පැහැදිලිව සහ පහසුවෙන් අවබෝධකරගත හැකි ශ්‍රී.ල.මු.වා. (SLFRS) ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කරන කාර්තුමය සහ වාර්ෂික මූල්‍ය වාර්තා බැංකුව ප්‍රසිද්ධියට පත් කරයි. බැංකුවේ කටයුතුවල පොදු බැඳියාව සුරක්ෂිත කරන බව මේ මගින් සහතික කරයි. අවශ්‍ය රහස්‍යතාව කඩනොකර බැංකුවේ අවදානම් නිරාවරණ සහ අවදානම් කළමනාකරණ ක්‍රමෝපායන් සම්බන්ධ ප්‍රධාන කරුණු පිළිබඳ එහි අනාවරණ බැංකුව විසින් කළ යුතුය යන්න පිළිගැනීම මගින්, විධිමත් වාර්තා අතර ඇතිවන සියලුම වැදගත් සංවර්ධනයන් අනවශ්‍ය ප්‍රමාදයක් නොමැතිව නීතිය මගින් අවශ්‍යකරන පරිදි අදාළ බලධාරීන්ට සහ පාර්ශ්වකරුවන්ට අනාවරණය කරනු ලැබේ.

2020 වසර කාලසීමාවේදී, බැංකුව තුළ වාර්තා වූ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු කිසිවක් නොමැත.

අධ්‍යක්ෂ මණ්ඩලය

1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතිය සහ එහි සංශෝධනවල දක්වා ඇති පරිදි රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මුදල් ආර්ථික හ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබ ඇති අතර, විවිධ ක්ෂේත්‍රවල දැනුම සහිත සුදුසු සහ යෝග්‍ය ස්වාධීන සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන් නව දෙනෙකුගෙන් සමන්විත වේ. එකී සාමාජිකයින් නවදෙනාගෙන් අධ්‍යක්ෂවරු තිදෙනෙක් කෘෂිකර්ම විෂයභාර අමාත්‍යාංශයේ අමාත්‍යවරයාගේ, නිවාස විෂයභාර අමාත්‍යාංශයේ අමාත්‍යවරයාගේ සහ පශුසම්පත් විෂයභාර අමාත්‍යාංශයේ අමාත්‍යවරයාගේ නියෝජිතයින් විය යුතුය. එයට හේතුව මූල්‍ය සහ අනෙකුත් සහය ලබාදීම මගින් කෘෂිකර්මය, කර්මාන්ත සහ නිවාස සංවර්ධනය තුළ පොදු ජනතාවට සහයවීම බැංකුවේ අරමුණ වීමයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ දායකවීමේ මඟපෙන්වීම්වල ප්‍රමාණවත් බල තුලනයක් සහ අඛණ්ඩතාවයක් ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය සංයුතිය මගින් සහතික කරයි. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය ඉහළ මට්ටමේ ක්‍රමෝපායික තීරණ ගැනීම අධීක්ෂණය කරමින් බැංකුවේ සමස්ථ වගකීම් සහ වගවීම භාරගන්නා අතර සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි වෙත ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීමේ බලය පවරා ඇති අතර ඔහු මූලිකත්වය ගන්නා සහ ඔහු විසින් නායකත්වය සහ උපදෙස් ලබාදෙන ආයතනික කළමනාකරණ කණ්ඩායම තුලින් විධායක බලය ක්‍රියාවට නංවයි. බැංකුවට ඵලදායී නායකත්ව ව්‍යුහයක් ඇති අතර ඉන් අධ්‍යක්ෂ මණ්ඩලයට කණ්ඩායමක් ලෙස සහයෝගයෙන් කටයුතු කිරීමට ඉඩලබා දේ.

අධ්‍යක්ෂ මණ්ඩලය, ඔවුන්ගේ තීරණ, පළපුරුද්ද සහ ප්‍රවීනත්වය මත විශ්වාසය තබමින්, බැංකුවේ ක්‍රමෝපායික ප්‍රමුඛතාවන්ට සමගාමීව සම්පත්වල ඵලදායී භාවිතය, ඵලදායී අභ්‍යන්තර පාලන ක්‍රියාපටිපාටි සහ සක්‍රීය අවදානම් කළමනාකරණ යාන්ත්‍රණයක් සහතික කිරීම සඳහා ආයතනික කාර්ය මණ්ඩලය වෙත මනා අධ්‍යක්ෂ මණ්ඩලයක් ලෙස සහ මඟපෙන්වීමේ මූලාශ්‍රයක් ලෙස සේවය කරයි.

සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන්ගේ ශක්තිමත් බැඳීම සහ දූරදර්ශී මඟපෙන්වීම අනුව, බැංකුවේ පාලනය ඉදිරියටත් සිදු කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය මාසයකට වරක් අවම වශයෙන් මුණ ගැසෙන අතර, 2020 වසර තුළ, රැස්වීම් 11ක් පවත්වා ඇත.

සියලුම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සාමාන්‍යාධිකාරීට ආරාධනය කෙරේ. පැමිණීම අවශ්‍යනම් පමණක් ක්‍රමෝපායික අරමුණු ක්‍රියාත්මක කිරීම, මූල්‍ය, සමාජ හා පාරිසරික කාර්යසාධනය, මෙහෙයුම් පරිසරයෙන් ඇතිකළ වෙනස්වීම් සහ අභියෝග, නිර්දේශිත ප්‍රතිපත්ති රාමු සහ විධායක පාලන ව්‍යුහ පිළිබඳ ප්‍රගතිය ඇතුළු කරුණු සම්බන්ධයෙන් විස්තර කිරීම සඳහා වෙනත් යම් විධායක නිලධාරීන් අධ්‍යක්ෂ මණ්ඩල කාමරය වෙත කැඳවනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලය ව්‍යාපාර අවස්ථාවන් සහ බැංකුව නිරාවරණය වන ප්‍රධාන අවදානම් සැලකිල්ලට ගනිමින් ආයතනික සැලැස්ම, කාර්ය සැලැස්ම සකස් කිරීම බැංකුවේ මෙහෙවර, දැක්ම, ව්‍යාපාර පරමාර්ථ සහ ක්‍රමෝපාය කලින්කල සමාලෝචන කර, තක්සේරු කර අනුමත කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කිරීමට පෙර සුදුසු බවට සලකා බලන බැවින් ක්‍රමෝපායික සැලැස්මට එවැනි සංශෝධන යෝජනා කරයි. කළමනාකාරිත්වය අනුමතකළ පරිදි ක්‍රමෝපාය ක්‍රියාත්මක කරන අතර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ප්‍රගති වාර්තා ඉදිරිපත් කරයි.

ආයතනික පාලනය (ඉතිරි කොටස)...

අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය

අධ්‍යක්ෂවරුන්ගේ නම	පත්වීමේ දිනය	විශ්‍රාම ගිය හෝ අධ්‍යක්ෂධූරය නතර වූ දිනය	අධ්‍යක්ෂවරයාගේ වර්ගීකරණය
ආචාර්ය කේ.ඩබ්.ඒ.යූ. කාරියවසම් මහතා (සභාපති)	13.01.2020		ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
එස්.කේ.ඒ. ගලප්පත්ති මහතා	02.01.2020		ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
ඒ.ජේ.පී.එච්.බී.එම්.ආර්.එස්. බණ්ඩාර මහතා	02.01.2020		ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
ඩබ්.සී.එන්. කුරේ මහත්මිය	02.01.2020		ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
එච්.සී.ඩී.එල්. සිල්වා මහතා	11.01.2020		ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ (භාණ්ඩාගාර නියෝජිත)
ආචාර්ය පී.බී.ඩබ්. මුනිගේ	23.09.2020	29.01.2020	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

2020 වසර තුළ රැස්වීම්වලට අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම මෙම වාර්ෂික වාර්තාවේ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව තුළ දැක්වේ.

සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී (ප්‍ර.වි.නි.) යනු බැංකුවේ ඉහළම ශ්‍රේණියට අනුයුක්ත පුද්ගලයාය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී පත්කරනු ලබයි. බැංකුවේ කළමනාකාරිත්ව සහ මෙහෙයුම් කටයුතු සාමාන්‍යාධිකාරී වෙත පවරා ඇති අතර ඔහු ආයතනික කළමනාකරණ කණ්ඩායම මෙන්ම බැංකුවේ කළමනාකරණ කමිටු මෙහෙයවයි.

බැංකුවේ මෙහෙයුම් හා ව්‍යාපාර කටයුතුවල එදිනෙදා කළමනාකරණය භාරව කටයුතු කරන ඉහළ විධායක නිලධාරියකු ලෙස සාමාන්‍යාධිකාරිවරයා කටයුතු කරයි. ඉහළ මට්ටමේ කළමනාකාරිත්ව තීරණ ගැනීම සඳහා බැංකුවේ සියලුම සාර්ථකත්වයන් වෙනුවෙන් ඔහු වගකීමට බැඳී සිටී. සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී බැංකුවේ කාර්යසාධනය සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තාකරන අතර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට වගකීමට බැඳී සිටී. බැංකුවේ සමස්ථ සාර්ථකත්වයට අමතරව, සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී සංවර්ධනය මෙහෙයවීම සහ කොටස්හිමි වටිනාකම වැඩි කිරීම අපේක්ෂා කරමින් දිගුකාලීන ක්‍රමෝපායන් ක්‍රියාවට නැංවීම සඳහා ද වගකිව යුතුය.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වෙනත් ආකාරයක උපදෙස් ලබාදී ඇත්නම් මිස සාමාන්‍යාධිකාරී අධ්‍යක්ෂ මණ්ඩලයේ සෑම රැස්වීමටකම පැමිණ සහභාගිවන නමුත් ඒහිදී ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ඔහුට නොමැත.

මෙය ඉතා වගකීම්සහගත තනතුරක් වන බැවින් සහ බැංකු ක්ෂේත්‍රයේ විවිධ අංශ සහ මට්ටම්වල වසර ගණනාවක පළපුරුද්ද අවශ්‍ය වන බැවින්, බැංකුවේ සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරීට බැංකුව තුළ සෑම මට්ටමකම සිදුවන මෙහෙයුම් පිළිබඳව ගැඹුරු දැනුමක් ඇත. බැංකුවේ මෙහෙයුම්වල ප්‍රධානී වීම තුළ, බැංකුවේ කළමනාකරණයේ සියලුම අංශ පාලනය සඳහා ඔහු වෙත පැවරී ඇති රාජකාරී ඔහු දැඩිව පිළිපැදිය යුතුය.

සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරීගේ බලය සහ වගකීම් ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් අනුව වෙනස් වේ.

අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු

බැංකුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලය අනුකමිටු හතරක් (4) පිහිටුවා ඇති අතර ඒවා සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කළ යුතුය. අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු සාමාන්‍යයෙන් එකිනෙකාගෙන් ස්වාධීනව කටයුතු කරන අතර, සමස්ත අධ්‍යක්ෂ මණ්ඩලයට සහයවීමේදී ඒවා වෙත ප්‍රමාණවත් බලය, සම්පත් සහ පැවරුණු වගකීම් ලබා දේ.

මෙම අනුකමිටු පහත පරිදි වේ;

- අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC)
- අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව (BHRRC)
- අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව (BNC)
- අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC).

මෙම අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවල විෂයපථයන් අනුකමිටු වාර්තාව තුළ විස්තර කර ඇති අතර, මෙම වාර්ෂික වාර්තාව තුළ සඳහන් කර ඇත. මෙම කමිටු විධායක නොවන අධ්‍යක්ෂවරුන් විසින් මෙහෙයවන අතර, අදාළ ක්ෂේත්‍රය තුළ ප්‍රවීනත්වය සහ ප්‍රවීනතාව ඔවුන් සතුය.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC) බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය, විගණන ක්‍රියාවලිය, බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධති සහ නීති සහ රෙගුලාසිවලට අනුකූලතාව සම්බන්ධ අධීක්ෂණය සිදුකරයි. මූල්‍ය ප්‍රකාශන කෙරෙහි අනාගත බලපෑම අවබෝධ කර ගැනීම සඳහා වැදගත් ගිණුම්කරණ හා වාර්තාකරණ ගැටළු සහ මෑතකාලීන වෘත්තීමය හා නියාමන ප්‍රකාශනයන් සමාලෝචනය වියින් අපේක්ෂා කරයි. වාර්තා සම්පූර්ණ සහ නිවැරදිද යන්න තක්සේරු කිරීම සඳහා කළමනාකරණය විසින් අභ්‍යන්තර අතුරු මූල්‍ය තොරතුරු සංවර්ධනය කරන ආකාරය පිළිබඳ අවබෝධයක් අවශ්‍යය.

ආයතනික පාලනය (ඉතිරි කොටස)...

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව (BHRRC) අධ්‍යක්ෂවරු, සාමාන්‍යාධිකාරී/ ප්‍ර.වි.නි., සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සඳහා ඉලක්ක සහ අරමුණු සකස් කරන අතර, කලින්කල සකස්කළ ඉලක්ක හා අරමුණු අනුව ඒවායේ කාර්යසාධනය ඇගයීමට ලක්කර, පාරිශ්‍රමිකය, ප්‍රතිලාභ සහ අනෙකුත් කාර්යසාධනය පදනම් දිරිදීමනා ගෙවීම් සමාලෝචනය සඳහා පදනම තීරණය කරයි. බැංකුව වෙනුවෙන් මානව සම්පත් සංවර්ධන ක්‍රමෝපායන් සංවර්ධනය සහ සමාලෝචනය සහ සියලුම කාර්ය මණ්ඩලයට අදාළ කරුණු ඇතුළුව සියලුම මානව සම්පත් ගැටළු පිළිබඳ අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු හා මෙහෙයුම් කමිටු සමඟ උපදේශක භූමිකාවක් පවත්වා ගැනීම අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව වෙත පැවරී ඇති බලතල අතර මූලික වගකීම් වෙති.

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව (BNC) සාමාන්‍යාධිකාරී/ ප්‍ර.වි.නි සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය තෝරාගැනීම/පත්කිරීමේ ක්‍රියාපටිපාටියක් ක්‍රියාත්මක කිරීම සහ සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි. තනතුරට සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩල තනතුරුවලට පත්කිරීම හෝ උසස් කිරීම සඳහා සලකාබැලිය යුතු යෝග්‍යතාව සඳහා අවශ්‍යකරන සුදුසුකම්, පළපුරුද්ද සහ මූලික සුදුසුකම් වැනි නිර්ණායක තීරණය කිරීම සඳහා වගකීමට බැඳී සිටී. ඒ අනුව, මෙම කමිටුව බැංකුවේ ආයතනික පාලනයේ කොටසක් ලෙස කටයුතු කරයි. ප්‍රධාන කළමණාකරන නිලධාරීන් හා අධ්‍යක්ෂවරු නැවත සේවයේ යෙදවීම සඳහා අනුප්‍රාප්තික කටයුතු හා අවශ්‍යවන අතිරේක/නව නිපුණතා කමිටුව විසින් කලින් කලට සලකා බලා අනුමත කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) සුදුසු අවදානම් දර්ශක හා කළමනාකරණ තොරතුරු තුළින් බැංකුවට ඇතිණය, වෙළෙඳපොල, ද්‍රවශීලතා, මෙහෙයුම් සහ ක්‍රමෝපායික අවදානම් යන සියලුම අවදානම් තක්සේරු කරයි. මෙම කමිටුව විශේෂ අවදානම් ආමන්ත්‍රණය කිරීමට සහ එවැනි අවදානම් කමිටුව විසින් නියමකළ පරිදි ප්‍රමාණාත්මක සහ ගුණාත්මක අවදානම් සීමාවන් තුළ කළමනාකරණය කර ගැනීම සඳහා ණය කමිටුව සහ වත්කම් - වගකීම් කමිටුව වැනි සියලුම කළමනාකාරිත්ව මට්ටමේ කමිටුවල ප්‍රමාණාත්මතාව සහ ඵලදායිත්වය සමාලෝචනය කරනු ලබයි. යම් අවදානම් බැංකුවේ ප්‍රතිපත්ති සහ නියාමන සහ අධීක්ෂණ අවශ්‍යතා මත පදනම් වී කමිටුව විසින් තිරණය කරන මට්ටම්වලින් එපිට පවතින අවස්ථාවලදි එවැනි විශේෂ අවදානම්වල බලපෑම අවම කිරීම සඳහා කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග මෙම කමිටුව විසින් ගනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC) සහ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) අභ්‍යන්තර පාලනයේ ප්‍රමාණතාව සහ විශ්වාසනීයත්වය පිළිබඳ සමාලෝචනය කර තීරණ ගැනීමට සහ මූල්‍ය තොරතුරු සහ ඒවායේ විශ්වාසනීයත්වය, ක්ෂේත්‍රයේ ප්‍රධාන අවදානම් අංග සහ බැංකුවේ සුදුසු අවදානම් සාධක සහ ආයතනික පාලනය සමාලෝචනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වේ. ආයතනික පාලන ව්‍යවහාර පරිදි මෙහෙයුම් මට්ටම දක්වා බලය බෙදීම නොමැතිව එහි අධීක්ෂණය යටතේ මෙහෙයුම්වල තීරණාත්මක ක්ෂේත්‍ර අධ්‍යක්ෂ මණ්ඩලය රඳවාගෙන ඇත.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ යහපත් අවදානම් කළමනාකරණය විසින් වඩා අඩු සාපේක්ෂ අවදානම් සහ පාර්ශ්වයන් අතර වඩා අඩු බැඳියා පිළිගැටුම් තුළ බැංකුව ක්‍රියාත්මක වන බව සඳහන් කරයි. යහපත් අවදානම් කළමනාකරණය ක්‍රියාත්මක කිරීමේ මෙවැනි වාසි බැංකුවේ කාර්යසාධනය වර්ධනය කිරීමට හේතු වී ඇත.

කළමනාකරණ කමිටු

බාසල් මාර්ගෝපදේශවලට අනුගත වෙමින්, අධ්‍යක්ෂ මණ්ඩලය විදිනෙදා කළමනාකරණයට සහභාගි නොවිය යුතු වුවත් කළමනාකරණය විනිශ්චය කිරීමට ප්‍රමාණවත් තොරතුරු ලබාගත යුතුය. බැංකුවේ කටයුතු කළමනාකරණය කිරීමේදි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී විසින් මෙහෙයවනු ලබන ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සමන්විත යම් විශේෂිත කමිටුවලට ව්‍යාපාර මෙහෙයුම් පවරා ඇත. මෙවැනි කමිටු අධ්‍යක්ෂ මණ්ඩලයට එහි පාලන කාර්යයන්හිදී සහයවීම සඳහා ස්ථාපිත කරනු ලැබ ඇත. ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය ආරක්ෂිත සහ යහපත් ආකාරයෙන් බැංකුවේ විදිනෙදා කටයුතු කරගෙන යනු ලබන බවට මඟපෙන්වීම සහ පාලනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට හැකියාව ඇති කරමින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මෙම කමිටු විසින් වාර්තා ඉදිරිපත් කළ යුතුය. මෙම සංදර්භය තුළ, අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවලට අමතරව පහත සඳහන් කළමනාකරණ කමිටු පත්කර ඇත.

- විධායක ණය කමිටුව (ECC)
- වත්කම්/වගකීම් කළමනාකරණ කමිටුව (ALCO)
- අලෙවිකරණ කමිටුව (MC)
- නිෂ්පාදන සංවර්ධන කමිටුව (PDC)
- අයකිරීම් කමිටුව (RC)
- විධායක ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (EIRMC)

අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදේශය සහ පාලනය යටතේ, ජ්‍යේෂ්ඨ කළමනාකරණය විසින් ව්‍යාපාර ක්‍රමෝපාය, අවදානම් රුචිය, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත පාරිශ්‍රමිකය සහ අනෙකුත් ප්‍රතිපත්තිවලට අනුරූප වන ආකාරයකින් බැංකුවේ කටයුතු සිදුකර පාලනය කළ යුතු අතර, ඒ අනුව ඉහත සඳහන් කළමනාකරණ කමිටුවල සාමාජිකයින්ට ඔවුන්ගේ අධීක්ෂණය යටතේ ව්‍යාපාරය සහ සේවකයින් කළමනාකරණය කර ගැනීමට අවශ්‍ය පළපුරුද්ද. දක්ෂතා සහ විශ්වාසනීයත්වය තිබිය යුතු අතර, ඔවුන්ගේ දක්ෂතා පවත්වාගැනීමට සහ වැඩි කර ගැනීමට මෙන්ම ඔවුන් වගකීමට බැඳී සිටින ක්ෂේත්‍රවලට අදාළ සංවර්ධනයන් පිළිබඳ යාවත්කාලීනකර තබාගැනීම සඳහා විධිමත් පුහුණුව වෙත ප්‍රවේශය ඔවුන්ට ලබා දේ. ශාඛා කළමනාකරුවන් ජ්‍යේෂ්ඨ කළමනාකරණය සමඟ මාසයකට වික්වරක් ප්‍රගති සමාලෝචන රැස්වීම්වල සහභාගි වෙති.

ආයතනික පාලනය (ඉතිරි කොටස)...

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } BAN/F/SMIB/CG/2020/1 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2021 දෙසැම්බර් 13

සභාපති,

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත්කර ඇති ආයතනික පාලන විධිවිධාන සපුරාලීම සඳහා අනුකූලවීමේ අවශ්‍යතා සම්බන්ධයෙන් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ සිද්ධි වාචක සෙවීම් පිලිබඳ විගණකාධිපතිගේ වාර්තාව - 2020 දෙසැම්බර් 31

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත්කර ඇති ආයතනික පාලන විධිවිධාන සඳහා අනුකූලවීමේ අවශ්‍යතා සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිළියෙලකර ඉදිරිපත්කර ඇති පාලන වාර්තාව සම්බන්ධයෙන් මෙම වාර්තාවේ ඇමුණුම 1 ට සම්බන්ධකර ඇති ක්‍රියාපටිපාටි ක්‍රියාවට නැංවීම මා විසින් සිදුකරනු ලැබ ඇත. එකඟ වූ ක්‍රියාමාර්ග සඳහා අදාලවන සම්බන්ධිත සේවා පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිති 4400 (SLSPS 4400) හි දක්වා ඇති මූලධර්මවලට අනුකූලව මෙම කටයුතු සිදුකර ඇත. ආයතනික පාලන විධිවිධානයන්ට අනුකූලවීමේ අවශ්‍යතාවය සපුරාලීම සඳහා ඔබට සහයවීම පිණිස පමණක් මෙම ක්‍රියාපටිපාටි ඉටුකර ඇත.

මාගේ සොයා ගැනීම් මෙම වාර්තාවේ 1 ඇමුණුමෙහි මා විසින් දක්වා ඇත.

ඉහත ක්‍රියාපටිපාටි ශ්‍රී ලංකා විගණන ප්‍රමිති හෝ සමාලෝචන බැඳීම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රමිතිවලට අනුකූලව සිදුකළ විගණනයක් හෝ සමාලෝචනයක් අර්ථවත් නොවන බැවින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත්කර ඇති ආයතනික පාලන විධිවිධාන සඳහා අනුකූලවීම සම්බන්ධයෙන් යම් සහතික කිරීමක් මම ප්‍රකාශ නොකරමි.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති හෝ සමාලෝචන කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රමිතිඅනුව පාලන වාර්තාවේ විගණනයක් හෝ සමාලෝචනයක් හෝ අතිරේක ක්‍රියාමාර්ග ඉටුකර තිබිනි නම් ඔබට වාර්තාකළ යුතුව තිබූ අනෙකුත් කරුණු මාගේ අවධානයට ලක්විය යුතුව තිබිනි.

මාගේ වාර්තාව මෙම වාර්තාවේ පලමුවන පරිච්ඡේදයේ විස්තරකර ඇති කාර්යයන් සඳහා සහ ඔබගේ දැනගැනීම පිණිස පමණක් වන අතර, එය

වෙනත් අරමුණු සඳහා හෝ වෙනත් කිසිම පාර්ශවයක් සඳහා ලබාදීම පිණිස නොවේ.

මෙම වාර්තාව ඉහත දක්වා ඇති අයිතමයන් සම්බන්ධයෙන් පමණක් වන අතර, සමස්ථයක් ලෙස ගත්විට රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ කිසියම් මූල්‍ය ප්‍රකාශයක් සම්බන්ධයෙන් විස්තර දැක්වීමක් නොවේ.

ඩබ්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

ආයතනික පාලනය (ඉතිරි කොටස).....

බැංකුවේ අනුකූලතා නිලධාරීන් සඳහා ප්‍රශ්නාවලියක්

සටහන: ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත්කරන ලද 2007 අංක 11 දරණ බැංකු පනත් විධිවිධානයේ 03 වන පරිච්ඡේදය සමග සමපාතවන කරුණු පහත අංකිතව දක්වා ඇත. පරිච්ඡේද අංක 01 සහ 02 මෙම ලේඛණය සඳහා අදාල නොවේ.

අනුක්‍රමික අංකය	විස්තරය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාල නොවේ	යොමුව	විගණන නිරීක්ෂණ
3.1	අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්					
3.1.i	අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ ආරක්ෂාව සහ විශිෂ්ඨත්වය ශක්තිමත් කර ඇති බව සහතික කිරීමට ගත යුතු ක්‍රියාපටිපාටි					
3.1.i.අ	බැංකුවේ ක්‍රමෝපායික පරමාර්ථ සහ ආයතනික වටිනාකම් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරීක්ෂා කිරීම	අනුකූලවිය			2020 - 2024 කාල පරිච්ඡේදය සඳහා වන ආයතනික සැලැස්ම සහ 2020සඳහා කාර්යය සැලැස්ම 2020.04.30 දින පැවති රැස්වීමේ දී අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 20/01/68 යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.	අනුකූලවිය 2020.04.30 දින පැවති රැස්වීමේ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 20/01/68 සහ 2020-2024 සඳහා වන ආයතනික සැලැස්මත් 2020 සඳහා වන කාර්ය සැලැස්මත් පරීක්ෂා කරන ලදී.
	බැංකුව විසින් බැංකුවේ ක්‍රමෝපායික පරමාර්ථ සහ ආයතනික වටිනාකම් බැංකුව තුළ සන්නිවේදනය කර තිබේද යන්න පරීක්ෂා කිරීම	අනුකූලවිය			2020 වසර තුළ ජෙෂ්ඨ කළමනාකරණ රැස්වීම් සහ ශාඛා කළමනාකරුවන්ගේ රැස්වීම්වලදී එක් එක් අංශයේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ක්‍රමෝපායික පරමාර්ථ සහ ආයතනික වටිනාකම් සන්නිවේදනය කර ඇත	අනුකූලවිය 2020 ජූලි 06 දින පැවති ශාඛා කළමණාකරුවන්ගේ රැස්වීම පරීක්ෂා කරන ලදී.
3.1.i.ආ	බැංකුවේ සමස්ත ව්‍යාපාරික ක්‍රමෝපාය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය පරීක්ෂා කිරීම	අනුකූලවිය			සමස්ත ව්‍යාපාරික ක්‍රමෝපාය (ආයතනික දැක්ම, මෙහෙවර සහ පරමාර්ථ) ආයතනික සැලැස්මේ ඇතුලත් වේ. එය 2020.04.30 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී අනුමත වී ඇත.	අනුකූලවිය 2020.04.30 දින පැවති රැස්වීමේ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 20/01/68 හි ආයතනික සැලැස්ම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය පරීක්ෂා කරන ලදී.
	සමස්ත අවදානම් ප්‍රතිපත්තිය, අවදානම් කළමනාකරණ ක්‍රියාපටිපාටි හා යාන්ත්‍රණ ඇතුළත් සමස්ත ව්‍යාපාරික ක්‍රමෝපාය සහ එය ලේඛණගත කිරීම පරීක්ෂා කිරීම	අනුකූලවිය			සමස්ත අවදානම් ප්‍රතිපත්තිය, අවදානම් කළමනාකරණ ක්‍රියාපටිපාටි හා යාන්ත්‍රණ ඇතුළත් සමස්ත ව්‍යාපාරික ක්‍රමෝපාය බැංකුව විසින් ලේඛණගත කර ඇත.	අනුකූලවිය ආයතනික සැලැස්මේ පිටු අංක 28 සිට 37 දක්වා බලන්න.

ආයතනික පාලනය (ඉතිරි කොටස)...

අනුක්‍රමික අංකය	විස්තරය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාල නොවේ	යොමුව	විගණන නිරීක්ෂණ
	සමස්ත ව්‍යාපාරික ක්‍රමෝපාය තුළ අවම වශයෙන් ඉදිරි වසර තුන සඳහා මැනිය හැකි ඉලක්ක අඩංගු බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය			2020-2024 සඳහා වන ආයතනික සැලැස්ම ඉලක්ක සමගින් ක්‍රියාකාරී සැලැස්ම මගින් ක්‍රියා ක්‍රියාත්මක කර ඇත.	අනුකූලවිය ආයතනික සැලැස්ම පිටු අංක 38 සිට 53 දක්වා බලන්න.
3.1.i.ඇ	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හඳුනාගත් අවදානම් කලමනාකරණය කිරීම සඳහා සුදුසු ක්‍රමවේදයන්හි විචක්ෂණශීලි බව මෙන්ම ඒවා නිසි පරිදි ක්‍රියාවට නංවා ඇත් දැයි පරීක්ෂා කිරීම.	අනුකූල නොවිය			අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර ඇති සමුද්දේශ්‍ය විෂයට අනුව ලබා දී ඇති බලතල පරිදි, අධ්‍යක්ෂ මණ්ඩලය පත්කරඇති, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමණාකරණ කමිටුව ක්‍රියා කරයි. බැංකුව ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව, අවදානම් තක්සේරු රාමුව සහ අවදානම් රුචිය සමාලෝචනය අනුමත කිරීම හා හඳුනාගත් ප්‍රධාන අවදානම් මාර්ග තක්සේරු කිරීමට ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව කලින් කල් රැස්වෙයි. අවදානම් අවම කිරීම සඳහා උපායමාර්ගික තීරණය ගැනීමට ප්‍රධාන අවදානම් සීමා හා තහවුරු පරීක්ෂණ ප්‍රතිඵල සහ BIRMC හි අවදානම් වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී සාකච්ඡා කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් යොමු කරනු ලබයි. ප්‍රධාන අවදානම් දර්ශක හා අවදානම් රුචිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරයි.	අනුකූල නොවිය BIRMC රැස්වීම් වාර හතරක් 2020 අගෝ. 25, 2020 සැප්. 24, 2020 ඔක්. 22 සහ 2020 දෙසැ. 11 දිනයන්හි පවත්වා ඇති අතර වත්කම් ගුණාත්මකභාවය, ද්‍රවශීල අවදානම, කළඹ අවදානම, ප්‍රාග්ධන ප්‍රමාණාත්මකභාවයේ අවදානම, ඉපයීම් හා ලාභදායිත්ව අවදානම, සහ මෙහෙයුම් අවදානම යන ක්ෂේත්‍රයන් සාකච්ඡා කරන ලදී. 2020 සඳහා බැංකුව BCPDR සිදුකර නොමැති බව අපි නිරීක්ෂණය කළෙමු. 2020 වසරේ BIRMC රැස්වීම් වල වාර්තා ලේඛනගත කිරීම දුර්වල මට්ටමක පැවති බව අපි නිරීක්ෂණය කළ අතර අනාගතයේදී එය ශක්තිමත් විය යුතු වෙයි. එයට අමතරව උපායමාර්ගික තීරයන්හි අවදානම හඳුනාගැනීමේ යාන්ත්‍රණයන් අධ්‍යක්ෂ මණ්ඩලය හඳුන්වා දිය යුතු අතර එය විධිමත් ලෙස ලේඛන ගත විය යුතු වෙයි.

ආයතනික පාලනය (ඉතිරි කොටස)...

අනුක්‍රමික අංකය	විස්තරය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාල නොවේ	යොමුව	විගණන නිරීක්ෂණ
3.1.i.අෑ	තැන්පත්කරුවන්, ණය හිමියන්, කොටස්කරුවන් හා ණය ගැනුම්කරුවන් ඇතුළු සියලුම පාර්ශ්වකරුවන් සමග සන්නිවේදන ප්‍රතිපත්තියක් අධ්‍යක්ෂ මණ්ඩලය අනුමතකර ක්‍රියාත්මක කරන්නේ දැයි පරීක්ෂා කිරීම.	අනුකූලවිය			බැංකුව සහ ගනදෙනුකරුවන් අතර ඵලදායි සන්නිවේදන ක්‍රියාවලියක් සඳහා ගනුදෙනුකාර ප්‍රඥප්තිය (පිටපතක් අමුණා ඇත) ප්‍රයෝජනයට ගනු ලබයි. එමෙන්ම, බැංකුවේ අයිතිය 100% රජය සතුවන අතර සියලුම අධ්‍යක්ෂවරු මුදල් අමාත්‍යංශය විසින් පත්කරනු ලබයි. එම නිසා රජය, කොටස්කරුවන්, තැන්පත්කරුවන්, ණය හිමියන්, හා ණය ගැනුම්කරුවන් සහ බැංකුව අතර ඵලදායි සන්නිවේදනයක් පවත්වාගෙන යනු ලබයි. කාර්තුමය මූල්‍ය ප්‍රකාශන පුවත්පත්වල ප්‍රසිද්ධ කරනු ලබයි. සන්නිවේදන ප්‍රතිපත්තිය 2015 දෙසැම්බර් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී. (අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 15/11/08 තුළ වාර්තා අංක 15.11.155.01	අනුකූලවිය ගනුදෙනුකරු ප්‍රඥප්තිය 2015 දෙසැම්බර් මස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද බව පරීක්ෂා කළා. අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 15/11/08 තුළ වාර්තා අංක 15.11.155.01.
3.1.i.ඉ	බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිය හා කලමනාකරණ තොරතුරු පද්ධතියේ ප්‍රමාණවත් බව හා විශ්වාසනීයත්වය අධ්‍යක්ෂ මණ්ඩලය සමාලෝචනය කර ඇත්දැයි පරීක්ෂා කිරීම;	අනුකූල නොවිය			අභ්‍යන්තර පාලන සහ කළමනාකරණ තොරතුරු පද්ධතියේ ප්‍රමාණාත්මකභාවය සහ විශ්වාසනීයත්වය අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සමාලෝචනය කර තිබිණි. අධ්‍යක්ෂ මණ්ඩල විගණනක කමිටුව, බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතියේ හා කලමනාකරණ තොරතුරු පද්ධතියෙන් ප්‍රමාණාත්මකභාවය හා විශ්වාසනීයත්වය සමාලෝචනය කරන අධ්‍යක්ෂක මණ්ඩලයට සහයෝගය ලබා දෙයි. අභ්‍යන්තර විගණන අංශය අබන්ඩව මෙය අධීක්ෂණය කරයි.	අනුකූල නොවිය දැනට බැංකුව ඔවුන්ගේ කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) ලෙස AS 400 යොදා ගන්නා අතර තොරතුරු හා වාර්තා ලබා ලබා ගැනීමේ දී මෙම පද්ධතිය කර්මාන්තයේ අවශ්‍යතා සඳහා පහසුකම් නොසපයයි. එම නිසා බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිය හා කළමනාකරණ තොරතුරු පද්ධතිය ප්‍රමාණාත්මකභාවය හා විශ්වාසනීයත්වය සඳහා විධිමත් වූ බැංකුකරන පද්ධතිය බැංකුව හඳුන්වා දෙයි.

ආයතනික පාලනය (ඉතිරි කොටස)...

අනුක්‍රමික අංකය	විස්තරය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාල නොවේ	යොමුව	විගණන නිරීක්ෂණ
3.1.i.ඊ	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල දක්වා ඇති පරිදි (i) ප්‍රතිපත්ති කෙරෙහි දැඩිව වගකියන (ii) සෘජු ක්‍රියාකාරකම් හා (iii) ව්‍යාපාරික කටයුතු මෙහෙයුම් හා අවදානම් කළමනාකරණය වැනි තනතුරුවලට අදාළ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හඳුනාගෙන පත්කර ඇත්දැයි පරීක්ෂා කිරීම.	අනුකූලවිය			සාමාන්‍යාධිකාරිවරයාද ඇතුළත්ව විධායක කටයුතු සිදුකරන නිලධාරීන් හා අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් ලෙස නිර්වචනය කරයි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS 24) ප්‍රමිතීන් නාම යෝජනා කමිටුව (BNC) විසින් නිර්දේශ කර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත.	අනුකූලවිය අධ්‍යක්ෂ මණ්ඩලය සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා බැංකුව LKAS 24 යොදාගෙන ඇත.
3.1.i.උ	අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රතිපත්තියට අනුව ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් මගින් බැංකුවේ කටයුතුවල සුදුසු පාලනය අධ්‍යක්ෂ මණ්ඩලය භාවිතාකර ඇත්දැයි පරීක්ෂා කිරීම.	අනුකූලවිය			බැංකුව උපායමාර්ගික ව්‍යාපාර සැලැස්මට අනුව බැංකුවේ කාර්යසාධනය සමාලෝචනයට ලක් කරන අතර අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු වලට පවරා ඇති මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලනය, අවදානම් කළමනාකරණය සහ වෙනත් අදාළ කරුණු පිළිබඳව වාර්තා ලබාගනී. ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් ඔවුන්ගේ විෂය පථය යටතේ ඇති කරුණු පිළිබඳව වාර්තා නිතරම ලබා දෙයි.	අනුකූලවිය 2020 වසරේ විගණන කමිටු වාර්තා සහ රැස්වීම් වාර්තා පරීක්ෂා කරන ලදී. 2020 වසරේ BIRMC වාර්තා පරීක්ෂා කරන ලදී.
3.1.i.ඌ	ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් හා අධ්‍යක්ෂවරුන්හට ඔවුන්ගේ ප්‍රධාන වගකීම් හා අධිකාරිත්වයේ ප්‍රමාණය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිර්වචනය කර ඇති බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය			අධ්‍යක්ෂවරුන්ගේ බලතල හා අධිකාරිත්වය 1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ පරිච්ඡේද අංක 07 යටතේ නිර්වචනය කර ඇත. එක් එක් අධ්‍යක්ෂවරු අනු කමිටුවක් හෝ කිහිපයක් සඳහා පත්කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂවරු අනු කමිටු සඳහා වෙන්කර ඇති අතර, සෑම කමිටු ප්‍රඥප්තියකම වගකීම් පිලිබඳ නිර්වචනයන් සිදුකර ඇත. ප්‍රධාන කළමනාකරණ නිලධාරියාගේ බලතල හා වගකීම් රැකියා විස්තරයෙහි ලැයිස්තුගත කර ඇත. අධ්‍යක්ෂවරුන්ට හා ප්‍රධාන කළමණාකරන නිලධාරීන් සඳහා අධිකාරිත්වයේ හා වගකීමේ ප්‍රමාණය BHRCC හි විස්තර කර ඇත.	අනුකූලවිය අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු ප්‍රඥප්තිය හා BIRMC, BHRCC සහ BNC සමුද්දේශ්‍ය විෂය පරීක්ෂා කරන ලදී.

ආයතනික පාලනය (ඉතිරි කොටස)...

අනුක්‍රමික අංකය	විස්තරය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාල නොවේ	යොමුව	විගණන නිරීක්ෂණ
3.1.i.ඒ	(i) අධ්‍යක්ෂවරු හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් තේරීම, නම් කිරීම හා පත්කිරීම, (ii) බැඳියා පිළිගැටුම් කළමනාකරණය සහ (iii) දුර්වලතාවයන් හඳුනාගැනීම සහ අවශ්‍ය පරිදි වෙනස්කම් සිදුකිරීම පිලිබඳ කරුණු ඇතුලත්වන අධ්‍යක්ෂවරුන්ගේ පාලන පරිචයන්හි ඇති සථලතාවය කලින් කලට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තක්සේරු කර ඇති බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය			අධ්‍යක්ෂ මණ්ඩලය තේරීම නම්කිරීම හා පත්කිරීම 1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියට අනුව අමාත්‍යවරයා විසින් සිදුකරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය විහි පාලන පරිචයක් පිලිබඳව වාර්ෂික ඇගයීමක් සිදුකර ඇති බවට අධ්‍යක්ෂවරු ඔවුන්ගේ ස්වයං ඇගයීම් පත්‍රිකාවල තහවුරු කර තිබේ. අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීම විගණනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණයක් ගෙන ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ ඵලදායිත්වය ප්‍රශ්නාවලියක් තුළින් තක්සේරු කෙරේ.	අනුකූලවිය අධ්‍යක්ෂ මණ්ඩලයේ තේරීම් නම් කිරීම සහ පත්කිරීම 1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියට අනුව අමාත්‍යවරයා විසින් සිදුකරනු ලබයි. 2020 වසරේ අධ්‍යක්ෂ මණ්ඩල ස්වයං ඇගයීම් පත්‍රිකා නිරීක්ෂණය කරන ලදී.
3.1.i.බී	ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් පත්කිරීම සඳහා අනුප්‍රාප්තික සැලස්මක් ඇති බව පරීක්ෂාකිරීම	අනුකූලවිය			2017 වසර සඳහා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා අනුප්‍රාප්තික සැලස්මක් පවතී. 2017/04/28 දින පැවැත්වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා අංක 17.04.52.04 (අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 17.04.21) තොරතුරු පද්ධතිය (SOR) සහ සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය පියවර ගෙන ඇත.	අනුකූලවිය 2017 වසරේ ප්‍රධාන කළමණාකරන පුද්ගලයින් සඳහා අනුප්‍රාප්තික සැලැස්ම පරීක්ෂා කළ අතර 2017.04.28 රැස්වීමේ දී අධ්‍යක්ෂ මණ්ඩලය එය අනුමත කර ඇත. (අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 17.04.21)
3.1.i.සී	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉහළ කළමනාකරණ නිලධාරීන් සමග ප්‍රතිපත්ති සමාලෝචනය කිරීමේ සන්නිවේදන ක්‍රම ඇති කිරීමේ සහ ආයතනික අරමුණුවල ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා නියමිත පරිදි රැස්වීම් වාර පැවැත්වීමට නියම කර ඇති බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය			සෑම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමිකටම සාමාන්‍යාධිකාරීවරයාගේ පැමිණීම මගින් අධ්‍යක්ෂ මණ්ඩලය සන්නිවේදන මාර්ග ඇතිකිරීමත් ආයතනික අරමුණුකරා ළඟාවී මේ ප්‍රගතිය අධීක්ෂණය කිරීමත් සිදුකරයි. ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් ඔවුන්ගේ විෂය පථය යටතේ ඇති කරුණු නිතර ඉදිරිපත් කිරීමත් සිදුකරයි. තවද, කලමනාකරණය, ආයතනික අරමුණු ලඟා කර ගැනීම සඳහා කටයුතු කරන බව තහවුරු කිරීම වෙනුවෙන් සෑම මසකම කලමනාකරණ කමිටු රැස්වීම් හා පෙෂ්ඨ කලමනාකරණ කමිටු රැස්වීම් පවත්වන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දැනුම් දී ඇත.	අනුකූලවිය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා පරීක්ෂාකර 2020 වසරේ සාමාන්‍යාධිකාරීවරයාගේ සහභාගිත්වය තහවුරු කරන ලදී.

ආයතනික පාලනය (ඉතිරි කොටස)...

අනුක්‍රමික අංකය	විස්තරය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාල නොවේ	යොමුව	විගණන නිරීක්ෂණ
3.1.i.ඕ	නියාමන පරිසරය අවබෝධකර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රියාමාර්ග සමඟ ක්‍රියාවලි ගෙන තිබේද යන්න සහ බැංකුව නියාමකයින් සමග සම්බන්ධතාවයක් පවත්වාගෙන යන්නේද යන්න පරීක්ෂා කිරීම.	අනුකූල නොවිය			අනුකූලතා නිලධාරියා මගින් නියාමකයින් සමග බැංකුව හොඳ සම්බන්ධතාවයක් පවත්වාගෙන යයි. ඇය නිතරම නියාමකයින් සමඟ සම්බන්ධතාවයක් පවත්වා ගෙන යයි. සියලුම නියාමන අවශ්‍යතාවයන් වලදී අධ්‍යක්ෂ මණ්ඩලය හා ප්‍රධාන කළමණාකරනයේ නිලධාරීන් ඇය නිතරම ඇගයීමට ලක් කරයි. නියාමන පරිසරයේ සිදුවන සියලුම වෙනස්වීම් අදාල නියාමකයා විසින් සන්නිවේදනය කළ විගසම දැනුම්දෙයි අනුකූලතාවය නිලධාරියා හා අවදානම් ප්‍රධානී අනුකූලතා අවශ්‍යතාවයන්ගේ තත්වය කලින් කලට තවදුරටත් වාර්තා කරයි.	අනුකූල නොවීය නියාමකයින් සමග සම්බන්ධතාවයක් පවත්වා ගැනීමට හා මෙහෙයුම් සුමට කිරීමට බැංකුව සතුව වෙනමම අනුකූලතා අංශයක් පවතී. කෙසේ හෝ අදාළ නියාමකයින් සමඟ නියමිත දිනට අදාළ වාර්තාකරණය සිදුකිරීම මගින් නියාමකයින් සමග ඇති සම්බන්ධතාවය ශක්තිමත් කිරීම බැංකුව සිදු කරයි. පසුගිය වාර්ෂික වාර්තාව.
3.1.i.ක	බාහිර විගණකවරුන්ගේ සේවය ලබාගැනීමට මෙන්ම ඔවුන් අධීක්ෂණ තත්ත්වයේ තබා ගැනීම සඳහා ක්‍රියා පිලිවෙතක් අධ්‍යක්ෂ මණ්ඩලයට ඇති බව පරීක්ෂා කිරීම.			අදාල නොවේ	1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ සඳහන් ප්‍රතිපාදන අනුව හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන වගන්තියේ ප්‍රතිපාදන අනුව විගණකාධිපතිවරයා පත්කර ඇති අතර එම ප්‍රතිපාදන අනුව විගණකාධිපතිවරයා බැංකුවේ බාහිර විගණකවරයා වෙයි.	අදාල නොවේ 1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතයේ ප්‍රතිපාදන අනුව විගණකාධිපතිවරයා පත්කර ඇත.
3.1.ii	සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරිවරයා (ප්‍ර.වි.නි.) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කර ඇති බව පරීක්ෂා කිරීම. සභාපතිවරයාගේ සහ (ප්‍ර.වි.නි.)ගේ කාර්යභාරය සහ වගකීම් මෙම නියෝගයන්හි 3 (5) නියෝගයට අනුකූලව ඇත්දැයි පරීක්ෂා කිරීම.	අනුකූලවිය			1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ පරිච්ඡේද අංක 14.1 අනුව, සභාපතිවරයා අදාළ රේඛීය අමාත්‍යංශය විසින් පත්කරනු ලැබ ඇත. සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරිවරයා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කර ඇත. සභාපතිවරයාගේ හා ප්‍ර.වි.නි.ගේ කාර්යන් සහ වගකීම් ඉහත සඳහන් විධිවිධාන අනුව සිදුවෙයි.	අනුකූලවිය 1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ පරිච්ඡේද අංක 14(1) බලන්න.

ආයතනික පාලනය (ඉතිරි කොටස)...

අනුක්‍රමික අංකය	විස්තරය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාල නොවේ	යොමුව	විගණන නිරීක්ෂණ
3.1.iii	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් නිසි පරිදි පවත්වා තිබේද යන්න හා මසකට වක් වතාවක් බැගින් වසරකට අවම වශයෙන් දොලොස් වතාවක් රැස්වීම් පවත්වා තිබේදැයි පරීක්ෂා කිරීම	අනුකූල නොවිය			දැනට සිටින අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් 2020 ජනවාරි, පෙබරවාරි මාසයන්හි දී පත්කර ඇත. 2020 වර්ෂය තුල දී අධ්‍යක්ෂ මණ්ඩලය ආසන්න වශයෙන් මසකට වක්වරක් පමණ 11 වරක් රැස්වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩල වාර්ථා ලේඛන සහ අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීමේ ලේඛන තිබේ.	අදාල නොවේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 2020 අප්‍රියෙල් මාසයේ සිට ආරම්භවී ඇති අතර 2020 වසර තුලදී වකොලොස් වතාවක් රැස්වී ඇත.
3.1.iv	විධිමත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල න්‍යාය පත්‍රයට කරුණු හා යෝජනා ඇතුලත් කිරීමට සියළුම අධ්‍යක්ෂවරුන්ට හැකිවන පරිදි සැකසූ වැඩ පිලිවෙලක් අධ්‍යක්ෂ මණ්ඩලය සතුව ඇති බව පරීක්ෂා කිරීම සහ මෙහිදී වීම කරුණු හා යෝජනා ව්‍යාපාරයේ ප්‍රවර්ධනය සහ බැංකුවේ අවදානම් කළමනාකරණයට අදාළ වීම	අනුකූලවිය			අධ්‍යයනය කිරීමට හා අවශ්‍ය යෝජනා ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් කාලයක් ලැබෙන පරිදි රැස්වීම් පැවත්වීමේ නිවේදනය හා න්‍යාය පත්‍රය සියළුම අධ්‍යක්ෂවරුන් වෙත රැස්වීම් පැවැත්වීමට අවම වශයෙන් දින 07 ට පෙර ලැබීමට සලස්වයි. ඒ අනුව බැංකුවේ ව්‍යාපාර ප්‍රවර්ධනයට හා අවදානම් කලමනාකරණය කිරීමට සම්බන්ධ කරුණු හා යෝජනා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාකච්ඡා කරනු ලබයි.	අනුකූල විය. රැස්වීම් පැවැත්වීමට අවම වශයෙන් දින 7 ට පෙර රැස්වීම් පැවැත්වීමේ නිවේදනය හා න්‍යාය පත්‍රය සියලුම අධ්‍යක්ෂවරුන් වෙත අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් විද්‍යුත් තැපෑලෙන් යවන බව නිරීක්ෂණය විය.
3.1.v	සියලුම අධ්‍යක්ෂවරුන්ට රැස්වීම්වලට සහභාගීවීම සඳහා අවස්ථාව ලබා දීම පිණිස අවම වශයෙන් දින 07 ට පෙර දැනුම් දීම සිදුකරන බව පරීක්ෂා කර ඇත. සියලු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහාත් දැනුම් දීම සිදුකර ඇත	අනුකූලවිය			අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් අත්සන් තබා අනුමත කර පිලියෙල කරන ලද න්‍යාය පත්‍රය රැස්වීම් පැවැත්වීමට දින 07 ට ප්‍රථම සෑම අධ්‍යක්ෂවරයකු වෙතම තැපැල් මගින් හෝ රැගෙන ගොස් බාර දීම සිදුකරයි	අනුකූලවිය. රැස්වීම් පැවැත්වීමට අවම වශයෙන් දින 7 ට පෙර රැස්වීම් පැවැත්වීමේ නිවේදනය හා න්‍යාය පත්‍රය සියලුම අධ්‍යක්ෂවරුන් වෙත අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් විද්‍යුත් තැපෑලෙන් යවන බව නිරීක්ෂණය විය.
3.1.vi	මාස 12 ක් ඇතුළත පැවැත්වූ රැස්වීම් වාර වලින් 2/3 කට සහභාගී නොවූ හා නොකඩවා රැස්වීම් වාර 03 ක් සඳහා සහභාගී නොවූ අධ්‍යක්ෂවරුන් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය අවශ්‍ය පියවර ගෙන ඇති බව පරීක්ෂා කරන ලදී. අධ්‍යක්ෂවරයෙකු වෙනුවට නම් කරන ලද විකල්ප අධ්‍යක්ෂවරයෙකු රැස්වීම් වලට සහභාගි කරවීම රැස්වීම් වලට සහභාගී වුවාසේ පිළිගනු ඇත.	අනුකූලවිය			අවශ්‍ය පරිදි අධ්‍යක්ෂවරු රැස්වීම් වලට සහභාගී වී ඇති නිසා එවැනි පියවර ගැනීමක් අවශ්‍ය නොවීය.	අනුකූලවිය. 2020 සඳහා අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම පරීක්ෂාකරන ලදී.

ආයතනික පාලනය (ඉතිරි කොටස)...

අනුක්‍රමික අංකය	විස්තරය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාල නොවේ	යොමුව	විගණන නිරීක්ෂණ
3.1.vii	1988 අංක 30 දරණ බැංකු පනතේ 43 වගන්තියේ විධිවිධානවලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගම් ලේකම් කෙනෙකු පත්කර ඇති බව පරීක්ෂා කරන ලද අතර, එම අයගේ මූලික වගකීම වන්නේ අධ්‍යක්ෂ මණ්ඩල හා කොටස් කරුවන්ගේ රැස්වීම්වල ලේකම්ගේ කාර්යභාරය ඉටු කිරීමත් අඥාපනතේ හා අනෙකුත් නීතිරීතිවලට අනුව ඇති කටයුතු ඉටු කිරීමත්ය.	අනුකූලවිය			1988 අංක 30 දරණ බැංකු පනතේ 43 වන පරිච්ඡේදය ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයකු පත්කර ඇත. වෙනම අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් කාර්යාලයක් ආරම්භ කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය තවදුරටත් තීරණය කර ඇත.	අනුකූලවිය 2007 අංක 07 දරණ සමාගම් ආඥාපනත සහ 1988 අංක 30 දරණ බැංකු පනතේ 43 වගන්තියට අනුව සුදුසුකම් සපුරාලන අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් නීතිඥවරයෙකි. අපි ඇයගේ සහතික පත් නිරීක්ෂණය කලෙමු.
3.1.viii	සියලුම අධ්‍යක්ෂවරුන්ට සමාගම් ලේකම්ගේ උපදෙස් හා සේවය ලබා ගැනීමට ඇති ක්‍රියාවලිය පරීක්ෂා කිරීම.	අනුකූලවිය			සියලුම අධ්‍යක්ෂවරුන්ට සමාගම් ලේකම්ගේ උපදෙස් සහ සේවාවන් ලබා ගැනීමට හැකිවී ඇත	අනුකූලවිය අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් සිදුකර ඇති ප්‍රකාශයට අනුව සියලුම අධ්‍යක්ෂකවරුන්හට අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගේ උපදෙස් සහ සේවාව ලබාගැනීමට හැකි වේ.
3.1.ix	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා තබා ගැනීම සමාගම් ලේකම් විසින් සිදු කරන අතර, සියලුම අධ්‍යක්ෂවරුන්ට එවැනි වාර්තා පිරික්සීමට ක්‍රියාවලියක් තිබේද යන්න පරීක්ෂා කරන ලදී.	අනුකූලවිය			සියළුම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා පිලිවෙලින් ගොනු කර අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගේ භාරයේ තබාගනී. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පිලිබඳ ඕනෑම තොරතුරක් ඕනෑම අවස්ථාවක ලබාගැනීමට ඕනෑම අධ්‍යක්ෂවරයකුට අවස්ථාව ඇත.	අනුකූලවිය සියලුම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා පිලිවෙලින් ගොනුකර අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ තබා ගනී. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගේ ප්‍රකාශයට අනුව ඕනෑම අවස්ථාවක රැස්වීම් පිළිබඳ තොරතුරු ඕනෑම අධ්‍යක්ෂවරයකුට ලබාගත හැකි වෙයි.

ආයතනික පාලනය (ඉතිරි කොටස)...

අනුක්‍රමික අංකය	විස්තරය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාල නොවේ	යොමුව	විගණන නිරීක්ෂණ
3.1.x	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාවල පහත සඳහන් කරුණු අඩංගු වී තිබේද යන්න පරීක්ෂා කිරීම: (අ) අධ්‍යක්ෂ මණ්ඩල සාකච්ඡා වලදී අධ්‍යක්ෂ මණ්ඩලය භාවිතා කල දත්ත හා තොරතුරු සාරාංශයක් (ආ)අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සැලකිල්ලට භාජනය කල කරුණු (ඇ)කරුණු හෙලිදරව් කර ගැනීමේ සාකච්ඡා සහ මතබේදයට තුඩු දුන් කරුණු, අධ්‍යක්ෂ මණ්ඩලය දැඩි සැලකිල්ලකින් හා විචක්ෂණශීලීව ඔවුන්ගේ රාජකාරී ඉටු කරමින් සිටියේද යන වග නිරූපණය කරයි. (ඈ)අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රමෝපායන් සහ ප්‍රතිපත්ති හා අදාළ නීති හා රෙගුලාසි පිලිපැදීම පිළිබඳ අනුකූලතාවය දක්වන කරුණු (ඉ) බැංකුව මුහුණදෙන අවදානම් අවබෝධ කර ගැනීම හා යොදාගත් අවදානම් කලමනාකරණ ක්‍රියාමාර්ගවල දළ විශ්ලේෂණයක් සහ (ඊ) තීරණ හා අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා	අනුකූලවිය			ඉහත සඳහන් සියලු කරුණුවලට අදාළව ප්‍රමාණවත් විස්තර අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාවල අඩංගුවී ඇත. පොදුවේ, අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවන් හි පහත සඳහන් දෑ අඩංගු වේ i. පෙර රැස්වීම්වල ස්ථිර කරන ලද වාර්තා ii. පෙර රැස්වීම්වල වාර්තාවලින් මතු වූ කරුණු iii. පෙර රැස්වීම් වාර්තාවලින් කල් තැබූ කරුණු iv. අයකර ගැනීම් පිලිබඳ කරුණු v. මූල්‍ය කරුණු vi. අලෙවිකරණ සහ ප්‍රකාශනය කරන ලද කරුණු vii. පරිපාලන සහ පුද්ගල කරුණු viii. ණය කරුණු ix. අවදානම් කරුණු x. නෛතික කරුණු සහ xi. වෙනත් කරුණ	අනුකූලවිය අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා පරීක්ෂා කළ අතර අවශ්‍ය සියලුම විස්තර ඇතුලත් ව ඇති බව තහවුරු විය.
3.1.xi	සාධාරණ ඉල්ලීමකින් පසුව සුදුසු අවස්ථාවන්හි දී ස්වාධීන වෘත්තිය උපදෙස් බැංකුවේ වියදමින් ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂවරුන්ට හැකිවීම පිණිස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එකඟවූ ක්‍රියා පිලිවෙත් ඇති බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය			තීරණ ගැනීමේ දී හා රාජකාරී කටයුතු කරගෙන යාමේ දී අවශ්‍ය වූ විටක ස්වාධීන වෘත්තීය උපදෙස් බැංකුවේ වියදමින් අධ්‍යක්ෂවරුන්ට ලබාගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. බැංකුව මේ සඳහා රජයේ අනුමත ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කරයි.	අනුකූලවිය බැංකුව විසින් අමසේකර සමාගම හා EY සමග අත්සන් කළ උපදේශන ලිපි දෙකම නිරීක්ෂණය කළෙමු

ආයතනික පාලනය (ඉතිරි කොටස)...

අනුක්‍රමික අංකය	විස්තරය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාල නොවේ	යොමුව	විගණන නිරීක්ෂණ
3.1.xii	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ බැඳියා පිලිගැටුම් නොමැතිවීම හෝ පැවතීම වැලැක්වීම සඳහා අවශ්‍ය ක්‍රියාපාටි පැවතීම, ඒ පිළිබඳ වාර්තා කිරීම හා ඒවා නිරවුල් කිරීම සහ එවැනි තත්ත්වයන් වලක්වාලීමට සුදුසු ක්‍රියාමාර්ග පැවතීම පරීක්ෂා කිරීම.	අනුකූලවිය			සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත. (අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 16/08/35) 2016.08.26 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා අංක 16.08.95.02	අනුකූලවිය 1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ පරිච්ඡේද අංක 28 අනුව සම්බන්ධිත පාර්ශ්වකාර ගනුදෙනු ප්‍රතිපත්තිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමතකර ඇත. 2016.08.16 දින පැවැත් වූ රැස්වීමේ වාර්තා අංක 16/08/35
	අධ්‍යක්ෂවරයකු ඔහු/ඇය හෝ ඔහුගේ /ඇයගේ ඥාති සම්බන්ධතාවයක් ඇති අයෙකු හෝ අධ්‍යක්ෂවරයාගේ සැලකිය යුතු උනන්දුවක් ඇති කිසියම් අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් සම්බන්ධයෙන් ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැලකී සිටීම පරීක්ෂා කිරීම.	අනුකූලවිය			එවැනි කිසිදු අවස්ථාවක් 2020 වසර තුළ සිදු නොවීය.	අනුකූලවිය 2020 වසර තුලදී එවැනි සිදුවීමක් දක්නට නොතිබිණි.
	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් න්‍යාය පත්‍රයේ අදාළ වන කරුණක් සඳහා ගණපූරණය සම්බන්ධයෙන් ඔහු/ඇය ගණන් ගෙන ඇති බව පරීක්ෂා කිරීම			අදාල නොවේ.	එවැනි කරුණක් 2020 වසර තුළ පැන නැගී නොමැති බැවින් මෙම කොටස අදාල නොවේ.	අදාල නොවේ.
3.1.xiii.	නියෝග හඳුනාගැනීම සහ බැංකුවේ පාලනය සම්පූර්ණයෙන්ම අධ්‍යක්ෂ මණ්ඩල අධිකාරිත්වයේ පවතින බව තීරණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසටම ආවේනික වූ විධිමත් සැලස්මක් ඇති බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය			කරුණු පිළිබඳ විධිමත් උපලේඛනයක් අධ්‍යක්ෂ මණ්ඩලය සතුවන අතර, බැංකුවේ විධිවිධානයන් හා පාලනය එහි බලය යටතේ දැඩිව පවතින බව හඳුනාගැනීම තීරණය කිරීම සඳහා වෙන්වූ කරුණු පිළිබඳ විධිමත් උපලේඛනයක් අධ්‍යක්ෂ මණ්ඩලය පවත්වා ගනී. 16.10.122.02 වාර්තාව තුළ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 16/10/40 නිරීක්ෂණය කරන ලදී.	අනුකූලවිය 2016 ඔක්තෝම්බර් 24 දිනැති වාර්තා අංක 16.10.122.02 සහ පත්‍රිකා අංක 16.10.40 නිරීක්ෂණය කරන ලදී
3.1.xiv	බැංකුවට සිය වගකීම් ඉටුකල නොහැකි හෝ නොහැකිවීමේ තත්ත්වයට පත්විය හැකි බව හෝ බුන්වත් තත්ත්වයට පත්වීමට ආසන්න බව හෝ තැන්පත්කරුවන්ගේ හා අනෙකුත් ණය හිමියන්ගේ ගෙවීම් අත්හිටුවීමට ආසන්න බව අධ්‍යක්ෂ මණ්ඩලයට හැඟි යන්නේ නම් බැංකුවේ තත්ත්වය පිළිබඳව යම්කිසි තීරණයක් හෝ පියවරක් ගැනීමට ප්‍රථම බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ වෙත වහාම දැනුම් දීම සිදුකල යුතු බව පරීක්ෂා කිරීම		අදාල නොවේ.		එවැනි අවස්ථාවක් පැන නැගී නැත.	අදාල නොවේ.

ආයතනික පාලනය (ඉතිරි කොටස)...

අනුක්‍රමික අංකය	විස්තරය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාල නොවේ	යොමුව	විගණන නිරීක්ෂණ
3.1.xv	මුදල් මණ්ඩලයේ අවශ්‍යතාවය පරිදි බැංකුවේ ප්‍රාග්ධන මට්ටම පවත්වා ගැනීම අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කර ඇති බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය			(ශ්‍රී ලංකා මහ බැංකුවේ 2016.07.12 දින දරණ ලිපිය අනුව) බැංකුව 2018.01.01.දිනට අවම නියාමන අවශ්‍යතාවය වන රු. බිලියන 5 ක් සම්පාදනය කර තිබිණි. 2017.ඔක්. 26 දිනැති 2017 අංක 5 දරණ විධිවිදානය අනුව 2020.12.31 දින සිට බලපැවැත්වෙන පරිදි මෙය රු. බිලියන 7.5 දක්වා තවදුරටත් වැඩිකර තිබූ අතර ඉන් පසුව 2020 මාර්තු 20 දිනැති මහ බැංකු අධිපතිවරයාගේ ලිපිය අනුව 2022.12.31 දින දක්වා මෙය දීර්ඝ කර ඇත. ඒ අනුව මීළඟ අවුරුදු 02 තුලදී 1975) අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ ප්‍රතිපාදන අනුව ව්‍යාපාරික කටයුතු ව්‍යාප්ත කිරීම හරහා බැංකුව අභ්‍යන්තරව ජනනය කරනලද අරමුදල් වන රු. බිලියන 7.5 ට අනුගතවීමට අපේක්ෂා කරයි. (සටහන් අංක 38.5.1)	අනුකූලවිය මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 38.5.1 බලන්න.
3.1.xvi	මෙම විධිවිධානයන්ගේ 03 වන විධිවිදානයට අනුකූල බව ප්‍රකාශ වන වාර්ෂික ආයතනික පාලන වාර්තාව බැංකුවේ වාර්ෂික වාර්තාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රසිද්ධ කර ඇති බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය			මෙම විධිවිදානයන්ගේ 03 වන විධිවිදානයට අනුකූල බව දැක්වෙන වර්ෂික ආයතනික පාලන වාර්තාව වාර්ෂික වාර්තාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පළකරනු ලබයි.	අනුකූලවිය
3.1.xvii	සෑම අධ්‍යක්ෂවරයකු විසින්ම වාර්ෂිකව ස්වයං තක්සේරුවක් සිදුකල යුතු බවට වැඩ පිළිවෙලක් අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රියාත්මකකර ඇති අතර එවැනි තක්සේරු පිළිබඳව වාර්තා පවතවාගෙන යෑම සිදු කිරීම කලයුතු බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය			අධ්‍යක්ෂවරුන්ගේ ස්වයං තක්සේරු/ඇගයීම් ක්‍රියාවලිය 2020 වසර සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදුකර ඇත	අනුකූලවිය 2020 වසර සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්වයං ඇගයීමේ වාර්තා නිරීක්ෂණය කරන ලදී

ආයතනික පාලනය (ඉතිරි කොටස)...

අනුක්‍රමික අංකය	විස්තරය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාල නොවේ	යොමුව	විගණන නිරීක්ෂණ
3.2 අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය						
3.2.i	අධ්‍යක්ෂ මණ්ඩලයේ 07 දෙනෙකුට නොඅඩු සහ 13 දෙනෙකුට නොවැඩි අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවක් අඩංගු විය යුතු බව පරීක්ෂා කිරීම.	අනුකූල නොවිය			අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන යෝග්‍ය පුද්ගලයින් පස් දෙනෙකුගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වේ.	අනුකූල නොවිය 2020 දෙසැම්බර් 31 දිනට අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරුන් පස් දෙනෙකුගෙන් සමන්විත වේ
3.2.ii.අ	ප්‍රධාන විධායක නිලධාරියාගේ තනතුර හොබවන අධ්‍යක්ෂවරයා හැර අනෙකුත් අධ්‍යක්ෂවරයකුගේ මුළු සේවා කාලය අවුරුදු 9 නොඉක්මවන බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය			අධ්‍යක්ෂවරයකු ලෙස කිසිම අධ්‍යක්ෂවරයෙකු වසර 09 ට වැඩි සේවා කාලයක් ගතකර නොමැත.	අනුකූලවිය සේවා කාලය වසර 09 ට වඩා වැඩි වූ අධ්‍යක්ෂවරයකු නොමැති බව නිරීක්ෂණය කරන ලදී.
3.2.ii..ආ	කිසියම් අධ්‍යක්ෂවරයකු අවුරුදු 9 ට වඩා කාලයක් සේවයේ යෙදෙනවිට සංක්‍රාන්තික ප්‍රතිපාදන අනුගමනය කර ඇත්දැයි පරීක්ෂා කිරීම.		අදාල නොවේ.		අධ්‍යක්ෂවරයකු ලෙස කිසිම අධ්‍යක්ෂවරයෙකු වසර 09 ට වැඩි සේවා කාලයක් ගතකර නොමැත.	අදාල නොවේ.
3.2.iii.	ප්‍රධාන විධායක නිලධාරියා ද ඇතුළුව විධායක අධ්‍යක්ෂවරුන්ගේ සංඛ්‍යාව අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් තුනෙන් එකකට වැඩි නොවන බව පරීක්ෂා කිරීම.		අදාල නොවේ.		1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ විධිවිධානවලට අනුව රේඛීය අමාත්‍යාංශය විසින් පත්කරනු ලබන අධ්‍යක්ෂවරුන් 09 දෙනෙකුගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වන අතර ඔවුන් සියල්ලන්ම විධායක නොවන අධ්‍යක්ෂවරු වේ.	අදාල නොවේ.
3.2.iv	අධ්‍යක්ෂ මණ්ඩලයට අවම වශයෙන් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු හෝ මුළු අධ්‍යක්ෂ මණ්ඩල සංඛ්‍යාවෙන් තුනෙන් එකකට සමාන ගණනින් වැඩි අගයට ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවක් සිටිය යුතු බව පරීක්ෂා කිරීම. විධායක නොවන අධ්‍යක්ෂවරු ස්වාධීන ලෙස සැලකිය හැකි නම් ඔහු හෝ ඇය:	අනුකූලවිය			සියලුම අධ්‍යක්ෂවරු අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන අතර සියලුම අය ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු වෙති.	අනුකූලවිය 1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතිය අනුව සියලුම අධ්‍යක්ෂවරුන් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අතර සියල්ලන්ම ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු වෙති.
3.2.iv.අ	බැංකුවේ සෘජු හා වක්‍ර කොටස් හිමිකාරිත්වයෙන් 1% ට වැඩි ප්‍රමාණයක් දැරීම;		අදාල නොවේ.		බැංකුව සම්පූර්ණයෙන්ම රජය සතුවන බැවින් එවැනි අවස්ථාවක් උදා නොවේ.	අදාල නොවේ.
3.2.iv.ආ	අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්වීමට පූර්වාසන්නයෙන් වසර දෙකක් ඇතුලත ඔහු/ඇය මෙහි විධිවිධාන අංක 3(7) යටතේ විස්තර වන බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් 10% ඉක්මවා යන ප්‍රමාණයක බැංකුව සමග කිසියම් ව්‍යාපාරික ගනුදෙනුවක් සිදුකර ඇති විට		අදාල නොවේ.		2020 මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් අංක 32 අනුව එවැනි ගණුදෙනුවක් සිදු වී නොමැත. එවැනි ගණුදෙනුවක් හෙලිදරව් හෝ හඳුනාගෙන ද නොමැත.	අදාල නොවේ.
3.2.iv. ඇ	අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්වීමට පූර්වාසන්නයෙන් වසර දෙකක් තුළදී බැංකුව විසින් එහි සේවයේ යොදවා ඇති විට		අදාල නොවේ.		බැංකුව මගින් සේවයේ යොදවා ඇති එවැනි කිසිම විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු නොමැත	අදාල නොවේ.

ආයතනික පාලනය (ඉතිරි කොටස)...

අනුක්‍රමික අංකය	විස්තරය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාල නොවේ	යොමුව	විගණන නිරීක්ෂණ
3.2.iv.අෑ	බැංකුවේ හෝ වෙනත් බැංකුවක අධ්‍යක්ෂවරයෙකු ප්‍රධාන විධායක නිලධාරි, ඉහල කලමනාකරණයේ නිලධාරියෙකු සැලකිය යුතු කොටස් හිමිකරුවෙකු සමග සමීප සම්බන්ධතාවයක්පවත්වා තිබීම (සමීප සම්බන්ධතාවය යනු කලත්‍රයාගේ හෝ මූල්‍යමය ලෙස යැපෙන දරුවෙක් මේ සඳහා අදහස් කෙරේ)			අදාල නොවේ.	ප්‍රධාන විධායක නිලධාරියාගේ ප්‍රකාශනය හා බැංකු පනතේ (42) වගන්තියට අනුව අධ්‍යක්ෂවරු සිදුකර ඇති ස්වයං ප්‍රකාශය අනුව සමීප සම්බන්ධතාවයක් පවත්වා ඇති එවැනි විධායක නොවන අධ්‍යක්ෂවරු නොමැත.	අදාල නොවේ.
3.2.iv.ඉ	බැංකුවේ විශේෂිත පාර්ශ්වකරුවෙකු නියෝජනය කරන විට			අදාල නොවේ.	බැංකුව සම්පූර්ණයෙන්ම රජය සතුවේ.	අදාල නොවේ.
3.2.iv. ඊ	සමාගමක හෝ ව්‍යාපාරික ආයතනයක අධ්‍යක්ෂවරයකු සේවකයකු හෝ සැලකිය යුතු කොටස්කරුවෙකු වන විට					
3.2.iv.ඊ.I	මෙම නියෝගවල 3(7) නියෝගයේ දක්වා ඇති පරිදි බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් 10% ප්‍රමාණයක් ඉක්මවා යන යම්කිසි ගනුදෙනුවක් බැංකුව සමග පැවතීම හෝ			අදාල නොවේ.	2020 න් අවසන් වූ වසර සඳහා කිසිම අධ්‍යක්ෂවරයෙකු බැංකුව සමග සෘජුවම හෝ වක්‍රව කිසියම් ගනුදෙනුවක් පිලිබඳව උනන්දුවක් දක්වා නොමැත	අදාල නොවේ. 2020 වර්ෂය තුළදී අධ්‍යක්ෂවරයෙකු සෘජුව හෝ වක්‍රව උනන්දුවක් දක්වා ඇති ගණුදෙනුවක් සිදු වී නොමැත
3.2.iv.ඊ.II	මේ සම්බන්ධයෙන් බැංකුවේ අනෙකුත් අධ්‍යක්ෂවරුන් සේවයේ යොදවා හෝ අධ්‍යක්ෂවරුන් හෝ සැලකිය යුතු කොටස්කරුවන් හෝ			අදාල නොවේ.	මේ සම්බන්ධයෙන් කිසිදු සිදුවීමක් ඇති වී නොමැත	අදාල නොවේ.
3.2.iv.ඊ.III	මෙම නියෝගවල 3(7) නියෝගයේ දක්වා ඇති පරිදි බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් 10% ප්‍රමාණයක් ඉක්මවා යන ගනුදෙනුවක් බැංකුවේ අනෙකුත් අධ්‍යක්ෂවරුන් බැංකුව සමග ඇති බව			අදාල නොවේ.	මේ සම්බන්ධයෙන් කිසිදු සිදුවීමක් ඇති වී නොමැත	අදාල නොවේ.
3.2.v	ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු නියෝජනය කිරීම සඳහා විකල්ප අධ්‍යක්ෂවරයෙකු පත්කල විට, එසේ පත්කල අය ස්වාධීන අධ්‍යක්ෂවරයෙකුට අදාළ සුදුසුකම් සපුරා ඇත්දැයි පරීක්ෂා කිරීම.			අදාල නොවේ.	වසර තුලදී විකල්ප අධ්‍යක්ෂවරුන් පත්කර නොතිබිනි.	අදාල නොවේ.
3.2.vi	බැංකුවට ස්වාධීන අධ්‍යක්ෂවරුන් පත් කිරීමට අදාල ක්‍රියා පිලිවෙත් ඇත්දැයි පරීක්ෂා කිරීම.	අනුකූලවිය			1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ 7 වගන්තියට අනුව අධ්‍යක්ෂවරු පත්කරනු ලබන්නේ අමාත්‍යවරයා විසිනි.	අනුකූලවිය 1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ 7 වගන්තියට අනුව අධ්‍යක්ෂවරු පත්කරනු ලබන්නේ අමාත්‍යවරයා විසිනි.

ආයතනික පාලනය (ඉතිරි කොටස)...

අනුක්‍රමික අංකය	විස්තරය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාල නොවේ	යොමුව	විගණන නිරීක්ෂණ
3.2.vii	බැංකුවේ නියම කරන ලද ගණපුරණය සඳහා අධ්‍යක්ෂවරුන් 50% වැඩි සංඛ්‍යාවක් අවශ්‍යවන අතර මෙම ගණපූරණයෙන් 50% ට වැඩි ප්‍රමාණයක් විධායක නොවන අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවක් විය යුතු බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය			සියලුම අධ්‍යක්ෂවරු විධායක නොවන අධ්‍යක්ෂවරුන් වෙති.	අනුකූලවිය සියලුම අධ්‍යක්ෂවරු විධායක නොවන අධ්‍යක්ෂවරුන් වෙති.
3.2.viii.	සභාපතිවරයාගේ, විධායක අධ්‍යක්ෂවරුන්ගේ විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ සහ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ නම් ඇතුළත්ව අධ්‍යක්ෂවරුන්ගේ වර්ගීකරණයක් සහ අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය වාර්ෂික ආයතනික පාලන වාර්තාවේ බැංකුව විසින් එළි දක්වා ඇති බව පරීක්ෂා කිරීම	අනුකූලවිය			අධ්‍යක්ෂවරුන්ගේ හා සභාපතිවරයාගේ නම් ද ඇතුළත්ව අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය බැංකුව විසින් එලිදරව්කර ඇත. ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු ලෙස වර්ග කරමින් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රවර්ගය බැංකුව විසින් වාර්ෂික වාර්ථාවේ එළි දක්වා ඇත.	අනුකූලවිය 2020 වාර්ෂික වාර්තා කෙටුම්පත බලන්න.
3.2.ix	අධ්‍යක්ෂ මණ්ඩලයට නව අධ්‍යක්ෂවරුන් පත්කිරීම පිළිබඳ ක්‍රියාපටිපාටිය පරීක්ෂා කිරීම.	අනුකූලවිය			1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියට අනුව අධ්‍යක්ෂවරු පත්කිරීම අමාත්‍යවරයා විසින් සිදුකරනු ලබයි.	අනුකූලවිය 1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ 7 වගන්තියට අනුව අධ්‍යක්ෂවරු පත්කිරීම අමාත්‍යවරයා විසින් සිදුකරනු ලබයි.
3.2.x	තාවකාලික පුරප්පාඩු පිරවීම සඳහා පත්කල සියළුම අධ්‍යක්ෂවරු ඔවුන්ගේ පත්වීමෙන් පසු විලඹෙන පලමු මහා සභා රැස්වීමේ දී කොටස්කරුවන්ගේ ඡන්දයෙන්ද තේරී පත්වීමට යටත්වන බව පරීක්ෂා කිරීම.			අදාල නොවේ.	1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ 7 වගන්තියට අනුව අධ්‍යක්ෂවරු පත්කරනු ලබන්නේ අමාත්‍යවරයා විසිනි.	අදාල නොවේ. 1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ 7 වගන්තියට අනුව අධ්‍යක්ෂවරු පත්කරනු ලබන්නේ අමාත්‍යවරයා විසිනි.
3.2.xi	අධ්‍යක්ෂවරයකු ඉල්ලා අස්වුවහොත් හෝ සේවයෙන් ඉවත් කරනු ලැබුවහොත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින්					
3.2.xi.අ	අධ්‍යක්ෂවරයාගේ ඉල්ලා අස්වීම් හෝ ඉවත්කිරීමට හේතුව නිවේදනය කළයුතු අතර එම ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීමට හේතුව එම අදාළ අධ්‍යක්ෂවරයා බැංකුව සමඟ තිබූ කිසියම් මතභේදයක් සම්බන්ධ තොරතුරුවලට පමණක් සීමා නොවීම සහ	අනුකූලවිය			1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියට අනුව අධ්‍යක්ෂවරු ඉවත්කිරීම සිදුකරනු ලබන්නේ අදාල රේඛීය අමාත්‍යංශයේ අමාත්‍යවරයා විසිනි.	අනුකූලවිය 1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියට අනුව අධ්‍යක්ෂවරු ඉවත්කිරීම සිදුකරනු ලබන්නේ අදාල රේඛීය අමාත්‍යංශයේ අමාත්‍යවරයා විසිනි.
3.2.xi.ආ	කොටස්කරුවන්ගේ අවධානයට ලක් කිරීමට අවශ්‍ය කරන යම් තොරතුරු තිබේද නැතිද යන වග තහවුරු කර නිවේදනයක් නිකුත් කළ යුතු වේ.			අදාල නොවේ.		අදාල නොවේ.

ආයතනික පාලනය (ඉතිරි කොටස)...

අනුක්‍රමික අංකය	විස්තරය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාල නොවේ	යොමුව	විගණන නිරීක්ෂණ
3.2.xii	බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු හෝ සේවකයකු වෙනත් බැංකුවක අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්කරනු ලැබ හෝ තේරී පත්වී ඇති බව හෝ නම්කර ඇති බවක් හෝ දැනගැනීම පිණිස වැඩ පිළිවෙලක් තිබේද යන්න පරීක්ෂා කිරීම.	අනුකූලවිය			බැංකු පනතේ 42 වගන්තිය සමඟ කියවියයුතු 76 ඒ වගන්තිය පරිදි රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂවරුන්ගේ යෝග්‍යතාවය සහ සුදුසුකම් ඇගයීම ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් පිළිගෙන ඇත.	අනුකූලවිය රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂවරුන්ගේ යෝග්‍යතාවය හා සුදුසුකම් ඇගයීම පිළිබඳ ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් එවන ලද ලිපිය නිරීක්ෂණය කරන ලදී.
3.3	**අධ්‍යක්ෂවරුන්ගේ යෝග්‍යතාව සහ සුදුසුකම තක්සේරු කිරීමේ නිර්ණායක**					
3.3.i	අධ්‍යක්ෂවරයකු ලෙස සේවය කරන අයෙකුගේ වයස අවුරුදු 70 ට නොඉක්මවිය යුතු බව පරීක්ෂා කිරීම	අනුකූලවිය			ප්‍රකාශන තුළින් සියලුම අධ්‍යක්ෂවරුන් අවුරුදු 70 ට වඩා අඩු අය බව පරීක්ෂාකර තහවුරුකර ඇත.	අනුකූලවිය අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්වයං ඇගයීමේ පත්‍රිකා නිරීක්ෂණය කළ අතර එවැනි අධ්‍යක්ෂවරයකු නිරීක්ෂණය නොවීය.
3.3.i.අ	සංක්‍රාන්තිමය විධිවිධානවලට අනුකූලවීම පරීක්ෂා කිරීම.			අදාල නොවේ.	වයස අවුරුදු 70 ඉක්මවූ අධ්‍යක්ෂවරු නොමැති බැවින් මෙම කොටස අදාල නොවේ.	අදාල නොවේ.
3.3.ii	බැංකුවේ පරිපාලිත හෝ ආශ්‍රිත සමාගම් ඇතුළුව සමාගම්/ආයතන 20 ට අධික ප්‍රමාණයක යම් අධ්‍යක්ෂවරයකු අධ්‍යක්ෂ ධුර හොබවන්නේද යන්න පිළිබඳ පරීක්ෂා කිරීම.	අනුකූලවිය			සමාගම්/ආයතන 20 ට අධික සංඛ්‍යාවක අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරන අධ්‍යක්ෂවරයෙකු නොමැත	අනුකූලවිය අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්වයං ඇගයීමේ පත්‍රිකා නිරීක්ෂණය කළ අතර එවැනි අධ්‍යක්ෂවරයකු නිරීක්ෂණය නොවීය.
3.3.iii	ශ්‍රී ලංකාවේ ක්‍රියා ක්‍රියාත්මක වන බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරයෙකු හෝ ප්‍රධාන විධායක නිලධාරිවරයෙකු පළමු බැංකුවේ ඔහුගේ/ඇයගේ නිලය අවසන්කළ දිනයේ සිට මාස 06 ක කාලයක් ඉකුත්වීමට ප්‍රථම ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මකවන වෙනත් බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂකවරයකු හෝ ප්‍රධාන විධායක නිලධාරී වරයෙකු ලෙස පත් නොකළ යුතු බව පරීක්ෂා කිරීම.			අදාල නොවේ.	එවැනි පත්වීමක් සිදු කර නොමැත.	අදාල නොවේ.
3.4	**අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බලය පවරන ලද කලමනාකරන කාර්යයන්**					
3.4.i	බලය පැවරීමේ කටයුතු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය			රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ 20 සහ 21 වගන්ති අනුව, ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාමාන්‍යාධිකාරිවරයාට බලය පවරා දීම සිදුකර ඇත. මෙයට අමතරව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කර ඇති අනු කමිටු සඳහා ද බලය පවරා දීම සිදුකර ඇත.	අනුකූලවිය රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ 20-21 වගන්ති සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කළ අනුකමිටු පරීක්ෂාකල අතර ඒ අනුව ඒවාට බලය පවරා ඇත.

ආයතනික පාලනය (ඉතිරි කොටස)...

අනුක්‍රමික අංකය	විස්තරය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාල නොවේ	යොමුව	විගණන නිරීක්ෂණ
3.4.ii	එවැනි ක්‍රියාවන් සඳහා බලය ලබාදී ඇති අවස්ථාවන්වලදී පවා 3 (1) (ස) හි සඳහන් කරුණු පිලිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමක් ගෙන ඇති බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය			අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු කරගෙන යෑමේ හැකියාව අඩු නොවන ප්‍රමාණයට අධ්‍යක්ෂ මණ්ඩල කමිටු වලට, ප්‍රධාන විධායක නිලධාරිවරයාට හෝ ජ්‍යෙෂ්ඨ කළමනාකරිත්වය නිලධාරීන්හට යම් යම් කරුණු පිලිබඳ බලය ලබා දීම සීමා කර ඇත.	අනුකූලවිය අනුකමිටු ප්‍රඥප්තිය හෝ සමුද්දේශ විෂය පරීක්ෂා කළා.
3.4.iii	බලය පැවරීමේ ක්‍රියාවලිය බැංකුවේ අවශ්‍යතාවන්ට උචිත පරිදි පවතී දැයි තහවුරු කර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විය කලින් කලට සමාලෝචනය කිරීම පරීක්ෂා කිරීම.	අනුකූලවිය			බලය පැවරීමේ ක්‍රියාවලිය බැංකුවේ අවශ්‍යතාවන්ට උචිත පරිදි පවතී දැයි තහවුරුකර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විය කලින් කලට සමාලෝචනය කරනු ලබයි.	අනුකූලවිය 2020 ජූනි 25 දින මානව සම්පත් කරුණු පිළිබඳව පැවැත්වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්
3.5	**සභාපතිවරයා හා ප්‍රධාන විධායක නිලධාරි**					
3.5.i	සභාපතිවරයාගේ හා ප්‍රධාන විධායක නිලධාරිවරයාගේ කාර්යභාරය එකිනෙකට වෙනස්වන අතර, එම කටයුත්ත එකම පුද්ගලයෙකු විසින් සිදු නොකරන බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය			සභාපතිවරයාගේ හා ප්‍රධාන විධායක නිලධාරිවරයාගේ කාර්යභාරය එකිනෙකට වෙනස්වන අතර, එම කටයුත්ත එකම පුද්ගලයෙකු විසින් සිදු නොකරයි.	අනුකූලවිය සභාපතිවරයා සහ ප්‍ර.වි.නි. ලෙස දෙදෙනකු ක්‍රියා කරයි.
3.5.ii	සභාපතිවරයා විධායක නොවන අධ්‍යක්ෂවරයකු බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය			සභාපතිවරයා විධායක නොවන අධ්‍යක්ෂවරයකු වන අතර, 1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතිය යටතේ අදාළ රේඛීය අමාත්‍යාංශය විසින් ඔහු පත්කරනු ලබයි.	අනුකූලවිය සභාපතිවරයා විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වන අතර ඔහුගේ පත්වීම් ලිපිය නිරීක්ෂණය කළා.
	සභාපතිවරයා ස්වාධීන අධ්‍යක්ෂවරයකු නොවන අවස්ථාවක, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සුදුසු ලෙස ලේඛනගතකළ විෂය ක්ෂේත්‍රයට අනුව ස්වාධීන අධ්‍යක්ෂවරයකු ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කිරීම පරීක්ෂා කිරීම.	අනුකූලවිය			සභාපතිවරයා ස්වාධීන අධ්‍යක්ෂවරයෙකි. එහෙයින් මෙවැනි අවශ්‍යතාවයක් පැන නොනැගිනි.	අනුකූලවිය
	ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයෙකු පත් කිරීම බැංකුවේ වාර්ෂික වාර්තාවේ වලිද්දව් කලයුතු බව පරීක්ෂා කිරීම.	අදාල නොවේ.				අදාල නොවේ.
3.5.iii	වාර්ෂික වාර්තාවේ කොටසක් වන ආයතනික පාලන වාර්තාවේ යම්කිසි සම්බන්ධතාවයක් (මූල්‍ය, ව්‍යාපාරික, ඥාති හෝ වෙනත් සැලකිය යුතු සම්බන්ධතාවය/තාවයන් සභාපතිවරයා, ප්‍ර.වි.නි. හා අධ්‍යක්ෂ මණ්ඩලය අතර තිබේද යන්න පිළිබඳවත් එම සම්බන්ධතාවයේ ස්වභාවය පිළිබඳවත් හඳුනාගැනීමක් කිරීමේ ක්‍රියාවලියක් අධ්‍යක්ෂ මණ්ඩලයට ඇති බව පරීක්ෂා කිරීම	අනුකූලවිය			බැංකු පනතේ 42 වගන්තියට අනුව අධ්‍යක්ෂවරුන් විසින් සිදුකර ඇති ස්වයං ප්‍රකාශයේ මේ පිලිබඳව අනාවරණය කිරීමක් සිදුකර ඇත.	අනුකූලවිය 2020 වර්ෂයේ කෙටුම්පත් කරන ලද වාර්ෂික වාර්තාව නිරීක්ෂණය කරන ලදී.

ආයතනික පාලනය (ඉතිරි කොටස)...

අනුක්‍රමික අංකය	විස්තරය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාල නොවේ	යොමුව	විගණන නිරීක්ෂණ
3.5.iv	අධ්‍යක්ෂ මණ්ඩලයට ස්වයං ඇගයීමේ ක්‍රියාවලියක් ඇති බවත් එහිදි සභාපතිවරයා: (අ) අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය ලබාදීමත (ආ) අධ්‍යක්ෂ මණ්ඩලය ඵලදායී ලෙස සේවය කිරීමත් වගකීම් නිසි ලෙස ඉටු කිරීමත් තහවුරු කිරීම සහ (ඇ) සියලුම ප්‍රධාන හා යෝග්‍ය කරුණු කාලානුරූපව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාකච්ඡා කර ඇති බව තහවුරු කිරීම.	අනුකූලවිය			ස්වයං ඇගයීමේ ක්‍රියාවලිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදුකර ඇත,	අනුකූලවිය අධ්‍යක්ෂ මණ්ඩලය ස්වයං ඇගයීම් පත්‍රිකා පිටපත්වල නිරීක්ෂණය කරන ලදී.
3.5.v	සභාපතිවරයා විසින් අනුමත කර ඇති විධිමත් න්‍යාය පත්‍රය සමාගම් ලේකම්වරයා විසින් බෙදා හැරී ඇති බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය			සභාපතිවරයාගේ අනුමැතිය සහිතව න්‍යාය පත්‍රය අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් සෑම අධ්‍යක්ෂවරයකු වෙතම ලැබීමට සලස්වා ඇත.	අනුකූලවිය 2021 ජූලි 17 දින සභාපතිවරයා විසින් අනුමත කරන ලද න්‍යාය පත්‍රය සමාගම් ලේකම් විසින් බෙදා හැර ඇති බව නිරීක්ෂණය කරන ලදී.
3.5.vi	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී පැන නගින මත භේදයන්ට ලක්වූ කරුණු පිළිබඳව කාලීනව ඉදිරිපත් කිරීම තුලින් අධ්‍යක්ෂවරුන් යථා පරිදි දැනුවත් කිරීම සිදුකර ඇති බව සභාපතිවරයා තහවුරු කරන බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය			අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වල දී පැන නගින කරුණු පිලිබඳව පූර්වයෙන් අධ්‍යක්ෂවරුන් දැනුවත් කර ඇති අතර පෙර සූදානම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා අධ්‍යක්ෂවරුන්ට ඉදිරිපත් කර ඇත.	අනුකූලවිය 2021 ජූලි 17 දින සභාපතිවරයා විසින් අනුමත කරන ලද න්‍යාය පත්‍රය සමාගම් ලේකම් විසින් බෙදා හැර ඇති බව නිරීක්ෂණය කරන ලදී.
3.5.vii	අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු සඳහා පූර්ණ ක්‍රියාකාරී දායකත්වය ලබාදීම වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය ධෛර්යමත් කිරීමේ ස්වයං ඇගයීමේ ක්‍රියාවලියක් අධ්‍යක්ෂ මණ්ඩලය සතුවන අතර සභාපතිවරයා බැංකුවේ ප්‍රගමනය සඳහා කටයුතු කිරීමට පෙරමුණ ගෙන ඇති බව පරීක්ෂා කිරීම.				2020 වසරේ දී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ දායකත්වය ඇගයීම සඳහා ස්වයං ඇගයීමේ ක්‍රියාවලිය සිදුකර ඇත.	අනුකූලවිය ශ්‍රී ලංකා මහ බැංකුව වෙත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යොමුකරන ලද ස්වයං ඇගයීමේ පත්‍රිකා නිරීක්ෂණය කරන ලදී.
3.5.viii	විධායක නොවන අධ්‍යක්ෂකවරුන්ගේ දායකත්වය තක්සේරු කලහැකි ස්වයං අගැයීමේ ක්‍රියාවලියක් අධ්‍යක්ෂ මණ්ඩලය සතුව ඇති බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය			2020 වසරේ දී ස්වයං ඇගයීමේ ක්‍රියාවලිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදුකර ඇති අතර, එමගින් විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ දායකත්වය තක්සේරු කරයි. ඇගයීමේ පත්‍රිකා නිරීක්ෂණය කරන ලදී.	අනුකූලවිය ශ්‍රී ලංකා මහ බැංකුව වෙත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යොමුකරන ලද ස්වයං ඇගයීමේ පත්‍රිකා නිරීක්ෂණය කරන ලදී.

ආයතනික පාලනය (ඉතිරි කොටස)...

අනුක්‍රමික අංකය	විස්තරය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාල නොවේ	යොමුව	විගණන නිරීක්ෂණ
3.5.ix	ප්‍රධාන කලමනාකරණ නිලධාරීන්ගේ හෝ විධායක තත්ත්වයේ කුමන හෝ රාජකාරියක සෘජු අධීක්ෂණය හා සම්බන්ධ කටයුතුවල සභාපතිවරයාගේ මැදිහත්මක් වන බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය			සභාපතිවරයා ප්‍රධාන කලමනාකරණ නිලධාරීන්ගේ හෝ වෙනත් විධායක රාජකාරී කටයුතු සඳහා සෘජු අධීක්ෂණ කටයුතු වල නියැලීමක් සිදු නොකරයි.	අනුකූල නොවිය සභාපතිවරයා විධායක නොවන අධ්‍යක්ෂවරයෙකි. කෙසේ නමුත් 2020 වසරේ සභාපතිවරයා අත්සන් කරන ලද ප්‍රධාන අභ්‍යන්තර විගණක, සහකාර කළමනාකරු (ණය) සහකාර අභ්‍යන්තර විගණක යන අයගේ පත්වීම් ලිපි අපි නිරීක්ෂණය කරමු.
3.5.x	කොටස්කරුවන් සමඟ ඵලදායී සන්නිවේදනයක් පවත්වාගෙන යෑම සඳහා සහ කොටස්කරුවන්ගේ අදහස් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබා ගැනීම සඳහා ක්‍රියාවලියක් ඇති බව පරීක්ෂා කිරීම.	අදාල නොවේ.			බැංකුවේ හිමිකාරිත්වය 100% රජය සතු වන අතර, සියලුම අධ්‍යක්ෂවරු පත්කිරීම අදාළ රේඛීය අමාත්‍යාංශය විසින් සිදුකරනු ලබයි. භාණ්ඩාගාරයේ නියෝජිත අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්ථිර සාමාජිකයෙකි.	අදාල නොවේ. බැංකුවේ හිමිකාරිත්වය 100% ක් රාජ්‍ය සතු වේ මුදල් ප්‍රාග්ධන වෙළඳපළ හා ව්‍යාපාර ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය මගින් අධ්‍යක්ෂවරු පත්කරන අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ නිත්‍ය සාමාජිකයකු ලෙස භාණ්ඩාගාර නියෝජිතයෙකු ක්‍රියාකරන බව තහවුරු කර ඇත.
3.5.xi	බැංකුවේ මෙහෙයුම් හා ව්‍යාපාරික කටයුතුවල එදිනෙදා කලමනාකරණය බාරව ඇති ඉහළ විධායක නිලධාරියකු ලෙස ප්‍ර.වි.නි. ක්‍රියාකරන බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය			සංවිධාන සැලැස්ම පරිදි, ප්‍ර.වි.නි./ සාමාන්‍යාධිකාරී ඉහළ විධායක නිලධාරියෙකු ලෙස බැංකුවේ එදිනෙදා මෙහෙයුම් කටයුතු කලමනාකරණය සඳහා සහභාගිවෙයි.	අනුකූලවිය බැංකුවේ සංවිධාන සැලැස්ම නිරීක්ෂණය කරන ලදී
3.6	**අධ්‍යක්ෂ මණ්ඩලය පත්කල කමිටු**					
3.6.i	මෙම නියෝගවල 3(6)(ii), 3(6)(iii), 3(6)(iv) සහ 3(6)(v) නියෝගවල දක්වා ඇති පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය අවම වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල කමිටු හතරක් (04) පිහිටුවා ඇති බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය			බැංකුව පහත සඳහන් අනුකමිටු පිහිටුවා ඇත. • අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC) • අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව (BHRRC) • අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුව (BNC) • අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කලමනාකරණ කමිටුව (BIRMC)	අනුකූලවිය BAC BHRRC, BNC, BIRMC වැනි අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු සඳහා අධ්‍යක්ෂවරු පත්කිරීම පිළිබඳ 20.01.03.01 අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව නිරීක්ෂණය කරන ලදී.

ආයතනික පාලනය (ඉතිරි කොටස)...

අනුක්‍රමික අංකය	විස්තරය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාල නොවේ	යොමුව	විගණන නිරීක්ෂණ
	සෑම අධ්‍යක්ෂ මණ්ඩල කමිටු වාර්තාවක්ම සෘජු ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර ඇති බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය			අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු සෑම වාර්තාවක්ම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමුකර ඇත.	අනුකූලවිය අනු කමිටු වාර්තා නිරීක්ෂණය කරන ලදී. Ex BAC, BIRMC
	සෑම කමිටුවකම කටයුතු, කාර්යභාරය හා කාර්යසාධනය පිළිබඳ වාර්තාවක් වාර්ෂික වාර්තාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත්කර ඇති බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය			BAC, BNC,BIRMC කමිටුවල විස්තර බැංකුව විසින් වාර්ෂික වාර්තාවේ විලිදැරව්කර ඇත.	අනුකූලවිය කොටුම්පත් කල වාර්ෂික වාර්තාව නිරීක්ෂණය කරන ලදී
3.6.ii	**විගණන කමිටුව:**					
3.6.ii.අ	කමිටුවේ සභාපතිවරයා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වන අතර අවශ්‍ය සුදුසුකම් හා විම ක්ෂේත්‍රයේ පලපුරුද්ද ලබා ඇති බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය			කමිටුවේ සභාපතිවරයා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වන අතර අවශ්‍ය සුදුසුකම් හා විම පලපුරුද්ද ඔහු සතුය. විගණන කමිටුවේ සභාපතිවරයා වරලත් ගණකාධිකාරිවරයෙකි.	අනුකූලවිය අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ සභාපතිවරයාගේ පත්වීම් ලිපිය නිරීක්ෂණය කරන ලදී.
3.6.ii.ආ	කමිටුවේ සියලුම සාමාජිකයින් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වේදැයි පරීක්ෂා කිරීම	අනුකූලවිය			අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව එක් විකල්ප අධ්‍යක්ෂවරයෙකුද ඇතුළුව සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විතවේ. සියලුම සාමාජිකයින් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු වෙති.	අනුකූලවිය අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවලට අධ්‍යක්ෂවරුන් පත්කිරීම සඳහා වන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 20.01.03.01 නිරීක්ෂණය කරන ලදී.
3.6.ii.ඇ	කමිටු පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කර ඇත් දැයි පරීක්ෂා කිරීම.				ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව බාහිර විගණකවරයා විගණකාධිපති වෙයි. 1975 අංක 13 රාජ්‍ය උකස් බැංකු නීතියේ 65 වගන්තිය, විගණන පනත, සහ මූල්‍ය පනත අනුව මෙම පත්වීම සිදුකරයි.	අදාල නොවේ. 1975 අංක 13 රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතිය හා මුදල් පනත අනුව බාහිර විගණකවරයා ලෙස විගණකාධිපතිවරයා පත්කරනු ලබයි.
3.6.ii. ඇ.I	අදාළ ආඥා පනත අනුව විගණන කාර්යයන් සඳහා බාහිර විගණකවරයෙකු පත් කිරීම.			අදාල නොවේ.		අදාල නොවේ.
3.6.ii. ඇ.II	විගණකවරුන් සඳහා කලින් කලට මහ බැංකුව විසින් නිකුත් කර ඇති උපදෙස් ක්‍රියාත්මක කිරීම.			අදාල නොවේ.		අදාල නොවේ.

ආයතනික පාලනය (ඉතිරි කොටස)...

අනුක්‍රමික අංකය	විස්තරය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාල නොවේ	යොමුව	විගණන නිරීක්ෂණ
3.6.ii. ඇ.III	අදාල ගිණුම්කරණ ප්‍රමිතීන් යොදා ගැනීම සහ				මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා නව මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRSs/LKASs) අනුව සහ නියාමකයින් විසින් නියම කර ඇති ආකෘති අනුව පිළියෙල කරනු ලබයි. සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2021 සැප්. 24 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී අනුමත කරනු ලැබූ අතර 2021 ඔක්තෝම්බර් 04 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ දී ස්ථිර කරන ලදී. වාර්ෂික මූල්‍ය ප්‍රකාශන වාර්ෂික වාර්තාවේ එළිදරව් කර ඇත. කාර්තුමය ප්‍රකාශන භාෂා ත්‍රිත්වයෙන්ම පුවත්පත්වල පළකර ඇත.	අනුකූලවිය 2021 සැප්තැම්බර් 24 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාව නිරීක්ෂණය කරන ලදී.
3.6.ii. ඇ.IV	සේවා කාලය, විගණක ශාස්තුව හා විගණකවරයා ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම විගණන සහකරුගේ සේවා කාලය වසර 05 නොඉක්මවීම අනුව සේවයෙන් ඉවත්කිරීම හා පෙර සේවා කාලය සම්පූර්ණ වූ දිනයේ සිට වසර තුනක් ගතවීමට පෙර අදාළ විගණක සහකරු නැවත සේවයේ පිහිටුවා නොතිබීම පරීක්ෂා කිරීම.	අදාල නොවේ.			1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 65 වගන්තිය, මුදල් පනත/විගණන පනත සහ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව විගණකාධිපතිවරයා බාහිර විගණක විගණකවරයා වෙයි.	අදාල නොවේ. 1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියට අනුව මුදල් අමාත්‍යවරයා විසින් විගණකාධිපතිවරයා පත් කරයි.
3.6.ii.ඇ.	තම ස්වාධීනත්වය පිළිබඳව බාහිර විගණකවරුන්ගේ කරුණු ඉදිරිපත් කිරීම කමිටුව ලබාගෙන තිබීම හා විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව සිදුකර ඇත්දැයි පරීක්ෂා කිරීම.	අදාල නොවේ.			1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතිය අනුව, විගණකාධිපතිවරයා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ බාහිර විගණකවේ.	අදාල නොවේ. 1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියට අනුව මුදල් අමාත්‍යවරයා විසින් විගණකාධිපතිවරයා පත් කරයි.
3.6.ii.ඉ.	අදාළ රෙගුලාසිවලට අනුව විගණන නොවන සේවා සැපයීමට බාහිර විගණකවරයකුගේ සේවය ලබා ගැනීමේ ප්‍රතිපත්තියක් කමිටුව අනුග මනය කර තිබේද යන්න පිළිබඳව පරීක්ෂා කිරීම.	අදාල නොවේ.			1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතිය අනුව, විගණකාධිපතිවරයා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ බාහිර විගණකවේ.	අදාල නොවේ. 1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියට අනුව මුදල් අමාත්‍යවරයා විසින් විගණකාධිපතිවරයා පත් කරයි.

ආයතනික පාලනය (ඉතිරි කොටස)...

අනුක්‍රමික අංකය	විස්තරය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාල නොවේ	යොමුව	විගණන නිරීක්ෂණ
3.6.ii.ඊ	විගණනය ආරම්භ කිරීමට ප්‍රථම ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් අනුව විගණනයේ විෂයපථය හා ස්වභාවය කුමක් දැයි බාහිර විගණකවරුන් සමඟ කමිටුව සාකච්ඡා කර තීරණය කර තිබේ දැයි පරීක්ෂා කිරීම.	අදාල නොවේ.			විගණන කමිටුව බාහිර විගණක සමඟ විගණනයේ විෂය පථය හා ස්වභාවය සාකච්ඡා කර ඇත. විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් අනුව පවත්වන ලද බව විගණන වාර්තාව සඳහන් කරයි.	විගණකාධිපතිවරයාගේ නියෝජිතයකු විගණන කමිටු රැස්වීම් සඳහා සහභාගිවන අතර විගණන සැලැස්ම මත පදනම්ව විගණකාධිපතිවරයා වාර්ෂික විගණනය සිදුකර ඇත.
3.6.ii.උ	ඵලදායීතාවය සඳහා පිළියෙළ කර ඇති බැංකුවේ කාර්තුමය වාර්තා, ගිණුම්, වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශනයන්හි විශ්වාසනීයත්වය අධීක්ෂණය කිරීම සඳහා මූල්‍ය තොරතුරු සමාලෝචනය කිරීමට කමිටුව ක්‍රියාවලියක් සහ පහත සඳහන් දෑ ප්‍රධාන මූල්‍ය නිලධාරීන්ගෙන් ලබාගැනීමටද ක්‍රියාවලියක් තිබේදැයි පරීක්ෂා කිරීම; (i) ප්‍රධාන තීන්දු ගතයුතු ක්ෂේත්‍ර (ii) ගිණුම් ප්‍රතිපත්ති හා ව්‍යවහාරවල වෙනස්වීම්; (iii) අඛණ්ඩතාව පිළිබඳ උපකල්පනය; සහ (iv) අදාල ගිණුම්කරණ ප්‍රමිති හා වෙනත් නෛතික අවශ්‍යතා සමඟ අනුකූලතාවය සහ (v) වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණනයේදී පැනනගින ප්‍රධාන ගැලපීම්	අනුකූලවිය			අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව පහත සඳහන් විගණන කමිටු රැස්වීම් තුළින් මූල්‍ය තොරතුරු සමාලෝචනය කර ඇත. රැස්වීම් දිනය : 2020.04.24 රැස්වීම් දිනය : 2020.06.23 රැස්වීම් දිනය : 2020.09.14 රැස්වීම් දිනය : 2020.09.29 රැස්වීම් දිනය : 2020.11.19 රැස්වීම් දිනය : 2020.12.11	අනුකූලවිය පහත දැක්වෙන පරිදි විගණන කමිටු වාර්තාව නිරීක්ෂණය කරන ලදී. රැස්වීම් දිනය : 2020.04.24 රැස්වීම් දිනය : 2020.06.23 රැස්වීම් දිනය : 2020.09.14 රැස්වීම් දිනය : 2020.09.29 රැස්වීම් දිනය : 2020.11.19 රැස්වීම් දිනය : 2020.12.11
3.6.ii.ඌ	විගණනයට සම්බන්ධ විධායක කලමනාකාරිත්වය සහභාගි නොවන යම්කිසි කරුණකට අදාළව බාහිර විගණකවරුන් කමිටුව හමුවීම පරීක්ෂා කිරීම.	අදාල නොවේ.			විගණනයට සම්බන්ධ විධායක කලමනාකාරිත්වය සහභාගි නොවන යම්කිසි කරුණකට අදාළව බාහිර විගණකවරුන් කමිටුව හමුවීම පරීක්ෂා කිරීම.	අදාල නොවේ. 2020 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම් වාර්තා බලන්න.
3.6.ii.එ	බාහිර විගණකගේ කලමනාකරණ ලිපිය හා ඒ සඳහා කලමනාකාරිත්වයේ ප්‍රතිචාර කමිටුව සමාලෝචනය කර ඇති බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය			අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විගණනයට සම්බන්ධ ගැටලු හා විමසුම් සහ ඒවාට කළමනාකරණය දැක්වූ ප්‍රතිචාර සමාලෝචනය කර ඇත. 2020.11.09 දින පවත්වන ලද රැස්වීමට කළමනාකරණය දැක්වූ ප්‍රතිචාර හා 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය අනුව නිකුත්කල 2019 වසර සඳහා විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව සමාලෝචනය කර ඇත.	අනුකූලවිය අධ්‍යක්ෂ මණ්ඩලය විගණන කමිටුව විගණනයට සම්බන්ධ ගැටලු හා විමසුම් ඒවාට කළමණාකරනය දැක්වූ ප්‍රතිචාර හා 2019 කළමනාකරණ ලිපිය 2020.11.19 දින පැවැති රැස්වීමේදී සමාලෝචනය කර ඇත.

ආයතනික පාලනය (ඉතිරි කොටස)...

අනුක්‍රමික අංකය	විස්තරය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාල නොවේ	යොමුව	විගණන නිරීක්ෂණ
3.6.ii.වී	බැංකුවේ අභ්‍යන්තර විගණන කාර්යයට අදාළව කමිටුව පහත දැක්වෙන ක්‍රියාමාර්ග ගනු ලබන බව පරීක්ෂා කිරීම:					
3.6.ii.වී.I	අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ සම්පත් කාර්යයන් සහ විෂය පථයේ ප්‍රමාණාත්මකභාවය සමාලෝචනය කරන අතර දෙපාර්තමේන්තුවට එහි වැඩ කටයුතු සිදුකරගෙන යෑම සඳහා අවශ්‍ය බලතල ඇති බවට සෑහීමකට පත් වෙයි.	අනුකූලවිය			2020 අභ්‍යන්තර විගණන සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු පත්‍රිකා අංක 19/05/03 (2019.11.14) මගින් අනුමත කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය හා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අනුමත කරන ලද අභ්‍යන්තර විගණන ප්‍රඥප්තිය මගින් අභ්‍යන්තර විගණන අංශයට ඔවුන්ගේ වැඩකටයුතු කරගෙන යෑමට අවශ්‍ය බලතල අභ්‍යන්තර විගණන අංශය වෙත ලබා දී ඇත. අවශ්‍ය සුදුසුකම් සපුරාලන කාර්ය මණ්ඩල සාමාජිකයින් මානව සම්පත් අංශයේ මානව සම්පත් අවශ්‍යතා සපුරාලීම පිණිස බඳවාගෙන ඇත.	අනුකූලවිය සුදුසුකම්ලත් සහකාර කළමනාකරුවන් දෙදෙනෙකු හා නව අභ්‍යන්තර විගණකවරයෙකු බඳවා ගැනීම මගින් බැංකුව අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව ශක්තිමත් කර ඇති අතර අභ්‍යන්තර විගණන සැලැස්ම විගණන කමිටු පත්‍රිකා අංක 19/05/03 (2019.11.14) මගින් අනුමත කර ඇත.
3.6.ii.වී.II	අභ්‍යන්තර විගණන වැඩ සටහන සහ අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ප්‍රතිඵල සමාලෝචනය කිරීම සඳහා අවශ්‍යතාවය පරිදි අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ නිර්දේශය මත සුදුසු පියවර ගැනීම සහතික කිරීම;	අනුකූලවිය			විගණන කමිටුව විසින් කාර්තුමය ලෙස අභ්‍යන්තර විගණන සැලැස්ම සහ අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ප්‍රතිඵල සමාලෝචනය කර ඇති අතර අවශ්‍ය අවස්ථාවලදී සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇත.	අනුකූලවිය 2020 වසරේ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තා පිරික්සීම සිදුකර ඇත.
3.6.ii. වී.III	අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානි හා ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ කිසියම් ඇගයීමක් හෝ තක්සේරුව පිළිබඳ සමාලෝචනය කිරීම.	අනුකූලවිය			අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානියාගේ කාර්ය සාධනය විගණන කමිටු සභාපතිවරයා විසින් ඇගැයීමට ලක් කරනු ලබයි. 2020.04.12 දින ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ පත්වීම දක්වා අභ්‍යන්තර විගණකවරයා අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානියා ලෙස වැඩ බලමින් සිටියේය.	අනුකූලවිය අභ්‍යන්තර විගණක විසින් තක්සේරු කරන විගණන අංශයේ කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ හා විගණන කමිටු සහ සහා සභාපති වරයා විසින් තක්සේරු කරන අපි අභ්‍යන්තර විගණක ගේ වැටුප් වර්ධක පත්‍රිකා නිරීක්ෂණය කරන ලදී.
3.6.ii. වී.IV	අභ්‍යන්තර විගණන කාර්යයේ ප්‍රධානි හා ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින් සහ බාහිර සේවා සපයන්නන්ගේ පත්කිරීම හෝ සේවය අවසන් කිරීම නිර්දේශ කිරීම.	අනුකූලවිය			2020 වසර තුළ සේවය අවසන් කිරීම් සිදු වී නොමැති අතර ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා කමිටුවේ නිර්දේශ මත 2020 වසරේ දෙසැම්බර් මාසයේදී පත්කර ඇත.	අනුකූලවිය ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා 2020 වසරේ දී පත්කර ඇත. 2020 වසරේ සේවය අවසන් කිරීම් සිදුවීම් නොමැත.

ආයතනික පාලනය (ඉතිරි කොටස)...

අනුක්‍රමික අංකය	විස්තරය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාල නොවේ	යොමුව	විගණන නිරීක්ෂණ
3.6.ii. වී.V	ප්‍රධාන අභ්‍යන්තර විගණක සහ බාහිර සේවා සපයන්නන් ඇතුළුව අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ජ්‍යේෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ ඉල්ලා අස්වීම් කමිටුව ඇගයීමට ලක් කරන අතර ඉල්ලා අස්වීම සඳහා හේතු ඉදිරිපත් කිරීමට ඉල්ලා අස්වන ජ්‍යේෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්ට සහ බාහිර සේවා සපයන්නන් වෙත අවස්ථාව ලබා දෙන බව පරීක්ෂා කිරීම;	අනුකූලවිය			2020 වසර තුළ සේවය අවසන් කිරීම් සිදු වී නොමැති අතර ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා කමිටුවේ නිර්දේශ මත 2020 වසරේ දෙසැම්බර් මාසයේදී පත්කර ඇත.	අනුකූලවිය වර්ෂය තුලදී කිසිදු ඉල්ලා අස්වීම්ක් සිදු වී නොමැත.
3.6.ii. වී.VI	අභ්‍යන්තර විගණන කාර්ය වීහි විගණන ක්‍රියාකාරකම් වලින් ස්වාධීනව සිදුකරන බව පරීක්ෂා කිරීම.				අභ්‍යන්තර විගණන කටයුතු ස්වාධීනව සිදුකර ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව තහවුරු කරන බව විගණන කමිටු ප්‍රඥප්තිය සඳහන් කරයි. අභ්‍යන්තර විගණන කාර්ය වය විගණන කරන කටයුතු ස්වාධීන වේ	අනුකූලවිය අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු ප්‍රඥප්තිය නිරීක්ෂණය කරන ලදී.
3.6.ii.ඔ	අභ්‍යන්තර පරීක්ෂණවලින් සොයාගත් කරුණු හා වී සඳහා කලමනාකරණය දැක්වූ ප්‍රතිචාර කමිටුව විසින් සැලකිල්ලට ගෙන ඇත්දැයි තහවුරු කරගැනීම පිණිස අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා පරීක්ෂා කිරීම.	අනුකූලවිය			සමාලෝචිත කාලසීමාව තුළ කමිටුවල වාර්තා සොයාගත් ප්‍රධාන කරුණු හා වී සඳහා කලමනාකරණය දැක්වූ ප්‍රතිචාර සමාලෝචනය කර ඇත.	අනුකූලවිය පහත සඳහන් පරිදි විගණන කමිටු වාර්තා නිරීක්ෂණය කරන ලදී. රැස්වීම් දිනය දිනය - 2020.04.24 රැස්වීම් දිනය දිනය - 2020.06.23 රැස්වීම් දිනය දිනය - 2020.09.14 රැස්වීම් දිනය දිනය - 2020.09.29 රැස්වීම් දිනය දිනය - 2020.11.19 රැස්වීම් දිනය දිනය - 2020.12.11
3.6.ii.ඕ	කමිටුව විධායක අධ්‍යක්ෂවරුන් නොමැතිව බාහිර විගණකරුවන් සමග අවම වශයෙන් කමිටු රැස්වීම දෙකක් පවත්වා ඇත්දැයි පරීක්ෂා කිරීම.	අනුකූලවිය			විගණකාධිපතිගේ නියෝජිතයෙක් සැම අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීමකටම සහභාගි වේ. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවට විධායක අධ්‍යක්ෂවරුන් ඇතුළත් නොවේ.	අනුකූලවිය 2020 වසර තුළදී විගණකාධිපතිවරයාගේ නියෝජිතයකු සෑම විගණන කමිටු රැස්වීමක් සඳහාම සහභාගී වී ඇත.

ආයතනික පාලනය (ඉතිරි කොටස)...

අනුක්‍රමික අංකය	විස්තරය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාල නොවේ	යොමුව	විගණන නිරීක්ෂණ
3.6.ii.ක	පහත තත්ත්වයන් තහවුරු කිරීම සඳහා කමිටුවේ සමුද්දේශ්‍ය පරීක්ෂා කරන ලදී. I. විෂය ක්ෂේත්‍රය තුළ ඇති ඕනෑම කරුණක් විභාග කිරීමේ ස්වාධීන පැහැදිලි බලය; II. එසේ කිරීම සඳහා අවශ්‍ය සම්පත් III. තොරතුරු වෙත පූර්ණ ප්‍රවේශයතා සහ IV. බාහිර වෘත්තිමය උපදෙස් ලබා ගැනීමේ බලතල හා අදාළ අත්දැකීම් ඇති බාහිර පුද්ගලයන්හට අවශ්‍ය විටක ආරාධනා කිරීම	අනුකූලවිය			අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු සමුද්දේශ්‍ය විෂය අවශ්‍ය කොන්දේසි අඩංගුවේ.	කාර්යයන් ඉටුකිරීම සඳහා අවශ්‍ය සම්පත් වෘත්තීය උපදෙස් ලබාගැනීමට ඇති බලය, තොරතුරු ලබා ගැනීමට ඇති බලය ඕනෑම කරුණක් විමර්ශනය කිරීම සහ විගණන කමිටු ප්‍රඥප්තිය අනුව කමිටුවට බලය පවරා ඇති බව තහවුරු පරීක්ෂා කරන ලදී.
3.6.ii.ග	කමිටුව අවම වශයෙන් සිව් වතාවක්වත් රැස්වී ඇති බව හා වාර්තා පවත්වාගෙන ගොස් ඇති බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය			2020 වසර තුල කමිටුව හය වතාවක් රැස්වී ඇති අතර, ඒ සම්බන්ධ වාර්තා පවත්වාගෙන යයි.	අනුකූලවිය පහත සඳහන් පරිදි විගණන කමිටු වාර්තා නිරීක්ෂණය කරන ලදී. රැස්වීම් දිනය - 2020.04.24 රැස්වීම් දිනය - 2020.06.23 රැස්වීම් දිනය - 2020.09.14 රැස්වීම් දිනය - 2020.09.29 රැස්වීම් දිනය - 2020.11.19 රැස්වීම් දිනය - 2020.12.11
3.6.ii.ච	වාර්ෂික වාර්තාවේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත කරුණු අනාවරණය කර ඇත්දැයි පරීක්ෂා කිරීම I. විගණක කමිටුවේ කටයුතු පිළිබඳ විස්තර II. වසර තුළ පැවැත්වූ විගණක කමිටු රැස්වීම් සංඛ්‍යාව, සහ III. එවැනි රැස්වීම් සඳහා එක් එක් අධ්‍යක්ෂවරයාගේ පැමිණීම පිළිබඳ විස්තර	අනුකූලවිය			අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාවක් වාර්ෂික වාර්තාව තුළ ඇතුළත් වන අතර එය අවශ්‍ය විස්තරවලින් සමන්විතය.	අනුකූලවිය 2020 වසර සඳහා කෙටුම්පත්කර ඇති වාර්ෂික වාර්තාව නිරීක්ෂණය කරන ලදී.
3.6.ii.ඩ	කමිටුවේ ලේකම් සමාගම් ලේකම් හෝ එසේ නැතහොත් අභ්‍යන්තර විගණක කාර්යයේ ප්‍රධානියා දැයි පරීක්ෂා කිරීම	අනුකූලවිය			කමිටුවේ ලේකම් අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා වේ.	අනුකූලවිය අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු ප්‍රඥප්තිය නිරීක්ෂණය කරන ලදී.

ආයතනික පාලනය (ඉතිරි කොටස)...

අනුක්‍රමික අංකය	විස්තරය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාල නොවේ	යොමුව	විගණන නිරීක්ෂණ
3.6.ii.ද	"තොරතුරු දැනගැනීමේ ප්‍රතිපත්තිය" (whistle blower) මඟින් පහත ක්‍රියාදාමය සිදුකරන්නේ දැයි පරීක්ෂා කිරීම; i. මූල්‍ය වාර්තාකරණය අභ්‍යන්තර පාලනය හෝ වෙනත් කටයුතු වල වැරදි ii. (i) ට අදාලව එවැනි කරුණු පිළිබඳව සාධාරණ හා ස්වාධීන පරීක්ෂණයක් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සැලසීමට කමිටුව වග බලා ගත යුතුය iii. අදාල පසු විපරම් පියවර	අනුකූලවිය			"තොරතුරු දැනගැනීමේ ප්‍රතිපත්තිය" (whistle blower) හඳුන්වා දී ඇති අතර එය 2019.06.24 දින අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සමාලෝචනය කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගැනිමෙන් පසු නව ප්‍රතිපත්තියක් හඳුන්වා දෙනු ලැබේ.	අනුකූලවිය බැංකුවේ "තොරතුරු දැනගැනීමේ ප්‍රතිපත්තිය" (whistle blower) නිරීක්ෂණය කරන ලදී.
3.6.iii	පහත දැක්වෙන නියමයන් මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවට අදාල වන්නේ දැයි පරීක්ෂා කිරීම.					
3.6.iii.අ	වාර්තා හා සමුද්දේශ්‍ය විෂය සමාලෝචනය කර බැංකුවේ අධ්‍යක්ෂවරුන් ප්‍රධාන විධායක නිලධාරී හා ප්‍රධාන කලමනාකරණ නිලධාරීන්හට පාරිශ්‍රමික (වැටුප්, දීමනා හා වෙනත් මූල්‍ය ගෙවීම්) ප්‍රමාණය තීරණය කිරීම සඳහා කමිටුව ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කර ඇත්දැයි පරීක්ෂා කිරීම.	අනුකූලවිය			දැනට පාරිශ්‍රමිකය පහත පරිදි තීරණය කරයි. රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක පී.ඊ.ඩී.3/2015 හා රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක PED 01/2020 අධ්‍යක්ෂවරු හා සභාපතිවරයා-සඳහා සහ ප්‍රධාන රාජ්‍ය බැංකු තුනක වැටුප් වර්ධක සලකා බලමින් සාමූහික ගිවිසුමක් මඟින් ප්‍රධාන කලමනාකරණ නිලධාරීන්ගේ පාරිශ්‍රමික තීරණය කරන අතර ඉන්පසු ඒවා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරයි.	අනුකූලවිය රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක PED 01/2020 සහ රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක පී.ඊ.ඩී.3/2015 මඟින් පරීක්ෂා කරන ලදී.

ආයතනික පාලනය (ඉතිරි කොටස)...

අනුක්‍රමික අංකය	විස්තරය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාල නොවේ	යොමුව	විගණන නිරීක්ෂණ
3.6.iii.ආ	අධ්‍යක්ෂවරුන් ප්‍රධාන විධායක නිලධාරී හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා ඉලක්ක හා පරමාර්ථ ලිඛිතව සකසා ඇත්දැයි පරීක්ෂා කිරීම.	අනුකූලවිය			අධ්‍යක්ෂවරු, ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී සහ ප්‍රධාන කළමනාකාර නිලධාරීන් සඳහා ඉලක්ක හා අරමුණු 2020-2024 සංශෝධිත ආයතනික සැලැස්මේ හා ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇත. කලින් කලට සපයා ඇති ඉලක්ක හා අරමුණු සඳහා ප්‍රධාන කළමණාකරණයේ නිලධාරීන් හා ප්‍රධාන විධායක නිලධාරියාගේ කාර්යසාධන මට්ටම් තවදුරටත් ක්‍රියාවලි ගත කරමින් පවතී. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව ප්‍රධාන කාර්යසාධන මට්ටම් අංශ ප්‍රධානීන්හට කාර්තුමය පදනමකින් වාර්තා කරන අතර මෙතෙක් ලබා ඇති ප්‍රගතිය කාර්තුමය වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තාකර ඇත.	අනුකූලවිය 2020-2024 ආයතනික සැලැස්ම හා 2020 ක්‍රියාකාරී සැලැස්ම මගින් පරීක්ෂා කර ඇත.
3.6.iii.ඇ	ප්‍රධාන විධායක නිලධාරී හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්හට ලබා දී ඇති ඉලක්ක හා අරමුණු පිළිබඳව කාලීනව කාර්යසාධන ඇගැයීම් සිදු කිරීමට කමිටුව අවධානය යොමුකර ඇත්දැයි හා ඔවුන්ගේ පාරිශ්‍රමික ප්‍රතිලාභ හා කාර්යසාධනය පදනම් කරගත් දිරි දීමනා වැනි වෙනත් ගෙවීම් සංශෝධනය කිරීමේ පදනම පිළිබඳ පරීක්ෂා කිරීම.	අනුකූල නොවිය			ප්‍රධාන විධායක නිලධාරියාගේ කාර්යසාධනය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වාර්ෂිකව ඇගයීමට ලක් කරයි. ප්‍රධාන කළමණාකරනයේ නිලධාරීන්ගේ කාර්යසාධනය දී තිබෙන ප්‍රධාන කාර්ය සාධන මට්ටම් සඳහා ඔවුන්ගේ කාර්යසාධනය අධීක්ෂණයකර ඇගයීමට ලක්කරයි. අභ්‍යන්තර විගණකගේ කාර්යසාධන ඇගයීම විගණන කමිටුව විසින් සමාලෝචනය කරයි. ප්‍රධාන කළමනාකරු අනුකූලතාගේ කාර්යසාධන ඇගයීම අවදානම් කළමනාකරණ කමිටුව විසින් සමාලෝචනය කරයි. ප්‍රධාන කළමණාකරුයේ අවදානම් කළමනාකරුගේ කාර්යසාධන ඇගයීම අවදානම් කළමනාකරන කමිටුව විසින් සමාලෝචනයය කරයි. ප්‍රධාන විධායක නිලධාරියාගේ හා ප්‍රධාන කළමණාකරනයේ නිලධාරීන්ගේ පාරිශ්‍රමික සාමූහික ගිවිසුම පදනම් කරගෙන අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරයි.	අනුකූල නොවිය 2020 වසරේ ප්‍රධාන කළමණාකරන නිලධාරීන්ගේ කාර්යසාධන ඇගයීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදුකර ඇති අතර අභ්‍යන්තර විගණකගේ කාර්යසාධන ඇගයීම් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සිදුකරයි. ප්‍රධාන කළමනාකරු අනුකූලතාගේ කාර්යසාධන ඇගයීම අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් සමාලෝචනය කරයි. ප්‍රධාන කළමනාකරු අවදානම් කළමනාකරණගේ කාර්යසාධන ඇගයීම අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් සමාලෝචනය කරනු ලබන බව අපි නිරීක්ෂණය කළෙමු. කෙසේ නමුත් ප්‍රධාන විධායක නිලධාරියාගේ හා ප්‍රධාන කළමණාකරන නිලධාරීන්ගේ කාර්යසාධන ඇගයීම සඳහා ආරම්භයේ දී නියමකර තිබූ ඉලක්ක හා අරමුණු බැංකුව සලකා බලා නොමැත. එඩාත් යහපත් පාලනයක් සඳහා ඉදිරියට පියනගන මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව හරහා දී තිබෙන ඉලක්ක හා අරමුණු සම්බන්ධයෙන් ප්‍රධාන විධායක නිලධාරියාගේ හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ කාර්යසාධන ඇගයීම මගින් ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට බැංකුවට සිදුවේ.

ආයතනික පාලනය (ඉතිරි කොටස)...

අනුක්‍රමික අංකය	විස්තරය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාල නොවේ	යොමුව	විගණන නිරීක්ෂණ
3.6.iii.අ	වාර්තා සමාලෝචනය කරමින් ප්‍රධාන විධායක නිලධාරියාට අදාල කරුණු සාකච්ඡා කරන කමිටු රැස්වීම් වලට ප්‍රධාන විධායක නිලධාරියා සහභාගී නොවන්නේ දැයි සමුද්දේශ්‍ය විෂයෙහි සඳහන් වීම පරීක්ෂා කිරීම	අනුකූලවිය			ප්‍රධාන විධායක නිලධාරිවරයාට සම්බන්ධ කරුණු සාකච්ඡා කරන රැස්වීම් සඳහා ඔහු සහභාගී නොවන බව මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු ව්‍යවස්ථාවේ දැක්වේ.	අනුකූලවිය බැංකුවේ HRRMC හි සමුද්දේශ්‍ය විෂය නිරීක්ෂණය කරන ලදී.
3.6.iv	පහත සඳහන් නීති නාම යෝජනා කමිටුවට අදාළ වන්නේ ද?:					
3.6.iv.අ	නව අධ්‍යක්ෂවරු ප්‍ර.වි.නි. හා ප්‍රධාන කලමනාකරණ නිලධාරී තනතුරු සඳහා තේරීම/ පත් කිරීම සඳහා ක්‍රියාපටිපාටියක් කමිටුව ක්‍රියාත්මකකර ඇත්දැයි පරීක්ෂා කිරීම.	අනුකූලවිය			1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ විධිවිධාන අනුව, අධ්‍යක්ෂවරු අමාත්‍යාංශය විසින් පත්කරනු ලබයි. ප්‍රධාන කලමනාකරණ නිලධාරීන් බඳවා ගැනීමේ පටිපාටිය අනුව තෝරා ගනී.	අනුකූලවිය 1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ විධිවිධාන අනුව, අධ්‍යක්ෂවරු අමාත්‍යාංශය විසින් පත්කරනු ලබයි. ප්‍රධාන කලමනාකරණ නිලධාරීන් බඳවා ගැනීමේ පටිපාටිය අනුව තෝරා ගනී.
3.6.iv.ආ	වත්මන් අධ්‍යක්ෂවරු නැවත පත්කිරීම සඳහා කමිටුව සලකා බලා නිර්දේශ කර (හෝ නිර්දේශ නොකර) ඇත්දැයි පරීක්ෂා කිරීම.	අනුකූලවිය			අධ්‍යක්ෂවරු අමාත්‍යවරයා විසින් පත් කරනු ලබයි. එක් අධ්‍යක්ෂවරයෙකු භාණ්ඩාගාරය නියෝජිතයෙකි.	අනුකූලවිය බැංකුවේ නාමයෝජනා කමිටුවේ ව්‍යවස්ථාවේ නිරීක්ෂණය කරන ලදී.
3.6.iv.ඇ	රැකියා විස්තර සමාලෝචනය මඟින් ප්‍ර.වි.නි. හා ප්‍රධාන කළමනාකරණ නිලධාරී තනතුරුවලට පත්කිරීම හෝ උසස් කිරීම සඳහා යෝග්‍යතාවය සලකා බැලීමට අවශ්‍ය සුදුසුකම් පළපුරුද්ද සහ අනෙකුත් ප්‍රධාන අවශ්‍යතා වැනි නිර්ණායක කමිටුව සකසා ඇත්දැයි පරීක්ෂා කිරීම	අනුකූලවිය			ප්‍ර.වි.නි. හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් පත්කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් පළපුරුද්ද බඳවා ගැනීමේ පටිපාටිය තුළ ඇතුළත් වේ.	අනුකූලවිය ප්‍ර.වි.නි. හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් පත්කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් පළපුරුද්ද බඳවා ගැනීමේ පටිපාටිය තුළ ඇතුළත් වේ.
3.6.iv.ඈ	ව්‍යාවස්ථාවෙහි හා විධිවිධාන 3 (3) හි නිර්ණායකයන්හි දක්වා ඇති පරිදි තමන් දරන නිලය සඳහා තමන් සුදුසු හා උචිත පුද්ගලයින් බවට අත්සන් කල ප්‍රකාශනයක් අධ්‍යක්ෂවරුන්, ප්‍ර.වි.නි. හා ප්‍රධාන කලමනාකරණ නිලධාරීන්ගෙන් කමිටුව ලබාගෙන ඇත්දැයි පරීක්ෂා කිරීම.	අනුකූලවිය			අධ්‍යක්ෂවරු සියළු දෙනා විසින් සම්පූර්ණ කළ ප්‍රකාශ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් ලබාගෙන ඇති අතර, ශ්‍රී ලංකා මහ බැංකුවට යොමුකර ඇත. ප්‍ර.වි.නි. ගේ හා ප්‍රධාන කලමනාකරණ නිලධාරීන්ගේ සම්පූර්ණ කළ ප්‍රකාශන මානව සම්පත් අංශයෙන් ලබාගෙන ඇති අතර, ශ්‍රී ලංකා මහ බැංකුවට යොමුකර කර ඇත.	අනුකූලවිය අධ්‍යක්ෂවරු සියළු දෙනා විසින් සම්පූර්ණ කළ ප්‍රකාශ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් ලබාගෙන ඇති අතර, ශ්‍රී ලංකා මහ බැංකුවට යොමුකර ඇත. ප්‍ර.වි.නි. ගේ හා ප්‍රධාන කලමනාකරණ නිලධාරීන්ගේ සම්පූර්ණ කළ ප්‍රකාශන මානව සම්පත් අංශයෙන් ලබාගෙන ඇති අතර, ශ්‍රී ලංකා මහ බැංකුවට යොමුකර කර ඇත.

ආයතනික පාලනය (ඉතිරි කොටස)...

අනුක්‍රමික අංකය	විස්තරය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාළ නොවේ	යොමුව	විගණන නිරීක්ෂණ
3.6.iv.ඉ	විශ්‍රාම යන අධ්‍යක්ෂවරුන් හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා විධිමත් අනුප්‍රාප්තික සැලැස්මක් පිළිබඳව කමිටුව අවධානය යොමුකර ඇත්දැයි පරීක්ෂා කිරීම.	අනුකූලවිය			1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතිය මගින් අධ්‍යක්ෂවරු පත් කිරීම පාලනය වන අතර ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩලයට කලින් කලට අධ්‍යක්ෂවරු පත්කිරීම/නම් කිරීම අමාත්‍යවරයා විසින් සිදු කරයි. ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා අනුප්‍රාප්තික සැලැස්මක් මීලග අවුරුදු 5 සඳහා 2017 වසරේ දී සලකා බලා ඇත.	අනුකූලවිය අධ්‍යක්ෂවරු අමාත්‍යවරයා විසින් පත්කරනු කරනු ලබයි. මීලග අවුරුදු 5 සඳහා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ විධිමත් අනුප්‍රාප්තික සැලැස්ම කමිටුව, විසින් 2017 වසරේ පළමු කාර්තුවේදී සලකා බලා ඇත.
3.6.iv.ඊ	ස්වාධීන අධ්‍යක්ෂවරුන් බහුතරයකින් සමන්විත කමිටුවේ සභාපතිත්වය ස්වාධීන අධ්‍යක්ෂවරයෙක් විසින් දරන බව පරීක්ෂා කිරීම. ප්‍ර.වි.නි. හට ආරාධනයෙන් රැස්වීම් වලට සහභාගී විය හැක.	අනුකූලවිය			සියළුම අධ්‍යක්ෂවරු (සභාපතිවරයා ද ඇතුළුව) ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු වන අතර, ඔවුන් අමාත්‍යවරයා විසින් පත්කරනු ලබයි. ප්‍ර.වි.නි. ආරාධනයෙන් රැස්වීම් සඳහා සහභාගී වෙයි. අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව සඳහා සාමාජිකයින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කර ඇත.	අනුකූලවිය සියළුම අධ්‍යක්ෂවරු (සභාපතිවරයා ද ඇතුළුව) ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු වන අතර, ඔවුන් අමාත්‍යවරයා විසින් පත්කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව සඳහා සාමාජිකයින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කර ඇත.
3.6.v	පහත සඳහන් නීති අධ්‍යක්ෂ මණ්ඩල වීකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට (IRMC) අදාළ වන්නේ දැයි පරීක්ෂා කිරීම:					
3.6.v.අ	විධායක නොවන අධ්‍යක්ෂවරු අවම වශයෙන් තිදෙනෙක් හා ප්‍ර.වි.නි. සහ ණය, වෙළඳපොල, ද්‍රවශීලතා, මෙහෙයුම් හා ක්‍රමෝපායික අවදානම් වැනි පුළුල් අවදානම් අධීක්ෂණය කරන ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගෙන් කමිටුව සමන්විත වන අතර, කමිටුවට පවරා ඇති බලතල හා වගකීම් රාමුව තුළ කටයුතු කරයි.	අනුකූලවිය			අධ්‍යක්ෂ මණ්ඩල වීකාබද්ධ අවදානම් කළමනකරණ කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරු තිදෙනෙකුගෙන්, එක් විකල්ප අධ්‍යක්ෂවරයෙක්, ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරි සහ - අවදානම් කළමනාකරණ ප්‍රධානී සහ මෙම කමිටුවේ ලේකම්ගෙන් සමන්විත වේ.	අනුකූලවිය අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු සඳහා අධ්‍යක්ෂවරු පත්කිරීම අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 20.01.03. මගින් පරීක්ෂා කරන ලදී.

ආයතනික පාලනය (ඉතිරි කොටස)...

අනුක්‍රමික අංකය	විස්තරය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාල නොවේ	යොමුව	විගණන නිරීක්ෂණ
3.6.v.ආ	බැංකුව මුහුණ දෙන ණය, වෙළෙඳපොල, ද්‍රවශීලතා, මෙහෙයුම් හා ක්‍රමෝපායික අවදානම් යන සියලුම අවදානම් මාසික පදනමක් මත සුදුසු අවදානම් දර්ශක හා කලමනාකරණ තොරතුරු මගින් තක්සේරු කිරීමේ ක්‍රියාවලියක් කමිටුවට තිබේ දැයි පරීක්ෂා කිරීම. පරිපාලිත සමාගම් හා ආශ්‍රිත සමාගම් සම්බන්ධයෙන්, බැංකු පදනම මත හා සමූහ පදනම මත අවදානම් කලමනාකරණය සිදු කරයි.	අනුකූලවිය			අවදානම් කලමනාකරණ අංශය (RMD) මගින් ණය අවදානම, වෙළෙඳපොල අවදානම හා මෙහෙයුම් අවදානම, ක්‍රමෝපායික අවදානම සහ ද්‍රවශීලතා අවදානම ප්‍රමාණවත් අයුරින් තක්සේරුකර, කාර්තුමය පදනම්න් වාර්තා මෙම කමිටුවට අමතරව අවදානම් හිමිකරුවන්ට තම අවදානම් හඳුනා ගැනීම සඳහා අවදානම් කලමනාකරණ අංශ පරිශීලකයින් වෙත යොමු කර ඇත.	අනුකූලවිය කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් කාර්තුමය පදනම මත රැස්වීම් පැවැත්වීමට බැංකුවට නොහැකි වූ අතර 2020 වසර සඳහා පහත පරිදි රැස්වීම් වාර හතරක් පවත්වා ඇත. 2020 අගෝස්තු 25 2020 සැප්තැම්බර් 24 2020 ඔක්තෝම්බර් 22 2020 දෙසැම්බර් 11 මෙම රැස්වීම් වාර්තා අපි නිරීක්ෂණය කළෙමු.
	කමිටුව විසින් විශේෂයෙන් සඳහන් කර ඇති පරිදි ප්‍රමාණාත්මක හා ගුණාත්මක අවදානම් සීමාතුල මෙම අවදානම් කලමනාකරණය කිරීමට හා විශේෂිත අවදානම් සඳහා අවධානය යොමුකිරීමට ණය කමිටුව සහ වත්කම් හා බැරකම් කළමනාකරණ කමිටුව වැනි සියලුම කළමනාකරණ මට්ටමේ කමිටුවල ප්‍රමාණාත්මක බව හා ඵලදායී බව කමිටුව සමාලෝචනය කරයි.	අනුකූලවිය			බැංකුවේ අවදානම් රුචි මට්ටම් මගින් විශේෂයෙන් සඳහන් කර ඇති පරිදි ප්‍රමාණාත්මක හා ගුණාත්මක අවදානම් සීමා ඇතුළත මෙම අවදානම් කළමනාකරණය කිරීම තහවුරු කිරීමට විශේෂිත අවදානම්වල ප්‍රමාණාත්මක බව හා ඵලදායී බව තක්සේරු කිරීම සඳහා ණය කමිටුව හා වත්කම් හා බැරකම් කළමනාකරණ කමිටුව වැනි කළමනාකරණ මට්ටමේ කමිටුවල වාර්තා කමිටුවට සමාලෝචනය කරයි.	අනුකූලවිය ණය කමිටුව සහ වත්කම් හා බැරකම් කළමනාකරණ කමිටුව වැනි කළමනාකරණ මට්ටමේ කමිටුවල වාර්තා කමිටුව සමාලෝචනය කරයි.
3.6.v.ඈ	විශේෂයෙන් සඳහන් කර ඇති ප්‍රමාණාත්මක හා ගුණාත්මක අවදානම් සීමා ඉක්මවන අවදානම් දර්ශක සියල්ල කමිටුව සමාලෝචනය කර සැලකිල්ලට ලක්කර ඇත්දැයි පරීක්ෂා කරන ලදී.	අනුකූලවිය			විශේෂයෙන් සඳහන් කර ඇති ප්‍රමාණාත්මක හා ගුණාත්මක අවදානම් සීමා ඉක්මවන අවදානම් දර්ශක සියල්ල කමිටුව සමාලෝචනය කර සැලකිල්ලට ලක්කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව වෙත යොමු කරන ලද අවදානම් මට්ටම් සාරාංශ පත්‍රිකාවෙන් විචක්ෂණ මට්ටමින් ඉදිරියට ගිය අවදානම් දර්ශක පිළිබඳ කමිටුව විශේෂ අවධානය යොමුකිරීමත් නිසි උපදෙස් ලබාදීමත් සිදු කර ඇත.	අනුකූලවිය කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් කාර්තුමය පදනම මත රැස්වීම් පැවැත්වීමට බැංකුවට නොහැකි වූ අතර 2020 වසර සඳහා පහත පරිදි රැස්වීම් වාර හතරක් පවත්වා ඇත. 2020 අගෝස්තු 25 2020 සැප්තැම්බර් 24 2020 ඔක්තෝම්බර් 22 2020 දෙසැම්බර් 11 මෙම රැස්වීම් වාර්තා අපි නිරීක්ෂණය කළෙමු.

ආයතනික පාලනය (ඉතිරි කොටස)...

අනුක්‍රමික අංකය	විස්තරය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාල නොවේ	යොමුව	විගණන නිරීක්ෂණ
3.6.v.ඉ	අවම වශයෙන් කාර්තුවකට කම්ටුව කොපමණ වාරයක් රැස්වී ඇත්දැයි පරීක්ෂා කිරීම.	අනුකූලවිය			අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කලමනාකරණ කමිටුව 2020 වසර තුළ හතර වරක් හමුවී ඇත.	අනුකූලවිය කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් කාර්තුමය පදනම මත රැස්වීම් පැවැත්වීමට බැංකුවට නොහැකි වූ අතර 2020 වසර සඳහා පහත පරිදි රැස්වීම් වාර හතරක් පවත්වා ඇත. 2020 අගෝස්තු 25 2020 සැප්තැම්බර් 24 2020 ඔක්තෝම්බර් 22 2020 දෙසැම්බර් 11 මෙම රැස්වීම් වාර්තා අපි නිරීක්ෂණය කළෙමු.
3.6.v.ඊ	සුවිශේෂී අවදානම් හඳුනාගැනීමට අපොහොසත්වීම සඳහා වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත්ව සැකසූ විනය ක්‍රියාමාර්ග ක්‍රමවේදයක් කමිටුව විසින් සමාලෝචනය කර ක්‍රියාත්මක කලේ දැයි පරීක්ෂා කිරීම.	අනුකූලවිය			සියළුම විනය ක්‍රියාමාර්ග රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ විනය කලමනාකරණ නීතිරීති මගින් පාලනය කරන අතර, එවැනි පියවර ගැනීමට අවශ්‍ය වූ විටදී කමිටුවට ඒ පිළිබඳ දන්වනු ලබයි.	අනුකූලවිය බැංකුවේ ණය වංචාවට එරෙහි විනය ක්‍රියාමාර්ගවල වත්මන් තත්ත්වය සඳහන් කරමින් මානව සම්පත් අංශය විසින් ලබාදෙන ලද කාර්ය සටහන මගින් බැංකුවේ විනය නීති මැනුවලය පරීක්ෂාකර තහවුරු කරන ලදී.
3.6.v.උ	කම්ටුව එක් එක් රැස්වීමකින් සතියක කාලයක් ඇතුළත අධ්‍යක්ෂ මණ්ඩල අදහස් එකඟත්වය හා/හෝ/විශේෂ උපදෙස් පතා අවදානම් තක්සේරු වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන්නේ දැයි පරීක්ෂාකිරීම	අනුකූලවිය			කම්ටුව කාර්තුමය පදනමක් මත හමුවන බැවින්, එවැනි සිදුවීම් මූලිකවම සාමාන්‍යාධිකාරී (විනය බලධාරියා) වෙත වර්තා කරන අතර විනය ක්‍රියාමාර්ග ආරම්භ කරනු ලබයි.	අනුකූලවිය 2020 සැප්තැම්බර් 24 දින පැවැත්වූ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ කළමනාකරණ කමිටු රැස්වීමේ අවදානම් තක්සේරු වාර්තාව නිරීක්ෂණය කරන ලදී.
3.6.v.ඌ	බැංකුව නීති, රෙගුලාසි, නියාමන මාර්ගෝපදේශ, අභ්‍යන්තර පාලන හා සියලු ව්‍යාපාරික මෙහෙයුම් ක්ෂේත්‍රවල අනුමත ප්‍රතිපත්ති සමඟ බැංකුවේ අනුකූලතාව තක්සේරු කිරීම සඳහා කම්ටුව අනුකූලතා කාර්යයක් ස්ථාපිත කර තිබේද යන්න සහ කම්ටුව වෙත කාලීනව වාර්තා කිරීම සඳහා අනුකූලතා කාර්යය කරගෙන යාමට ප්‍රධාන කලමනාකරණ නිලධාරීන් අතරින් තෝරාගත් සුදුසු අනුකූලතා නිලධාරියෙක් සිටි ද යන්න පරීක්ෂා කිරීම.	අනුකූලවිය			අනුකූලතා කාර්යය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රධාන කළමනාකරු - අනුකූලතා පත්කර ඇත. ප්‍රධාන කළමනාකරු - අනුකූලතා විසින් අනුකූලතා කාර්ය නිතර නිතර අධ්‍යක්ෂ මණ්ඩලයටත් කාර්තුමය වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කමිටුවටත් වාර්තා කරයි.	අනුකූලවිය බැංකුවේ අනුකූලතා කාර්ය කරගෙන යෑම සඳහා ප්‍රධාන කළමනාකරු - අනුකූලතා වෙත ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කළ යෝග්‍ය හා සුදුසුබව දැක්වෙන ලිපිය ඔහුගේ රාජකාරීන් දැක්වෙන ලැයිස්තුව සහ පත්වීමේ ලිපිය නිරීක්ෂණය කරන ලදී.

ආයතනික පාලනය (ඉතිරි කොටස)..

අනුක්‍රමික අංකය	විස්තරය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාල නොවේ	යොමුව	විගණන නිරීක්ෂණ
3.7	**සම්බන්ධිත පාර්ශවකාර ගනුදෙනු**					
3.7.ඒ	යම්කිසි අයෙකු හා විශේෂයෙන්ම මෙම නියෝගයේ අරමුණ සඳහා "සම්බන්ධිත පාර්ශ්ව" ලෙස සලකා බැලිය හැකි පහත දැක්වෙන පුද්ගල වර්ග සමඟ බැංකුවේ කිසියම් හෝ ගනුදෙනුවක් සිදුකිරීමේදී ඇතිවිය හැකි බැඳියා පිළිගැටුම් වැලැක්වීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට පිළිගත් හා ලිඛිත ක්‍රියාවලියක් ඇත්දැයි පරීක්ෂා කිරීම; අ බැංකුවේ යම්කිසි පරිපාලිත සමාගම්; ආ බැංකුවේ යම්කිසි ආශ්‍රිත සමාගම් ඇ බැංකුවේ කිසියම් අධ්‍යක්ෂවරයෙකු ඈ බැංකුවේ යම්කිසි ප්‍රධාන කලමනාකරණ නිලධාරීන්; ඉ බැංකුවේ අධ්‍යක්ෂවරුන් ප්‍රධාන කලමනාකරණ නිලධාරීන් කවරෙකුගේ හෝ සමීපතම ඥාතියෙකු; ඊ බැංකුවේ සැලකියයුතු හිමිකමක් ඇති කොටස්කරුවෙක් උ බැංකුවේ කිසියම් අධ්‍යක්ෂවරයෙකු හෝ බැංකු අධ්‍යක්ෂවරුන්ගේ කිසියම් සමීප ඥාතියෙකු හෝ එහි සැලකියයුතු කොටස්කරුවන්හට සැලකියයුතු උනන්දුවක් ඇති සුවිශේෂී අවස්ථාවක	අනුකූලවිය			බැඳියා පිළිගැටුම් වැලැක්වීම සඳහා ගනුදෙනු කරගෙන යාමට පෙර සම්බන්ධිත පාර්ශ්ව හඳුනාගැනීම සඳහා ස්ථාපිත ක්‍රියාවලියක් ඇත. සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 16/08/35 2016.08.16 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා අංක 16.08.95.02	අනුකූලවිය 2016.08.16 දින දරණ අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා අංක 16.08.95.02 අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 16/08/35 මඟින් සම්බන්ධිත පාර්ශව ගනුදෙනු ප්‍රතිපත්තිය හා අනුමැතිය පරීක්ෂා කරන ලදී.
3.7.ii	පහත ආකාරවල ගනුදෙනු මෙම නියෝගයේ ආවරණය කරන සම්බන්ධිත පාර්ශ්ව සමඟ ගනුදෙනුවක් ලෙස හඳුනා ගැනීම හා වාර්තා කිරීමේ ක්‍රම වේදයක් ඇති දැයි පරීක්ෂා කිරීම.	අනුකූලවිය			සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 16/08/35 2016.08.16 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා අංක 16.08.95.02.	අනුකූලවිය 2016.08.16 දින දරණ අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා අංක 16.08.95.02 අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 16/08/35 මඟින් සම්බන්ධිත පාර්ශවකාර ගනුදෙනු ප්‍රතිපත්තිය හා අනුමැතිය පරීක්ෂා කරන ලදී.

ආයතනික පාලනය (ඉතිරි කොටස)...

අනුක්‍රමික අංකය	විස්තරය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාල නොවේ	යොමුව	විගණන නිරීක්ෂණ
3.7.ii.අ	උපරිම ණය පහසුකම් ප්‍රමාණයක් පිළිබඳ මූල්‍ය මණ්ඩල නියෝගයේ දක්වා ඇති පරිදි ඕනෑම වර්ගයක ණය මුදලක්				1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ 28 වගන්තියට අනුව, යම් අධ්‍යක්ෂවරයෙක්ට හෝ සේවකයෙක්ට හෝ යම් සමාගමකට හෝ අධ්‍යක්ෂවරයෙක්ට හෝ සේවකයෙක්ට සැලකියයුතු හිමිකමක් ඇති යම් ආයතනයකට බැංකුව විසින් කිසිදු ණය මුදලක් පිරි නොනමයි.	
3.7.ii.ආ	තැන්පත්, ණයගැනීම් හා ආයෝජන ලෙස බැංකුවේ යම්කිසි වගකීමක් නිර්මාණය කිරීම.					
3.7.ii.ඇ	බැංකුවට ලබාදෙන හෝ බැංකුවෙන් ලබා ගන්නා මූල්‍ය හෝ මූල්‍ය නොවන ආකාරයේ කිසියම් සේවා සැපයීම.					
3.7.ii.ඈ	බැංකුව හා අදාළ කිසියම් හෝ පාර්ශවයන් අතර තොරතුරු හුවමාරු හා දැනුම්දීමේ ක්‍රම ඇතිකිරීම හෝ පවත්වාගෙන යෑම මගින් එවැනි අදාළ පාර්ශ්වයන්ට වාසිවිය හැකි තීරණාත්මක තොරතුරු එසේ නැතහොත් හිමිකාරත්වයන් බෙදී යාම					
3.7.iii	ඉහත 3(7)(1) නියෝගයේ දක්වා ඇති පරිදි සම්බන්ධිත පාර්ශව සමඟ බැංකුව ගනුදෙනුවල නිරත නොවන බව සහතික කිරීමත් සහ එවැනි පාර්ශව සඳහා එකම ව්‍යාපාරයේ නිරත බැංකුවේ අනිකුත් ගනුදෙනුකරුවන්ට වඩා වැඩි සැලකිල්ලක් ලබාදෙන බවට සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට ක්‍රියාවලියක් තිබේද	අනුකූලවිය			සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත. (අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 16/08/35) 2016.08.16 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා අංක 16.08.95.02	අනුකූලවිය සම්බන්ධිත පාර්ශ්වකාර ගනුදෙනු ප්‍රතිපත්තිය අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර ඇත. 2016.08.16 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා අංක 16.08.95.02 පත්‍රිකා අංක 16/08/35

ආයතනික පාලනය (ඉතිරි කොටස)...

අනුක්‍රමික අංකය	විස්තරය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාල නොවේ	යොමුව	විගණන නිරීක්ෂණ
	අ. මෙම උප නියෝගයන්ගේ කාර්ය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරනු ලබන බැංකුවේ නියාමන ප්‍රාග්ධනයේ විචක්ෂණ මට්ටම ඉක්මවායන මුළු ශුද්ධ ණය පහසුකම් සම්බන්ධිත පාර්ශව සඳහා අනුමත කිරීම. I. "ණය පහසුකම" යන්නෙන් උපරිම ණය පහසුකම් මත 2007 අංක 7 දරණ බැංකු පනතේ නියෝගවල සඳහන් ණය පහසුකම අදහස් වේ; II. මුළු ශුද්ධ ණය පහසුකම් ගනනය කරනු ලබන්නේ මුළු ණය පහසුකම් ප්‍රමාණයෙන් එවැනි සම්බන්ධිත පාර්ශව විසින් බැංකුවේ හුවමාරු ප්‍රාග්ධනයේ හා ණය උපකරණවල වසර 5ක් හෝ ඊට වැඩි කල්පිරීමේ කාලයක් සහිත මුදල් ඇපසුරුකුම් හා ආයෝජන අඩු කිරීමෙනි; ආ. අසම්බන්ධිත සෑම පාර්ශවයක් සමග සම ගනුදෙනුවක් සඳහා බැංකුවේ ඉහළ ණය අනුපාතිකයට වඩා අවම පොලී අනුපාතයක් අයකිරීම හෝ බැංකුවේ තැන්පතු අනුපාතයට වඩා වැඩියෙන් ගෙවීම; ඇ. සම්බන්ධිත නැති පාර්ශ්ව සමඟ ගණුදෙනු කිරීමේ සාමාන්‍ය ක්‍රමයට ලබාදෙන කොන්දේසි පරයායන සහනශිලී කොන්දේසි, වෙළඳ අඩුපාඩු පියවීම හා/හෝ ගාස්තු/කොමිස් කපා හැරීම වැනි විශේෂිත සැලකීම් දැක්වීම; ඈ. ඇගැයුම් ක්‍රමවේදයකින් තොරව සම්බන්ධිත පාර්ශ්වයකින් සේවා සැපයීම සහ සේවා ලබා ගැනීම; ඉ. කාර්යසාධනය සඳහා අවශ්‍යවන සුදුසු රාජකාරී හා කාර්යයන් හැර සම්බන්ධිත පාර්ශව සමඟ යෝග්‍ය විය හැකි රහසිගත හෝ වැදගත් තොරතුරු හුවමාරුවීම සඳහා හේතුවන තොරතුරු ගලායෑමක් සහ වාර්තාකරණ ක්‍රම පවත්වාගෙන යෑම.	අනුකූලවිය			අධ්‍යක්ෂවරුන් සඳහා පහසුකම් පිරිනමා නැත. ප්‍රධාන කලමනාකරණ නිලධාරීන් විසින් ලබාගන්නා සේවක නිවාස ණය පහසුකම් අනුමත ණය සීමාව ඇතුලත පමණක් වේ.	අනුකූලවිය

ආයතනික පාලනය (ඉතිරි කොටස)...

අනුක්‍රමික අංකය	විස්තරය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාල නොවේ	යොමුව	විගණන නිරීක්ෂණ
3.7.iv	බැංකුවේ කිසියම් අධ්‍යක්ෂවරයෙකුට හා ප්‍රධාන කළමනාකරණ නිලධාරියෙකුට ණය පහසුකම් ලබාදීමේ ක්‍රමවේදයක් ඇත්දැයි යන්න හා එසේ ණය පහසුකම් දීම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී අනුමත කලයුතු බව සහ එහිදී අදාළ අධ්‍යක්ෂ හැර අධ්‍යක්ෂවරු සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු අධ්‍යක්ෂවරුන් වී සඳහා වූ යෝජනාවට පක්ෂව ඡන්දය දීමටත් එසේ ලබාදෙන ණය පහසුකම් සඳහා මූල්‍ය මණ්ඩලයද වරින්වර තීරණය කරනු ලබන ඇපයකින් ආරක්ෂා වියයුතු බව පරීක්ෂා කිරීම.			අදාල නොවේ.	එවැනි ණය මුදලක් අනුමතකර නොමැත.	අදාල නොවේ.
3.7.v.අ	බැංකුව මගින් කිසියම් පුද්ගලයෙකුට හෝ ඔහුගේ සමීප නෑදෑයකුහට හෝ සැලකියයුතු සම්බන්ධයක් ඇති පුද්ගලයෙකුට ණය පහසුකම් අනුමත කිරීමේ ක්‍රියාවලියක් බැංකුව සතුව පවතී දැයි පරීක්ෂා කිරීම.			අදාල නොවේ.	සැලකිය යුතු සම්බන්ධයක් ඇති පුද්ගලයෙකු (පසු කාලීනව බැංකුවේ අධ්‍යක්ෂ ධූරයකට පත්වන) කිසියම් කරුණකට අදාළව ණය පහසුකම් ලබාදීමේ ක්‍රමවේදයක් බැංකුව සතුව තිබේ දැයි හා මූල්‍ය මණ්ඩලය විසින් අනුමතකර ඇති අත්‍යාවශ්‍ය ඇප ලබාගැනීමට අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්කල දිනයේ සිට වසරක් ඇතුලක බැංකුව ගෙන ඇති පියවර පිළිබඳව පරීක්ෂා කිරීම.	අදාල නොවේ. එවැනි ණය පහසුකමක් අනුමතකර නොමැත.
3.7.v.ආ	උක්ත 3(7)(ඩ)(වී) උපදේශයේ දක්වා ඇති පරිදි අදාල කාලයට ඇප සපයා නොමැති අවස්ථා පරීක්ෂාකර තිබේද උක්ත 3(7)(ඩ)(වී) උපදේශයේ දක්වා ඇති පරිදි අදාල කාලයට ඇප සපයා නොමැතිවිම පරීක්ෂාකිරීම, එවැනි අධ්‍යක්ෂවරයෙකු පත්කර මාස 18ක කාලයක් ගතවීමේ දී හෝ ණය පහසුකම් අනුමත කිරීමේදී ගිවිසගත් කාලය ඇතුලත, කුමක් කලින් සිදුවූවත් පොලියක් තිබේනම් ඒ සමග ණය මුදල් ගිණුමෙන් අයවිය යුතු ප්‍රමාණය අයකර ගැනීමට බැංකුව පියවර ගෙන තිබේද? එවැනි අධ්‍යක්ෂවරයෙකු පත්කර මාස 18ක කාලයක් ගතවීමේ දී හෝ ණය පහසුකම් අනුමත කිරීමේ දී ගිවිසගත් කාලය ඇතුලත කුමක් කලින් සිදුවූවත් පොලියක් තිබේ නම් ඒ සමග ණය මුදල් ගිණුමෙන් අයවිය යුතු ප්‍රමාණය අයකර ගැනීමට බැංකුව පියවර ගෙන ඇත.			අදාල නොවේ.	එවැනි ණය පහසුකමක් අනුමතකර නොමැත.	අදාල නොවේ.

ආයතනික පාලනය (ඉතිරි කොටස)...

අනුක්‍රමික අංකය	විස්තරය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාල නොවේ	යොමුව	විගණන නිරීක්ෂණ
3.7.v.අ	ඉහත සඳහන් පරිදි නියෝගයට අවනත වීමට අපොහොසත්වන කිසියම් හෝ අධ්‍යක්ෂවරයෙකු හඳුනාගැනීමට සහ තම අධ්‍යක්ෂධුරය අතහැර ගිය අයෙකු ලෙස සැළකීමටත් එවැනි සිදුවීම් බැංකුව මහජනතාවට හෙලි කිරීමේ ක්‍රමවේදයක් ඇත්දැයි පරීක්ෂා කිරීම			අදාල නොවේ.	සිදුවී නොමැත.	අදාල නොවේ.
3.7.v.ඈ	ණය පහසුකම් අනුමතකරන සමය වන විට 3(7)(ඩ)(සී) වගන්තිය කිසියම් අධ්‍යක්ෂ වරයෙකුට අදාල නොවන්නේ දැයි පිළිබඳ තහවුරු කිරීමට ක්‍රියාවලියක් තිබේ දැයි පරීක්ෂාකිරීම, ණය පහසුකම් අනුමතකරන සමයවන විට බැංකුවේ සේවකයකුට සිටි කිසියම් අධ්‍යක්ෂවරයෙකුට 3(7)(ඩ)(සී) වගන්තිය අදාල නොවන්නේ ද පිළිබඳ තහවුරු කිරීමට ක්‍රියාවලියක් තිබේද යන්න පරීක්ෂා කිරීම සහ එම ණය පහසුකම් අනුමතකර ඇත්තේ එවැනි බැංකුවක සියලුම සේවකයින්ට අදාලවන යෝජනා ක්‍රමයක් යටතේ වන අතර එම අධ්‍යක්ෂවරයා එහි සේවකයකු වී සිටීම නිසා හා එවැනි බැංකුවක සේවකයින් සියල්ලටම අදාලවන යෝජනා ක්‍රමයක් යටතේ ණය පහසුකම් අනුමතකර ඇත.			අදාල නොවේ.	සිදුවී නොමැත.	අදාල නොවේ.
3.7.vi	එවැනි බැංකුවක සේවකයින්ට අදාලවන හෝ උක්ත 3(7)(ඩ) උපදේශයට අනුව ණය පහසුකම් හෝ සහන සැළසීමට අදාලව මූල්‍ය මණ්ඩලය විසින් අනුමතකර තිබිය හැකි ඇපය මගින් සහන අත්වීම එවන් අවස්ථාවකදී හැර කිසියම් සේවකයකුට හෝ එවැනි සේවකයකුගේ සමීප ඥාතියෙකුට හෝ සේවකයාට හෝ ඥාතියාට සම්බන්ධිත වෙනත් කිසියම් අයෙකු සඳහා හෝ ගාස්තු හා/හෝ කොමිස් කපාහැරීම බැංකුව කිසියම් ණය පහසුකමක් මුදලක් හෝ "වඩාත් හිතකර සැළකීමක්" ලබා දීම හඳුනා ගැනීමේ ක්‍රමවේදයක් ඇත්දැයි පරීක්ෂා කරන ලදී.	අනුකූලවිය			සිදුවී නොමැත.	සම්බන්ධිත පාර්ශ්වකාර ගනුදෙනු ආර් පී ඩී සඳහා වඩාත් හිත හිතකර සැලකිලිමක් බැංකුව කිසියම් ණය පසු පහසුකමක් අනුමත හෝ නොකිරීම තහවුරු කිරීම් සඳහා තොරතුරු තාක්ෂණ අංශයෙන් තහවුරු කිරීමක් ලබා ගැනීම.

ආයතනික පාලනය (ඉතිරි කොටස)...

අනුක්‍රමික අංකය	විස්තරය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාල නොවේ	යොමුව	විගණන නිරීක්ෂණ
3.7.vii.	උක්ත 3(7)(v) හා 3(7)(vi) නියෝග යටතේ බැංකුව විසින් කිසියම් ණය පහසුකමක් සඳහා මූල්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබා ගැනීමේ ක්‍රමවේදයක් ඇත්දැයි හා එවැනි අනුමැතියක කොටසක් හෝ එමඟින් ලැබෙන පොළී මුදලක් මූල්‍ය මණ්ඩලයේ පූර්ණ අනුමැතිය රහිතව බැරකර ඇති බව හා එවැනි අනුමැතිය රහිත කිසියම් බැර කිරීමක් වලංගු බවක් නැති බව පරීක්ෂා කිරීම.			අදාල නොවේ.	සිදුවී නොමැත.	අදාල නොවේ.
3.8.	**හෙළිදරව් කිරීම්**					
3.8.i.අ	අධීක්ෂණ හා නියාමන අධිකාරීන් විසින් නිර්දේශිත ආකෘතියට හා අදාල ගිණුම් කරන ප්‍රමිතීන්ට අනුව විගණනය කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සිංහල දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් සංක්ෂිප්තව සකසා ප්‍රවෘත්ති පත්‍රවල පළකිරීම, අධ්‍යක්ෂ මණ්ඩලය හෙළිදරව් කර තිබේදැයි පරීක්ෂා කිරීම.	අනුකූලවිය			අධීක්ෂණ හා නියාමන අධිකාරීන් විසින් නිර්දේශිත ආකෘතියට හා අදාල ගිණුම්කරණ පිරිවිතර වලට අනුව විගණනය කරන ලද වාර්ෂික මූල්‍ය වාර්තා පිළියෙල කරයි. තවද එම ප්‍රකාශන පහත සඳහන් පුවත්පත්වල පළ කරන ලදී. 1. ඩේලි නිවුස් 2. ලංකාදීප 3. තිනකුරල් 4. ඩේලිමිරර්	අනුකූලවිය මුදල් අංශයේ තබා ඇති ප්‍රවෘත්ති පත්‍රයේ පිටපතක් නිරීක්ෂණය කරන ලදී.
3.8.i.ඈ	කාර්තුමය මූල්‍ය ප්‍රකාශන සකස්කර සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සංක්ෂිප්තව පුවත් පත්වල පළකරන ලදී	අනුකූලවිය			ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුව කාර්තුමය මූල්‍ය ප්‍රකාශන ද ඉහත සඳහන් පරිදි ප්‍රසිද්ධ කර ඇති බව නිරීක්ෂණය කරන ලදී.	අනුකූලවිය මුදල් අංශයේ තබා ඇති ප්‍රවෘත්ති පත්‍රයේ පිටපතක් නිරීක්ෂණය කරන ලදී.
3.8.ii	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වාර්ෂික වාර්තාවේ පහත දැක්වෙන අවම හෙළිදරව් කිරීම සිදුකර ඇත්දැයි පරීක්ෂා කිරීම.					
3.8. ii.අ.	විශේෂිත හෙළිදරව් කිරීම් ඇතුළුව අදාළ ගිණුම්කරණ ප්‍රමිති හා නියාමන අවශ්‍යතාවලට අනුකූලව වාර්ෂික විගණිත මූල්‍ය ප්‍රකාශන සකස්කර ඇති බවට වූ ප්‍රකාශනය	අනුකූලවිය			මෙම විස්තර “මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම්” යටතේ එලි දක්වා ඇත	අනුකූලවිය 2020 මූල්‍ය ප්‍රකාශනවල අඩංගු 1:3 දක්වා ඇති ආයතනික තොරතුරු මඟින් පරීක්ෂා කරන ලදී.

ආයතනික පාලනය (ඉතිරි කොටස)...

අනුක්‍රමික අංකය	විස්තරය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාල නොවේ	යොමුව	විගණන නිරීක්ෂණ
3.8. ii.ආ	මූල්‍ය වාර්තාකරණ පද්ධතිය මූල්‍ය වාර්තාකරණ විශ්වාසදායිත්වය පිළිබඳ සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය සකස්කර තිබීම සහ බාහිර අවශ්‍යතා සඳහා මූල්‍ය ප්‍රකාශන සැකසීම අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලව සිදුකර තිබීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව	අනුකූලවිය			මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් බැංකුවේ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව වාර්ෂික වාර්තාවේ අඩංගුවේ.	අනුකූලවිය 2020 වාර්ෂික වාර්තාවේ අඩංගු මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් බැංකුවේ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තා නමින් නම් කර ඇති වාර්තාව මගින් පරීක්ෂා කරන ලදී.
3.8. ii.ඇ	අධ්‍යක්ෂ මණ්ඩලය උක්ත 3:8)(ii)(ආ) සඳහන් අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ ක්‍රියාකාරිත්වය පිළිබඳව බාහිර විගණන වාර්තාව ලබාගෙන ඇත්දැයි පරීක්ෂා කිරීම	අනුකූලවිය			මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් බැංකුවේ අභ්‍යන්තර පාලනය පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇත.	අනුකූලවිය 2020 කෙටුම්පත් කරන ලද වාර්ෂික වාර්තාව නිරීක්ෂණය කරන ලදී.
3.8. ii.ඈ	යෝග්‍යතාවය හා සුදුසුකම යන මාර්ගෝපදේශයට අවශ්‍යතා සැපිරීම සහ බැංකුව සමග සිදු කරන ගනුදෙනු සහ බැංකුව මගින් ගෙවනු ලබන මුළු ගෙවීම් පාර්ශ්‍රමික නම් සහ සුදුසුකම්, වයස පළපුරුද්ද ඇතුළු අධ්‍යක්ෂවරුන්ගේ විස්තර	අනුකූලවිය			අධ්‍යක්ෂවරුන්ගේ විස්තර වාර්ෂික වාර්තාවේ හෙළිදරව් කර ඇත. අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික වාර්ෂික වාර්තාවේ එළිදරව් කර ඇත.	අනුකූලවිය 2020 කෙටුම්පත් කරන ලද වාර්ෂික වාර්තාව නිරීක්ෂණය කරන ලදී.
3.8. ii. ඉ	3(7)(iii) හි පෙන්වා දී ඇති අදාළ පාර්ශ්වවල එක් එක් වර්ගය සඳහා සමස්ථ ශුද්ධ ණය පහසුකම් දීම සිදු කර ඇත. අදාළ පාර්ශ්වවල එක් එක් වර්ගය සඳහා ලබා දී ඇති ශුද්ධ ණය පහසුකම් බැංකුවේ නියාමන ප්‍රාග්ධනයේ ප්‍රතිශතයක් ලෙස හෙළිදරව් කර ඇත	අනුකූලවිය			සම්බන්ධිත පාර්ශව සඳහා ණය පහසුකම් සපයා නොමැත.	අනුකූලවිය අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් හා තොරතුරු තාක්ෂණ අංශය මගින් තහවුරු කරන ලදී.
3.8. ii. ඊ	බැංකුව විසින් එහි ප්‍රධාන කලමනාකරණ නිළධාරීන්හට ගෙවනු ලබන පාරිශ්‍රමිකවල මුළු වටිනාකම හා බැංකුව එහි ප්‍රධාන කලමනාකරණ නිලධාරීන් සමග ඇති ගනුදෙනු වල මුළු වටිනාකම ගෙවූ පාරිශ්‍රමික, ලබාදුන් ණය පහසුකම් හා බැංකුවේ කල තැන්පත් හෝ ආයෝජන ලෙස අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රභේද දක්වා ඇත.	අනුකූලවිය			ප්‍රධාන කළමණාකරන නිලධාරීන් සමඟ සිදුවූ ගනුදෙනු වාර්ෂික වර්තාවේ එළිදරව් කර ඇත.	අනුකූලවිය 2020) කෙටුම්පත් කරන ලද වාර්ෂික වාර්තාවෙන් නිරීක්ෂණය විය

ආයතනික පාලනය (ඉතිරි කොටස)...

අනුක්‍රමික අංකය	විස්තරය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාල නොවේ	යොමුව	විගණන නිරීක්ෂණ
3.8. ii.උ	අධ්‍යක්ෂ මණ්ඩලය ආයතනික පාලන නියෝග සමඟ අනුකූලතාව සම්බන්ධයෙන් බාහිර විගණන වාර්තාව ලබාගෙන ඇත්දැයි පරීක්ෂා කිරීම	අනුකූලවිය			ආයතනික පාලන නියෝග සමඟ විගණකාධිපතිවරයාගේ වාර්තාවේ අනුකූලතාවය වාර්ෂික වාර්තාවේ අඩංගුවේ.	අනුකූලවිය ආයතනික පාලන නියෝග සමඟ විගණකාධිපති වාර්තාවේ අනුකූලතාවය 2020 කෙටුම්පත් කරන ලද වාර්ෂික වාර්තාවේ අඩංගුවේ.
3.8. ii.ඌ	විචක්ෂණයෙන් යුතුව කටයුතු කිරීමේ අවශ්‍යතා නීති රෙගුලාසි හා අභ්‍යන්තර පාලනය සමඟ අනුකූලවීමේ සහ ප්‍රමාණාත්මක නොගැලපීම් නිවැරදි කිරීමට ගත් පියවර පිළිබඳව විස්තර ඇතුළත් වාර්තාවක්	අනුකූලවිය			වාර්ෂික වාර්තාවෙහි විචක්ෂණශීලිව කටයුතු කිරීමේ අවශ්‍යතාවයන්, නීති රෙගුලාසි, අභ්‍යන්තර පාලනය, සහ කිසියම් ප්‍රමාණාත්මක අනුකූල නොවීමක් නිවැරදි කිරීමට ගත් ක්‍රියා මාර්ග පිළිබඳ විස්තර ඇතුලත් වෙනම වාර්තාවක් නොමැත. කෙසේ නමුත් අදාළ නීති හා රෙගුලාසි සමඟ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාවේ අනුකූලතා ප්‍රකාශයක් අඩංගු වෙයි.	කෙටුම්පත් කරන ලද වාර්ෂික වාර්තාවෙහි ප්‍රමාණාත්මක අනුකූල නොවීමත් දැක්වෙන වෙනම වාර්තාවක් නොමැත.
3.8. ii.එ	බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් පෙන්වා දී ඇති මෙම නියෝග හා අනුකූල නොවීම හෝ බැංකුවේ අවදානම් කළමනාකරණයේ අඩුපාඩු පිළිබඳව නියාමනය හා අධීක්ෂණය පිළිබඳ ප්‍රකාශයක් එසේ නම් මෙම අඩුපාඩු පිළිබඳව බැංකුව ගත් ක්‍රියාමාර්ගයන් සමඟ මුදල් මණ්ඩලය උපදෙස් දී ඇති පරිදි එය මහජනයාට අනාවරණය කිරීම.	අනුකූලවිය			2020 වසර තුළ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් අනුකූල නොවීම සම්බන්ධයෙන් කරුණු දක්වමින් කිසිදු වාර්තාවක් ලබා දී නොමැත.	අනුකූලවිය බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් නිකුත් කර ඇති එවැනි වාර්තාවක් නොමැත.



1931 වසරේදී පිහිටුවන ලද පැරණිතම රාජ්‍ය බැංකුව

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව	65
අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටු වාර්තාව	67
අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව	68
අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව	69

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව

සභාපති වරයාගේ සමස්ථ නිරීක්ෂණය 2020

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරු තිදෙනෙකුගෙන් සමන්විත වන අතර, බලපත්‍රලාභී බැංකු සඳහා ආයතනික පාලනය පිළිබඳ 2007 අංක 12 දරණ මහ බැංකු පනත් නියෝගය යටතේ 3 (6) (11) හි දක්වා ඇති කරුණු, අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත විගණන ප්‍රඥප්තිය සහ අදාළ අධ්‍යක්ෂ මණ්ඩල තීරණවලට අනුකූලව කමිටුවේ කටයුතු පවත්වාගෙන යයි.

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ (BAC) අරමුණ වන්නේ එහි ආයතනික පාලන ව්‍යවහාරවල විනිවිදභාවය තහවුරු කිරීම වේ. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව, බැංකුවේ මූල්‍ය පරිපාලනය සහ මෙහෙයුම් කටයුතු පිළිබඳ ස්වාධීන වාස්තවික සමාලෝචනයක් සහතික කිරීමට සහ මහ බැංකුව විසින් දෙනලද මඟපෙන්වීම්වලට අනුකූලවීමට, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත විෂය ක්ෂේත්‍රය අනුගමනය කරමින් අභ්‍යන්තර හා බාහිර සාධක මගින් හැඩගැසෙමින් එහි න්‍යාය පත්‍රය සමඟ තවත් වසරක් ප්‍රත්‍යක්ෂ කර ඇත.

කමිටුවේ සංයුතිය

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC) පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත වන අතර, 2020 වසර තුළ රැස්වීම් ගණන හා පැමිණීම පහත දැක්වේ. සාමාන්‍යාධිකාරී සහභාගි වන්නේ ආරාධනයෙනි.

	සාමාජිකයා	අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ දරන තනතුර	කමිටු සාමාජිකයා		2020 වසර තුලදී පැමිණි රැස්වීම් වාර ගණන
			සිට	දක්වා	
1	ඩබ්.සී.විත්. කුරේ මහත්මිය	සභාපති (විධායක නොවන අධ්‍යක්ෂ)	අප්‍රේල් 2020	අද දක්වා	06
2	එච්.සී. දිලිප් ලාල් සිල්වා මහතා	සාමාජික (විධායක නොවන අධ්‍යක්ෂ)	අප්‍රේල් 2020	අද දක්වා	06
3	එස්.කේ.එල්. ගලප්පත්ති මහතා	සාමාජික (විධායක නොවන අධ්‍යක්ෂ)	අප්‍රේල් 2020	අද දක්වා	05

මෙම කමිටුවේ සියලුම සාමාජිකයන් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ වරු වන අතර ඔවුන් මූල්‍ය කළමනාකරනයේ නිපුනත්වයක් ලබා ඇති නීති, ගිණුම්, විගණන සහ මූල්‍ය ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ලබා ඇති පිරිසක් වේ. සාමාජිකයින්ගේ විස්තර මෙම වාර්ෂික වාර්තාවේ දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු ප්‍රඥප්තිය අනුව, අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරයි. විගණකාධිපතිවරයාගේ නියෝජිතයින් (බැංකුවේ බාහිර විගණක) ප්‍ර.වි.නි. සහ තවත් ජ්‍යේෂ්ඨ නිලධාරියකු ආරාධනයෙන් රැස්වීම්වලට සහභාගී වෙයි.

අභ්‍යන්තර විගණනය සහ අධ්‍යක්ෂ මණ්ඩල විගණන ප්‍රඥප්තිය

අභ්‍යන්තර විගණනයට සහ අධ්‍යක්ෂ මණ්ඩල විගණනයට එහි කාර්යයන් කාර්යක්ෂමව හා ස්වාධීනව කරගෙන යාමට සහයවීම පිණිස විගණන ප්‍රඥප්තිය භාවිතා කරනු ලබයි. විගණන කමිටුවේ විෂයපථය, කාර්යයන්, වගකීම්, බලතල, වාර්තාකරණ ක්‍රියාපටිපාටිය, ස්වාධීනත්වය සහ විෂයමූලිකත්වය මෙම ප්‍රඥප්තියේ ඇතුළත් වේ.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු ප්‍රඥප්තියේ දක්වා ඇති සමුද්දේශ්‍ය විෂයට අනුව කමිටුව කටයුතුකර ඇත. ප්‍රඥප්තියේ දක්වා ඇති පරිදි පහත දෑ සඳහා අධීක්ෂණ වගකීම් ඉටුකිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට සහයවීම කමිටුවේ විෂය පථය විය.

(අ) බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල විශ්වාසනීයත්වය;

(ආ) බැංකුවේ අවදානම් කළමනාකරණ කාර්යයේ ඵලදායිත්වය,;

(ඇ) නීතිමය සහ නියාමන අවශ්‍යතාවයන් සඳහා බැංකුවේ අනුකූලතාවය;

(ඈ) බැංකුවේ බාහිර විගණන කාර්යයේ කාර්යසාධනය, ; සහ

(ඉ) බැංකුවේ අභ්‍යන්තර විගණන කාර්යයේ කාර්යසාධනය.

වාර්තාකරණය

කමිටුව රැස්වීම්වල වාර්තා සමඟ එහි කටයුතු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සෘජුවම වාර්තා කරයි. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව අභ්‍යන්තර විගණනය, බාහිර විගණනය සහ අධ්‍යක්ෂ මණ්ඩලය අතර විවෘත සන්නිවේදන මාවතක් ලබා දේ. කමිටුවේ විෂය ක්ෂේත්‍රය සියලුම වැදගත් අංශ තුළ සකස් කර ඇති බව කමිටුවේ මතය වේ.

කමිටුවේ කාර්යය හා වගකීම

බැංකුවේ මූල්‍ය, පරිපාලන හා මෙහෙයුම් කටයුතු කරගෙන යෑම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහය දැක්වීම අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ අරමුණ වේ. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ විෂය පථයට පහත සඳහන් කරුණු ඇතුලත් වේ.

- බැංකුවේ මූල්‍ය වාර්තාකරනය ගිණුම්කරණ ප්‍රමිතීන් (LKAS) හා අනුකූලවේ ද යන්න නිරීක්ෂණය කිරීම.
- මෙහෙයුම් හා මූල්‍ය පාලන පද්ධතියේ ගුණාත්මක බව සමාලෝචනය කිරීම.
- අභ්‍යන්තර විගණනයේ විෂයපථය හා කාර්ය සාධනය ඇගයීම නිරීක්ෂණය කිරීම හා සමාලෝචනය කිරීම.
- බැංකුව මුහුණදෙන අවදානම් වැලක්වීමට/අවම කිරීමට අභ්‍යන්තර ක්‍රියාමාර්ග හා පාලන පද්ධතියේ ප්‍රමාණාත්මකභාවය සමාලෝචනය කිරීම.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව (ඉතිරි කොටස)...

- සියළුම නියාමන අවශ්‍යතාවයන් සමග අනුකූලවීම නිරීක්ෂණය කිරීම සහ සමාලෝචනය කිරීම.
- විගණන විෂයපථය හා වාර්තා පිලිබඳව බාහිර විගණකවරුන් සමග සහයෝගයෙන් ක්‍රියා කිරීම.

රැස්වීම්

2020 වර්ෂය තුළ දී කමිටුව රැස්වීම් වාර හයක් (06) පවත්වා ඇත. ආරාධනය අනුව මෙම කමිටුවේ රැස්වීම් සඳහා විගණකාධිපතිගේ නියෝජිතයෙක් ලෙස රජයේ විගණන අධිකාරී සහභාගි විය. රැස්වීම්වලදී සාකච්ඡා කල කරුණු පිළිබඳ කෙටි විස්තරයක් පහත සඳහන් වේ.

2020 වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ කටයුතු

කමිටුව පහත සඳහන් කාර්යයන් සිදුකර ඇත. :

01. විගණන කමිටුව විසින් 2020 වසරේ ක්‍රියාත්මක කිරීම සඳහා කාර්තුමය වශයෙන් අවදානම් පදනම් අභ්‍යන්තර විගණන සැලැස්ම අනුමතකර සමාලෝචනය කරන ලදී.
02. 2019 වසර සඳහා විගණකාධිපතිගේ විමසුම්වල පිළිතුරුවල ප්‍රගතිය සමාලෝචනය කරන ලදී.
03. ශාඛාවන් හි අයවැය ඉලක්ක ලබා ඇති ප්‍රගතිය තුන් මසකට වරක් කමිටුව සමාලෝචනය කළ අතර මතු බලාපොරොත්තු ඉලක්ක ලබා ඇති ප්‍රගතිය, ශාඛා මගින් පවත්වාගෙන යන වාර්තා හා ලේඛණ පිලිබඳව ද කමිටුව විශේෂ අවධානයක් යොමු කරන ලදී.
04. 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සහ 2020 මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 දිනෙන් අවසන් වූ කාර්තුවල බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කර ඒවා අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කර ඇත.
05. සියළුම නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලව බැංකුවේ මූල්‍ය හා මෙහෙයුම් කටයුතු සිදුවන බව තහවුරු කිරීම සඳහා කමිටුව විසින් ත්‍රෛමාසික සමාලෝචනයක් සිදුකර ඇත.
06. අභ්‍යන්තර විගණන අංශයේ කාර්යසාධනය පිළිබඳ ත්‍රෛමාසික සමාලෝචනයක් සිදුකර ඇත
07. අභ්‍යන්තර විගණන අංශයේ ජ්‍යේෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ කාර්යසාධනය ඇගයීම සිදුකර ඇත
08. බැංකුවේ මූල්‍ය, පරිපාලන සහ මෙහෙයුම් කටයුතු පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තා සඳහා කළමනාකරණයේ ප්‍රතිචාරය කමිටුව විසින් නිරීක්ෂණය කර සමාලෝචනය කර ඇත. කමිටුව අභ්‍යන්තර විගණන අංශයේ කාර්ය සාධනයේ ඵලදායී බව සමාලෝචනය කර ඇත. අභ්‍යන්තර විගණන පැවරුම්වල ප්‍රමාණවත්බව හා ඒවා අනුමත කරන ලද විගණන වැඩසටහනට අනුව ඉටුකිරීම පිළිබඳව ද නිරීක්ෂණය කරයි.

බාහිර විගණන වාර්තා

ව්‍යවස්ථාව අනුව, විගණකාධිපති බැංකුවේ බාහිර විගණකවරයා වේ. කමිටු රැස්වීම් තුළ බාහිර විගණකගේ සොයාගැනීම් සාකච්ඡා කිරීමට බාහිර විගණකට ආරාධනය කරන ලදි. විගණනයේ අරමුණ සඳහා බාහිර විගණකට අවශ්‍යවන සියලුම තොරතුරු සහ ලියවිලි ලබාදීම කමිටුව සහතික කර ඇත. අවසන් විගණන වාර්තාවේ වැදගත් කර ඇති බාහිර විගණනයේ දී සැලකිල්ලට බඳුන් වූ කරුණු සමාලෝචනය කර ඇති අතර, බාහිර විගණකවරුන්ගේ සැලකිල්ලට යොමු වූ කරුණු සඳහා අවධානය යොමුකර වීමට කළමනාකාරිත්වය ගත් නිවැරදි කිරීමේ ක්‍රියා මාර්ගවල ප්‍රමාණවත් බව ද සමාලෝචනය කර ඇත.

අභ්‍යන්තර පාලන පද්ධතිය

අභ්‍යන්තර පාලන පද්ධතිය පිළිබඳ අත්පොතේ අර්ථ දක්වා ඇති අභ්‍යන්තර පාලන පද්ධතියට අනුකූලව බැංකුවේ මූල්‍ය හා මෙහෙයුම් කටයුතු සඳහා අදාළ, තොරතුරු තාක්ෂණ හා අභ්‍යන්තර පාලන පද්ධතියේ ඵලදායී බව අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් කමිටුව සමාලෝචනය කර ඇත.



ඩබ්.සී.එන්. කුරේ
සභාපති - අධ්‍යක්ෂ මණ්ඩල විගණක කමිටුව

අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටු වාර්තාව

කමිටුවේ සංයුතිය

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරනු ලබන එක් විකල්ප සාමාජිකයෙකු ද ඇතුළත්ව ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු සිව් දෙනෙකුගෙන් අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුව සමන්විත වේ.

2020 වර්ෂය අවසානයේ දී අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව පහත සඳහන් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය.

2020 වසරේ සාමාජිකයින්

ආචාර්ය කේ.ඒ.යූ.කාරියවසම් මහතා	- සභාපති
එච්.සී.ඩි.එල්. සිල්වා මහතා	- සාමාජික
එස්.කේ.ඒ. ගලප්පත්ති මහතා	- සාමාජික
ඒ.ජේ.පී.එච්.බී.එම්.ආර්.එස්. බණ්ඩාර මහතා	- විකල්ප සාමාජික

ආචාර්ය ප්‍රියාත් බී. වික්‍රමසිංහ මහතා අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුවේ සභාපතිවරයා ලෙස පත්කර තිබිණි. කෙසේ නමුත් ආචාර්ය ප්‍රියාත් බී. විකමසිංහ මහතාගේ අධ්‍යක්ෂ ධූරය වෙනස් වීමත් සමග 2020.09.23 දින පැවති රැස්වීමේ දී ආචාර්ය උදයසිරි කාරියවසම් මහතා සභාපතිවරයා ලෙස පත් කර ඇත.

කමිටු රැස්වීම්

කමිටුව අවම වශයෙන් වර්ෂයකට දෙවතාවක් රැස්වියයුතු අතර අවශ්‍ය වූ අවස්ථාවකවක දී රැස්වීම් කැඳවිය හැකි වෙයි. ගණපූර්ණය සාමාජිකයින් දෙදෙනකු වන අතර ඔවුන් දෙදෙනාම පුද්ගලිකවම රැස්වීම් සඳහා සහභාගිවන ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු වියයුතු වෙයි. කමිටුවේ සභාපතිවරයාගේ උපදෙස්මත ආරාධිතයකු ලෙස සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි. රැස්වීම් වලට සහභාගී වෙයි.

කමිටු රැස්වීම්වල කටයුතු අධ්‍යක්ෂවරුන්ගේ දැනගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට නිරතුරුව වාර්තා කෙරේ. බැංකුව සම්බන්ධයෙන්, එක් කමිටු රැස්වීමක් 2020 වසරේදී පවත්වන ලදි.

ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරයි.

කමිටුවේ විෂය පථය

ප්‍රධාන කළමනාකරණ තනතුරු සඳහා හා ප්‍රධාන විධායක නිලධාරී තනතුරට උසස් කිරීමට හෝ පත් කිරීම සඳහා සුදුසු බවට, අවශ්‍ය ප්‍රධාන අවශ්‍යතා හා පළපුරුද්ද සුදුසුකම් වැනි නිර්ණායක අනුව ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් හා ප්‍රධාන විධායක නිලධාරී පත්කිරීම හෝ තෝරාගැනීමට ක්‍රියාමාර්ග ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුව මැදිහත් වෙයි. තවදුරටත් එයට, කමිටුව කලින් කලට බැංකුවට අවශ්‍ය අතිරේක හෝ නව විශේෂඥ දැනුමේ අවශ්‍යතාවයන් නිර්දේශ කිරීම හා සලකා බැලීමට එකට එක්ව ක්‍රියා කිරීමෙන් අපේක්ෂකයින් බඳවා ගැනීමට හෝ නම් කිරීමට අවශ්‍ය යහපත් ක්‍රියාවලියක් ඇති කරයි.



ආචාර්ය උදයශ්‍රී කාරියවසම්
කමිටු සභාපති

රැස්වීම් සඳහා කමිටු සාමාජිකයන්ගේ පැමිණීම

අධ්‍යක්ෂවරයාගේ නම	කමිටුවේ දරණ තනතුර	පැවැත්වූ රැස්වීම් ගණන	සහභාගිවූ රැස්වීම් ගණන
ආචාර්ය උදයසිරි කාරියවසම් මහතා	සභාපති	1	1
ආචාර්ය ප්‍රියාත් බී. වික්‍රම මහතා	හිටපු සභාපති	1	0
එච්.සී.ඩි.එල්. සිල්වා මහතා	සාමාජික	1	0
එස්.කේ.ඒ. ගලප්පත්ති මහතා	සාමාජික	1	1
ඒ.ජේ.පී.එච්.බී.එම්.ආර්.එස්. බණ්ඩාර මහතා	විකල්ප සාමාජික	1	1

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව

2020 වසර තුළ කමිටුවේ සංයුතිය හා ගණපූරණය

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව අධ්‍යක්ෂවරු සිව් දෙනෙකුගෙන් සමන්විත වන අතර රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරනු ලබන විකල්ප සාමාජිකු ද ඒ අතර වෙයි. කමිටුවේ ගනපූරණය සාමාජිකයින් දෙදෙනෙකි.

2020 වර්ෂය අවසානයේ දී අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව පහත සඳහන් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය.

2020 වසරේ සාමාජිකයින්

ආචාර්ය උදයසිරි කාරියවසම් මහතා - සභාපති
ඒ.ජේ.පී.එච්.බී.එම්.ආර්.එස්. බණ්ඩාර මහතා - සාමාජික
එස්.කේ.ඒ. ගලප්පත්ති මහතා - සාමාජික
ඩබ්.සී.එන්. කුරේ මහත්මිය - විකල්ප සාමාජික

ආචාර්ය ප්‍රියාත් බන්දු වික්‍රම මහතා අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ විකල්ප සාමාජික ලෙස පත්කරනු ලැබිය කෙසේ නමුත් ආචාර්ය ප්‍රියත් බී. වික්‍රම මහතාගේ අධ්‍යක්ෂ තනතුර වෙනස් වීමත් සමග ඩබ්.සී.එන්. කුරේ මහත්මිය විකල්ප සාමාජික ලෙස 2020.09.23 දින පැවති රැස්වීමේදී පත්කරනු ලැබිය.

ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ ලේකම් ලෙස ක්‍රියා කරයි.

කමිටුවේ විෂයපථය

බැංකුවේ අධ්‍යක්ෂවරු ප්‍රධාන විධායක නිලධාරී (ප්‍ර.වි.නි.) සහ ප්‍රධාන කළමණාකරන නිලධාරීන්ගේ පාරිශ්‍රමික ප්‍රතිපත්තිය තීරණය කිරීම සහ මානව සම්පත් සම්බන්ධ ගැටළු නිරාකරණය කිරීම, මානව සම්පත් ප්‍රතිපත්ති, මූලෝපායන්, සැලසුම් සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම සඳහා කමිටුව මඟ පෙන්වීම් සහ උපදෙස් ලබා දෙයි. කමිටුව අධ්‍යක්ෂවරු, ප්‍ර.වි.නි.ට හා ප්‍රධාන කළමණාකරන නිලධාරීන් සඳහා ඉලක්ක හා අරමුණු නියම කරයි. ප්‍ර.වි.නි.ට හා ප්‍රධාන කළමණාකරන නිලධාරීන්ට දී තිබෙන ඉලක්ක හා අරමුණුවල කාර්යසාධනය කලින් කලට ඇගයීමට ලක්කරන අතර දිරි දීමනා මත පදනම්වූ කාර්යසාධනය සඳහා වන අනෙකුත් ගෙවීම් හා ප්‍රතිලාභ සහ පාරිශ්‍රමික සංශෝධනය සඳහා පදනමක් තීරණය කරයි.

කමිටු රැස්වීම්

මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු අවම වශයෙන් තුන් මසකට වරක් රැස්වෙන අතර අවශ්‍යවූ ඕනෑම අවස්ථාවක රැස්වීම් කැඳවිය හැකි වෙයි. 2020 වර්ෂය තුළ දී අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් පාරිශ්‍රමික කමිටු රැස්වීම් වාර දෙකක් පවත්වා ඇත.



ආචාර්ය උදයශ්‍රී කාරියවසම්
කමිටු සභාපති

රැස්වීම් සඳහා කමිටු සාමාජිකයන්ගේ සහභාගිත්වය

අධ්‍යක්ෂවරයාගේ නම	කමිටුවේ දරන තනතුර	පැවැත්වූ රැස්වීම් ගණන	සහභාගී වූ රැස්වීම් ගණන
ආචාර්ය කේ.ඩබ්.ඒ.යූ. කාරියවසම් මහතා	සභාපති	2	2
ඒ.ජේ.පී.එච්.බී.එම්.ආර්.එස්. බණ්ඩාර මහතා	සාමාජික	2	2
එස්.කේ.ඒ. ගලප්පත්ති මහතා	සාමාජිකr	2	1
ඩබ්.සී.එන්. කුරේ මහත්මිය	විකල්ප සාමාජික	2	0
ආචාර්ය ප්‍රියාත් බී. වික්‍රම මහතා	පෙර සිටි විකල්ප සාමාජික	2	0

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ සංයුතිය -2020

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරු සිව්දෙනෙක්, බැංකුවේ සාමාන්‍යාධිකාරී / ප්‍ර.වි.නි., අවදානම් කළමනාකරණ අංශ ප්‍රධානී සහ කමිටුවේ ලේකම්ගෙන් සමන්විතවේ. 2020 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් වාර හතරක් පවත්වා ඇත.

පළමුවන, දෙවන, තුන්වන සහ සිව්වන කමිටු රැස්වීම් සඳහා කමිටුවේ සංයුතිය පහත සඳහන් පරිදි වේ.

එච්.සී.ඩී.එල්. සිල්වා මහතා	- විධායක නොවන අධ්‍යක්ෂ - කමිටුවේ සභාපති
ඩබ්.සී.එන්. කුරේ මහත්මිය	- විධායක නොවන අධ්‍යක්ෂ
ඒ.ජේ.පී.එච්.බී.එම්.ආර්.එස්. බණ්ඩාර මහතා	- විධායක නොවන අධ්‍යක්ෂ
එස්.කේ.ඒ. ගලප්පත්ති මහතා	- විධායක නොවන අධ්‍යක්ෂ
ඩබ්.එම්. දයාසිංහ මහතා	- සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී
එස්.ඒ.කේ. සූරියආරච්චි මහතා	- ප්‍රධාන කළමණාකරු - අවදානම් කළමණාකරන අංශය
නිශානි ලොකුගේ මහත්මිය	- සහකාර සාමාන්‍යාධිකාරී - නීති/කමිටුවේ ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු ප්‍රඥප්තිය

ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා ආයතනික පාලනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කළ 2007 අංක 12 දරන බැංකු පනත් නියෝගයේ 3(6) (v) වගන්තියට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව පිහිටුවන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු ප්‍රඥප්තිය 2012.03.27 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර, එය කලින් කලට සමාලෝචනය කරයි. අනුමත කරගත් ප්‍රඥප්තිය තුළින් එහි බලතල, ව්‍යුහය සහ වගකීම් පිළිබඳ අර්ථ දක්වයි.

ප්‍රඥප්තියට අනුව අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ ප්‍රධාන වගකීම් පහත පරිදි වේ.

1. බැංකුවේ අවදානම් රුචිය සමාලෝචනය කිරීම.
2. බැංකුවේ ප්‍රධාන අවදානම් ප්‍රතිපත්ති සමාලෝචනය සහ අනුමත කිරීම හා විශේෂිත සීමාවන් සඳහා බැංකුවේ අනුගතවීම පිළිබඳ වාර්තා ලබා ගැනීම.
3. බැංකුව මුහුණ දෙන ණය, වෙළඳපොල, ද්‍රවශීලතා හා මෙහෙයුම් අවදානම් ඇතුළුව විවිධ අවදානම් සහ එක් එක් වර්ගවලට නිරාවරණයවීම, මෙම අවදානම් වර්ග තුළ සැලකියයුතු සංකේන්ද්‍රණ, අවදානම් නිරාවරණය මැනීම සඳහා යොදාගත් ක්‍රම සහ මෙම අවදානම් නිරාවරණයේ පිලිගතහැකි හා සුදුසු මට්ටම් පිළිබඳ කළමනාකරණයේ අදහස් පිළිබඳ වාර්තා ලබාග ැනීමත් ඒවා සමාලෝචනය කිරීමත් සමගින් කළමනාකරණයට යම් පිටුවහලක් ලබාදීම.
4. කළමනාකරණය විසින් අවදානම් නිරාවරණ පාලනය කිරීමට භාවිතා කරන වැදගත් ප්‍රතිපත්ති, ක්‍රියාවලි සහ ක්‍රම ඇතුළුව බැංකුවේ ණය, වෙළෙඳපොල, ද්‍රවශීලතා හා මෙහෙයුම් අවදානම් කළමනාකරණ රාමුව සහ අවදානම් මැනීමේ ක්‍රමවේද සහ පීඩන පරීක්ෂා ප්‍රවේශය සමාලෝචනය කිරීම
5. මෙයටම සීමා නොවූවද, බැංකුව වෙත ඇති ණය, වෙළෙඳපොල, ද්‍රවශීලතා හා මෙහෙයුම් සහ ක්‍රමෝපායික/ කීර්තිනාම අවදානම් ඇතුළු සියලුම අවදානම් සුදුසු අවදානම් දර්ශක සහ කළමනාකරණ තොරතුරු තුළින් සමාලෝචනය කිරීම.
6. බැංකුවේ ප්‍රතිපත්ති සහ නියාමන සහ අධීක්ෂණ අවශ්‍යතා මත පදනම් වී, ස්ථාපිතව පවරනලද බලතලවලට අනුකූලව අවදානම් තීරණ ගන්නා බව සහ කමිටුව විසින් නියමකළ අවදානම් ඉවසුම් සීමාව ඉක්මවන, අවදානම් අවම කිරීමට නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගන්නා බව සහතික කිරීම.
7. අවදානම් කළමනාකරණ කාර්යයේ ප්‍රමාණාත්මතාව සහ තෝරාගත් අවදානම් නිලධාරීන්ගේ සුදුසුකම් සහ පසුබිම ඇගයීමට ලක් කිරීම.
8. අවදානම් කළමනාකරණ කාර්යයේ ස්වාධීනත්වය සහ බලතල සමාලෝචනය කිරීම.
9. බැංකුවේ අවදානම් ප්‍රාග්ධන රාමුව (ණය, වෙළෙඳපොල, ද්‍රවශීලතා හා මෙහෙයුම් අවදානම්) වැදගත් නිමැවුම් හා උපකල්පන ඇතුළුව සමාලෝචනය කිරීම
10. අවදානම් නිරාවරණය කළමනාකරණ සඳහා කළමනාකරණය භාවිතා කරන වැදගත් ප්‍රතිපත්ති, ක්‍රියාවලි සහ ක්‍රම ඇතුළුව බැංකුවේ ශේෂ පත්‍රය. ශේෂ පත්‍ර ව්‍යුහය, ප්‍රාග්ධනය, අරමුදල්, පොළී අනුපාත සහ ද්‍රවශීලතා කළමනාකරණ රාමුව සමාලෝචනය කිරීම.
11. බැංකුවේ ද්‍රවශීලතාව, තැන්පතු රැස්කිරීම සහ අරමුදල් කටයුතු සම්බන්ධයෙන් කළමනාකරණයේ වාර්තා සමාලෝචනය කිරීම.
12. බැංකුවේ නියාමන ප්‍රාග්ධන මට්ටම සහ ප්‍රාග්ධන ව්‍යුහය සම්බන්ධයෙන් කළමනාකරණයේ වාර්තා සමාලෝචනය කිරීම.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව (ඉතිරි කොටස)...

13. බැංකුවේ ප්‍රාග්ධන අරමුණු ඇතුළුව එහි ප්‍රාග්ධනය තක්සේරු කිරීමේ රාමුව සමාලෝචනය කිරීම.

14. අවදානම් කළමනාකරණය සහ අවදානම් කළමනාකරණ කාර්යයට අදාළ කරුණු සම්බන්ධයෙන් අවදානම් කළමනාකරණ ප්‍රධානී, අනුකූලතා නිලධාරී, අභ්‍යන්තර විගණක, මූල්‍ය ප්‍රධානී, භාණ්ඩාගාරික, කළමනාකරණයේ අනෙකුත් පිරිස, ස්වාධීන විගණකවරුන්, නියාමකයින් සහ සුදුසු පරිදි බාහිර ප්‍රවීනයින්ගෙන් තොරතුරු ලබාගැනීම.

15. විධායක ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව, අයකරගැනීමේ කමිටුව, විධායක ණය කමිටුව සහ වත්කම් හා වගකීම් කමිටුව වැනි විශේෂිත අවදානම් හෝ අවදානමේ සමහර අංශ සමඟ කටයුතු කරන සියලුම කළමනාකරණ කමිටුවල විෂය ක්ෂේත්‍රය සමාලෝචනය කිරීම.

16. ඉහත සඳහන් අදාළ කමිටු විසින් ගනු ලබන ක්‍රියාමාර්ගවල ඵලදායිත්වය පරීක්ෂා කිරීමට ජ්‍යෙෂ්ඨ කළමනාකරණය විසින් ආරම්භ කළ ක්‍රියාමාර්ග නියාමනය.

17. ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් නියමකළ ප්‍රමාණාත්මක හා ගුණාත්මක පරාමිති තුළ අවදානම් හඳුනාගැනීම, මැනීම, වැලැක්වීම, අවම කිරීම, මාරු කිරීම හෝ පාලනය කිරීම සඳහා එහි විධි නියෝගය සහ ප්‍රමාණවත් යාන්ත්‍රණය පිළිබඳ මනා අවබෝධයක් ඇති බව සහතික කිරීමට ඉහත කමිටුවල වාර්ෂික වැඩ සැලැස්ම, අදාළ ක්‍රමෝපායන්, ප්‍රතිපත්ති සහ වැඩරාමු සමාලෝචනය කිරීම.

18. විශේෂිත අවදානම් සමඟ සෘජුව හෝ වක්‍රව කටයුතු කරන කළමනාකරණ කමිටු සමඟ අබණ්ඩ සාකච්ඡා පවත්වා ගැනීම සහ ඒ තුළින් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව එහි කාර්යය ඉටු කිරීමේදී හෝ එහි තීරණ ක්‍රියාත්මක කිරීම තුළ යම් අවහිරතා, බාධා, අධෛර්යමත් කිරීම හෝ වැලැක්වීම පිළිබඳ ඒකාබද්ධ කළමනාකරණ කමිටුව (BIRMC) දැනුවත් කෙරේ.

19. අපේක්ෂිත අවදානම් කළමනාකරණ පරමාර්ථවලට සේවය කිරීමේදී අවදානම් දර්ශකවල ප්‍රමාණාත්මතාව තීරණය කිරීම පිළිබඳ දැක්මක් සහිතව යම් දෙන ලද කාලයක් තුළ විශේෂිත අවදානම්වල මට්ටම නියාමනය කිරීමට එවැනි දර්ශක සමාලෝචනය කිරීම.

20. එක් එක් අවදානම් දර්ශක අනුව මාසිකව ගණනය කරන ලද සැබෑ ප්‍රතිඵල සමාලෝචනය කිරීම සහ යම් අවදානම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියමකළ සීමාවන් ඉක්මවන අවස්ථාවක එම විශේෂිත අවදානම්වල බලපෑම අවම කිරීමට නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග වහාම ගතයුතුය.

21. විවිධ වර්ගයේ අවදානම් අනුව කළමනාකරණය විසින් නියමකළ පරාමිති සහ සීමා සමාලෝචනය කර අනුමත කිරීම සහ ඒවා අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූලව මෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියමකළ අපේක්ෂිත ප්‍රතිපත්ති මට්ටම්වල පවතින්නේද යන්න සහතික කිරීම.

22. විශේෂ අවදානම් හඳුනාගැනීමට/ අභ්‍යන්තර පාලන උපදෙස්වලට අනුකූලවීමට අපොහොසත් වීම සඳහා වගකීමට බැඳී සිටින නිලධාරීන්ට එරෙහිව සුදුසු පියවර ගැනීම සහ කමිටුව විසින් නිර්දේශ කරන පරිදි කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සහ විනය ක්‍රියාපටිපාටි ගැනීම.

23. ව්‍යාපාර මෙහෙයුම්වල සෑම ක්ෂේත්‍රයක් තුළ නීති සහ රෙගුලාසි සහ නියාමන මාර්ගෝපදේශ, අභ්‍යන්තර පාලනයන් සහ අනුමත ප්‍රතිපත්ති සමඟ බැංකුවේ අනුකූලතාව තක්සේරු කිරීම සඳහා අනුකූලතා කාර්යයේ ඵලදායිත්වය සමාලෝචනය කිරීම.

24. වාර්ෂිකව ව්‍යාපාර අඛණ්ඩතාව සහ ආපදා පිලියම් සැලැස්ම සමාලෝචනය කිරීම.

25. බැංකුවේ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා තක්සේරු කිරීමේ ක්‍රියාවලිය සමාලෝචනය කර අනුමත කිරීම

26. බැංකුවේ ප්‍රධාන වියදම් වැඩසටහනට අනුව සිදුකරන අධ්‍යක්ෂ මණ්ඩලය වෙත දැනුම් දීමට අවශ්‍ය ප්‍රාග්ධන දායකත්වයන් සමාලෝචනය කිරීම.

27. වැදගත් පීඩන අවස්ථාවක් සම්බන්ධයෙන් ව්‍යාපාරය පිළිබඳ අර්බුදයක් වියහැකි බලපෑම සම්බන්ධයෙන් තොරතුරු රැස් කිරීම සහ කළමනාකරණය විසින් සිදුකළයුතු අයකරගැනීමේ විකල්ප සමාලෝචනය කිරීම

28. විගණන කමිටුවේ උපදේශකත්වයෙන්, අවම වශයෙන් වාර්ෂිකව කළමනාකරණය සමඟ සමාලෝචනය කර සාකච්ඡා කිරීම

29. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉල්ලා ඇති පරිදි ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු ප්‍රඥප්තියට අදාළ වෙනත් කටයුතු ඉටු කිරීම

ප්‍රඥප්තියට අනුව, මෙම කමිටුවේ අනෙකුත් වගකීම් පහත පරිදි වේ.

1. කමිටුව විසින් විගණන කමිටුවට එහි ව්‍යවස්ථාපිත, නියාමන සහ අනෙකුත් වගකීම් සුදුසු පරිදි ඉටු කිරීමට ඉඩ ලබාදීම සඳහා අවශ්‍ය පරිදි තොරතුරු හුවමාරුව සහ සන්නිවේදනය පවත්වාගෙන යෑම.

2. කමිටුව විසින් කමිටුවේ විෂයපථය තුළ ඇති කරුණු සම්බන්ධයෙන් නියාමන පරීක්ෂණ වාර්තා පිටපත් සහ ඒ සඳහා කළමනාකරණයේ ප්‍රතිචාරයද ලබාගනී.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව (ඉතිරි කොටස)...

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවධානම් කළමනාකරණ කමිටු රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව කාර්තුමය පදනමක් මත රැස්වන අතර, කමිටු සාමාජිකයින්ගේ පැමිණීම පහත පරිදි වේ.

1,2,3, හා 4 වන කාර්තු සඳහා

අධ්‍යක්ෂවරයාගේ නම	සහභාගීවූ රැස්වීම් ගණන / සහභාගීවූ විය යුතු රැස්වීම් ගණන
එච්.සී.ඩී.එල්. සිල්වා මහතා (කමිටුවේ සභාපති)	4/4
ඩබ්.සී.එන්. කුරේ මහත්මිය	4/4
ඒ.ජේ.පී.එච්.බී.එම්.ආර්.එස්. බණ්ඩාර මහතා (කමිටුවේ විකල්ප සාමාජික)	3/4
එස්. ගලප්පත්ති මහතා	2/4

වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව වෙත පවරා ඇති වගකීම් ඉටු කිරීමේදි ව්‍යාපාර මෙහෙයුම් සිදුකරමින් හා අවදානම් කළමනාකරණය කරමින් ජ්‍යේෂ්ඨ කළමනාකරණ කාර්ය මණ්ඩලය සමඟ ඉතා සමීපව කටයුතු කර ඇත.

වාර්තාකරණය

අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් වලදී යෝජනා කල හා සාකච්ඡාවට ලක්කල කරුණු අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස් ලබා ගැනීම එකඟතා හා විශේෂිත මඟ පෙන්වීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ නිර්දේශ සමගින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කර ඇත. සමාලෝචිත වර්ෂය තුළ දී අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව විසින් සිදුකල නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේදී සාකච්ඡා කර අධ්‍යක්ෂමණ්ඩලය විසින් අනුමත කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තා අවශ්‍ය විස්තර ද සමග අධ්‍යක්ෂ මණ්ඩලයේ දැන ගැනීම පිණිස ඔවුන් වෙත ඉදිරිපත් කර ඇත.




එච්.සී.ඩී.එල්. සිල්වා මහතා
සභාපති - අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව



අපි වටිනාකම් නිර්මාණය කරන්නේ කෙසේද ?

ඒකාබද්ධ අවදානම් කළමනාකරණය	73
මානව සම්පත් කළමනාකරණය	85
ආයතනික සමාජ වගකීම	87
අපගේ නිශ්පාදන හා සේවාවන්	88

ඒකාබද්ධ අවදානම් කළමනාකරණය



නිෂ්පාදන, සේවා, ගනුදෙනු තුළ සහ සමස්ත බැංකුව තුළ අවදානම් පාලනය කරමින් බැංකුවේ තිරසාර වර්ධන ක්‍රමෝපායට සහ එහි සෞභාග්‍ය කරා යන ගමන් මඟට සහයවීම සඳහා ශක්තිමත් අවදානම් කළමනාකරණ රාමුවක් අවශ්‍ය බව රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව දැඩිව විශ්වාස කරයි.

කොවිඩ් 19 වසංගතයේ අහිතකර බලපෑම් සමග වේගයෙන් වෙනස්වන මූල්‍ය පරිසරය බැංකුව විවිධ වූ අවදානම්වලට නිරාවරණය කරවයි. පොදුවේ, බැංකු ආයතනයක මූල්‍ය අවදානම යනු යම්කිසි ක්‍රියාවක හෝ සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස ඇතිවිය හැකි අහිතකර බලපෑමකි. එවැනි ප්‍රතිඵල ඉපයීම්/ප්‍රාග්ධනය සෘජුවම අහිමිවීමෙන් හෝ බැංකුවට තම ව්‍යාපාරික අරමුණු ඉටුකර ගැනීමේ හැකියාව කෙරෙහි බාධා විල්ලවීම් මගින් ඇතිවීමට ඉඩකඩ ඇත. කොවිඩ් 19 වසංගතයේ බලපෑම හා ඒ සඳහා බැංකුව ගෙන ඇති පියවර පහත වෙනම පරිච්ඡේදයක විස්තර කර ඇත.

බැංකුවේ අවදානම් සුදානම හා කළමනාකරණය මගින් ණය අවදානම, වෙළෙඳපොල අවදානම, ද්‍රවශීලතා අවදානම, මෙහෙයුම් අවදානම, නෛතික අවදානම සහ ක්‍රමෝපායික අවදානම යන සියළුම වර්ගවල ප්‍රධාන අවදානම් සඳහා අවධානය යොමු කරයි. පැහැදිලි කළ සීමාවන් මගින් සියලුම වැදගත් සහ අදාළ අවදානම් වර්ගීකරණ සහ අවදානම් ප්‍රාග්ධන තත්ත්වය සඳහා බැංකුවේ අවදානම් රුචිය පැහැදිලි කරයි.

බැංකුවේ වර්ධනයවන අවදානම් කළමනාකරණ ක්‍රියාවලියට අවදානම් හඳුනාගැනීම, තක්සේරු කිරීම අධීක්ෂණය හා පාලනය කිරීම ඇතුළත් වන අතර ඉහත සඳහන් ක්ෂේත්‍ර තුළදී මේවා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පනවා ඇති අවදානම් නිරාවරණ සීමාව තුළ සිදුවන බවට හා අවදානම් සහිත තීරණ බැංකුවේ ව්‍යාපාරික ක්‍රමෝපායන් සහ අරමුණු සමග සමගාමීව සිදුවන බවට තහවුරු කිරීම සිදු කරයි. කළමනාකරණය සඳහා සෘජු වගකීම සහ අවදානම් පාලනය ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුවේ ඵලදායිත්වය අධීක්ෂණය කිරීමේ වගකීම හා පලමු හා දෙවන මට්ටම් හරහා ස්වාධීන තහවුරුවක් සැපයීම අතර වෙන් වෙන්ව හඳුනාගැනීම සඳහා බැංකුවේ අවදානම් කළමනාකරණ නැඹුරුව ආරක්ෂක මට්ටම් තුනක් මත පදනම්වෙයි.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණය (ඉතිරි කොටස)...

කොවිඩ් 19 වසංගතය සහ එහි බලපෑම්

2020 ජනවාරි මාසයේදී ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) කොවිඩ් - 19 රෝගය පැතිර යාම ගෝලීය හදිසි සෞඛ්‍ය තත්ත්වයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත. අප්‍රියෙල් 19 පාස්කු ඉරුදින සිදුවූ ත්‍රස්තවාදී ප්‍රහාරයෙන් ආර්ථිකයට සිදුවූ අහිතකර බලපෑම සමනය කරගැනීමට උත්සාහ කරමින් සිටිය දී ශ්‍රී ලංකාවේ කොවිඩ් - 19 රෝගය හිස ඔසවමින් තිබිණි. මෙය සාමාන්‍ය මහජනතාවට මෙන්ම ආයතනවලට ද ඒවායේ වර්ධනය හා තිරසාරත්වයට ඇති හැකියාවයන් අඩපන කරමින් එකවිට බලපෑම් ඇතිකර තිබිණි. දිවයිනේ මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව සුරැකීමට කොවිඩ් - 19 වසංගතයෙන් විපතට පත්වූ ව්‍යාපාර සහ පුද්ගලයින් සඳහා මෙම පීඩාකාරී තත්ත්වය සමනය කිරීමට ණය සහන කාලසීමාවන් ලබාදීමට හා සෞභාග්‍ය ණය පහසුකම් වැනි විවිධ මූල්‍ය සහන යාන්ත්‍රණයන් හඳුන්වාදීමට ශ්‍රී ලංකා මහ බැංකුව පියවර ගෙන තිබිණි.

කොවිඩ් - 19 රෝගය පාලනය කිරීමේ අරමුණින් මාස දෙකක කාලයක් රට වසා තැබීම, ව්‍යාපාරික කටයුතු සිදුකරන වේලාවන් සීමා කිරීම, සීමාකාරී ආර්ථික කටයුතු සහ ප්‍රාදේශීය මෙහෙයුම් අතර සංචරණ සීමා පැනවීම ආදිය නිසා බැංකුවට මෙහෙයුම් අභියෝග යන්ට මුහුණදීමට සිදුවිය. බැංකු කාර්ය මණ්ඩලය අතර කොවිඩ් - 19 රෝගය පැතිරයෑම පාලනය කිරීම සඳහා බැංකුව ගත් ක්‍රියාමාර්ග සමඟ මෙම අභියෝග විර්ෂයතුළ බැංකුව සිදුකරන ගනුදෙනුවල පරිමාව සඳහා සැලකිය යුතු බලපෑමක් විල්ලකර තිබූ අතර එමඟින් බැංකුවේ පොලී ආදායමට ද අහිතකර බලපෑම් විල්ල කර තිබිණි.

මෙම අභියෝග හමුවේ වුවද ජීවා ජය ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව හඳුන්වාදී තිබූ සහන ක්‍රියාමාර්ග හා බැංකුව ආරම්භකර තිබූ අවශ්‍ය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා බැංකුව ක්ෂණික පියවර ගෙන ඇත. විශේෂයෙන්ම පහත සඳහන් කරුණු සඳහා බැංකුව අවධානය යොමුකර තිබිණි.

- විකල්ප සේවා අවකාශයන් සැපයීම් සඳහා වූ ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්මේ කොටසක් ලෙස ආපදා ප්‍රතිපත්ති ස්ථාන ශක්තිමත් කරමින් බැංකු කාර්යමණ්ඩලයේ සෞඛ්‍ය ආරක්ෂාව තහවුරු කිරීම සඳහා රජය සහ සෞඛ්‍ය බලධාරීන් විසින් නිකුත් කරන ලද ආරක්ෂක උපදෙස් බැංකුව තදින්ම අනුගමනය කර ඇත.
- සේවක පිරිස සහ ගනුදෙනුකරුවන්ගේ ආරක්ෂාව තහවුරු කරමින් ගනුදෙනුකරුවන් වෙත අඛණ්ඩ සේවාවක් සැපයීම සඳහා ව්‍යාපාර මෙහෙයුම් සිදුකරගෙන යෑම.
- ඩිජිටල් සේවාවන් සැපයීමේ අඩු හැකියාව හේතුවෙන් ශාඛා ජාලයේ අඛණ්ඩ මෙහෙයුම් අත්‍යවශ්‍ය විය.
- දිවයිනේ ආර්ථික තත්ත්වයේ සැලකියයුතු වෙනස්කම් සලකා බැලීම තහවුරු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර ඇති 2020 වර්ෂය සඳහාවන උපායමාර්ගික සැලැස්ම අඛණ්ඩව සමාලෝචනය කිරීම.
- බැංකුවේ ක්‍රියාකාරී නොවූ ණය අයකරගැනීමේ කළමනාකරණය පාදක කරගනිමින් බැංකුවේ ණය ගුණාත්මකභාවය අඛණ්ඩව සමාලෝචනය කළ අතර ව්‍යාපාරයේ ලාභයට හා ප්‍රාග්ධනයට ඇතිවූ බලපෑම හඳුනාගැනීමට සිදුකළ තහවුරු පරීක්ෂාව සහ ණය සහන ක්‍රියාමාර්ග තහවුරු කිරීම.
- දිවයිනේ මූල්‍ය පද්ධතියට සිදුවන අහිතකර බලපෑම් අවම කර ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ සහන ක්‍රියාමාර්ග සඳහා අනුබල දෙමින් වසංගතයෙන් දරුණු ලෙස බලපෑමට ලක්වූ කර්මාන්ත පිළිබඳ හඳුනාගෙන සමාලෝචනය කිරීමට බැංකුව අවධානය යොමුකර තිබිණි.
- බැංකුව වෙත සිදුකරන ගෙවීම් (එනම් අනෙකුත් රාජ්‍ය බැංකු හරහා කරන ගෙවීම්) පහසුකරවීමට ආපසු ගෙවීමේ විකල්ප ක්‍රම ශක්තිමත් කිරීම.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණය (ඉතිරි කොටස)...

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව

ආයතනය තුළ අවදානම් කළමනාකරණ රාමුවක් මගින් ආයතනයේ හැම මට්ටමක අවදානම් සහ සියලුම අවදානම් වර්ග සඳහා පාලනය සහ වගකීමට පහසුකම් ඇති කරයි. ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුවේ ප්‍රධාන මූලිකාංග පහත පරිදි වේ.

- අවදානම් පාලනය සහ කළමනාකරණ ව්‍යුහය
- අවදානම් රුචිය
- අවදානම් කළමනාකරණ ක්‍රමවේදය
- අවදානම දැනුවත් සංස්කෘතිය

බැංකුවේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය අවදානම් කළමනාකරණය, අවදානම් පාලනය, අභ්‍යන්තර පාලනයන්, අවදානම් රුචිය, අවදානම් කළමනාකරණ මෙවලම් සහ අවදානම් පදනම් සංස්කෘතිය පිළිබඳ එකිනෙකට සැබැඳි මූලිකාංගවලින් සමන්විත වේ.

මේවා බැංකුවේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණය මත පදනම්වූ සංස්කෘතිය විදහා දක්වන එකට එක්වූ හා අන්තර් සම්බන්ධිත මූලයන් වේ.



අවදානම් කළමනාකරණය රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ක්‍රමෝපායික කළමනාකරණයේ මධ්‍ය ලක්ෂය වේ. එය බැංකුවේ බැංකු කටයුතුවලට සම්බන්ධ අවදානම් ක්‍රමානුකූලව විසඳාගැනීමේ ක්‍රියාවලියකි. සාර්ථක අවදානම් කළමනාකරණ පියවර ආයතනයක අවදානම් කළමනාකරණ මට්ටම හා සමානුපාතික වියයුතු අතර අනෙකුත් ආයතනික කටයුතු එහි විෂය පථයේ පරිපූර්ණත්වය, එදිනෙදා කටයුතුවලට සම්බන්ධවීම සහ වෙනස්වන වාතාවරණයන්ට ප්‍රතිචාර දක්වමින් ක්‍රියාකාරිවීම යන කරුණු සමග සමාන්තරගතව පැවතිය යුතුවේ. සුදුසු අවදානම් ප්‍රතිචාරයන් ආරම්භකිරීමට මෙන්ම සැලකියුතු අවදානම් තක්සේරු කිරීම රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අවදානම් කළමනාකරණයේ අභිප්‍රායයි. මෙය ආයතනයක සියලුම කටයුතුවලින් උපරිම තිරසාර වටිනාකමක් කරා ලඟාවීම අරමුණවේ. ආයතනයේ අරමුණුකරා ලඟාවීම සමග සම්බන්ධවූ අවිනිශ්චිතතාවයේ මට්ටම සහ අතපසුවීම් වියහැකි බව අඩුකිරීමත් සාර්ථක වියහැකි බව වැඩිකිරීමත් අවදානම් කළමනාකරණය මගින් සිදුකරයි.


බැංකුවේ අවදානම් පාලන හා කළමනාකරණ ව්‍යුහය

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අවදානම් කළමනාකරණ ව්‍යුහය ව්‍යාපාර මෙහෙයුම්, ඒකාබද්ධ අවදානම් කළමනාකරණය සහ විගණන/අනුකූලතා යන කොටස් තුනකින් සමන්විත වේ. මෙම ප්‍රධාන ආරක්ෂක සීමාවන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිකුත් කරන ලද උපදෙස් අනුව ක්‍රියාත්මක වෙයි. තුන්වන ආරක්ෂක පියවර මගින් සිදුකරනු ලබන ස්වාධීන විගණනය අධීක්ෂණය හා පාලනය කිරීම අවදානම් කළමනාකරණයේ හා අවදානම් තක්සේරුවල දක්වා ඇති අධ්‍යක්ෂ මණ්ඩලයේ හා ජ්‍යේෂ්ඨ කළමනාකරණයේ අධීක්ෂණ ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග පිළිබඳ ක්‍රියා කිරීම යාන්ත්‍රනයේ ප්‍රධාන කාර්ය වේ.

බැංකුව මුහුණ දෙන ණය, වෙළඳපල සහ මෙහෙයුම් අවදානම් සම්බන්ධයෙන් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග පිළිබඳ අර්ථ දක්වා ඇත. ප්‍රතිපත්ති සහ ක්‍රමවේදයන් ඒවායේ අනුකූලතාවය තහවුරු කරගැනීම පිණිස කලින් කලට සමාලෝචනය කරනු ලබයි. අවදානම් ගන්නා සහ ඒවා කළමනාකරණය කරනු ලබන එක් එක් අයගේ කාර්යභාරය සහ වගකීම බැංකුවේ සංවිධාන ව්‍යුහය මගින් පැහැදිලි ලෙස අර්ථ දක්වනු ලබයි. හැකියාවන් ගොඩනැගීමේ හා සමාලෝචනය කිරීමේ යාන්ත්‍රනයක් මගින් අවදානම් කඹමනාකරණ සංකල්පය බැංකුව තුල ප්‍රචලිත කිරීමට උත්සහ ගනිමින් ඇත.

බැංකුවේ අවදානම් කළමනාකරණ ක්‍රමවේදය සියලු ව්‍යාපාරික ක්‍රියාකාරකම් වල අවදානම් අන්තර් ක්‍රියාවන් යථා පරිදි හඳුනාගැනීම හා විදහා දැක්වීම සුදුසු පරිදි සිදු කෙරේ. බැංකුවේ අවදානම් කළමනාකරණ ක්‍රමවේදය තුල ආයතනයේ අවදානම් අන්තර් ක්‍රියාකාරකම් පිළිබඳ පහත දැක්වෙන ව්‍යුහය සකසා ඇත.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණය (ඉතිරි කොටස)...



අධ්‍යක්ෂ මණ්ඩල හා අධ්‍යක්ෂ මණ්ඩවල අනුකමිටු කාර්යභාරය

බැංකුවේ අවදානම් කළමනාකරණයේ අධීක්ෂණය සඳහා අවසන් වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරෙයි. අඛණ්ඩ පදනමකින් කාර්යක්ෂම අවදානම් කළමනාකරණයට සම්බන්ධ අනෙකුත් කරුණු හා පාලන ව්‍යුහය, ප්‍රතිපත්ති රාමුව, හා අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම හා අවදානම් නැඹුරුව තීරණය කිරීමත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදුකරනු ලබයි.

ණය, අලෙවි, මෙහෙයුම් හා ප්‍රාග්ධන සහ වෙනත් අවදානම් කළමනාකරණය කිරීම සඳහා යොදා ගන්නා ප්‍රධාන ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග ඇතුළුව බැංකුවේ අවදානම් කළමනාකරණ අධීක්ෂණය කිරීමට සහයවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව පත්කර ඇත.

මෙහෙයුම් කටයුතු අදාල ප්‍රතිපත්ති, ක්‍රියාමාර්ග හා මාර්ගෝපදේශ වලට අනුව කරගෙන යනු ලබන බවටත් මෙහෙයුම් පාලනය නිසිපරිදි ක්‍රියාවට නංවා ඇති බවටත් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව තහවුරු කරයි. විශේෂයෙන්ම මූල්‍ය විගණනය පවත්නා මෙහෙයුම් පාලනය අනුව සිදු කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩල කමිටු හැරුනුවිට කළමනාකරණ කමිටු, සැලසුම් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ විවිධ අවදානම් ක්ෂේත්‍ර තුල හඳුනාගත් අතපසුවීම් සහ ඵලදායී අවදානම් රාමුවක් හා සංස්කෘතිකයක් පවත්වාගෙන යෑම සඳහා වගකිව යුතුවේ. ව්‍යාපාරික රේඛීය කළමනාකරුවෝ ඔවුන්හට අදාල ක්ෂේත්‍ර තුල ඇතිවන අවදානම් කළමනාකරණය කිරීම සඳහා වගකිව යුතුවෙති.

අවදානම් නැඹුරුව

බැංකුවේ මූලෝපායික අරමුණුකරා ලඟාවීමේ දී ව්‍යාපාරයේ විවිධ ක්ෂේත්‍රයන්හි ඇතිවූ අවදානම්වල ප්‍රමාණය උපකල්පනය කිරීමට බැංකුවේ ඇති කැමැත්ත අවදානම් නැඹුරුව මගින් නිර්වචනය වෙයි. අවදානම් නැඹුරු ප්‍රකාශනය පිළියෙල කිරීමේ දී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියාමන අවශ්‍යතා, මූලෝපායික ඉලක්ක ප්‍රාග්ධන ප්‍රමාණවත් බව සහ අනෙකුත් වැදගත් කරුණු සලකා බලයි. බැංකුවේ අවදානම් කළමනාකරණයේ සමස්ත වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරෙයි. අවදානම් නැඹුරුව හා දරා සිටීමේ හැකියාවේ ප්‍රමාණය ප්‍රකාශ කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය ගුණාත්මක හා ප්‍රමාණාත්මක ක්‍රියාමාර්ග ගෙන ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ආරම්භකර ඇති මූලෝපායික විධිවිදාන ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග ලෙස පරිවර්තනය කිරීමත්, මෙම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ධූරාවලියක් ඇති කිරීමත් ජ්‍යේෂ්ඨ කළමනාකරණයේ කාර්යභාරය වේ.

මෙම ප්‍රතිපත්ති පහල මට්ටම් දක්වා සන්නිවේදනය වී ඇති බවට හා ආයතන සංස්කෘතියට එක්කර ඇති බවට ද බැංකුවේ ජ්‍යේෂ්ඨ කළමනාකරණය තහවුරු කලයුතු වේ. ප්‍රමාණකල හැකි අවදානම් සම්බන්ධ අවදානම් දැරීමේ හැකියාව බැංකුවේ අවදානම් දරණ කණ්ඩායම් වෙත සීමා හෝ උප සීමා ලෙස සන්නිවේදනය කරන ලබයි. ගුණාත්මක අවදානම් ක්‍රියාමාර්ග උපදෙස් ලෙස සන්නිවේදනය කරනු ලැබේ.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණය (ඉතිරි කොටස)...


බැංකුවේ අවදානම් නැඹුරුව අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග මගින් අධීක්ෂණය හා පාලනය සිදු කරමින් අධ්‍යක්ෂ මණ්ඩලයට, ආයතනික කළමනාකරණයට හා අදාල කමිටුවලට නිතර නිතර වාර්තා කරයි.

බාහිරව හා අභ්‍යන්තරව මෙම ප්‍රතිපත්ති සැලකිය යුතු වෙනස්කම් සමග සමගාමීව තබා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය මෙම ප්‍රතිපත්ති කලින් කලට සමාලෝචනයකර අවශ්‍ය අවස්ථාවන් වලදී අවශ්‍ය වෙනස්කම් සිදු කරයි. මෙම අවදානම් නැඹුරු සීමාවන් මාසිකව හා කාර්තුමය වශයෙන් අධීක්ෂණය කරන අතර අවදානම් කළමනාකරණ ධාරිතාවන්, ව්‍යාපාරික අවස්ථා, බැංකුවේ ව්‍යාපාරික මූලෝපායන් සහ නියාමන පිරිවිතර සමග සමගාමීව අවම වශයෙන් වාර්ෂිකව සමාලෝචනය කරයි.

අවදානම් නැඹුරු ප්‍රකාශනය බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රාමුවේ අඩංගු වේ.

අවදානම් කළමනාකරණ ක්‍රමවේදය

අවදානම් හඳුනාගැනීම, මැනීම, ඇගයීම, අධීක්ෂණය සහ කළමනාකරණය සඳහා අවදානම් කළමනාකරණ ක්‍රමවේදය පහසුකම් සලසයි. ප්‍රතිපත්ති, සීමා හා තහවුරු පරීක්ෂා අවදානම් කළමනාකරණ මෙවලම් තුල අඩංගුවේ. අවදානම් මැනීම, අධීක්ෂණය හා වාර්තාකරණය අවදානම් කළමනාකරණ කාර්යයේ වගකීම වෙයි. මූලෝපායික තීරණ ගැනීමේ දී කළමනාකරණ කමිටු හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිතර නිතර හෝ අවස්ථාවෝචිත සමාලෝචන සඳහා වාර්තා සපයනු ලබයි.




නිෂ්පාදන හා ආයෝජන හේතුවෙන් එකතුවූ සමස්ත අවදානම් තොරතුරු අඩංගු වාර්තා හඳුනාගත් අවදානම්වල සංවේදී බව, වර්ගය හා ප්‍රමාණය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබාදෙන එකඟවූ ප්‍රතිපත්ති හා සීමාවන් සමග සංසන්දනය කරනු ලබයි.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවා ඇති බේසල් II, III හා අනෙකුත් නියාමන ව්‍යුහයන් පදනම්ව ආරම්භකර ඇති බැංකුවේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ ව්‍යුහය අරමුණු, ක්‍රියාවලි හා අවදානම් කලමනාකරණය කාර්යභාරය පිළිබඳව අර්ථ දක්වයි.

වෙළඳපලේ ඇතිවන විවිධ තත්ත්වයන් හා අනෙකුත් අවදානම් සාධක වෙනස්වීම් හේතුවෙන් ඉපයීම්, ප්‍රාග්ධනය හා ද්‍රවශීලතාවය සඳහා වියහැකි බලපෑම් ඇස්තමේන්තු කිරීම සඳහා ණය අවදානම් නැඹුරුව, වෙළඳපල අවදානම් සීමා ප්‍රාග්ධනය හා අරමුදල් රැස්කිරීමේ අවශ්‍යතා වෙනුවෙන් පුද්ගල මට්ටමින් හා ආයතන මට්ටමින් තහවුරු පරීක්ෂා සිදු කරයි. ICAAP වාර්තා සමාලෝචනයට අනුව සුදුසු පියවර මගින් හඳුනාගත් ගැටළු සඳහා මුහුණදීමට බැංකුවේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව කළමනාකරණ හා අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමින් අවශ්‍ය පියවර ගෙන ඇත.

- රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අවදානම් පැතිකඩ ස්ථාපිත කිරීම.
- බැංකුවේ අවදානම් යෝග්‍ය ලෙස තක්සේරු කිරීම.
- බැංකුවේ අවදානම් සිදුවන කටයුතුවල ආර්ථික බලපෑම ආවරණය කිරීම.
- බැංකුවේ කාර්යසාධනයට දැඩිලෙස බලපෑම් ඇතිකරන අභ්‍යන්තර හා බාහිර කරුණු කලින් හඳුනාගැනීම.
- බැංකුවේ විවිධ මට්ටම් වලදී ගන්නා තීරණ සඳහා සහයෝගය ලබා දීම.

2020.12.31 දිනට රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ පලමු පෙල ප්‍රාග්ධන අවශ්‍යතාවය 21.58% ක් ලෙස හා මුළු ප්‍රාග්ධන අනුපාතය 22.67% ක් ලෙස දැක්වේ. මෙම අනුපාතයන් කර්මාන්තයේ පවතින අගයට වඩා ඉහල අගයක් ගන්නා අතර අවදානම් අවශෝෂණය කිරීම සඳහා ශක්තිමත් තත්ත්වයක් පෙන්නුම් කරයි. ප්‍රාග්ධන කළමනාකරණ පරාමිතීන් පහත සඳහන් රූප සටහනේ දැක්වේ



ඒකාබද්ධ අවදානම් කළමනාකරණය (ඉතිරි කොටස)...

අවදානම් පිළිබඳ දැනුවත්වීමේ සංස්කෘතිය

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුවේ දක්වා ඇති ප්‍රතිපත්ති නිසි ලෙස පහල මට්ටම් දක්වා සන්නිවේදනය වීමත්, ආයතන සංස්කෘතියට ඇතුලත්කර තිබීමත් පිළිබඳව බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණය තහවුරු කල යුතුවේ.

ප්‍රමාණයකල හැකි අවදානම් සම්බන්ධ අවදානම් දැරීමේ හැකියාව බැංකුවේ අවදානම් දරණ කණ්ඩායම් වෙත සීමා හෝ උප සීමා ලෙස සන්නිවේදනය කරනු ලබයි. ගුණාත්මක අවදානම් ක්‍රියාමාර්ග උපදෙස් ලෙස සන්නිවේදනය කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපිතකර ඇති සීමාවන් ඇතුලත අවදානම් පවතී දැයි ව්‍යාපාරික රේඛීය කලමනාකරුවන් තහවුරු කල යුතුවේ. අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති හා අවදානම් දැරීමේ හැකියාවෙහි කිසියම් ප්‍රමාණාත්මක වෙනසක් ඇතිවුවහොත් ඒ බව අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුම් දිය යුතු අතර ඒ පිළිබඳව ඔවුන් නිවැරදි කිරීමේ නිසි පියවර ගතයුතුවේ. මෙම වෙනස්කම් අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් පද්ධති හා ක්‍රියාමාර්ග යෝග්‍යතාවය තීරණය කිරීමට අවශ්‍ය යෙදවුම් ලෙස ක්‍රියාත්මක වෙයි.

ලබා දී තිබෙන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව තුල අවදානම් පාලනය කිරීම සඳහා තීරණ ගැනීමට හා අවදානම් ගැනීම හෝ පාලනය කරන සේවකයන්ට පැහැදිලි අවබෝධයක් ලබාගැනීම පිණිස අවදානම් පිළිබඳව දැනුවත්වීමේ සංස්කෘතියක් ඇති කිරීමට බැංකුව අදහස් කරයි.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ විකාශනයවන අවදානම් කලමනාකරන කාර්යය

> බැංකුවේ අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව 2012 වසරේ දී පිහිටුවා ඇත.

> අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව, විධායක ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ ව්‍යාපාර අඛන්ඩභාවය - සැලසුම් කිරීමේ නියමු කමිටුව පිහිටුවා ඒ සෑම කමිටුවකටම අදාල සමුදේශ්‍ය විෂය හඳුන්වා දීම ද අවසන් කර ඇත.

> ණය වෙළඳපල, මෙහෙයුම් ද්‍රවශීලතා, පොලී අනුපාත, නිෂ්පාදන, උපාය මාර්ගික සහ අනුකූලතා වැනි අවදානම් ආවරණය වන පරිදි අවදානම් ප්‍රතිපත්තිය අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව, තහවුරු පරීක්ෂණ ප්‍රතිපත්තිය, අවදානම් පාලන ස්වයං ඇගයීමේ ප්‍රතිපත්තිය සහ ණය සමාලෝචන යාන්ත්‍රණ ප්‍රතිපත්තිය හඳුන්වා දී තිබිනි.

> බැංකුවේ අවදානම් රුචි ප්‍රකාශය සහ සියලු අවදානම් පාදක පරිචයන් ඇතුළු ලේඛනයක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව සංවර්ධනය කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව 2019 වර්ෂයේ දී අවදානම් රුචිය සහ අභ්‍යන්තර දරා සිටීමේ හැකියා සීමාවන් සංශෝධනය කර ඇත.

> සිදුවිය හැකි විවිධ තත්ත්වයන් යටතේ බැංකුවේ ප්‍රාග්ධන ද්‍රවශීලතා තත්ත්වය පිළිබඳව අධීක්ෂණය හා තක්සේරු කිරීමට තහවුරු පරීක්ෂා කිරීමත් ආරම්භ කර ඇත.

> දරා සිටීමේ සීමාවන් සමඟ ප්‍රධාන අවදානම් දර්ශක හා අධ්‍යක්ෂ මණ්ඩල ට්‍රිගර් සීමාවන් (Trigger limits) දරාගැනීම අයිතමයන් හා ප්‍රධාන අනුපාතයන් කලින් කලට (මාසිකව හෝ කාර්තුමය වශයෙන්) පරීක්ෂා කිරීම, ගණනය කිරීම, සහ තක්සේරු කිරීම සිදුකර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට වාර්තා කර තිබිණි.

ණය අවදානම

ගිවිසගත් කොන්දේසි අනුව තම වගකීම් ඉටු කිරීමට ණය ලබාගත් තැනැත්තා හෝ ප්‍රතිපක්ෂය අපොහොසත් වීමේ ප්‍රවණතාවය ණය අවදානම ලෙස ඉතා සරලව අර්ථ දැක්විය හැකි වේ.

වත්කම් ඉපයීමෙන් ණය අවදානමට නිරාවරණයවීම සියයට 13%ක් ලෙස ඉහළ ගොස් තිබිණි. විශේෂයෙන්ම මෙය ණය හා අත්තිකාරම් මගින් 2019 වර්ෂයේ දී රුපියල් බිලියන 35.5 සිට 2020 වසරේ දී රුපියල් බිලියන 36.9 දක්වා වර්ධනය වී තිබිනි.

වත්කම් ඉපයීමෙන් ණය අවදානම සඳහා බැංකුවේ නිරාවරණය


	2020 (රු. මිලියන)	2019 (රු. මිලියන)	% වෙනස
බැංකුවල තැන්පතු	11,812	7,089	67%
මූල්‍ය වත්කම් - FVPL	21	19	11%
ණය සහ අත්තිකාරම්	36,857	35,561	4%
ණය සහ අනිකුත් උපකරණ	2,415	2,615	-8%
මූල්‍ය වත්කම් - FVOCI	5	5	0%
වත්කම් ඉපයීම සඳහා සමස්ත නිරාවරණය	51,110	45,289	13%

ණය සහ අත්තිකාරම් කළඹ වර්ධනය වාර්තා වී තිබූ පුද්ගල ණය මගින් අත්පත් කරගෙන තිබිණි. වය වර්ෂය තුලළ දී 5%ක්වූ උකස් ණය වර්ධනය සමග 10% ක වර්ධනයක් වාර්තා කර තිබිණි.


ඒකාබද්ධ අවදානම් කළමනාකරණය (ඉතිරි කොටස)...

පාර්ශවකාර පැහැර හැරීම් අවදානම

පාර්ශවකාර පැහැරහැර වීමේ අවදානම බැංකුවට ඉතා සැලකියයුතු ණය අවදානමක් වන අතර ගිවිසගත් කොන්දේසි මත ණය ආපසු ගෙවීමේ පාර්ශවයන්ගේ ප්‍රමාද දෝෂයන්ගෙන් පැන නැගිය හැකි බලපෑම මෙයින් අදහස් වෙයි. 2020 වසර සඳහා බැංකුවේ සමස්ත අක්‍රිය ණය රු. බිලියන 8.4ක් වූ අතර එයින් 62.2% ක් අර්ථසාධක අරමුදල් ණය විය. අර්ථ සාධක ණය වක් වක් අයගේ අර්ථසාධක අරමුදලේ ශේෂය මත පදනම්වූ අතර ශ්‍රී ලංකා මහ බැංකුවේ අර්ථසාධක අරමුදල් අංශයෙන් අර්ථසාධක ණය ආපසු අයකර ගැනීම ඉතා ඉහළ මට්ටමක පැවතිණි. එය ඉතා පහල පැහැර හැරීම් අවදානමක් වේ. දක්වා තිබෙන අක්‍රිය ණයවල වැඩි ප්‍රමාණයක් අයකර ගැනීමේ ක්‍රියාවලියේ තිබූ කාල පමාවක් නිසා සිදුවී ඇත. අර්ථසාධක අරමුදල් ණය හැර අක්‍රිය ණය 37.8% ක් ලෙස ගණනයකර තිබූ අතර2020 වසරේ අක්‍රිය ණයවල කාල විශ්ලේෂණයක් පහත දැක්වේ.



අවදානම් අවම කිරීමේ කටයුතු ශක්තිමත් කිරීමෙන් වත්කම් ගුණාත්මකභාවය වර්ධනය කිරීමට බැංකුව ක්‍රියාමාර්ග බොහෝමයක් ගෙන තිබූ අතර අක්‍රිය ණය රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ප්‍රධාන අවදානම් අතුරින් එකක් විය. බැංකුව ණය සමාලෝචන යාන්ත්‍රණය අධීක්ෂණයේ ගුණාත්මකභාවය ඉහළ නංවා තිබූ අතර එමගින් ණය ආපසු ගෙවීමේ ධාරිතාවය දැඩි ලෙස තක්සේරු කිරීම සහ අධීක්ෂණය කිරීම සිදු කරයි. බැංකුව නිතර නිතර අක්‍රිය ණය කළඹ සමාලෝචනය කරන අතර පවතින ණය කළඹේ අයකර ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට එයට අදාළ අයකර ගැනීමේ සැලැස්ම අධීක්ෂණය කරයි.




දෙසැම්බර් 19 හා සැසඳීමේදී අක්‍රීය ණය ප්‍රමාණය ඉහළ ගොස් තිබුණත් මාර්තු 20 දින තිබූ ඉහළම වැඩිවීම බොහෝවිට කොවිඩ් 19 වසංගතය නිසා සිදුවී තිබිණි. වසංගතය නිසා සිදු වූ අහිතකර බලපෑම කළමනාකරණය කරන අතර අක්‍රිය ණය ප්‍රමාණය එම ප්‍රමාණයට වඩා අඩුවෙන් පවත්වා ගෙන යෑමට බැංකුවට හැකිවී තිබිණි. පහත සාකච්ඡා කරන ණය අවදානම අඩුකිරීමේ පියවර සමඟ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව තවදුරටත් පැහැර හැරීමේ අවදානම හා ආපසු ගෙවීමේ අවදානම අඩු කිරීමට අදහස් කරයි.

කේන්ද්‍රගතවීමේ අවධානම

විශේෂිත ණය ගැණුම්කරුවාට/ගැණුම්කරුවන්ට කර්මාන්තයට, නිෂ්පාදනයට අංශයට හෝ භූගෝලීය ප්‍රදේශයට දැඩි ලෙස වැඩි වශයෙන් නිරාවරණය වීම හෝ නිරාවරණයේ අසමතුලිත බෙදීයාම හේතුවෙන් සිදු විය හැකි අවදානමකි.

මෙම අනු අවදානම් ප්‍රබේදයන් මැනීමට හා අධීක්ෂණය කිරීමට බැංකුව අවදානම් රුචි සීමාවන් කීපයක් ප්‍රයෝජනයට ගන්නා අතර ඒවා කිසියම් අහිතකර බලපෑමක් පාලනය කරගැනීමට කලින් කලට සමාලෝචනය කර අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ සමග වාර්තා කරයි.

Herfindahl - Hirschman දර්ශකය උපයෝගීකර ගනිමින් ඉහත සඳහන් ප්‍රබේදයන්හි ණය කේන්ද්‍රගතවීම අධීක්ෂණය කරන අතර විවිධ අංශයන්ට හා කර්මාන්තයන්ට විවිධාංගීකරණය කිරීමේ අරමුණින් ආයතනික ණය කළඹ වර්ධනය කිරීමට බැංකුව පියවර ගෙන ඇත. කාර්යමණ්ඩල හැකියා වර්ධනය ඇතුළු පවතින ක්‍රියාවලි හා ක්‍රියාමාර්ග ශක්තිමත් කරමින් මෙම සංක්‍රාන්තියට ධනාත්මක පියවරක් ලෙස නව නිෂ්පාදන කීපයක් බැංකුව හඳුන්වා දී ඇත.



ඒකාබද්ධ අවදානම් කළමනාකරණය (ඉතිරි කොටස)...

ණය අවදානම් කළමනාකරණය

ණය ගැනුම්කරුවන් හා පාර්ශවකරුවන් සඳහා පිළිගතහැකි ණය ප්‍රමිතියක් ඇතිකිරීමට බැංකුවේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය මගින් ඉලක්ක කර ඇත. යහපත් ආයෝජන අවදානම් කළමනාකරණය සහ අබණ්ඩ අවධානය යටතේ ආර්ථික ප්‍රවණතාවයන්ගේ වෙනස්වීම බැංකුවේ ප්‍රති පක්ෂ ණය ස්ථාවරය දුර්වල කිරීමට හේතු වෙයි.

අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කල අවදානම් සීමාවන් ඇතුලත ගනුදෙනුකරුවන් තෝරා ගැනීම, නිසි අවධානය, අවදානම් තුලනය, සමාලෝචන සහ අයකරගැනීම් පටිපාටි, වත්කම් නිරීක්ෂණය හා කළමනාකරණය යන කරුණු ඇතුලත් නියමයන් අර්ථ දක්වා ඇති ණය ප්‍රතිපත්තියක් හා ණය සංග්‍රහයක් (credit manual) බැංකුව ඵලි දක්වා ඇත. මෙම ලේඛන ණය අනුමත කිරීමේ සුදුසු ක්‍රියාවලියක් යටතේ ක්‍රියාත්මක වන යෝග්‍ය ණය අවදානම් වාතාවරණයක් ඇති කිරීම මගින් ණය අවදානම් තක්සේරු කිරීම, නිරීක්ෂණය හා පාලනය, යෝග්‍ය, ණය පාලනයක් තක්සේරු කිරීම හා නිරීක්ෂණ ක්‍රියාවලියක් පවත්වාගෙන යෑම සහ ණය අවදානම සඳහා ප්‍රමාණවත් පාලනයක් තහවුරු කිරීම යන කරුණු හඳුනාගැනීම සඳහා මග පෙන්වනු ලබයි. ව්‍යාපාරික මූලෝපායන් හා බැංකුවේ අවදානම් රුචිය සමග ඇති අනුගතබව තහවුරු කිරීම් සඳහා ණය ප්‍රතිපත්තිය හා ණය සංග්‍රහය නිතර නිතර සමාලෝචනයකර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලබයි. ණය අවදානම් කාර්ය සාධනයේ වගකීම සියලුම ව්‍යාපාරික ඒකකයන්ට පැවරී ඇති අතර අයහපත් ප්‍රවණතා සඳහා බැංකුවේ සියලු මට්ටම්වලට අවධානය යොමු කරනු ලබයි. එහිදී අනුමත කිරීමේ ක්‍රියාවලියේ විවිධ මට්ටම්වලට බලතල ලබා දී ඇත. පහත සඳහන් ප්‍රධාන ක්‍රියාවලි මත පදනම්ව රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ණය අවදානම් කළමනාකරණ ප්‍රවේශය තවදුරටත් ශක්තිමත් කරනු ලබයි.

- ගණුදෙනුකරුවන්ගේ අදාල අවදානම් පැතිකඩ මත පදනම්වූ ණය පහසුකම් සහ ඔවුන් ගන්නූ අවදානම්වල බරපතලකම මත පදනම්වූ ණය පහසුකම් වර්ගීකරණය කිරීමට අභ්‍යන්තරව අවදානම් ශ්‍රේණිගත කිරීමේ ආකෘතියක් සකසා ඇත. (සැක රහිත, පහත්, මධ්‍යස්ථ පිළිගතහැකි, ආන්තික, ඉහල පිළිගත නොහැනි - ප්‍රතික්ෂේප)

- රාජ්‍ය නොවන අයදුම්කරුවන්ගේ ආදායම් ප්‍රභවයන්හි විශ්වාසනීයත්වය ඇගයීමට මූලික උපදෙස් ලබාදීම මගින් බැංකුවේ ණය අවදානම අඩුකර ගැනීමට ආදායම් ප්‍රභව තහවුරුකිරීමේ ආකෘතියක් (ISVM) ආරම්භකර ඇත.

- ඇප තක්සේරු කිරීම සඳහා විශේෂයෙන්ම (ඉඩම් ගොඩනැගිලි වැනි) උකස් ඇප සුරැකුම් තක්සේරුකිරීමට බැංකුව අභ්‍යන්තර තක්සේරු ඒකකයෙන් හා බාහිර තක්සේරු වෘත්තිකයින්ගෙන් උපදෙස් ලබා ගනී.

- අබණ්ඩ අධීක්ෂණය හා පසු විපරම් සිදුකිරීම තහවුරු කිරීමට පූර්ව අනතුරු හැඟවීම් ලබාදීමට විශේෂිත මට්ටමට ඉහළින් පවතින ණය අවදානම් නිරාවරණය අනුමත කිරීමට පෙර ස්වාධීනව සමාලෝචනය කිරීම අවදානම් කළමනාකරණ අංශය මගින් සිදුකරනු ලබයි.

- වගන්ති/නෛතික උපදෙස් ණය ගිවිසුම් කොන්දේසි හා ඇප ලියකියවිලි සම්පූර්ණ කිරීම පිළිබඳ පිළිබඳව නිසි අවධානය යොමු කිරීමෙන් නොසැලකිලිමත්කම නිසා සිදුවන අලාභ සිදුවීමේ අවදානම පිටු දැකීම පෙර-ණය මුදාහැරීම් ඒකකය මගින් තහවුරු කරයි.

- පෙර අනතුරු ඇඟවීම් හඳුනාගැනීම හා ණය පහසුකම් නැවත තක්සේරු කිරීම ණය සමාලෝචනය යාන්ත්‍රණයක් මගින් සිදු කරයි.

- ක්‍රියාකාරී නොවූ අත්තිකාරම් හා ගැටළු සහගත ණය පිළිබඳ පූර්ව අත්දැකීම් මගින් ඵලදායී පසුවිපරම් හා ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම අයකරගැනීමේ දෙපාර්තමේන්තුව අවදානම් කළමනාකරණය හා එක්ව තහවුරු කරයි. අවසන් ක්‍රියාමාර්ගය ලෙස නීතිමය පියවර ගැනීමට අයකර නොගත් අත්තිකාරම් නීති අංශය වෙත යොමු කරයි.

- ආරක්ෂක සීමා ත්‍රිත්වය ඇතුලත සේවකයින්ගේ හැකියා වර්ධනය කිරීම සඳහා විෂය පිළිබඳ ප්‍රවීනයන් බඳවාගැනීම හා ණය තක්සේරු කිරීම හා අවදානම් කළමනාකරණය පිළිබඳව දැනට සිටින කාර්ය මණ්ඩලයට පුහුණුවීම් ලබා දීම.

- දරා සිටීමේ සීමාවන් සමග ප්‍රධාන අවදානම් දර්ශක හා අධ්‍යක්ෂ මණ්ඩල ට්‍රිගර් සීමාවන් (Trigger limits) සිහිපත් අයිතමයන් හා ප්‍රධාන අනුපාතයන් කලින් කලට (මාසිකව හා කාර්තුමය වශයෙන්) පරීක්ෂා කිරීම, ගණනය කිරීම, සහ තක්සේරු කිරීම සිදුකර ඇති අතර ඒවා අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට වාර්තාකර තිබිණි. කිසියම් අහිතකර බලපෑමක් පාලනය කිරීම සඳහා නිර්දේශ සපයා ඇත.

- බැංකුවේ ණය කළඹේ ගුණාත්මකභාවය විශ්ලේෂණය කිරීමට හා ගණනය කිරීමට අවදානම් කළමනාකරණ අංශය පහත සඳහන් ප්‍රධාන කරුණු තක්සේරු කරයි.

  - විශේෂිත ශ්‍රේණිගතකිරීම් වර්ගීකරණයන්ගේ සමස්ත නිරාවරණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමතකර ඇති ප්‍රමාණාත්මක සීමා කිරීම් නියම කිරීම.
  - ණය කළඹේ සංයුතිය විශ්ලේෂණය කිරීම.
  - ණය කළඹ සහ ක්‍රියාකාරී නොවූ ණය වර්ධනය විශ්ලේෂණය කිරීම.
  - ප්‍රධාන උපායමාර්ගික කාර්ය සාධනය.

වෙළෙඳපල අවදානම

වෙළෙඳපල අනුපාත හෝ මිල ගනන් වල උච්චාවචනය ශේෂ පත්‍ර දිනට හෝ ඉන් පසුව එහි වටිනාකම් වලට අහිතකර ලෙස ඇති කරවන බලපෑම වෙළඳපල අවදානම වේ. බැංකුවට අදාලව වෙළඳපල අවදානම ලෙස සලකනු ලබන්නේ පොලී අනුපාත සහ ද්‍රවශීලතා යන අවදානම් වේ. සාමාන්‍යයෙන් මූල්‍ය වෙළඳපලේ අස්ථාවර බව හා විශේෂයෙන්ම නිවාස මූල්‍ය වෙළඳපලේ ඇතිවිය හැකි බලපෑම් වෙනුවෙන් බැංකුව විශේෂ අමතර අවධානයක් යොමු කරයි.

බැංකුවේ වෙළඳපල හා ද්‍රවශීලතා අවධානම් අධීක්ෂණය හා කළමනාකරණය කිරීමේ වගකීම පැවරී ඇත්තේ වත්කම් සහ වගකීම් කළමනාකරණ කමිටුව වෙතය.

බැංකුවේ වත්කම් හා බැරකම් ව්‍යුහය/සංයුතිය නිරීක්ෂණය කිරීම පිළිබඳ සහ තැම්පත් සහ අත්තිකාරම් සඳහා නිශ්පාදන මිල තීරණය කිරීම රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ වත්කම් හා බැරකම් කළමනාකරණ කමිටුවේ වගකීම වේ. මෙහිදී අවශ්‍ය කරන කල්පිරීම් ආකෘතිය හා වර්ධිත වත්කම් හා බැරකම් සම්බන්ධතාවය තීරණය කිරීම කමිටුව විසින් සිදු කරනු ලබයි.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණය (ඉතිරි කොටස)...

බැංකුවේ ප්‍රකාශිත පොලී අනුපාත ප්‍රකාශයට පත්කිරීම සහ අනාගත ව්‍යාපාරික මූලෝපායන් තීරණය කිරීම අරමුදල් ප්‍රතිපත්තිය විමර්ශනය හා ප්‍රකාශ කිරීම දැනට කමිටුව විසින් සිදු කරගෙන යනු ලබන කාර්යයන්ගෙන් කිහිපයකි. ද්‍රවශීලතා ගැටලු නිරාකරනය කිරීම සඳහා වූ අසම්භාව්‍යතා අරමුදල් සැලස්මක හා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කල වත්කම් හා බැරකම් කළමනාකරණ ප්‍රතිපත්තියක් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව සතුවේ.

පොලී අනුපාත අවදානම

නියමිත කාල පරිච්ඡේදයක් තුල පොලී අනුපාත ගැලපීම් නිසා ඇතිවන තත්ත්වයන් අතර අසමාන බවක් ඇතිවූ විට වත්කම් සඳහා (ණය දීම් හා පාරිභෝගික තැම්පත් වැනි) පොලී අනුපාත අවදානම පැනනගී එය නිශ්චිත කාල පරිච්ඡේදයක් තුල පොලී අනුපාත ගැලපීමට හේතුවෙයි. බැංකුවේ ණය දීම, අරමුදල් රැස්කිරීම හා ආයෝජන කටයුතු වලින් පොලී අනුපාත අවදානමේ වැඩිවීමක් ඇතිවේ.

අරමුදල් රැස්කිරීමේ මූලික ප්‍රභවය තැම්පතු මගින් වන නිසා මෙය බැංකුවේ වෙලඳපල අවදානමේ ප්‍රධාන අංගයකි. බැංකුවේ ප්‍රධාන ව්‍යාපාරික කටයුත්ත දිගුකාලීන ණය ලබාදීම් වන නිවාස මූල්‍ය වන හෙයින් මෙය ස්වාභාවයෙන් කෙටි කාල පරිච්ඡේදයක සිට මධ්‍යම කාල පරිච්ඡේදයකට පාදක වෙයි. බැංකුව ප්‍රධාන වශයෙන්ම ස්ථිර අනුපාත ණය දීමේ පරිසරයක ක්‍රියාත්මකවන අතර එහි වගකීම්වලින් වැඩි ප්‍රමාණයක් නිතර නිතර ප්‍රති මිල කිරීම්වලට යටත්වේ. වර්ෂය තුල ඉහලගිය පොලී පිරිවැය ලාභදායිත්වයට සැලකියයුතු ලෙස බලපෑමක් සිදුකල අතර බැංකුව මෙම අවගැලපීම විසඳීම සඳහා උපායමාර්ගයන් ක්‍රියාත්මක කරමින් සිටියි. වර්ෂයතුල අවගැලපුම් ගැලපීම සඳහා ක්‍රියාත්මක නව වත්කම් හා බැරකම් නිශ්පාදන කීපයක් හදුන්වා දී පාරිභෝගික අවශ්‍යතාවයන් හා වෙලඳපල තත්ත්වයන් අතර සමපාත කර ඇත.

පොලී අනුපාත අවදානම් කළමනාකරණය

බැංකුව නවීකරණය කරන ලද කාල පරතර ප්‍රවේශයක් හදුන්වා දී ඇත්තේ හිමිකරු ප්‍රාග්ධනයේ ආර්ථික අගයේ වෙනස්කම් විශ්ලේෂණය සඳහා වන අතර එයට වත්කම්වල හා බැරකම්වල කල්පිරීමට ඇති ඉතිරි කාලය පදනම් කරගන කාල වශයෙන් බෙදා වෙන්කිරීමක් අවශ්‍ය වෙයි. වෙනස්වන පොලී අනුපාත තත්ත්වයට විසදුමක් ලෙස හිමිකරු ප්‍රාග්ධනයේ ආර්ථික අගයේ ක්‍රියාශීලි හැසිරීම් මෙම ප්‍රවේශය මගින් විශ්ලේෂණය කරයි. පොලී අනුපාතයන්ගේ වෙනස්වීම වලට ප්‍රතිචාරයක් ලෙස වත්කම් වල ආර්ථික අගය හා බැරකම්වල ආර්ථික අගය අතර වෙනස පුලුල් වශයෙන් ප්‍රාග්ධනයේ ආර්ථික අගය ලෙස (EVE) නිර්වචනය කරයි. මෙම ද්විත්වය අතර සම්බන්ධය අනුපාත ශූන්ක්ෂම වත්කම් හා වගකීම් නවීකරණය කරන ලද කාල සීමාව හරහා පිහිටුවා ඇත. ඉපයීම් හා හිමිකරු ප්‍රාග්ධනයේ ආර්ථික අගයට සිදුවන බලපෑම වටහා ගැනීමෙන් බැංකුව IRRBB අධීක්ෂණය කරන අතර ඉන් අනතුරුව මෙය පොලී අනුපාතයන්ගේ වෙනස්වීමෙන් ඇතිවන බලපෑම හඳුනාගැනීමට පාදකකර ගනී.

ශුද්ධ පොලී අනුපාතයට සිදුවන සෘණාත්මක බලපෑම අවම කිරීම සඳහා පලදා වක්‍රයේ වෙනස්කම් හා වෙලඳපල අනුපාත සඳහා වියහැකි බලපෑමේ වෙනස්කම් වත්කම් හා බැරකම් කළමනාකරණ කමිටුව (ALCO) කළමනාකරණය කරයි.

ද්‍රවශීලතා අවදානම

ආයතනයකට සිය ගිවිසගත් වගකීම් ඉටු කිරීමට ඇති නොහැකියාව මත හෝ බලාපොරොත්තු නොවූ පිරිවැය හෝ පාඩු සිදු නොකර නියමිත වත්කම් අරමුදල් වැඩිවීම නිසා සිදුවිය හැකි අලාභ ද්‍රවශීල අවදානම ලෙස හැඳින්විය හැක. ද්‍රවශීලතා අවදානම එක් හුදකලා සිද්ධියක් නොවේ. ණය සහ වෙළඳපල අවදානම් වැනි අනෙකුත් අවදානම්වල ප්‍රතිඵලයක් ලෙසද එය සිදුවිය හැකිය.

ද්‍රවශීලතා කළමනාකරණය රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට ඉතා වැදගත් වනුයේ එහි වත්කම් හා බැරකම් සංචිතයේ ස්වභාවය හේතුවෙන්ය. වත්කම් හා බැරකම් සංයුතිය බැරකම් ස්ථාවරත්වය හා විවිධාංගීකරනය බැංකුව අධීක්ෂණය කරමින් ණය සංචිතයේ ගුණාත්මක බව වර්ධනය කිරීම කෙරෙහි අවධානයෙන් පසුවේ.

පුළුල් ශාඛා ජාලය මගින් සුළු තැම්පත් ලබාගැනීමට බැංකුව සමත් වී ඇත. එහෙයින් මහ පරිමාණ තැම්පතු සඳහා වන විශ්වාසය අඩුවී ඇත. දැරිය හැකි මිලකට දිගුකාලීන ණය උපකරණ නොමැති බැවින් වත්කම් පොතෙහි කල්පිරීම් අව ගැලපුම් ඇතිවීමට හේතු වී ඇති අතර කල්පිරීම් අවගැලපුම් අඩුකිරීම සඳහා බැංකුව නැවුම් නිශ්පාදන හඳුන්වාදීම සඳහා සැලසම් කරමින් සිටියි.

ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය


- අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ වත්කම් හා බැරකම් කමිටුවේ සාකච්ඡාකර ඇති ශ්‍රී ලංකා මහ බැංකුවේ විධිවිදාන අනුව බැංකුව ද්‍රවශීලතා අනුපාත කීපයක් අධීක්ෂණය කරයි.
- තහවුරු පරීක්ෂා හා අනාගත සිදුවීම් විශ්ලේෂණය
  - > තහවුරු පරීක්ෂා කිරීම බැංකුවේ අවදානම් කළමනාකරණයේ අත්‍යවශ්‍ය අංගයක්වන අතර සිදුවිය නොහැකි විභවතාවයන් එහෙත් පොලී අනුපාත වෙනස්වීමේ සංවලන හෝ ඒවාට ගොදුරුවියහැකි අවස්ථා ඇගැයීම සඳහා ප්‍රයෝජනයට ගනී. ගොදුරුවියහැකි බව සාමාන්‍යයෙන් බැංකුවේ ලාභ ලාභදායිත්වයට, ද්‍රවශීලතාවයට සහ/හෝ ප්‍රාග්ධන ප්‍රමාණවත් බවට සම්බන්ධ ගණනය කිරීමට ලක්වෙයි.
  - > බැංකුවේ ඉපයීම් ප්‍රාග්ධන තත්ත්වය ද්‍රවශීලතා තත්ත්වය සහ වෙළඳපල ණය ප්‍රමාණයන්ගේ ඇතිවන සුළු, මධ්‍යස්ථ හා ප්‍රධාන අර්බුදකාරී තත්වයන් වැනි අනපේක්ෂිත මූල්‍ය තත්ත්වයන්ට බැංකුව ගොදුරුවිය හැකි බව තක්සේරු කිරීමට බැංකුවේ Stress Scenarious සැලසුම් කර ඇත.
  - > අනපේක්ෂිත අවදානම් අවමකිරීම සඳහා පූර්ණ ආරක්ෂක දැනුම්දීම් සමග අවශ්‍ය කළමනාකරණ හා උපායමාර්ගික ක්‍රියාමාර්ග සමඟ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව හා අධ්‍යක්ෂ මණ්ඩලයට, කාර්තුමය වාර්තා යොමු කරනු ලබයි. ශුද්ධ පොලී ආදායමට බලපාන යම්කිසි සෘණාත්මක බලපෑම අවම කිරීමට වෙළෙඳපල අනුපාත උච්චාවචනයන්ගේ විභවතා බලපෑම ඵලදායිතා චක්‍රයේ වෙනස් වීම් සාමාන්‍ය වශයෙන් වත්කම් හා බැරකම් කමිටුව විසින් කළමනාකරණය කරයි.


ඒකාබද්ධ අවදානම් කළමනාකරණය (ඉතිරි කොටස)...

- ද්‍රවශීලතා සම්බන්ධ අනුපාත

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ සහ වත්කම් හා බැරකම් කමිටුවේ සාකච්ඡා කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද අවදානම් සම්බන්ධ විධිවිදාන, කල්පිරීම් පරතර විශ්ලේෂණය හා ද්‍රවශීලතා අනුපාතය අඛණ්ඩ මුදල් ප්‍රවාහ අනාවැකි මගින් බැංකුව විහි ද්‍රවශීලතා සංචලනය අධීක්ෂණය කරයි. ශ්‍රී ලංකා මහ බැංකුව නියමකර ඇති මට්ටමට වඩා ඉහළින් ද්‍රවශීල වත්කම් අනුපාතය තබාගැනීම හා පවත්වාගෙන යෑම සඳහා භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව වගකිව යුතු වෙයි.

ද්‍රවශීලතා අනුපාත	2020 දෙසැ 31 දිනට
ආයෝජන/තැන්පතු	31%
ණය/තැම්පතු	81%
ණය/වත්කම්	70%
ණය/ප්‍රාග්ධනය	612%
ණයටගත් අරමුදල් ශුද්ධ/ප්‍රාග්ධනය	5.78%
ආයතනික තැම්පතු සඳහා විශ්වාසය	23%
ද්‍රවශීල වත්කම්/මුළු වත්කම්	29%
පවතින ණය ප්‍රමාණය රු. බිලියන	2.8





- මීට අප අමතරව ද්‍රවශීල අර්බුදතා අවස්ථාවක් ඇති වූ විට බැංකුව සතුව ද්‍රවශීල අරමුදල් සැලැස්මක් පවතින අතර අසම්භාව්‍යතා අරමුදල්කරණයේ ප්‍රමාණාත්මක බව හඳුනාගැනීමට වත්කම් බැරකම් මත තහවුරු පරීක්ෂා (stress testing) සිදු කරයි.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණය (ඉතිරි කොටස)...

මෙහෙයුම් අවදානම

බාහිර සිදුවීම්, පුද්ගල හා පද්ධති ප්‍රමාණවත් නොවන හෝ අසාර්ථක අභ්‍යන්තර ක්‍රියාවලියෙහි ප්‍රතිඵලයක් ලෙස ඇතිවන අලාභවීමේ අවදානම මෙහෙයුම් අවදානම ලෙස හඳුන්වා දිය හැකිය. පුද්ගල වැරදි පද්ධති අඩපනවීම් හා ප්‍රමාණවත් නොවන ක්‍රියාමාර්ග හා පාලනය සමඟ ආශ්‍රිතව මෙහෙයුම් අවදානම ඇතිවේ.

මෙහෙයුම් අවදානම් කළමනාකරණය

ක්‍රියාමාර්ග හා පාලනය කාර්යක්ෂමව හා මනාව සංවිධිත කිරීම සහ තාක්ෂණ යටිතල පහසුකම්, ප්‍රතිපත්ති වැඩි දියුණු කිරීම මගින් බැංකුව මෙහෙයුම් අවදානම අඩුකරනු ලබයි. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට පරිපූර්ණ මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තියක් පවතින අතර එයට අවදානම් හඳුනාගැනීම, තක්සේරු කිරීම, පාලනය හා ක්‍රියාවේ යෙදවීම අධීක්ෂණ සහ වාර්තාකරන යාන්ත්‍රනය ඇතුලත් වෙයි. ප්‍රධාන මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති ණය සහ මෙහෙයුම් වැනි මැනුවල (Manuals) මගින් වෙන් වෙන් වශයෙන් හසුරවනු ලබයි. පද්ධති සංවර්ධනය හා වැඩි දියුණු කිරීමේ ක්‍රමවේදය සැකසීම බැංකුව අබණ්ඩව සිදුකරගෙන යයි. තොරතුරු තාක්ෂණ පද්ධතිය හරහා පාලනය වැඩි දියුණු කිරීම, නිවාරක නඩත්තුව, සේවක කුසලතා වර්ධනය, ප්‍රතිපත්ති නිසිකලට හඳුන්වා දීම හා භාවිතාවේ යෙදවීම සහ අවදානම් මාරුකිරීමේ පියවර විගණන භාවිතාවේ යෙදවීම මෙයට අන්තර්ගතවේ. මෙහෙයුම් හා ක්‍රියාකාරකම් විමර්ශණය කිරීම විදිනෙදා රැස්වීම් වලදී සිදු කරනු ලැබේ.

තම රාජකාරිවලට අදාල නිවැරදි මෙහෙයුම් ක්‍රියාමාර්ග හඳුනාගැනීම සඳහාත් මෙම ක්‍රියාමාර්ග වලට සෑමවිටම අනුගතව ක්‍රියාකිරීමේ වගකීම අවධාරණය කිරීම සඳහාත් සේවකයින් පුහුණු කරයි. මෙහෙයුම් අවදානම්, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවට වාර්තා කිරීම සෑම කාර්ය බද්ධ ඒකකයකටම පත්කර ඇති නිලධාරීන් මගින් සිදුවෙයි. අවදානම් හඳුනාගැනීමේ ක්‍රියාවලියට තොරතුරු ලබා දෙමින් විගණන චිලිදරව් චකඟතා ක්‍රියාවලිය ශාඛා පරීක්ෂාව සහ නියැදි මූලික සමාලෝචනය බැංකුවේ මෙහෙයුම් අවදානම් ක්‍රියාවලිය මගින් සිදුකරනු ලබයි.

ව්‍යාපාර කටයුතුවලට පදනම් වන අලාභ සිදුවීම් අවස්ථා විකරුස්කර විශ්ලේෂණය කිරීම සඳහා අලාභ හඳුනාගැනීමේ දත්ත සංචිතයක් ස්ථාපනය කර ඇත. හඳුනාගත් අඩුපාඩු වැලැක්වීම සහ ක්‍රියාමාර්ග ඇති කිරීමට මෙම තොරතුරු විශ්ලේෂණය කරයි.

ක්‍රියාවලියේ යම් අඩුපාඩුවක් හඳුනාගත්විට ඒවා නැවත සිදුවීම වලක්වා ගැනීම සඳහා ක්ෂණික ක්‍රියා මාර්ග ගැනීම සිදුවෙයි. සුමට සහ යහපත් මෙහෙයුම් කටයුතු සිදු කිරීම තහවුරු කරමින් ව්‍යාපාර කටයුතු වල විනිවිදභාවය පාලනය හා ප්‍රතිපත්ති වර්ධනය කිරීම සඳහා පියවර ගෙන ඇත. බැංකුවේ. නියමිත ප්‍රතිපත්ති හා මෙහෙයුම් කටයුතු වල ඇති අනුකූලතාවය බාහිර සහ අභ්‍යන්තර විගණකවරුන්ගේ නිරීක්ෂණට ලක්වෙයි.

නිවැරදි තීරණ ගැනීම පහසුකරවීම හා කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට තොරතුරු පද්ධතිය හා කළමනාකරණ තොරතුරු පද්ධතිය වැඩි දියුණු කිරීමට ආයෝජන සිදු කිරීමේ ක්‍රියාමාර්ග බැංකුව ආරම්භ කර ඇත.

නිවැරදි තීරණ ගැනීම පහසුකරවීමටත් කාර්යක්ෂම සේවාවක් ලබාදීම පිණිසත් අභ්‍යන්තර පාලන පද්ධතිය සහ කළමනාකරණ තොරතුරු පද්ධතිය වැඩි දියුණු කිරීම වෙනුවෙන් ආයෝජන සිදුකිරීමට වැඩ පිළිවෙලක් බැංකුව ආරම්භකර ඇත.

තරඟකාරී ලාභයක් සහතික කරගැනීම සඳහා වෙළඳපල පංගුව විකල්ප මාර්ග වලින් ලබා ගැනීමත් ව්‍යුහය හා පද්ධතිය සහ පුද්ගලයින් මත අවශ්‍ය ආයෝජන සිදු කිරීමටත් බැංකුව දැඩි ලෙස මැදිහත්වී ඇත.

අවම හානියක් සහිතව ඉතා ඉක්මනින් අනපේක්ෂිත ව්‍යසනයකින් මිදීම සඳහා තවදුරටත් මෙහෙයුම් අවදානම අඩුකිරීමේ ක්‍රියාමාර්ගයක් ලෙස රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ඵලදායි ලෙස ව්‍යාපාර අබන්ධතා සැලසුම අබන්ධව ක්‍රියාත්මක කරයි. ඒ සඳහා පහත සඳහන් ප්‍රධාන ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කර ඇත.

- රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ව්‍යාපාර අබන්ධතා සැලසුමේ 03 කොටස සමාලෝචනය කරමින් ව්‍යාපාර අබන්ධතා සැලසුමේ මෙහෙයුම් කමිටුවේ සමුද්දේශ්‍ය විෂය (TOR) ස්ථාපිත කරයි.
- ව්‍යාපාර අබන්ධතා සැලසුම් (BCP) කමිටුව පත් කිරීම
- මූලස්ථාන ගොඩනැගිල්ලේ සෑම මහලකම ගිනි අධීක්ෂණ නිලධාරියෙකු පත්කිරීම
- තොරතුරු තාක්ෂණය සම්බන්ධ තක්සේරුවක් සැපයීම හා ලේඛන කළමනාකරණ පද්ධතිය සඳහා මිලදී ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම.
- මූලස්ථාන කාර්යාලයේ ව්‍යාපාර අබන්ධතා සැලසුම් සඳහා සුදුසු ස්ථිර ස්ථානයක් පිළියෙල කිරීම.
- මූලස්ථාන ගොඩනැගිල්ලේ ගිනි අනතුරු හැඟවීමේ සංඥා සවිකිරීම
- ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රධාන ශාඛා 11 තුළ ආපදා නිවාරණ පෙරහුරු සිදුකිරීම හා එහි ප්‍රතිඵල BCP නියමු කමිටුවට හා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට වාර්තා කිරීම.
- ගිනි නිවීමේ උපදේශකයින්ගේ සහයෝගයෙන් ප්‍රධාන කාර්යාලය සඳහා ගිනි නිවීමේ පෙරහුරුවක් සහ ප්‍රධාන කාර්යාලයේ හා ශාඛා කාර්ය මණ්ඩල සඳහා ව්‍යාපාර අබණ්ඩතා සැලැස්ම (BCP) පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් සිදුකිරීම.

දැනට පවතින ගෝලීය වසංගත තත්ත්වය නිසා පැනනැගිය හැකි තර්ජන හේතුවෙන් සේවකයින්ගේ ප්‍රධාන විශයෙන් මහජනතාවගේ හා ගනුදෙනුකරුවන්ගේ සෞඛ්‍ය හා ආරක්ෂණ ප්‍රමිතීන් පවත්වාගෙන යෑමට අවශ්‍ය පියවර ගැනීම සඳහා වර්ෂය තුළදී අර්බුද කළමනාකරණ කණ්ඩායමේ (CMT) රැස්වීම් කීපයක් පවත්වා තිබිණි. සෞඛ්‍ය බලධාරීන් විසින් නිකුත් කර ඇති සෞඛ්‍ය හා ආරක්ෂණ ප්‍රමිතීන් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව දැඩි ලෙස අනුගමනය කරයි.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණය (ඉතිරි කොටස)...

මූලෝපායික අවදානම් කළමනාකරණය

මූලෝපායික අවදානම යනු ඉපයීම් සඳහා පවතින හෝ වියහැකි බලපෑම්, අභිතකර ව්‍යාපාරික තීරණ නිසා ප්‍රාග්ධනය කෙරෙහි ඇතිවිය හැකි බලපෑම්, අනිසි ලෙස තීරණ ක්‍රියාත්මක කිරීම සහ ක්ෂේත්‍රයේ ඇතිවන වෙනස්වීම් සඳහා ප්‍රතිචාර නොදැක්වීම හේතුවෙන් ඇතිවිය හැකි තත්ත්වයකි.

අධ්‍යක්ෂ මණ්ඩලය හා සාමාන්‍යාධිකාරීවරයා, ආයතනික කළමනාකරණය හා එක්ව මූලෝපායික සැලැස්මක් මෙහෙය වන අතර එය මනා ලෙස ක්‍රියාත්මක වීම සඳහා පහල මට්ටම් දක්වා සන්නිවේදනය කිරීම සිදුකෙරේ. අධ්‍යක්ෂ මණ්ඩලය හා ආයතනික කලමනාකාරිත්වය විසින් ගනු ලබන සියලුම මූලෝපායික තීරණවල ගුණාත්මකබාවය ඉහල නැංවීමට හා අවදානම අඩු කිරීම සඳහා නියාමන අවශ්‍යතා අදාල නීති හා රෙගුලාසි, සංස්ථාපිත පාලන අවශ්‍යතා, ආචාර ධර්ම සහ කර්මාන්තයේ යහපත් පරිචය සම්බන්ධයෙන් නිසි අවධානය යොමු කරයි.

නෛතික අවදානම් හා අනුකූලතා අවදානම් කළමනාකරණය

බලාපොරොත්තු රහිත අධිකරණ ක්‍රියාමාර්ග හෝ බැංකුවට එරෙහිව ගත් නීතිමය පියවරකට සාර්ථක ලෙස මුහුණදීමට අපොහසත්වීම නිසා නෛතික අවදානම ඇතිවේ. එවැනි අවස්ථාවලදී බැංකුවේ සේවය කරන නෛතික කටයුතු සඳහා මැදිහත්වන කණ්ඩායම අවශ්‍ය පියවර ගෙන එවැනි අවදානම් අවම කිරීම සඳහා ක්ෂණික පියවර ගනී. බැංකුව මුහුණදෙන නෛතික අවදානම මැඩ පැවැත්වීම සඳහ අවශ්‍ය වුවහොත් බැංකුව බාහිර නීති උපදෙස් ලබා ගනී.

අදාළ නීති රෙගුලාසි හා චර්යා ධර්ම සංග්‍රහ සහ යහපත් භාවිතාවන්ගේ ප්‍රමිති සඳහා අනුකූල නොවීම නිසා අනුකූලතා අවදානම බැංකුවට බලපෑහැකි අලාභයකි. එහෙත් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවතුළ අනුකූලතා ක්‍රියාමාර්ග ආරම්භකර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුකූලතා අත්පොතක් අනුමතකර ඇත. අනුකූලතා අවදානම අනුරූප ලෙස කළමනාකරණය කිරීම සහතික කරගැනීම සඳහා අනුකූලතා කාර්ය ව්‍යාපාරික හා මෙහෙයුම් ඒකක සමග සමීපව කටයුතු කරයි. 2020 වසරේ අනුකූලතා අවදානම් කළමනාකරණය පිළිබඳ වැඩි විස්තර සඳහා වාර්ෂික වාර්තාවේ ආයතනික පාලනය පිළිබඳව කොටස බලන්න.

අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා ක්‍රියාවලිය (ICAAP)

බලපත්‍රලාභී විශේෂිත බැංකු හා බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා බේසල් III යටතේ ප්‍රාග්ධන අවශ්‍යතාවයන් (අධ්‍යර II අධීක්ෂණ සමාලෝචන ක්‍රියාවලිය) (SRP) 2016 අංක 01 දරණ බැංකු පනත් විධිවිදානයන්ගේ 4.2 සහ 4.3 පරිච්ඡේද අනුව ICAAP වාර්තාව පිළියෙල කර ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමුකර ඇත.

එම නිසා ICAAP පහත සඳහන් අවදානම් පිළිබඳ අවධානය යොමු කරයි.

අ) අධියර 1 යටතේ හඳුනාගත් ණය වෙළඳපොළ හා මෙහෙයුම් අවදානම්

ආ) අධියර 1 යටතේ සම්පූර්ණයෙන්ම හඳුනානොගත් අවදානම්, සංකේන්ද්‍රණ අවදානම (ණය අවදානම) පොළී අනුපාත බැංකු පොත්පත්වල ප්‍රතිලාභ අවදානම් අනුපාත (වෙළෙඳපොළ අවදානම) සහ

ඇ) අධියර 1 යටතේ ආවරණ නොවූ අවදානම් වර්ග අධියර 1 යටතේ විශේෂයෙන්ම හඳුනානොගත් අවදානම් වේ සඳහා ද්‍රවශීලතා අවදානම, කීර්තිනාම අවදානම, සංකේන්ද්‍රන අවදානම, අනුකූලතා අවදානම, උපයමාර්ගික හා ව්‍යාපාරික අවදානම්, අවශේෂ අවදානම සහ ශේෂපත්‍ර දිනෙන් පසු වීලිදරව්කිරීම් ඇතුළත්වේ.

විවිධ අවදානම් වර්ග සඳහා තහවුරු පරීක්ෂා හා අවස්ථා විශ්ලේෂණය වැනි ප්‍රමාණාත්මක යාන්ත්‍රණ කීපයක් ICAAP සංවර්ධන ක්‍රියාවලියේ අන්තර්ගතවේ. බැංකුව නිරාවරණයවන අධියර දෙක අවදානම් තක්සේරු කිරීමට අවදානම් තක්සේරු ආකෘති හා අවස්ථා විශ්ලේෂණ, අවදානම් කළමනාකරණ අංශය මගින් අභ්‍යන්තරව සකසා ඇත. ප්‍රාග්ධනයට හා අවදානම් බරිත වත්කම්වලට ඇතිවන බලපෑම ගණනය කර ඇති අතර එම නිසා සෑම අවස්ථාවකදීම CAR වෙනස්වීම් තක්සේරු කරනු ලබයි.

මානව සම්පත් කළමනාකරණය

සේවක පිරිස් ආයතනයේ ලාභය සඳහා ප්‍රධාන වශයෙන් දායක වන අතර ඔවුන්ගෙන් ආයතනයට වටිනාකමක් ලැබෙයි. සේවක පිරිස ආයතනයක ශේෂ පත්‍රයේ හෝ ගිණුම් පොත් තුළ වත්කම් යටතේ දැක්විය හැකිවේ. කෙසේ නමුත් ඔවුන් යම් මූල්‍ය වටිනාකමක් ලබා දිය නොහැකි ඉතා වටිනා වත්කමකි.

එම නිසා අපගේ ගනුදෙනුකරුවන් වෙත වටිනාකමක් ලබා දෙන අපගේ දැක්ම දෘෂ්‍ය ප්‍රතිඵල බවට පත් කරනු ලබන්නේ සේවක පිරිස විසිනි. එම නිසා පුහුණු හා සංවර්ධන කටයුතු සහ සේවක සහභාගිත්ව කටයුතු මගින් සේවක පිරිසට යහපත් සේවා ස්ථානයක් නිර්මාණය කරමින් අප සේවක පිරිසගේ දැනුම, දක්ෂතා සහ හැකියාවන් වර්ධනය කිරීම සඳහා ආයෝජන සිදු කරමින් අවධානය යොමුකර ඔවුන්ට විශිෂ්ඨත්වය දැක්වීම සඳහා සියල්ල ඇතුලත් පෙලඹවීම් ඇති කරන සේවා පරිසරයක් ලබා දෙන බව අපි තහවුරු කරමු. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අපි ආර්ථික වර්ධනය ඉදිරියට ගෙනයාමට විශිෂ්ට දක්ෂයින් ආකර්ෂණය පෝෂණය කිරීම හා රඳවා ගැනීම කෙරෙහි අඛණ්ඩව අවධානය යොමු කරමු.

කාර්ය මණ්ඩලය සංඛ්‍යාව

මෙම වසර තුළ මුළු සේවක සංඛ්‍යාව 369ක් වූ අතර, ඔවුන් තුළනාත්මකව කුඩා ප්‍රමාණයක් වුවත්, ඔවුන් වඩා ඉහළ ප්‍රමාණයකින් බැංකුවේ කාර්යසාධනයට දායක වී ඇත. වසර තුළ, කාර්ය මණ්ඩල සාමාජිකයින් තිදෙදෙනු බැංකුවෙන් ඉවත් වූ අතර නිලධාරීන් 12ක් බැංකුවෙන් විශ්‍රාම ගන්නා ලදී. කාර්ය මණ්ඩල සාමාජිකයෙක් වෙනත් හේතූන් මත බැංකුවෙන් ඉවත් විය. වසර තුළ බැංකුව සඳහා නව කාර්ය මණ්ඩල සාමාජිකයින් 07ක් අපි බඳවා ගත්තෙමු. අභ්‍යන්තරව සහ බාහිරව අපගේ බඳවා ගැනීමේ පටිපාටියට අනුකූලව ඇබෑර්තු පිරීවීම සිදුකරන ලදී.

කාර්යමණ්ඩලය වෙනස

කළමනාකරණ මට්ටම	වෙනස		
	විශ්‍රාම ගිය	ඉල්ලා අස්වූ / වෙනත්	බාහිරින් බඳවාගත්
ආයතනික කළමනාකරණය	2		2
ජේෂ්ඨ කළමනාකරණය	2	1	
විධායක	3	1	5
විධායක නොවන	5	2	
එකතුව	12	4	7

කාර්ය මණ්ඩල සංඛ්‍යාව ස්ථර අනුව

කළමනාකරණ මට්ටම	2020.12.31 දිනට සේවක සංඛ්‍යාව
ආයතනික කළමනාකරණය	9
ජේෂ්ඨ කළමනාකරණය	7
විධායක	106
විධායක නොවන	247
එකතුව	369

ස්ත්‍රී පුරුෂභාවය

සමානව රැකියා අවස්ථා සපයන්නෙකු ලෙස රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව කාන්තා හා පුරුෂ පාර්ශවයන් සඳහා සමාන රැකියා අවස්ථා ලබා දී ඇත. 2020 වසර සඳහා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ කාන්තා හා පිරිමි සේවක ප්‍රතිශතය පිරිමි 50% සහ කාන්තාවන් 50% ක් විය.

සේවක වයස් විස්තරය

ඉතා පළපුරුදු හා ජ්‍යේෂ්ඨ කාර්ය මණ්ඩලයක් තබා ගැනීමට බැංකුවට හැකියාව ලැබී තිබිනි. කාර්ය මණ්ඩලයෙන් 49% ක ප්‍රමාණයක් අවුරුදු 40 ඉක්මවූ අය වෙති.

වයස් වර්ගය	2020.12.31 දිනට සේවකයින් ගණන
50 හෝ ඊට ඉහළ	78
40 - 49	102
30 - 39	102
29 හෝ ඊට පහළ	87
එකතුව	369

කුසලතා කළමනාකරණය

අපගේ සියලුම ගනුදෙනුකරුවන්හට උසස් ගුණාත්මක සේවාවක් ලබා දීමට හැකි වන නිසා කුසලතා සංචිතය කළමනාකරණය සඳහා අපගේ ඉහලම ප්‍රමුඛත්වය හිමි වෙයි. සම්පූර්ණ හැකියාවක් අවබෝධ කරගැනීමට සමාගමට හැකියාව ඇතිකරමින් අනාගත නායකයින් බවට පත්වීම සඳහා සේවකයින්ගේ හැකියාවන් සංවර්ධනය කිරීමට අපගේ කණ්ඩායම තුළ ආයෝජනය කරමින් විශිෂ්ට සම්පත් අත්පත් කරගෙන බැංකුව තුළ රඳවා ගන්නා බව අපි තහවුරු කරමු.

මානව සම්පත් කළමනාකරණය (ඉතිරි කොටස)...

කුසලතා ආකර්ෂණය හා අත්පත් කරගැනීම

ව්‍යාපාර අවශ්‍යතාවයන් සඳහා මනාව ගැලපෙන අපේක්ෂකයා තෝරාගැනීම සඳහා සැලසුම්කර ඇති බැංකුවේ බඳවාගැනීමේ පටිපාටිය මගින් නව කුසලතා අත්පත් කර ගැනීම සිදුකරයි. අවශ්‍ය දක්ෂතාව, දැනුම, හැකියාවන් සහ අපගේ සංස්කෘතියට ගැලපෙන හා එය පෝෂණය කරන වඩාත් වැදගත් චර්යාවන් සහිත දක්ෂයින්ට ප්‍රමුඛතාව ලබා දේ. ඇබෑර්තු ඇතිවන සෑම අවස්ථාවකදීම, අභ්‍යන්තර දක්ෂයින්ට සමීප සලකාබැලීම ලබාදෙන අතර, අභ්‍යන්තර දක්ෂයින් ලබාගත නොහැකිනම් අවශ්‍ය මට්ටම්වලදී විශේෂිත දක්ෂයින් ලබා ගනී.

පුහුණුව හා සංවර්ධනය

සේවකයෙකුගේ දැනුම, හැකියාවන්, දක්ෂතා, ආකල්ප සහ කාර්යසාධනය වැඩි කරන ආකාරයෙන් පුහුණුව හා සංවර්ධනය ප්‍රධාන මෙවලමක් වන අතර, එය අප බැංකුවේ වර්ධනය අත්කර ගනු ලබයි. අපගේ සේවකයින්ට ඔවුන්ගේ දක්ෂතා සහ දැනුම වැඩි කර ගැනීමට ඔවුන්ගේ පුද්ගල සන්නාමය ශක්තිමත් කරමින් පුහුණුව හා සංවර්ධන අවස්ථා පිරිනමනු ලැබේ. තම රාජකාරි ඉටු කිරීමට ඔවුන්ට හැකියාව ඇති කරමින් විවිධ කාර්යයන් හී සෑම මට්ටමකදීම සේවකයින් පුහුණු කර සංවර්ධනය කිරීමට බැංකුව උත්සාහ ගන්නා අතර අනාගත වගකීම් සඳහා ඔවුන්ට අවස්ථාව ලබා දේ.

නායකත්වය සඳහා මංපෙත් සංවර්ධන කිරීමේ වැදගත්කම සලකා බලමින් බැංකුව සුදුසුකම්ලත් තරුණ සේවකයින් උදෙසා නායකත්වය සංවර්ධන වැඩසටහනක් සැලසුම්කර ඇත. උපදේශකයින් මෙන්ම මනා සාර්ථකත්වයකින්යුත් නායකයින් ලෙස පුහුණුකරවීමට හා වෘත්තිය සංවර්ධනය සහ අනුප්‍රාප්තික සැලසුම් මගින් පුහුණුකර යොමුකරවීමට මෙම වැඩසටහන මේ පිළිබඳව ඉහළ විභවතාවකින් යුත් කණ්ඩායමක් හඳුනාගැනීම සඳහා සැලසුම් කර ඇත. ආයතනික ඉලක්ක වෙත ලඟා වීම සඳහා සහයෝගීතාවය මත පදනම්වූ, රාජකාරී පරිසරයක් ගොඩනැඟීම හා වෙනස්කම් කළමනාකරණය කිරීමේ හැකියාව ප්‍රවර්ධනයටත්, වඩාත් ඵලදායී ලෙස කටයුතු කිරීමටත් ඔවුන්හට මෙම වැඩ වැඩසටහන, තවදුරටත් සහාය දක්වයි. නායකත්ව සංවර්ධන වැඩසටහන, නායකත්ව සංවර්ධන කුසලතා, ඉදිරිපත් කිරීමේ කුසලතා, ඵලදායී ලේඛන කුසලතා, කාර්යසාධන කළමනාකරණ කුසලතා සහ සාර්ථක උපදේශනය හා ගනුදෙනුකාර සේවාව සඳහා ඉලක්කකර ඇත. දැනුමෙන් හා පලපුරුද්දෙන් සපිරුනු අති දක්ෂ අභ්‍යන්තර ශ්‍රමබලකායක් ඇතිකරමින් ව්‍යාපාර පරිමාව වර්ධනය කිරීම අපේක්ෂිත ඉලක්කකරා ලඟාවීමට රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව අපේක්ෂා කරයි.

කොවිඩ්-19 ගෝලීය වසංගත තත්ත්වය හමුවේ 2020 වර්ෂයතුළ දී පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ඒ සඳහා සහභාගිවීම අභියෝගාත්මක විය. කෙසේ හෝ මාර්ගගත ක්‍රමය ඔස්සේ අභ්‍යන්තර හා බාහිර පුහුණු වැඩසටහන් පැවැත්වීමට අපිට හැකියාව ලැබී තිබිනි. සමාලෝචිත වර්ෂය තුළ දී අපගේ සේවකයින් අභ්‍යන්තර පුහුණු වැඩසටහන් 06 ක් හා බාහිර පුහුණු වැඩසටහන් 15 ක් සඳහා සහ සහභාගී වී ඇති බව පෙනී යයි. දේශීයව හා ජාත්‍යන්තරව කර්මාන්තයේ නවෝත්පාදන හා සංවර්ධනයට නිරාවරණයවීම සඳහා බැංකුව සේවකයින් සඳහා බාහිර පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදුකරයි.

2020 වසර තුළ, ලබාදෙන ලද විවිධ පුහුණු අවස්ථාවන් හී සේවක සහභාගිත්වය පහත වගුවෙන් සාරාංශ කෙරේ.

ප්‍රධාන ක්ෂේත්‍ර	සහභාගිවූවන් ගණන
දැනුම හා දක්ෂතා සංවර්ධන පුහුණුව	37
ආකල්ප සංවර්ධන පුහුණුව අභිප්‍රේරණ පුහුණුව	77
සම්මන්ත්‍රණ, වැඩමුළු, සාමාජිකත්ව ගාස්තු, ප්‍රශ්න තරගාවලි	9

සේවකයින්ගේ සේවය

සේවා වර්ගය (අවුරුදු)	2020.12.31 දිනට සේවකයින් ගණන
0-4	58
5-9	155
10-14	52
15-19	9
20 ඉහළ	95
එකතුව	369

සේවකයින්ගෙන් 43%ක් බැංකුව තුළ වසර 10කට වැඩි කාලයක් සේවය කර ඇති අතර, බැංකුවේ සංවර්ධනයට ඔවුන්ගේ සේවය දායක කරයි. කාර්ය මණ්ඩලය වෙත මූල්‍ය ප්‍රතිලාභ ලබාදීම පමණක් නොව, මූල්‍ය නොවන ප්‍රතිලාභ ලබාදීමෙන් ඔවුන්ගේ රැකියා තෘප්තිය වැඩිකර ඇත.

අප අද සිටින ස්ථානය කරා ගමන්මඟ විතරම් පහසු නොවීය. නමුත්, බැංකුව එය අත්කරගෙන සිටින සෑම දෙයක්ම එහි සේවකයින්ගේ වෙහෙස නොබලා කැපවීමේ උත්සාහයන් තුළින් අත්කරගෙන ඇත.

අනාගත කරුණු

එළඹෙන වර්ෂයේ දී මානව සම්පත් විශිෂ්ට පරිචයන් වැඩි දියුණු කරමින් අපගේ සේවක පිරිස අඛණ්ඩව ශක්තිමත් කරමු. පුහුණු හා සංවර්ධන අවශ්‍යතාවයන් පිළිබඳ පරිපූර්ණ විශේෂ විශ්ලේෂණයක දැනටමත් සිදු කරන අතර මෙම විශ්ලේෂණය මගින් සේවකයින්ගේ තාක්ෂණය සහ මෘදු කුශලතා ආවරණය වන පරිදි සියල්ල ඇතලත් වඩාත් විස්තීර්ණ පුහුණු සැලැස්මක් නිර්මාණය කිරීමට අපි අපේක්ෂා කරමු.

අපේක්ෂිත මට්ටම් කරා ලඟා වීම සඳහා ප්‍රධාන පුද්ගලයින්ට ඔවුන්ගේ කුසලතා හා දැනුම වර්ධනය කරගැනීම වෙනුවෙන් ලබාදී තිබෙන අවධානාත්මක කරුණු මගින් අනුප්‍රාප්තික සැලසුම් ක්‍රියාවලිය වැඩි දියුණු කිරීමට හා ශක්තිමත් කිරීමට ඉදිරි වසරේ දී අපේක්ෂා කරයි. කෙටියෙන් සඳහන් කරන්නේනම්, වඩා යහපත් සේවා ස්ථානයක් සහ වඩා තෘප්තිමත් සේවකයින් නිර්මාණය කිරීමට අපි උත්සාහ කරමු.

ආයතනික සමාජ වගකීම

පුරවැසියා ඕනෑම රටක සමාජයේ ප්‍රධාන ඒකකය නියෝජනය කරයි. රාජ්‍ය යාන්ත්‍රණය මෙම පුරවැසියාගේ පූර්ණ අභිවෘද්ධිය පිණිස ක්‍රියා කරයි. මේ කාර්යය සඳහා මෙම සමාජ වෙනුවෙන් පුළුල් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරමින් සිටියි. භෞතික දියුණුව මෙන්ම ආධ්‍යාත්මික දියුණුවද ප්‍රධාන අභිලාෂයකි. කෙසේ නමුත් මෙම කටයුතුවල අවසන් ප්‍රතිඵලය දියුණු සමාජයක් නිර්මාණය කිරීම හා තෘප්තිමත් පුරවැසියෙකු බිහිකිරීම වෙයි. රටක දියුණුව සඳහා මෙය වඩාත් හිතකර ප්‍රධාන අවශ්‍යතාවයකි.

“තිරසාර සංවර්ධනය” යන සංකල්පය නූතන ලෝකයේ ප්‍රධාන සංවර්ධන මාතෘකාවන්ගෙන් එකකි. මේ සඳහා විධිමත් රාජ්‍ය මෙන්ම අනෙකුත් සංවිධානද විවිධ මැදිහත්වීම් සහ දායකත්වයන් සිදු කරයි. මෙම කටයුතුවලට ස්වේච්ඡා මෙන්ම වගකිවයුතු දායකත්වයන් ද ඇතුළත්වේ. එමගින් සෞඛ්‍ය සම්පන්න හා තෘප්තිමත් සමාජයක් නිර්මාණය කිරීම අරමුණු කරයි. පිළිගත් ක්‍රමයක් යටතේ සමාජය සමග අන්තර් ක්‍රියාකරන කිසියම් ව්‍යුහයක පැවතීම තීරණය කිරීමේ දී එවැනි තෘප්තිමත් සමාජයක් පැවතීම අත්‍යවශ්‍ය කරුණකි.

එමගින් අදහස් වන්නේ මානව මූලිකව පවතින සාමාජයන්හි පූර්ණ සංවර්ධනය සමාජයේ පවතින ව්‍යුහාත්මක සංවිධානවලට සෘජුවම බලපෑම් එල්ලකරන බවයි.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව නිතරම සමාජ වගකීම අරමුණුකරගත් රාජ්‍ය මූල්‍ය ආයතනයකි. සාමාන්‍ය සමාජ සංවර්ධනය අත්‍යවශ්‍ය කරුණක් ලෙස මෙන්ම ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා ද අපි හඳුනාගෙන ඇත්තෙමු. වගකිවයුතු හැසිරීම් පද්ධතියක් සහිත විධිමත් ව්‍යුහගත රාජ්‍ය මූල්‍ය ආයතනයන්ගෙන් එකකි. දශක නවයක් පැරණි රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ මතකයන් මෙයට සාක්ෂි දරයි. ජාතියේ නිවාස අවශ්‍යතාවයන් සපුරාලීමට එවැනි කැපකිරීම් සිදුකල අද දක්වා එම කටයුතු සිදුකරන ආයතනයක් දක්නට නොමැත. බැංකුවේ ව්‍යාපාරික අරමුණු ඉටුකරගැනීම මෙන්ම ඉහත සඳහන් කල ජාතික වගකීම් ද ඉටු කරයි.

ව්‍යාපාරික අරමුණු ඉටුකර ගැනීමේ ප්‍රමාණයට ආයතනය ධනාත්මක දායකත්වයක් එහි ප්‍රජාව වෙනුවෙන් සිදුකරයි. පාරිසරික සංවර්ධනය, සංස්කෘතික අනන්‍යතා සුරැකීම, දේශීය අධ්‍යාපන පුනර්ජීවනය කලා ශිල්ප හා අත්කම් පෝෂණය කිරීම, ක්‍රීඩා කුශලතා වර්ධනය මෙන්ම ජාතික ආරක්ෂාව හා ජාතික සමගිය වැනි ප්‍රධාන ජාතික අවශ්‍යතා සඳහා දායකත්වය ලබාදීම සිදුකරයි.

සාමාන්‍ය වශයෙන් සෑම දෙනෙකුටම 2020 වසර ගෝලීය තර්ජනයන්ට මුහුණ දීමට සිදුවූ කාලයකි. අඩු වැඩි වශයෙන් මේ දක්වා අපි ද ඒවාට මුහුණ දෙමින් සිටිමු. එවැනි තත්ත්වයන් යටතේ අපගේ මූල්‍ය ආයතනයේ අපේක්ෂාව වන්නේ ප්‍රජාව සඳහා එහි උපරිම සහයෝගය ලබා දීමයි. මෙම මූල්‍ය ආයතනයේ ආයතනික සමාජ වගකීමේ සැලකිය යුතු කොටසකට ලබාදෙන දායකත්වය ප්‍රමාණ කල නොහැකි වෙයි. එහි එක් සන්ධිස්ථායක් ලෙස ජාතියේ මූල්‍ය සාක්ෂරතාවය ගොඩනැගීමේ දී ඒ පිළිබඳ දැනුවත් කිරීමට ආරම්භකරඇති වැඩ පිළිවෙල ප්‍රශංසනීයවේ. මේ දක්වා මෙම කාර්යයන් පිළිබඳව උපරිම දායකත්වයක් ලබා දී ඇත. මේ සඳහා විධිමත් ජාලගත සැලසුමක් ජාතික මට්ටමින් ආරම්භකරමින් පවතී. මෙය ආයතනය ලාභ ලැබීමේ අපේක්ෂාවෙන් සිදුකරන මැදිහත්වීමක් නොවේ. එය අනාගත සමාජ ප්‍රගමනය සඳහා සිදුකරන අත්‍යවශ්‍ය මැදිහත්වීමකි.

රටක් ලෙස ඉදිරියට යෑම සඳහා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව උපරිම වගකීම් හා බැඳීම් ඉටු කිරීම සඳහා ඉදිරියටත් වගකියනු ඇත.

අපගේ නිෂ්පාදන හා සේවාවන්

බැංකුවේ සෑම ඉදිරි පියවරක්ම ජනහිතකාමී වියයුතු බව අප දරණ මතයයි. සියලුම සේවාවන්ගේ අවසන් ප්‍රතිලාභියා මහජනතාව වෙයි. සේවා සැපයීමේදී ගනුදෙනුකරුවන්හට එකම ස්ථානයක දී ඔවුන්ගේ අවශ්‍යතාවයන් සපුරාලීම ඉතා වැදගත් වේ. විවිධ මූල්‍ය අවශ්‍යතාවයන් සමග පැමිණෙන සෑම ගනුදෙනුකරුවෙක්ම තෘප්තිමත් කිරීම පහසු කරුණක් නොවේ. අපගේ නිමැවුම් මෙන්ම අප සපයන සේවාවන් ද ඉහළ ගුණාත්මකභාවයෙන් යුතු වීවා විය යුතු වේ. මෙය ගනුදෙනුකරුවන්ගේ තෘප්තිමත්භාවයට මග පාදයි.

බැංකුවේ කාර්ය මණ්ඩලය මෙම මූලධර්මයට එකඟවීමට දැඩි කැමැත්තක් දක්වන බව දිස්වෙයි. 2020 වසරේ දී බැංකුව ලබාගත් ප්‍රගතිය මෙම කරුණ සනාථ කළහැකි එක් නිදසුනකි. දිවයින පුරාම සේවා සැපයීම සඳහා ක්‍රියාත්මක වෙමින් පවතින ශාඛා ජාලය ළඟාකරගත් ප්‍රගතිය සඳහන් කළ යුතුම කරුණකි.

වෘත්තිකයාගේ සිට සාමාන්‍ය පුද්ගලයා දක්වා පරාසයක සියල්ලන්ටම සුදුසුවන නිෂ්පාදන පෙළක් හඳුන්වාදීමට අපහට හැකියාව ලැබී ඇත. සියලුම නිවාස මූල්‍ය අවශ්‍යතාවයන් ඉටු කිරීමේ ශක්‍යතාවයක් අප සතු වෙයි. දළ දේශීය නිෂ්පාදිතයේ වැඩිම ප්‍රතිශතයක් නියෝජනය කරන කෘෂිකාර්මික අංශයට වැදගත් දායකත්වයක් ලබා දෙන්නෙකු බවට තවදුරටත් අප පත්වී ඇත. පාරම්පරික මැණික් කර්මාන්තය සහ අනෙකුත් කර්මාන්ත අංශ ඉලක්ක කර ගනිමින් මූල්‍ය සේවා රැසක් ආරම්භ කරමින් පවතී.

රට තුළ ආදායම් බෙදීයාම දිරිමත් කිරීම සඳහා ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ආර්ථික වර්ධනය සඳහා ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (MSME) බලගැන්වීමේ රජයේ ප්‍රතිපත්තියට හවුල් වෙමින් මූල්‍ය දායකත්වය ලබාදීම මගින් රජය සතු ආයතනයක් ලෙස රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ක්ෂේත්‍රය පෝෂණය කිරීම හඳුනාගෙන ඇත.

රාජ්‍ය සේවයේ නිලධාරීන් ඉලක්ක කරගනිමින් සුවිසල්, සේවා විවිධාංගීකරණයක් සිදුකර ඇත. 2020 වසර මෙම කාර්යයේ සැලසුම් කිරීමේ වසර විය. තවදුරටත්, විශ්වාසයෙන් යුතුව අප වෙත පැමිණෙන ගනුදෙනුකරුවන්ට ලබාදුන් පොරොන්දු 100% ඉටු කර ඇති අතර ඔවුන්, රාජ්‍ය බැංකුවක් ලෙස අප උපයාගත් වත්කමකි. 2020 වසරේ දී විවැහි ගනුදෙනුකරුවන් සඳහා සිත්ගන්නා සුළු පොලී අප හඳුන්වා දී ඇත. එපමණක් නොව ලමුන් හා ජේෂ්ඨ පුරවැසියන් සඳහා විවිධ ඉතුරුම් ක්‍රමද ආරම්භ කිරීමට අපහට හැකියාව ලැබී ඇත.

අවුරුදු 89 ට අධික කාලයක් බැංකුවට ජන හඳවත් දිනා ගැනීමට හැකිවී ඇත්තේ සෘජු හා වක්‍ර ගනුදෙනුකරුවන් සඳහා බැංකුව ලබා දෙන සේවාව පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට ගෙනගිය ප්‍රචාරණ ව්‍යාපාරය හේතුවෙනි. රාජ්‍ය යාන්ත්‍රණය සහ පුද්ගලික සම්බන්ධතා මගින් ගනුදෙනුකරුවන් දිනා ගැනීමට විවිධ අලෙවිකරණ තාක්ෂණික ක්‍රම යොදා ගෙන තිබිණි. වර්ෂය මුළුල්ලේ තිබූ බැංකුවේ මූල්‍ය ශක්‍යතාවය සර්ව ව්‍යාප්ත අලෙවිකරණ ක්‍රමවේද යොදාගත් බවට තහවුරුවක් වෙයි.

2020 වසර වැඩිවීම ණය ප්‍රමාණයක් නිකුත් කළ වසර ලෙස වාර්තා වී ඇත. අමාත්‍යාංශයේ යෝජනාක්‍රම ණයවලින් මෙම වටිනාකම රුපියල් මිලියන දාහතක් පමණ වේ. අනෙක් අතට ණය මගින් ලැබූ පොලියේ ලාභදායිත්වය විශාල ලෙස ඉහළ ගොස් තිබිණි. මෙය දශක 9 ක පමණ මූල්‍ය පළපුරුද්දක් ඇති බැංකුවක් වන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ කැපීපෙනෙන සන්ධිස්ථානයන්ගෙන් එකකි. කෙටිකාලීන හා දිගුකාලීන ස්ථාවර තැම්පත් ලෙස වඩාත් කැපී පෙනෙන ස්ථාවර තැම්පත් කලඹක් ලබා ගැනීමට බැංකුවට තවදුරටත් අවස්ථාව සැලසී තිබිණි.

මූල්‍ය අංශයේ ප්‍රචලිතව ඇති 1922 දුරකතන අංකය හඳුන්වා දීමද බැංකුව ලබාගත් ජයග්‍රහනයකි. පාරිභෝගිකයින් වෙත අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා නිලධාරීන් මෙම සේවාවට අනුයුක්තකර ඇත. මීට අමතරව නූතන ලෝකයට මූල්‍ය තොරතුරු සැපයීම සඳහා වෙබ් අඩවිය ද මනාලෙස ප්‍රයෝජනයට ගනී. මේ සියල්ලටම අමතරව රාජ්‍ය උකස් හා අයෝජන බැංකුව ජන මාධ්‍ය හා වෙනත් සේවාවන් මගින් තොරතුරු සැපයීමේ ශක්තිමත් ජාලයක් පවත්වාගන යෑමට සමත් වී ඇත.



මූල්‍ය තොරතුරු

අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව	90
මූල්‍ය වාර්තාකරණය පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ අභ්‍යන්තර පාලන ප්‍රකාශනය	94
අභ්‍යන්තර පාලනය පිළිබඳ විගණකාධිපති වාර්තාව	96
මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම	98
විගණකාධිපති වාර්තාව	100
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය	105
ලාභ හෝ අලාභ ප්‍රකාශනය	106
ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය	107
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය	108
ගිණුම්කරණ ප්‍රතිපත්ති	109
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්	127
දස වසරක සංඛ්‍යාත්මක සාරාංශය	164

අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

සාමාන්‍ය තොරතුරු

1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතිය මගින් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ශ්‍රී ලංකාව තුළ සංස්ථාපනය කරන ලද අතර 1988 අංක 30 දරන බැංකු පනත හා එහි සංශෝධන ප්‍රකාරව බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් ලෙස ප්‍රකාශයට පත්කර ඇත. 1988 අංක 30 දරණ බැංකු පනත හා එහි සංශෝධනයන්ට යටත්ව හා 1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතිය හා එහි සංශෝධනයන්ගේ අවශ්‍යතාවයන්ට අනුකූලවන පරිදි 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා බැංකුවේ විගණනය කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන හා මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව සමඟින් බැංකුවේ කටයුතු පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව අධ්‍යක්ෂවරු ඉදිරිපත් කරන්නේ ඉමහත් සතුටිනි.

බැංකුවේ ප්‍රධාන කටයුතු

නිවාස, කෘෂිකාර්මික සහ කර්මාන්ත සංවර්ධන මූල්‍ය ප්‍රවර්ධනය කිරීම හා තැම්පතු එක්රැස් කිරීම රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ප්‍රධාන කාර්යයන් විය. වසර තුළ දී බැංකුවේ ප්‍රධාන කටයුතුවල ස්වභාවයේ සැලකියයුතු වෙනසක් සිදුවී නොමැත. දිවයිනේ නීති හා රෙගුලාසි වලට පටහැනි කිසිදු කටයුත්තක් බැංකුව සිදු කර නොමැත.

අධ්‍යක්ෂවරු

සංශෝධිත පරිදි 1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ විධිවිධාන යටතේ, සභාපතිවරයා ඇතුළු විධායක නොවන අධ්‍යක්ෂවරු නවදෙනෙකුගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වන අතර, සංශෝධිත පරිදි 1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ 7 වගන්තියට අනුකූලව අමාත්‍යවරයා විසින් ඔවුන් පත්කරනු ලබයි. විධායක අධ්‍යක්ෂවරු කිසිවෙකු බැංකුවේ නොමැත.

එසේ පත්කරන ලද අධ්‍යක්ෂවරු තිදෙනෙකු පහත සඳහන් අමාත්‍යාංශවල නියෝජිතයින් වේ.

අ. කෘෂිකර්ම විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය
ආ. නිවාස විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය
ඇ. පශු සම්පත් විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය

එක් අධ්‍යක්ෂවරයෙකු භාණ්ඩාගාර නියෝජිතයා ලෙස පත්කර ඇත.

ඕනෑම අධ්‍යක්ෂමණ්ඩල රැස්වීමක දී ගණපූරණය සඳහා අධ්‍යක්ෂවරු නව දෙනා අතුරෙන් සාමාජිකයින් තිදෙනෙකු ප්‍රමාණවත් වේ. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතිය හා බැංකු පනත අනුව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් අවම වශයෙන් මසකට එක් වතාවක් හෝ සභාපතිවරයාට අවශ්‍ය යයි හැඟීයන විට නිතර නිතර වුවත් පැවැත්විය හැකි වෙයි. 2020 වසර තුල දී රැස්වීම් 11 ක් පවත්වා ඇති බව වාර්තා වෙයි.

අධ්‍යක්ෂ මණ්ඩල රැසවීම් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම

අධ්‍යක්ෂවරයාගේ නම	සහභාගීවූ වියයුතු රැස්වීම් ගණන	සහභාගීවූ රැස්වීම් ගණන
ආචාර්ය කේ.ඩබ්.ඒ.යූ. කාරියවසම් මහතා (සභාපති)	11	11
ඩබ්.සී.එන්. කුරේ මහත්මිය	11	10
ඒ.ජේ.පී.එච්.බී.එම්.ආර්.එස්. බණ්ඩාර මහතා	11	11
එස්. ගලප්පත්ති මහතා	11	10
එච්.සී.ඩී.එල්. සිල්වා මහතා	11	11
ආචාර්ය පී. බී. වික්‍රම මහතා	11	04

කොන්ත්‍රාත් පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ උනන්දුව

සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තියේ අරමුණ වන්නේ බැංකුව හා එහි සම්බන්ධිත පාර්ශ්ව අතර ගනුදෙනු විනිවිදභාවය සහ අතේ දුරින් මිලකරණය මත පදනම් වන බව සහතික කිරීමයි.

සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනුවල ප්‍රමාණාත්මකබව බැංකුව විසින් සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමඟ කටයුතු කරන ආකාරය අනුව තීරණය කරනු ලබන පදනම් මෙම ප්‍රතිපත්තිය තුලින් පෙන්වා දේ. බැංකුව සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තිය අනුගමනය කරන අතර, එය බැංකු පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත්කළ නියෝගවලට සමගාමී වේ.

අධ්‍යක්ෂමණ්ඩලය විසින් සිදුකල හෝ සිදුකිරීමට යෝජනාකර ඇති යම්කිසි ව්‍යාපාර ගනුදෙනුවක් පිළිබඳව සෘජුව හෝ වක්‍රව බැංකුවේ අධ්‍යක්ෂවරයකු හෝ ඔහුගේ කලත්‍රයා හෝ යැපෙන දරුවකු හෝ දරුවන් උනන්දුවක් දක්වා තිබේනම් එම ගනුදෙනුව සඳහා දක්වා තිබූ උනන්දුවේ ස්වභාවය එවැනි ගනුදෙනු සාකච්ඡා කරන රැස්වීමක දී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එලි දරව් කලයුතු වේ.

අධ්‍යක්ෂවරුන්ට බැඳියාවක් ඇති කරුණු සම්බන්ධයෙන් ඔවුන් ඡන්දය දීමෙන් වැලකී සිටින බව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අධ්‍යක්ෂවරු ඔවුන්ගේ අධ්‍යක්ෂධූර සහ සම්බන්ධතා අනාවරණය කළ යුතුය. බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සම්බන්ධයෙන්, 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා බැංකුව සමඟ යම් ගිවිසුමක් හෝ යෝජිත ගිවිසුමක් තුළ කිසිදු අධ්‍යක්ෂවරයෙක් සෘජුව හෝ වක්‍රව බැඳියාවක් නොමැති බව වාර්තා කරමි.

අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව (ඉතිරි කොටස)...

මෙහෙයුම් සමාලෝචනය හා අනාගත සංවර්ධනය

2020 මූල්‍ය වසර තුළ බැංකුවේ මූල්‍ය හා මෙහෙයුම් කාර්යසාධනය සහ අනාගත සංවර්ධනය පිළිබඳ සහ එම මෙහෙයුම්වල ප්‍රතිඵල පිළිබඳ දළ විශ්ලේෂණයක් මෙම වාර්ෂික වාර්තාව තුළ පිළිවෙලින් අංක 6 සිට 14 දක්වා පිටුවල දක්වා ඇති සභාපතිගේ වාර්තාව, සාමාන්‍යාධිකාරී/ ප්‍ර.වි.නි. ගේ වාර්තාව සහ මූල්‍ය සමාලෝචනය තුළ අඩංගුවේ. එම වාර්තා මෙම වාර්ෂික වාර්තාවේ අත්‍යවශ්‍ය කොටසකි.

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී (ප්‍ර.වි.නි)

සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී (ප්‍ර.වි.නි.) බැංකුවේ තුළ ඉහළ ශ්‍රේණියේ පුද්ගලයකු වන අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔහු පත්කරනු ලබයි. ඔහුගේ මූලික වගකීම්වලට බැංකුවේ කළමනාකරණය සහ මෙහෙයුම් කටයුතු ඇතුළත් වේ. බැංකුවේ තිරසාර සංවර්ධනය අත්කර ගැනීමට, අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ක්‍රමෝපායික පරමාර්ථ, ආයතනික සාරධර්ම සහ සමස්ත අවදානම් ප්‍රතිපත්තිය සහ අවදානම් කළමනාකරණ ක්‍රියාපටිපාටිවලට අනුකූලව බැංකුවේ ව්‍යාපාරවල එදිනෙදා කළමනාකරණය ඔහු සිදු කරයි.

දැක්ම, මෙහෙවර හා ආචාර ධර්ම

දැක්ම, මෙහෙවර හා ආචාර ධර්ම ප්‍රකාශනය මගින් බැංකුව ගමන් කරන දිසාව සහ අත්කර ගැනීමට උත්සාහ කරන දෑ පිළිබඳ සියලුම දෙනා අවධානයෙන් තබා ඇත. ඒ අනුව, ඉන් බැංකුවේ ප්‍රධාන සාරධර්ම සහ සේවකයින්ගේ හැසිරීම අපේක්ෂා කරන ආකාරය පැහැදිලි කරයි. බැංකුවේ ව්‍යාපාර කටයුතු එහි දැක්ම අත්කර ගැනීම සඳහා සදාචාර ප්‍රමිතිවල ඉහළ මට්ටමකින් පවත්වනු ලැබේ.

බැංකුවේ දැක්ම මෙහෙවර හා ආචාර ධර්ම මෙම වාර්ෂික වාර්තාවේ 03 පිටුවෙහි දක්වා ඇත.

ආයතනික පාලනය

ඵලදායී ආයතනික පාලන රාමුවක් හා ක්‍රියාවලියක් පවත්වාගෙන යෑම උදෙසා අධ්‍යක්ෂවරු කැපවී සිටිති. ඵලදායී පාලනය තිරසාර වගකීම් සහගත වර්ධනය සඳහා උපදේශයක් බව අධ්‍යක්ෂමණ්ඩලය සලකනු ලබයි. ආයතනික පාලන ප්‍රතිපත්ති අනුව බැංකුවේ මූල්‍ය, මෙහෙයුම් හා අනුකූලතා කාර්යයන් ඵලදායී ලෙස මෙහෙයවීම හා පාලනය කිරීම සිදුකරයි. ආයතනික පාලන වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ 21 සිට 63 දක්වා පිටුවල දක්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු

බැංකුවේ කටයුතු පාලනය සහතික කිරීම පිණිස බැංකු පනත් නියෝගවලට අනුකූලව අනු කමිටු හතරක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කර ඇත.

o අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව

වැලි දැක්වීම සඳහා පිළියෙල කරනු ලබන කාර්තුමය වාර්තා හා ගිණුම්, බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සහ වෙහි වාර්ෂික වාර්තාවේ විශ්වාසනීයත්වය අධීක්ෂණය කිරීම සඳහා බැංකුවේ මූල්‍ය තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සමාලෝචනය කරනු ලබයි. නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ බැංකුවේ අනුකූලතාවය, බැංකුවේ බාහිර විගණන කාර්යයේ වාර්ෂික වැඩ සටහන සාකච්ඡා කිරීම හා බැංකුවේ අභ්‍යන්තර විගණන කාර්යයේ කාර්යසාධනය හා මූල්‍ය වාර්තාකරන පාලනය, තොරතුරු තාක්ෂණ ආරක්ෂාව සහ මෙහෙයුම් කටයුතු කමිටුවේ විෂයපථය යටතට පත්වෙයි.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විකල්ප සාමාජිකයකු ද සමඟ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු සිව් දෙනෙකුගෙන් සමන්විත වෙයි. කමිටුවේ සභාපති ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වන අතර ඔහු ගිණුම්කරනය පිළිබඳව සුදුසුකම් ලබා ඇති අයෙකි. විගණන කමිටුවට සේවය කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් හා කුසලතා සහ පළපුරුද්දක් ලබා ඇති ඉහත සඳහන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගෙන් විගණන කමිටුව සඳහා සාමාජිකයින් පත් කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විගණන කමිටු ලේකම් ලෙස කටයුතු කරයි. සාමාන්‍යාධිකාරී, සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය) සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සහ ප්‍රසම්පාදන) ප්‍රධාන කළමනාකරු (ශාඛා මෙහෙයුම්) ආරාධිතයන් ලෙස රැස්වීම් සඳහා සහභාගීවන අතර රජයේ විගණන අධිකාරි නිරීක්ෂකයකු ලෙස සියලුම රැස්වීම් සඳහා සහභාගිවෙයි.

2020) වසර තුළ අධ්‍යක්ෂමණ්ඩල විගණන කමිටු රැස්වීම් 04 ක් පවත්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 65 සිට 66 දක්වා දැක්වේ.

o අධ්‍යක්ෂමණ්ඩල මානව සම්පත් හා පරිශ්‍රමික කමිටුව

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව බැංකුව වෙනුවෙන් මානව සම්පත් ප්‍රතිපත්ති, ක්‍රමෝපායන් සහ සැලසුම් සංවර්ධනය කර ක්‍රියාත්මක කිරීමේදී මඟ පෙන්වීම් හා උපදෙස් ලබාදී, සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි., සහ ප්‍රධාන කාර්ය මණ්ඩලයට අදාළ සියලුම පාරිශ්‍රමික ප්‍රතිපත්ති, වැඩසටහන්, වැටුප් ව්‍යුහයන් සහ නියමයන් හා කොන්දේසි සමාලෝචනය කර, සියලුම කාර්ය මණ්ඩලයට අදාළ කරුණු ඇතුළුව සියලුම මානව සම්පත් ගැටළු පිළිබඳ අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු සමඟ උපයෝගී කාර්යභාරයක් පවත්වා ගන්නා අතර, මෙය මෙම කමිටුව වෙත පැවරී ඇති මූලික වගකීම් වේ.

ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු සිව් දෙනෙකුගෙන් අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව සමන්විත වන අතර, මින් එක් අයෙකු විකල්ප සාමාජිකයෙකි. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් (නීති) මෙම කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරයි. සාමාන්‍යාධිකාරී/ ප්‍ර.වි.නි. අදාළ කරුණු සම්බන්ධයෙන් සාකච්ඡා කරනු ලබන රැස්වීම් හැර මෙම කමිටුවේ සියලුම රැස්වීම්වලට සහභාගි වෙති.

අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව (ඉතිරි කොටස)...

කමිටු රැස්වීම් කාර්තුමය ලෙස පවත්වන අතර කෙසේවෙතත්, අවශ්‍යතාව මත පදනම් වී රැස්වීම් පවත්වනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු රැස්වීම් දෙකක් (2) 2020 වසර තුළ පවත්වනු ලැබීය. අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ 68 වන පිටුවේ දක්වා ඇත.

o අධ්‍යක්ෂමණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC)

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සුදුසු ණය දර්ශක සහ කළමනාකරණ තොරතුරු තුළින් බැංකුවේ ණය, වෙළෙඳපොල, ද්‍රවශීලතාව, මෙහෙයුම් හා ක්‍රමෝපායික අවදානම් යන සියලුම අවදානම් තක්සේරු කරන අතර, බැංකුවට අදාළ අවදානම් සහ අනුකූලතාව පිළිබඳ ප්‍රතිපත්ති, වාර්තා සහ යෝජනා සමාලෝචනය කරයි. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විශේෂිත අවදානම් ආමන්ත්‍රණය කිරීමට සහ කමිටුව විසින් නියමකළ ගුණාත්මක හා ප්‍රමාණාත්මක අවදානම් සීමා තුළ එවැනි අවදානම් කළමනාකරණය කිරීමට ණය කමිටුව වැනි සියලුම කළමනාකරණ මට්ටමේ කමිටුවල ප්‍රමාණාත්මතාව සහ ඵලදායිත්වය සමාලෝචනය කරයි.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් නීති, රෙගුලාසි, නියාමන මාර්ගෝපදේශ, අභ්‍යන්තර පාලනයන් සහ ව්‍යාපාර මෙහෙයුම්වල සියලුම ක්ෂේත්‍ර පිළිබඳ අනුමත ප්‍රතිපත්තිවලට බැංකුවේ අනුකූලතාව තක්සේරු කිරීමට සහ බැංකුවේ ප්‍රතිපත්ති හා නියාමන සහ අධීක්ෂණ අවශ්‍යතාවන් මත පදනම්වී කමිටුව විසින් තීරණය කරන විචක්ෂණ මට්ටම ඉක්මවන මට්ටම්වල ඇති විශේෂ අවදානම්වල බලපෑම් අවම කිරීමට කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා ස්වාධීන අනුකූලතා කාර්යයක් ස්ථාපිත කර ඇත.

විධායක නොවන අධ්‍යක්ෂවරු සිව් දෙනෙකුගෙන් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සමන්විත වන අතර, මින් එක් අයෙකු විකල්ප සාමාජිකයෙකි. සාමාන්‍යාධිකාරී/ ප්‍ර.වි.නි. සහ පුළුල් අවදානම් වර්ගීකරණ භාරව සිටින අවදානම් කළමනාකරණ ප්‍රධානී ද කමිටුවේ සාමාජිකයින් වෙති. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් මෙම කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරයි. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් හතරක් 2020 වසර තුළ පවත්වනු ලැබීය.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ 69 සිට 71 දක්වා පිටුවල දක්වා ඇත.

o අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව සාමාන්‍යාධිකාරී/ ප්‍ර.වි.නි. ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් තෝරාගැනීම/ පත්කිරීම සඳහා ක්‍රියාපටිපාටියක් ක්‍රියාත්මක කිරීම සහ ප්‍රවීනි සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරී තනතුරුවලට පත්කිරීම හෝ උසස් කිරීම සඳහා සලකා බැලියයුතු යෝග්‍යතාවයට සුදුසුකම්, පළපුරුද්ද සහ ප්‍රධාන ආකල්ප වැනි නිර්ණායක සකස් කිරීම සඳහා වගකීමට බැඳී සිටී.

විධායක නොවන අධ්‍යක්ෂවරු සිව් දෙනෙකුගෙන් අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව සමන්විත වන අතර මින් එක් අයෙකු විකල්ප සාමාජිකයෙකි. සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි., සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා නීති), සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය) සහ සහකාර සාමාන්‍යාධිකාරී (අවදානම් කළමනාකරණ) කමිටුවේ සභාපතිගේ උපදෙස් මත ආරාධිතයින් ලෙස රැස්වීම්වලට සහභාගි වෙති. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් /සහකාර සාමාන්‍යාධිකාරී (නීති) මෙම කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරයි.

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු රැස්වීම් අවම වශයෙන් වර්ෂයකට දෙවරක් පවත්වනු ලැබේ. කෙසේවෙතත්, අවශ්‍යතාව මත පදනම් වී රැස්වීම් පවත්වනු ලැබේ. එක් කමිටු රැස්වීමක් 2020 වසර තුළ පවත්වනු ලැබීය.

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ 67 පිටුවේ දක්වා ඇත.

ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාත (CAR)

ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය යනු බැංකුවේ පවතින ප්‍රාග්ධනය අවදානම් බරතබනලද ණය නිරාවරණයේ ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශකිරීමේ මිම්මකි. බැංකුව සෑමවිටම අවම ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අවශ්‍යතාවය පවත්වාගෙන ඇත.

ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය බැංකුවේවත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව විසින් විධිමත්ව නියාමනය කෙරේ.

අවදානම් කළමනාකරණය

අවදානම් කළමනාකරණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය සියළුම වගකීම් භාර ගනිති. අවදානම් අවමකිරීම සඳහා බැංකුව විසින් ගන්නා ලද විශේෂ ක්‍රියාමාර්ග මෙම වාර්ෂික වාර්තාවේ 73 වෙනි පිටුවෙහි සවිස්තරව දක්වා ඇත.

අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව (ඉතිරි කොටස)...

අභ්‍යන්තර පාලනය

ගිණුම්කරණය සහ විගණනය මගින් නිර්වචනය කර ඇති පරිදි අභ්‍යන්තර පාලනය යනු මෙහෙයුම් ඵලදායිත්වය සහ කාර්යක්ෂමතාව, විශ්වාසදායක මූල්‍ය වාර්තාකරණය සහ නීති, රෙගුලාසි සහ ප්‍රතිපත්තිවලට අනුකූලතාව තුළ බැංකුවේ අරමුණු සහතික කිරීමේ ක්‍රියාවලියකි.

අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුව තුළ ඵලදායි සහ සම්පූර්ණ අභ්‍යන්තර පාලන පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සහතික කර ඇති අතර, එය ව්‍යාපාරයේ විදිනෙදා කළමනාකරණය තුළ ආයතනික කළමනාකරණය සඳහා මාර්ගෝපදේශයකි.

අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ 94 වෙනි පිටුවේ දැක්වේ.

ලාභ සහ විසර්ජන

2020 වසර සඳහා බැංකුවේ මුළු ආදායම රු. 6,076,716,152 ක් විය. බැංකුවට අදාළ ලාභ විස්තර පහත සඳහන් වගුවේ දැක්වේ.

විස්තරය	රු.
සංචිත	11
ප්‍රාග්ධන වියදම්	11
නිශ්චල දේපල වෙළඳපල සාධාරණ අගය	11
දායක ප්‍රාග්ධනය	11
සැලකිය යුතු කොටස් දැරීම් හා කොටස් තොරතුරු	11
රජයේ ව්‍යවස්ථාපිත ගෙවීම් සඳහා දායකත්වය	අදාල නොවේ
බදු	
ශේෂපත්‍ර දිනට පසු සිදුවීම්	අදාල නොවේ
වාර්තා කරන කාලයට පසුව මූල්‍යප්‍රකාශ නිකුත් කිරීමට පෙර සිදු වූ සිදුවීම්	අදාල නොවේ
ප්‍රවර්තන ව්‍යාපාරය	අදාල නොවේ

අදාළ නීති හා නියමයන් සහ රෙගුලාසි සමඟ අනුකූලතාව

සංශෝධිත පරිදි 1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතිය හා ශ්‍රී ලංකාවේ නීතියට අනුව සම්මත කරන ලද අනෙකුත් සියළුම අදාළ නීති, නියමයන් හා රෙගුලාසි සමඟ සැමවිටම අනුකූලව කටයුතු කරන බව බැංකුව තහවුරු කරයි.

සියලුම පාර්ශ්වකරුවන්හට සාධාරණව සැලකීම

සියළුම වර්ගයේ පාර්ශ්වකාර කණ්ඩායම්වලට බැංකුව ඉතා වැදගත් ලෙස ගෞරවයෙන් සමානව සලකයි.සාධාරණ මිල කිරීම්, සේවාවේ ගුණාත්මකබව මෙන්ම අවංකභාවය හා විශ්වාසනීයත්වයේ කාර්යක්ෂමතාවය වර්ධනය කිරීමට බැංකුව කැපවී ඇත.

ගනුදෙනුකරුවන් හා ණය ගැනුම්කරුවන්

දැරිය හැකි පිරිවැයකට ජාතියට නිවාස ණය සැපයීම බැංකුවේ ප්‍රධාන අරමුණු අතරින් එකකි. මේ සම්බන්ධයෙන් නිතිපතා සමීක්ෂණ සිදුකිරීමට බැංකුව විශේෂ උත්සාහයක් ගෙන ඇත. එමෙන්ම විරැකියාව තුරන් කිරීමේ රජයේ අපේක්ෂාවට සහයවෙමින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්, කර්මාන්තකරුවන් වෙත ණය යෝජනා ක්‍රම කිහිපයක් බැංකුව හඳුන්වා දී ඇත.

තැන්පත්කරුවන් හා සැපයුම්කරුවන්

බැංකුවේ අරමුදල් සපයන්නන් අතර තැන්පත්කරුවන් ප්‍රධාන ස්ථානයක් ගනී. තැන්පතු අනුපාත ප්‍රසිද්ධ කරන අතර, ඒවා තරඟකාරී ස්වභාවයක් උසුලයි. ප්‍රාග්ධනය හා පොලිය නියමිත දිනට ගෙවීම සිදුකරයි.

භාණ්ඩ හා සේවා ලබාගැනීමේදී බැංකුව මිලගණන් කැඳවීම සිදුකරන අතර නිසි කලට ගෙවීම් සිදුකරයි.

විගණන වාර්තාව

විගණකාධිපතිවරයා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ විගණකවරයා වෙයි. 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ගිණුම් විගණනය කිරීම 1971 අංක 38 දරණ මුදල් පනතේ 13(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර විගණකාධිපතිවරයාගේ අධීක්ෂණය යටතේ සිදුකරන ලදී.

2020 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 100 සිට 104 දක්වා පිටුවල පළකර ඇත.

ස්තුතිය

අධ්‍යක්ෂවරු බැංකුවේ අගනා ගනුදෙනුකරුවන්ගේ සහයෝගය හා බැංකුව කෙරෙහි ඔවුන් තබා ඇති විශ්වාසය පිළිබඳව අවංක ස්තූතිය පුදකර සිටින අතර මෙම අනෝන්‍ය සහයෝගාත්මක සම්බන්ධතාවය ඉදිරියටත් පවත්වාගෙන යෑමට අපේක්ෂා කරති. බැංකුවේ ප්‍රගමනය සඳහා සේවකයින් ලබාදුන් දායකත්වය පිළිබඳව අධ්‍යක්ෂවරු ඔවුන්ගේ කෘතඥතාවය පිරිනමන අතර ශ්‍රී ලංකාවේ නියාමන හා රාජ්‍ය බලධාරීන්ගෙන් ලැබුණු සහයෝගය පිළිබඳවත් ස්තූතිය පළ කරති.

අධ්‍යක්ෂ මණ්ඩලය අණ පරිදි,

අශ්මි එස්.කේ. අමරසිංහ
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

මූල්‍ය වාර්තාකරණය පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ අභ්‍යන්තර පාලන ප්‍රකාශනය

වගකීම

2007 අංක 12 දරණ බැංකු පනත් නියෝගයේ 03 වන පරිච්ඡේදයේ (8) 11 (ඩී) වගන්තියට අනුකූලව සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත්කර ඇති 2017 ආයතනික පාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහයේ ඈ 1.5 මූලධර්මය මත පදනම් වී සහ නිර්දේශයන්ට අනුව රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව ඉදිරිපත් කරති.

බැංකුවේ අභ්‍යන්තර පාලනය සහ එහි සඵලතාවය සමාලෝචනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිවයුතු වේ. බැංකුවේ මූල්‍ය වාර්තාකරණ පද්ධතිය සම්බන්ධයෙන් නිසි පරිදි ගිණුම් පොත් සහ විශ්වාසනීයත්වය පවත්වා ගනිමින් වත්කම් විධිමත් පරිදි සුරක්ෂිත කරන්නේද යන්න පිළිබඳව සාධාරණ තහවුරුවක් ලබාදීම සඳහා බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිය පිහිටුවා ඇති බව අධ්‍යක්ෂවරු (අධ්‍යක්ෂ මණ්ඩලය) නිශ්චය කරති. කෙසේ වෙතත් ආවේනික අවදානම් හේතුවෙන් ඇතිවිය හැකි වැරදි අඩුපාඩු සහ වංචා වැලැක්වීම පිළිබඳ නිසි තහවුරු කිරීමක් මෙම පද්ධතිය මගින් සිදු නොකරයි.

බැංකුව මගින් මුහුණපාන වැදගත් අවදානම් හඳුනාගැනීම, ඇගයීම සහ පාලනය කිරීම සඳහා අඛණ්ඩ ක්‍රියාවලියක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපිත කර ඇති අතර, මෙම ක්‍රියාවලියට අවශ්‍ය අවස්ථාවේදී සහ ව්‍යාපාර පරිසරයේ හෝ නියාමන අවශ්‍යතාවල වෙනසක් ඇති වූ විට අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීම ඇතුළත් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම ක්‍රියාවලිය නිරතුරුව සමාලෝචනය කරන අතර, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත්කර ඇති ආයතනික පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය සඳහා මාර්ගෝපදේශවලට අනුකූලව තහවුරු කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එම මාර්ගෝපදේශයේ දී ඇති අභ්‍යන්තර පාලන පද්ධතිය තක්සේරු කිරීම සඳහා වන මූලධර්ම සැලකිල්ලට ගනිමින් අභ්‍යන්තර පාලන පද්ධතිය තක්සේරු කර ඇත.

අදාල ගිණුම්කරන මූලධර්ම හා නියාමන අවශ්‍යතාවයන් අනුව බාහිර කාර්යන් සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ මූල්‍ය වාර්තාකරනයේ විශ්වාසනීයත්වය සම්බන්ධයෙන් ප්‍රමාණවත් තහවුරු කිරීමක් ලබාදීම පිණිස පවත්නා අභ්‍යන්තර පාලන පද්ධතිය යහපත් හා ප්‍රමාණවත් තත්ත්වයේ පවතින බව අධ්‍යක්ෂවරු දරණ මතය වේ.

බැංකුව මගින් මුහුණපාන අවදානම් හඳුනාගැනීම සහ ඇගයීම මගින් අවදානම සහ පාලන පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කිරීම තුළ සහ මෙවැනි අවදානම් අවම කර පාලනය කිරීම සඳහා සුදුසු අභ්‍යන්තර පාලනය සැලසුම් කිරීම, මෙහෙයවීම සහ අධීක්ෂණය තුළ කළමනාකරණය අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වේ.

මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලන පද්ධතියේ සැලැස්ම සහ ඵලදායිත්වය යොදා ගැනීම සහ සමාලෝචනයේදී භාවිතා කරන ක්‍රියාවලියේ ප්‍රධාන ලක්ෂණ

කලින් කල අභ්‍යන්තර පාලන පද්ධතියේ ඵලදායිත්වය සමාලෝචනය කර සැලසුම් කිරීම සඳහා ක්‍රමවේදයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ක්‍රියාවට නංවා ඇත. අනෙකුත් කරුණු අතර, එම පාලන පද්ධතියට පහත දැක්වෙන කරුණු අඩංගුවේ.

- බැංකුව මුහුණ දෙන අවදානම් කළමනාකරණය කිරීම හා තක්සේරු කිරීම සඳහා ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග ආරම්භ කිරීමේ දී අධ්‍යක්ෂ මණ්ඩලයට සහය දැක්වීම පිණිස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විවිධ අනුකමිටු පිහිටුවා ඇති අතර එමගින් අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රමාණාත්මක බව හා විශ්වාසනීයත්වය පිළිබඳ තහවුරුවක් ලබාදීමටත් ආයතනික කළමනාකරණය, ජ්‍යෙෂ්ඨ කළමනාකරණය හා කළමනාකරුවන් යන විවිධ ස්ථර අතර බලතල පවරාදීමක්ද සිදුකර ඇත.

- අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වෙයි. බැංකුවේ අවදානම් පැතිකඩ සමාලෝචනය කිරීම පිළිබඳව කමිටුව වගකිව යුතු අතර, මෙම කමිටුව බැංකුව මුහුණදෙන ප්‍රධාන අවදානම් හඳුනාගෙන බැංකුවේ අවදානම් කළමනාකරණය පදනම් කරගනිමින් ප්‍රතිපත්ති සකස් කරයි.

- බැංකුවේ මූල්‍ය පරිපාලන හා මෙහෙයුම් කටයුතු ස්ථාපිත කර ඇති අභ්‍යන්තර පාලන ක්‍රියාපටිපාටි හා අනුකූලවේද යන්න තහවුරු කිරීම සඳහා බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය නියැඳි මූලික පරීක්ෂාවන් සිදුකරයි. සියළුම ඒකක හා ශාඛාවන්හි විගණන කටයුතු නිතර නිතර සිදුකරන අතර, එය බැංකුවේ ක්‍රියාකාරී ඒකකවල සහ නිෂ්පාදනය අදාළ අවදානම් මට්ටම හා පදනම් වී තිරණය කරනු ලබයි. බැංකුවේ මූල්‍ය පරිපාලනය හා මෙහෙයුම්වල අක්‍රමිකතා, අඩුපාඩු සහ වංචා පිළිබඳව විගණන නිරීක්ෂණ සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානියා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ සභාපතිවරයා වෙත ස්වාධීන අරමුණු වාර්තාවක් යොමුකිරීම පිළිබඳව වගකිව යුතුවේ.

- පොදුවේ, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව පවතින අභ්‍යන්තර පාලනයේ සමස්ථ සඵලතාවය සමාලෝචනය කර, අභ්‍යන්තර පාලනයේ පවතින දුර්වලතාවයන් පිළිබඳ විශේෂ නිරීක්ෂණ පිළිබඳ නිරතුරුව අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරයි. මේ සම්බන්ධයෙන් කමිටුව යොදාගන්නා යාන්ත්‍රණයට විගණකාධිපති වාර්තාව, අභ්‍යන්තර විගණන වාර්තා, නියාමන වාර්තා වාර්ෂික/මාසික මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමාලෝචනය කිරීම ඇතුළත් වේ.

මූල්‍ය වාර්තාකරණය පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ අභ්‍යන්තර පාලන ප්‍රකාශනය (ඉතිරි කොටස)...

- 2012 දී LKAS හා SLFRS සමන්විත නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අධ්‍යක්ෂ මණ්ඩලය යොදා ගෙන ඇත. හඳුනාගැනීම, ඇගයීම, වර්ගීකරණය සහ අනාවරණය යන නව අවශ්‍යතාවයන්ට අනුකූලවීම සඳහා අඛණ්ඩ අධීක්ෂණ හා වර්ධනාත්මක ඉහල නැංවීමේ ක්‍රියාවලිය එකී නව ගිණුම්කරණ ප්‍රමිති යොදාගැනීමේ සිට සිදුකරමින් පවතී

- 2020 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතීන්හි සඳහන් අවශ්‍යතාවයන් ද අධ්‍යක්ෂ මණ්ඩලය සැලකිල්ලට ගෙන ඇත. LKAS 01 ට අදාල සංශෝධනය, මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත්කිරීම සහ LKAS 08 ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු, වෙනස්වීම් හා වැරදි (සංශෝධන - විලිදැරවිවිකිරීම් - ආරම්භකිරීම් - ද්‍රව්‍ය නිර්වචනය) මූල්‍ය වර්තාකරණය සඳහා වූ සංකල්පමය රාමුව (සංශෝධිත) ගිණුම්කරණ උපදේශන සටහන්, කොවිඩ් 19 පැතිරීමේ දී මූල්‍ය ප්‍රකාශන සඳහා වූ බලපෑම තක්සේරු කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත්කර ඇති වාර්තාකරන අවශ්‍යතාවයන් පිළිබඳ මඟ පෙන්වීම්වලට අනුකූලව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිලියෙලකර ඇති බවට බැංකුවේ මූල්‍ය වාර්තාකරන ක්‍රියාවලිය යම් තහවුරු කිරීමක් ලබා දෙන්නේ ද? යන්න පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය සමාලෝචනය කර ඇත.

- එදිනෙදා ව්‍යාපාර මෙහෙයුම්වල බැංකුවේ ප්‍රධාන ක්ෂේත්‍රවල ඵලදායී කළමනාකරණය සහ අධීක්ෂණය සහතික කිරීම සඳහා සුදුසු සවිබලගැන්වීම සමඟ කළමනාකරණ මට්ටමේ කමිටු ක්‍රියාත්මකව පවතී.

- බැංකුවේ මූල්‍ය වාර්තාකරනය පිළිබඳ අභ්‍යන්තර පාලනයේ සැකැස්ම හා සඵලතාවය පිළිබඳව ව්‍යුහාත්මක වාර්ෂික සමාලෝචනයක් සිදුකර ඇත. අභ්‍යන්තර පාලනයේ සඵලතාවය පිළිබඳ සමාලෝචනය කිරීම පහසුකරවන බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිය ලේඛණගත කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය දැනටමත් අනුමත කර ඇත.

- බැංකුවේ වඩාත් ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ඇතිකිරීම සහතික කිරීම සඳහා මූල්‍ය වාර්තාකරන ක්‍රියාවලිය පිලිබඳ අමතර පාලන ක්‍රියාමාර්ග සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කරවීම පිලිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය අවබෝධ කරගෙන ඇත.

සහතික කිරීම

ඉහත ක්‍රියාවලිය මත පදනම් වී, බැංකුවේ මූල්‍ය වාර්තාකරන ක්‍රමය මූල්‍ය වාර්තාකරනයේ විශ්වාසය සම්බන්ධයෙන් සාධාරණ සහතිකයක් ලබාදීම සඳහා පිළියෙල කර ඇති බව සහ බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන අවශ්‍යතාවන්ට අනුව සිදුකර ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කර ඇත.

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය වාර්තාකරනය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය පිලිබඳ අධ්‍යක්ෂවරුන්ගේ උක්ත ප්‍රකාශය බාහිර විගණක සමාලෝචනය කරයි.

ඩබ්.සී.එන්. කුරේ මහත්මිය
සභාපති - අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව
අධ්‍යක්ෂ (විනෝ)

එච්.සී. දිලිප් ලාල් සිල්වා මහතා
අධ්‍යක්ෂ (විනෝ)

එස්.කේ.ඒ. ගලප්පත්ති මහතා
අධ්‍යක්ෂ (විනෝ)

බැංකුවේ අභ්‍යන්තර පාලනය පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. BAN/F/SMIB/IC/2020/01 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2021 ඔක්තෝම්බර් 29

සභාපති
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙහි අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත විගණකාධිපතිවරයාගේ තහවුරු වාර්තාව

හැඳින්වීම

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාවට ඇතුලත් කළ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙහි අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රකාශන ("ප්‍රකාශණය") සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශණය පිළිබඳ තහවුරු කිරීමක් මෙම වාර්තාව මගින් සපයනු ලබයි.

කළමණාකාරිත්වයේ වගකීම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් නිකුත්කර ඇති 2007 අංක 12 දරණ බැංකු පනත් නියෝගයේ 3(8)(11)(ආ) වගන්තිය අනුකූලව නිකුත්කරන ලද "අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශණය සම්බන්ධයෙන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල සඳහා මාර්ගෝපදේශය" ට අනුව මෙම ප්‍රකාශණය පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා කළමණාකරණය වගකීමට බැඳී සිටී.

මාගේ වගකීම සහ SLSAE 3050 (ප්‍රතිශෝධිත) සමග අනුකූලතාවය

මාගේ වගකීම වන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිළියෙල කරන ලද මෙම ප්‍රකාශනය ලේඛනවලින් තහවුරු වන්නේද යන්න සහ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙහි අභ්‍යන්තර පාලනයේ සැලැස්ම සහ ඵළදායිත්වය සමාලෝචනය කිරීමේදි අධ්‍යක්ෂවරුන් විසින් යොදාගෙන ඇති ක්‍රියාවලිය පිළිබිඹු කරන්නේද යන්න සම්බන්ධයෙන් තක්සේරු කිරීමයි.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් නිකුත්කර ඇති අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ බැංකුව සඳහා සහතික කිරීමේ වාර්තාව වන, සහතික කිරීමේ කාර්යය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිතිය -SLAE 3050 (ප්‍රතිශෝධිත) අනුකූලව මම මෙම කාර්යය පැවැත්වූයෙමි. සියලුම වැදගත් අංශයන් හිදී කළමනාකරණය අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රකාශය පිළියෙල කර ඇති බවට සීමිත සහතිකයක් ලබාගැනීමේ ක්‍රියාපටිපාටි මම විසින් සැලසුම් කර ඉටුකිරීම මෙම ප්‍රමිතියෙන් අවශ්‍ය වේ.

මෙම කාර්යයේ අරමුණ සඳහා, කිසිදු වාර්තාවක් යාවත්කාලීන කිරීම හෝ නැවත නිකුත් කිරීම සඳහා මම වගකීමට බැඳි නොමැති අතර, මෙම කාර්යය සම්බන්ධයෙන් මුල්‍ය තොරතුරු පිළිබඳ විගණනයක් හෝ සමාලෝචනයක් සිදුකර නොමැත.

අංක 306/72, පොළුදුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

ක්‍රියාවට නංවන ලද කාර්යයන් පිළිබඳ සාරාංශය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිළියෙල කරන ලද මෙම ප්‍රකාශනය ලේඛනවලින් තහවුරු වන්නේද යන්න සහ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙහි අභ්‍යන්තර පාලනයේ සැලැස්ම සහ ඵළදායිත්වය සමාලෝචනය කිරීමේදි අධ්‍යක්ෂවරුන් විසින් යොදාගෙන ඇති ක්‍රියාවලිය පිළිබිඹු කරන්නේද යන්න සම්බන්ධයෙන් තක්සේරු කිරීම සඳහා මාගේ කාර්යය මම ඉටු කළෙමි.

නියැදියකින් ප්‍රශ්න කිරීම් මගින් ලබාගත් තොරතුරු සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කර ඇති ක්‍රියාවලියට සහයවන නියැදි පදනමක් මත, ඉටුකරන කරන ලද ක්‍රියාපටිපාටි මූලික වශයෙන් බැංකුවෙහි කාර්යය මණ්ඩලය සහ ලේඛණවල පැවැත්ම පරීක්ෂා කිරීම සඳහා සීමා විය.

SLSAE 3050 (ප්‍රතිශෝධිත) අනුව මෙම ප්‍රකාශනය මගින් සියලුම අවදානම් සහ පාලනයන් ආවරණය කරන්නේද යන්න හෝ බැංකුවෙහි අවදානම සහ පාලන ක්‍රියාපටිපාටිවල ඵලදායිතාව පිළිබඳ මතයක් සකස් කරන්නේද යන්න සලකා බැලීමක් අවශ්‍ය නොවනු ඇත. SLSAE 3050 (ප්‍රතිශෝධිත) අනුව වාර්ෂික වාර්තාව තුළ හෙළිදරව් කරන ලද කිසියම් සැලකිය යුතු ගැටළු පිළිබඳ වැදගත් අභ්‍යන්තර පාලන අංගයන් සමඟ කටයුතු කිරීම සඳහා විස්තර කරන ලද ක්‍රියාවලි සැබැවින්ම ගැටළුවලට පිළියම් කරන්නේද යන්න සලකා බැලීමක් මාහට අවශ්‍ය නොවනු ඇත.

තෝරාගත් ක්‍රියාපටිපාටි බැංකුවේ ස්වභාවය, ප්‍රකාශනය පිළියෙල කර ඇති සිදුවීම හෝ ගනුදෙනුව පිළිබඳ මාගේ අවබෝධය සැලකිල්ලට ගත් මගේ විනිශ්චය මත රඳා පවතී.

මගේ නිගමනය සඳහා පදනමක් ලබා ගැනීමට සුදුසු හා ප්‍රමාණවත් කරුණු මා ලබාගෙන ඇති බව මම විශ්වාස කරමි.

මගේ නිගමනය

ඉටුකරන ලද ක්‍රියාපටිපාටි අනුව, බැංකුවෙහි මූල්‍ය වාර්තාකරණය සඳහා වන අභ්‍යන්තර පාලන ක්‍රමයෙහි සැකැස්ම සහ එහි ඵලදායිත්වය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය මගින් ක්‍රියාවට නගනු ලබන අගය කිරීමේ ක්‍රියාවලිය, අපගේ අවබෝධයට අනුව සහ වාර්ෂික වාර්තාවෙහි ඇතුලත් ප්‍රකාශනයන්ගේ අනුකූලතාවයේ පැහැදිලි බවක් හෝ විශ්වාස කටයුතුභාවයෙහි සැකයක් ඇති බවට කිසිඳු සාක්ෂියක් හමුවී නොමැත.

ඩබ්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

කළමනාකරණය විසින් භාරගන්නා මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සඳහා වගකියමින්, මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේදී මූල්‍ය වාර්තාකරණයට අදාළ නෛතික අවශ්‍යතාවන්ට අනුකූල වී ඇති බව සහතික කිරීම සඳහා අවසාන වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. ඒ අනුව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙහි මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම මෙම ප්‍රකාශනය තුළ දැක්වේ.

බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට කටයුතුවල තත්ත්වය සහ එදිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා බැංකුවේ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් පිළිබිඹු කරන බව බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි. මෙම වාර්ෂික වාර්තාව තුළ ඉදිරිපත්කරන මූල්‍ය ප්‍රකාශනවල විශ්වාසනීයත්වය හා විෂයමූලිකත්වය සඳහා වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය භාරගනී.

මූල්‍ය ප්‍රකාශන

1988 අංක 30 දරණ බැංකු පනත, 1971 අංක 38 දරන මූල්‍ය පනත සමග කියවියයුතු 1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතිය හා එහි සංශෝධනයන්හි දක්වා ඇති විධිවිධාන සහ ශ්‍රී ලංකා මහ බැංකු විසින් නිකුත් කළ නියෝග ප්‍රකාරව අවබෝධකර ගැනීම, අධීක්ෂණය සහ ආයතනය ඉදිරියට මෙහෙයවීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය සාක්ෂරතාවයක් ඇති බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ කටයුතු සහ ව්‍යාපාරය පාලනය සහ පරිපාලනය කිරීම සිදුකරයි.

මෙම වාර්ෂික වාර්තාවේ පිළියෙල කර ඉදිරිපත් කර ඇති 2020 මූල්‍ය වසර සඳහා මූල්‍ය ප්‍රකාශන ගිණුම්කරණ පොත්වලට අනුකූලවන අතර, පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රමිති, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති, සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවල අවශ්‍යතාවන්ට අනුකූලවන අතර අදාළ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන්ට අනුකූලව වික් වික් මූල්‍ය වසර අවසානයේදී බැංකුවේ මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් ලබා දේ.

මෙම වාර්ෂික වාර්තුව තුළ ඉදිරිපත් කරන මූල්‍ය ප්‍රකාශනවල විශ්වාසනීයත්වය හා විෂයමූලිකත්වය සඳහා වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය භාරගනී. මෙම මූල්‍ය ප්‍රකාශනවල පිළියෙල කිරීමේදී අධ්‍යක්ෂවරු පහත දෑ තහවුරු කර සිටිති.

1. පවත්නා මූල්‍ය වාර්තාකරණ රාමුවට අනුව අනුරූප ආකාරයකින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගෙන, යොදාගෙන, සහ භාවිතා කර ඇති අතර වැදගත් අපගමනයන් ඇත්නම් අනාවරණය සහ පැහැදිලිකර ඇත;

2. අදාළ සියලුම ගිණුම්කරණ ප්‍රමිති අදාල පරිදි අනුගමනය කර ඇත;

3. විනිශ්චයන් හා ඇස්තමේන්තු සිදුකර ඇති බව සහ ඒවා විවක්ෂණ හා සාධාරණබව.

මූලික කාර්යසාධන දර්ශක ඇතුළුව කාර්තුමය විගණනය කළ මූල්‍ය ප්‍රකාශන වික් වික් කාලසීමාව අවසානයේදී මාස දෙකක් ඇතුළත භාෂා තුනෙන් පුවත්පත්වල බැංකුව ප්‍රකාශයට පත් කර ඇති අතර ඒවා බැංකුවේ වේබ් අඩවියේද ප්‍රකාශයට පත් කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සිදුකළ සමාලෝචනය හා නිර්දේශය අනුගමනය කරමින් අතුරු මූල්‍ය ප්‍රකාශන මුදාහැරීමට පෙර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒවා අනුමත කරයි. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ 65 පිටුවේ දක්වා ඇත. මූල්‍ය ප්‍රකාශන බලපත්‍රලාභී විශේෂ බැංකු සඳහා ශ්‍රී ලංකා මහ බැංකු විසින් නිකුත් කළ නියමිත ආකෘතියට අනුකූල බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික වේ.

අඛණ්ඩතා පැවැත්ම

නුදුරු අනාගතය සඳහා සිය මෙහෙයුම් අඛණ්ඩව සිදුකිරීම සඳහා සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත්කළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (LKAS හා SLFRS) අනුකූලව සහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අඛණ්ඩතා පැවැත්ම පදනම යොදා ගැනීම සාධාරණය කිරීමට ප්‍රමාණවත් සම්පත් බැංකුවට ඇති බව සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද නියෝගවලට අනුකූලව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බව රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වේ.

අභ්‍යන්තර පාලනය හා අවදානම් කළමනාකරණය

බැංකුවේ වත්කම් ආරක්ෂා කිරීම, වංචා හා වැරදි කළමනාකරණය පිටු දැකීම සහ ශක්තිමත් පාලන වටපිටාවක් පවත්වාගෙන යෑම සඳහා සැලකිය යුතු අවදානයක් යොමු කිරීම හා අභ්‍යන්තර විගණනය හා අවදානම් කළමනාකරණය ඇතුළත් ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් හා එහි ඵලදායිත්වය අධීක්ෂණය කිරීම සඳහා ඵලදායී පද්ධතියක් ස්ථාපිත කර ඇති අතර බැංකුවේ වත්කම් ආරක්ෂා කර ගැනීමටත් වංචා හා වෙනත් අක්‍රමිකතා අනාවරණය කර ගැනීම සඳහාත්, සැලකිය යුතු ක්‍රියාමාර්ග හා දැඩි අවදධානය යොමු කිරීමට බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වෙයි.

අභ්‍යන්තර පාලනයේ අරමුණ වන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියමකර ඇති ඉලක්ක සපුරාගත හැකි ඵලදායී ආයතනයක් බිහිකර ගැනීම වන අතර එබැවින් මූල්‍ය වාර්තාකරණයේ විශ්වාසනීයත්වය පිළිබඳව සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා බැංකුවේ ව්‍යාපාර කටයුතු සුදුසු හා ඵලදායී ලෙස සිදුකරගෙන යනු ලබන බව සහ නීති හා රෙගුලාසි සඳහා අනුකූලව කටයුතු කරන බව සැලකිය යුතු දුරකට අර්ථවත් වෙයි.

විගණන කමිටුවේ මග පෙන්වීම් යටතේ අභ්‍යන්තර විගණන අංශය අභ්‍යන්තර පාලන පද්ධතියේ ඵලදායිත්වය අධීක්ෂණය කරන අතර අවශ්‍ය විටදී අවශ්‍ය සංශෝධන සඳහා නිර්දේශ ඉදිරිපත් කරයි.

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම (ඉතිරි කොටස)...

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව හරහා සහ සාමාන්‍ය පරිදි පවත්වන රැස්වීම්වලදී සෘජුව මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කරනු ලබන බව අධ්‍යක්ෂවරු තහවුරු කරති.

බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය පිළිබඳ අධ්‍යක්ෂවරුන් විසින් ඉදිරිපත් කරන වාර්තාව මෙම වාර්ෂික වර්තාවේ පිටු අංක 94 සිට 95දක්වා පිටුවල ඇත.

අනුකූලතා වාර්තාව

අධ්‍යක්ෂවරුන්ගේ දැනුම හා විශ්වාසය පරිදි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනයට බැංකුව විසින් ගෙවියයුතු බදු සහ බැංකුවේ සේවකයින් සම්බන්ධයෙන් හා ඒ වෙනුවෙන් ගෙවියයුතු සියලුම දායකත්වයන් හා බදු සහ බැංකුව විසින් රජයට සහ අනෙකුත් නියාමන හා ව්‍යවස්ථාපිත ආයතනයන්ට ගෙවීමට බැඳී සිටින හා ගෙවිය යුතුව තිබූ සියළුම ව්‍යවස්ථාපිත ගෙවීම් සිදුකර ඇති බවට අධ්‍යක්ෂවරු තහවුරු කර සිටී.

විගණන වාර්තාව

විගණකාධිපතිවරයා බැංකුවේ විගණකවරයාවන අතර බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අවසන් මතයක් ප්‍රකාශකරයි.

අධ්‍යක්ෂවරුන් විසින් ඉදිරිපත්කර ඇති මූල්‍ය ප්‍රකාශන ඇතුලු බැංකුවේ සියලුම වාර්තා විගණකාධිපතිවරයා වෙත ලබා දී ඇති අතර ඔවුන්හට සුදුසුයයි හැඟීයන පරීක්ෂාකිරීම් සිදුකිරීමට අවස්ථාව ලබා දෙමින් විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් සියලුම දේ පරීක්ෂාකර විගණකාධිපතිවරයා අවසන් මතයක් ප්‍රකාශකර ඇත.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකවරයාගේ වගකීම මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 100 හි ඇති විගණකාධිපති වාර්තාවේ දක්වා ඇත.

වැදගත් ගිවිසුම් පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ බැඳියාව

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සම්බන්ධයෙන් බැංකුව පාර්ශවකරුවෙක් වූ වැදගත් ගිවිසුම් සමඟ බැංකුවේ අධ්‍යක්ෂවරයෙක් හෝ හිටපු අධ්‍යක්ෂවරයෙක්ට වසර අවසානයේදී හෝ වසරේ කිසියම් අවස්ථාවක සෘජුව හෝ වක්‍රව කිසිදු බැඳියාවක් නොතිබූ බව සහ බැංකුව පාර්ශවකරුවෙක් වූ වැදගත් ගිවිසුම් සමඟ බැංකුවේ අධ්‍යක්ෂවරයෙක්ට වසර අවසානයේදී හෝ වසරේ කිසියම් අවස්ථාවක සෘජුව හෝ වක්‍රව කිසිදු බැඳියාවක් නොතිබූ බව සහතික කළ යුතුය ඇත.

ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂවරුන්ගේ දැනුම හා විශ්වාසය පරිදි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනට බැංකුව විසින් සියළුම නියාමන හා ව්‍යවස්ථාපිත ආයතනයන්ට ගෙවිය යුතුව තිබූ සියළුම ව්‍යවස්ථාපිත ගෙවීම් සිදුකර ඇති බව හෝ අදාල පරිදි සපයා ඇති බවට අධ්‍යක්ෂවරු සෑහීමකට පත්වෙති.

මෙම ප්‍රකාශයේ දක්වා ඇති පරිදි ඔවුන්ගේ වගකීම් ඉටුකර ඇති බව අධ්‍යක්ෂවරුන් දරණ මතය වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,



ඒ.එස්.කේ. අමරසිංහ
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. BAF/G/SMIB/FA/2020/2

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2021 සැප්තැම්බර් 28

සභාපති,
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාර 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සහ අනෙකුත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව විගණකාධිපති වාර්තාව

1.මූල්‍ය ප්‍රකාශන

1.1. මතය

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනත සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර පාර්ලිමේන්තුව සඳහා මාගේ වාර්තාව යථාකාලයේදී සභාගත කරනු ලැබේ.

මේ සමග ඉදිරිපත්කර ඇති මූල්‍ය ප්‍රතාශන 2020 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන්වූ වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව සත්‍ය හා සාධාරණ නිරූපණයක් පිළිඹිබු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.2. මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (SLAuSs) අනුකූලව මම මාගේ විගණනය පැවැත්වූයෙමි. මෙම ප්‍රමිති යටතේ මාගේ වගකීම් මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන කොටසේ විගණනය සඳහා විගණකගේ වගකීම් යටතේ තවදුරටත් විස්තරකර ඇත. මම ලබාගත් විගණන සාක්ෂිය මගේ මතය සඳහා පදනමක් ලබාදීමට ප්‍රමාණවත් සහ සුදුසු බවට මම විශ්වාස කරමි.

අංක 306/72, පොළduwa පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.3. බැංකුවේ 2020 වාර්ෂික වාර්තාවේ අඩංගු වෙනත් තොරතුරු

අනෙකුත් තොරතුරු සඳහා බැංකුවේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුලත් තොරතුරු අන්තර්ගත නමුත් ඒවා මූල්‍ය ප්‍රකාශනවල හා මාගේ විගණන වාර්තාවේ ඇතුලත් නොවන අතර එම තොරතුරු මා ලබාගෙන ඇත්තේ මෙම විගණන වාර්තාවේ දිනට ප්‍රථමයෙනි. අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුවෙයි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොවන අතර මම එහිදී සහතික කරනලද නිගමනයන් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනය සම්බන්ධයෙන් ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු පවතිනවිට ඒවා කියවමින් මූල්‍ය ප්‍රකාශන සමග එම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මකව නොගැලපේද? හෝ විගණනයේදී මා ලබාගත් තොරතුරු සාවද්‍ය ලෙස ප්‍රකාශවී තිබේද යන්න සලකා බැලීම වෙයි.

විගණන වාර්තාවට පෙර මා විසින් ලබාගන්නාලද අනෙකුත් තොරතුරු මත පදනම්ව මා විසින් ඉටුනර ඇති කාර්ය සිදුකලේනම් මෙම අනෙකුත් තොරතුරුවල ප්‍රමාණාත්මක වැරදි ප්‍රකාශයන් ඇතුලත්වී ඇති බව මම නිගමනය කරමි. එම තොරතුරු මා විසින් වාර්තාකරනු ලැබියයුතුව ඇත. මේ සම්බන්ධයෙන් වාර්තා කිරීමට මා හට කිසිවක් නොමැත.

1.4. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමට හැකිවීම පිණිස අවශ්‍ය යයි කලමනාකරණය තීරණය කරන අභ්‍යන්තර පාලනයක් හා ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති අනුව සත්‍ය හා සාධාරණ නිරූපණයක් ලැබෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා කලමනාකරණය වගකිවයුතු වෙයි.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී කලමනාකරණය එක් පසකින් බැංකුව ඈවර කිරීමට හෝ මෙහෙයුම් නැවත්වීමට හෝ තත්ථ්‍ය විකල්පයක් නොමැතිනම් එසේ සිදුකිරීම නැතහොත් ගිණුම්කරණයේ දී ප්‍රවර්ථන ව්‍යාපාර සංකල්පයට සම්බන්ධ කරුණු සුදුසු පරිදි හෙලි කිරීම ප්‍රවර්ථන ව්‍යාපාරයක් ලෙස ඉදිරියටත් පවත්ගෙන යෑමේ බැංකුවේ හැකියාව තක්සේරු කිරීම සඳහා කලමනාකරණය වගකිව යුතු වෙයි.

පාලනය සඳහා වගකිවයුතු පිරිස බැංකුවේ මූල්‍ය ප්‍රකාශන ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා වගකිවයුතු වෙයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව බැංකුව එහි අන්තර්වාර හා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවීම පිණිස බැංකුවේ සියලුම ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් වාර්තා කිරීම සඳහා යෝග්‍ය පොත්පත් පවත්වාගෙනයෑම අවශ්‍යවෙයි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.5. මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකගේ වගකීම්

මගේ පරමාර්ථය වන්නේ සමස්ථයක් ලෙස වංචා හෝ දෝෂ හේතුකොට ගෙන මූල්‍ය ප්‍රකාශන වැදගත් වැරදි ප්‍රකාශයන්ගෙන් නිදහස්ද යන්න පිළිබඳ සාධාරණ සහතිකය ලබාගැනීම සහ මගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාවක් නිකුත් කිරීමයි. සාධාරණ සහතිකය ඉහළ මට්ටමේ සහතිකයක් වුවද, ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනයකින් වැදගත් වැරදි ප්‍රකාශයක් එහි පැවතියද සෑම අවස්ථාවකදීම එය සොයා ගන්නා බවට වගවීමක් නොමැත. වැරදි ප්‍රකාශ වංචාව හෝ දෝෂය තුළින් ඇතිවිය හැකි අතර තනි තනිව හෝ එකතුව මෙම මූල්‍ය ප්‍රකාශනවල පදනම මත ගනු ලබන ආර්ථික තීරණවලට බලපෑම් කිරීමට ඉන් සාධාරණව අපේක්ෂා කරන්නේනම් වැදගත් ලෙස සලකනු ලබයි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනයක කොටසක් ලෙස, මම වෘත්තීය විනිශ්චය ක්‍රියාවේ යොදවන අතර, විගණනය පුරා වෘත්තීය සංශයවාදය පවත්වා ගනිමි. එමෙන්ම මම :

- වංචාව හෝ දෝෂ හෝ සැලැස්ම හේතු කොට ගෙන මූල්‍ය ප්‍රකාශනවල වැදගත් වැරදි ප්‍රකාශන පිළිබඳ අවදානම් හඳුනාගෙන තක්සේරු කරන අතර, එවැනි අවදානම්වලට ප්‍රතිචාරාත්මක විගණන ක්‍රියාපටිපාටි ඉටුකරමින් මගේ මතය සඳහා පදනමක් ලබාදීමට ප්‍රමාණවත් සහ සුදුසුවන විගණන සාක්ෂිය ලබා ගනිමු. වංචාවෙන් ඇතිවන වැදගත් වැරදි ප්‍රකාශනයක් සොයා නොගැනීමේ අවදානම වංචාව කුමන්ත්‍රණය, ව්‍යාජ ලේඛන සෑදීම, සිතාමතා ඉවත්කිරීම්, ව්‍යාජ නියෝජන, හෝ අභ්‍යන්තර පාලනය ප්‍රතික්ෂේප කිරීම හා සම්බන්ධවන බැවින් දෝෂයකින් ඇතිවන දෙයකට වඩා විශාලය.

- බැංකුවේ අභ්‍යන්තර පාලනයේ ඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අරමුණ සඳහා හැර අවස්ථාවන්ට සුදුසුවන විගණන ක්‍රියාපටිපාටිය සැලසුම් කිරීම පිණිස විගණනයට අදාළ අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගනිමු.

- කළමනාකරණය විසින් භාවිතා කළ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍යතාව සහ ඔවුන් විසින් සිදුකරක ගිණුම්කරණ ඇස්තමේන්තු සහ අදාළ අනාවරණවල සාධාරණත්වය අගය කරමි.

- ගිණුම්කරණය පිළිබඳ අඛණ්ඩතා පදනම සම්බන්ධ කළමනාකරණයේ භාවිතයේ යෝග්‍යතාව සහ ලබාගත් විගණන සාක්ෂිය මත පදනම් වී, ප්‍රවර්ථන ව්‍යාපාරයක් ලෙස ඉදිරියට යාම පිළිබඳ බැංකුවේ හැකියාව සම්බන්ධව වැදගත් සැකයක් ඇතිකළ හැකි සිදුවීම් සහ තත්ත්වයන් සම්බන්ධයෙන් වැදගත් අවිනිශ්චිතතාවක් පවතීද යන්න නිශ්චය කරමි. වැදගත් අවිනිශ්චිතතාවක් පවතින බවට මම නිශ්චය කරන්නේනම් මූල්‍ය ප්‍රකාශන තුළ අදාළ අනාවරණයන්ට මගේ විගණක වාර්තාව පිළිබඳ අවධානය යොමු කිරීම අවශ්‍ය වන අතර, එවැනි අනාවරණ ප්‍රමාණවත් නොවන්නේනම් මගේ මතය වෙනස් කිරීමට අවශ්‍ය වේ. මගේ විගණක වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂිය මත මාගේ නිගමන පදනම් වේ. කෙසේවෙතත්, අනාගත සිදුවීම් හෝ තත්ත්වයන් ප්‍රවර්ථන ව්‍යාපාරයක් ලෙස බැංකුව ඉදිරියට යාම නතර කිරීමට හේතු විය හැකිය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

- සමස්ත ඉදිරිපත් කිරීම, අනාවරණ ඇතුළුව මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සහ මූල්‍ය ප්‍රකාශන සාධාරණව ඉදිරිපත් කිරීම අත්කර ගන්නා ආකාරයකින් පාදක වූ ගනුදෙනු හා සිදුවීම් නියෝජනය කරන්නේද යන්න ඇගයීමට ලක් කළෙමි.

අනෙකුත් කරුණු අතර මගේ විගණනය කුළ මම හඳුනාගත් අභ්‍යන්තර පාලනය තුළ යම් වැදගත් අඩුපාඩු ඇතුළුව වැදගත් විගණන සොයා ගැනීම් සම්බන්ධයෙන් වගකියන පුද්ගලයින් සමඟ මම අදහස් හුවමාරු කර ගනිමි.

2. අනෙකුත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනත තුළ පහත අවශ්‍යතා සඳහා විශේෂ විධිවිධාන ඇතුළත්ය:

2.1.1 විගණනය සඳහා අවශ්‍ය සියලුම තොරතුරු සහ පැහැදිලි කිරීම මම ලබාගෙන ඇති අතර, මගේ පරීක්ෂණයෙන් පෙන්නුම්වන තාක් දුරට, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ අවශ්‍යතා පරිදි සුදුසු ගිණුම්කරණ වාර්තා බැංකුව විසින් තබා ගෙන ඇත.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) (iii) වගන්තියේ අවශ්‍යතා පරිදි ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශ පූර්වාසන්න වසර සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) (iv) වගන්තියේ අවශ්‍යතා පරිදි ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශවල පෙර වසරේ මා විසින් සිදුකළ සියලුම නිර්දේශ ඇතුළත් වේ.

2.1.4 ඉටුකල ක්‍රියාමාර්ග හා ලබාගත් තොරතුරු මත පදනම්ව ප්‍රමාණාත්මක කරුණු සඳහා පමණක් සීමා වෙමින් මාගේ අවධානය සඳහා කිසිවක් හමුවී නොමැත.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඩී) පරිච්ඡේදයේ අවශ්‍යතාවයන් ප්‍රකාරව සාමාන්‍ය ව්‍යාපාරික ක්‍රියාවලියෙන් බැහැරව බැංකුව විසින් ගිවිසගත් කිසියම් කොන්ත්‍රාත්තුවක් සඳහා බැංකුවේ පාලන තන්ත්‍රයේ සිටින කිසියම් සාමාජිකයකු කිසියම් සෘජු හෝ වක්‍ර උනන්දුවක් දක්වා තිබීම ප්‍රකාශ කිරීම.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඒෆ්) පරිච්ඡේදයේ අවශ්‍යතාවයන් ප්‍රකාරව බැංකුවේ පාලන තන්ත්‍රය විසින් නිකුත්කර ඇති සාමාන්‍ය හා විශේෂ විධිවිධාන කිසියම් අදාල ලිඛිත නීතියක් සමග බැංකුව අනුකූල නොකරගත් බව ප්‍රකාශ කිරීම.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(පී) පරිච්ඡේදයේ අවශ්‍යතාවයන් ප්‍රකාරව කාර්යයන් සහ රාජකාරීන් වෙහි බලතල අනුව බැංකුව සිදුකර නොමැති බව ප්‍රකාශ කිරීම.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(චිචි) පරිච්ඡේදයේ අවශ්‍යතාවයන් ප්‍රකාරව අදාල නීති සමග අනුකූලව හා කාල සීමාවන් තුල පිරිමැසුම්දායක ලෙස, කාර්යක්ෂමව හා ඵලදායී ලෙස බැංකුවේ සම්පත් ප්‍රසම්පාදනය හා භාවිතා කිරීම සිදුකර නොමැති බව ප්‍රකාශ කිරීම.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

	සටහන්	2020 රු.	2019 රු.
වත්කම්			
මුදල් සහ මුදල් හා සමාන දෑ	13	195,817,542	121,239,625
බැංකු තැම්පතු	14	11,811,735,024	7,088,742,434
මූල්‍ය වත්කම් - ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට	15	21,350,000	19,475,000
මූල්‍ය වත්කම් - ක්‍රමක්ෂය පිරිවැයට			
- ණය සහ අත්තිකාරම්	16	36,856,886,670	35,560,992,158
- ණය සහ අනෙක් උපකරණ	17	2,414,814,588	2,615,182,916
මූල්‍ය වත්කම් - අනෙකුත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයට	18	5,379,078	5,379,078
දේපළ පිරියත සහ උපකරණ	19	52,102,138	56,067,712
භාවිතයට අයිතිය ඇති වත්කම්	33	104,493,362	112,674,031
පමාකල බදු වත්කම්	20	234,711,041	221,648,675
වෙනත් වත්කම්	21	1,104,631,205	1,178,156,939
මුළු වත්කම්		52,801,920,648	46,979,558,568
වගකීම්			
බැංකුවලට ගෙවිය යුතු	22	67,348,787	12,412,879
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම්			
- තැන්පත්කරුවන්ට ගෙවිය යුතු	23	45,388,490,392	38,872,216,979
- ණය සුරැකුම්පත් හිමිකරුවන්ට ගෙවිය යුතු		-	110,180,822
- අනෙකුත් ණයකරුවන්ට ගෙවිය යුතු	23	348,093,800	1,501,680,632
සේවක ප්‍රතිලාභ වගකීම	24	449,258,424	390,291,731
වෙනත් වගකීම්	25	529,220,557	434,106,979
මුළු වගකීම්		46,782,411,960	41,320,890,022
ස්කන්ධය			
ප්‍රකාශිත ප්‍රාග්ධනය/පවරන ලද ප්‍රාග්ධනය	26	889,812,899	889,812,899
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල	27	283,911,475	270,921,034
රඳවාගත් ඉපැයීම්	28	3,767,975,310	3,420,125,609
අනෙකුත් සංචිත	29	1,077,809,004	1,077,809,004
මුළු ස්කන්ධය		6,019,508,688	5,658,668,546
මුළු ස්කන්ධය හා වගකීම්		52,801,920,648	46,979,558,568
ආපතිත වගකීම් හා බැඳීම්	30	87,742,347	76,477,573

පිටු අංක 33 සිට 71 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටසක් නිරූපණය කරයි.

සහතික කිරීම:

මෙම මූල්‍ය ප්‍රකාශන 2020 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ කටයුතු හා එදිනෙන් අවසන්වූ වර්ෂය සඳහා ලාභය පිළිබඳව සත්‍ය හා ාධාරණ නිරූපනයක් ලබාදෙයි.

ජී.එච්.එන්. කොඩිකාර මිය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මූල්‍ය හා සැලසුම්)

බැංකුවේ අධ්‍යක්ෂවරු මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකිව යුතුවේ. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබ ඔවුන් වෙනුවෙන් අත්සන් තබා ඇත

ආචාර්ය උදයශ්‍රී කාරියවසම් මහතා
සභාපති

එස්.කේ.ඒ්. ගලප්පත්ති මහතා
අධ්‍යක්ෂ

එල්.අයි. රණසිංහ මහතා
වැඩ බලන සාමාන්‍යාධිකාරි / ප්‍ර.වි.නි

ලාභ හෝ අලාභ ප්‍රකාශනය

	සටහන්	2020 රු.	2019 රු.
පොළී ආදායම	4	6,076,716,152	5,981,510,158
පොළී වියදම		(3,960,479,767)	(3,951,342,868)
ශුද්ධ පොළී ආදායම	4	2,116,236,385	2,030,167,290
ගාස්තු සහ කොමිස් ආදායම		148,120,735	113,332,608
ගාස්තු සහ කොමිස් වියදම		-	-
ශුද්ධ, ගාස්තු සහ කොමිස් ආදායම	5	148,120,735	113,332,608
ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී ශුද්ධ සාධාරණ ලාභය/ (අලාභය)	6	1,875,000	1,840,000
ශුද්ධ, අනෙකුත් මෙහෙයුම් ආදායම	7	33,852,096	28,318,619
මුළු මෙහෙයුම් ආදායම		2,300,084,216	2,173,658,517
හානිකරණ ගාස්තු	8	(270,320,795)	(131,528,308)
ශුද්ධ මෙහෙයුම් ආදායම		2,029,763,421	2,042,130,209
සේවක වියදම්	9	(872,736,805)	(882,138,042)
ක්ෂයකිරීමේ හා ක්‍රමක්ෂය වියදම්	10, 33.2	(52,576,301)	(57,301,152)
අනෙකුත් වියදම්	10	(314,173,773)	(286,785,299)
එඅබදු, ජාගොබදු හා ණයආගෙබදු පෙර මෙහෙයුම් ලාභය / (අලාභය)		790,276,542	815,905,716
මූල්‍ය සේවා මත විකතුකළ අගය මත බදු	34	(218,205,322)	(171,063,330)
මූල්‍ය සේවා මත ජාතිය ගොඩනැගීමේ බදු		-	(26,555,943)
මූල්‍ය සේවා මත ණය ආපසු ගෙවීමේ බදු		-	(118,632,641)
බදු පෙර ලාභය / (අලාභය)		572,071,220	499,653,802
ආදායම් බදු වියදම්	11	(216,236,762)	(80,580,258)
වසර සඳහා ලාභය / (අලාභය)		355,834,458	419,073,544

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

	සටහන්	2020 රු.	2019 රු.
වර්ෂය සඳහා ලාභය / (අලාභය)		355,834,458	419,073,544
ආදායම් ප්‍රකාශනයට නැවත වර්ගීකරණය කරනු ලබන අයිතම			
මූල්‍ය වත්කම් නැවත තක්සේරු කිරීම මත ලාභය හෝ අලාභය		-	-
ආදායම් ප්‍රකාශනයට නැවත වර්ගීකරණය කරනු නොලබන අයිතම			
පශ්චාත් සේවක ප්‍රතිලාභ බැඳීම නැවත තක්සේරු කිරීම		(24,741,748)	17,009,388
නිශ්චිත ප්‍රතිලාභ බැඳීම මත ආයුගණක ලාභය හෝ අලාභය මත විලම්බිත බදු බලපෑම		6,927,690	(4,762,629)
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම		338,020,400	431,320,303

ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශනය

	දායක ප්‍රාග්ධනය	ව්‍යවස්ථාපිත සංචිතය	ප්‍රාග්ධන සංචිතය	පොදු සංචිතය	හිමිකම් හානිපූර්ණ අරමුදල	රඳවාගත් ඉපයීම්	එකතුව
2018.12.31. දිනට ශේෂය	889,812,899	261,668,385	393,498,004	683,280,000	1,031,000	2,957,693,676	5,186,983,964
වර්ෂය සඳහා ශුද්ධ ලාභය	-	-	-	-	-	419,073,544	419,073,544
ගෙවියයුතු ලාභාංශ අධි බදු ගෙවීම් / වෙන්කිරීම්	-	-	-	-	-	40,364,278	40,364,278
වෙනත් විස්තීර්ණ ආදායම්	-	-	-	-	-	12,246,759	12,246,759
වර්ෂය තුල මාරු කිරීම්	-	9,252,649	-	-	-	(9,252,649)	-
ඒකාබද්ධ අරමුදලට මාරු කිරීම්	-	-	-	-	-	-	-
2019.12.31. දිනට ශේෂය	889,812,899	270,921,034	393,498,004	683,280,000	1,031,000	3,420,125,609	5,658,668,546
පෙර කාලසීමාවේ ගැලපීම්	-	-	-	-	-	22,819,743	22,819,743
OCI සංචිතයෙන් RE සංචිතයට මාරු කිරීම්	-	-	-	-	-	-	-
හානිකරණ ගැලපීම්	-	-	-	-	-	-	-
වර්ෂය සඳහා ශුද්ධ ලාභය	-	-	-	-	-	355,834,458	355,834,458
ගෙවියයුතු ලාභාංශ අධි බදු ගෙවීම් / වෙන්කිරීම්	-	-	-	-	-	-	-
වෙනත් විස්තීර්ණ ආදායම්	-	-	-	-	-	(17,814,059)	(17,814,059)
වර්ෂය තුල මාරු කිරීම්	-	12,990,441	-	-	-	(12,990,441)	-
ඒකාබද්ධ අරමුදලට මාරු කිරීම්	-	-	-	-	-	-	-
2020.12.31. දිනට ශේෂය	889,812,899	283,911,475	393,498,004	683,280,000	1,031,000	3,767,975,310	6,019,508,686

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	සටහන්	2020 රු.	2019 රු.
මෙහෙයුම් කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහය			
ලද පොළිය		4,340,182,198	4,820,061,666
ගෙවූ පොළිය		(3,523,797,215)	(4,143,156,182)
ශුද්ධ කොමිස් ලැබීම්		142,634,398	113,332,608
සේවකයින්ට ගෙවීම්		(776,830,997)	(824,099,815)
මූල්‍ය සේවා මත බදු, ණආගෙ බදු හා ජාගො බදු		(214,861,853)	(343,765,347)
අනෙකුත් මෙහෙයුම් කටයුතුවලින් ලැබීම්		4,982,596	3,530,149
අනෙකුත් මෙහෙයුම් කටයුතු මත ගෙවීම්		(300,509,429)	(347,767,572)
මෙහෙයුම් වත්කම් හා වගකීම් වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය		(328,200,303)	(721,864,493)
මෙහෙයුම් වත්කම් (වැඩිවීම්)/අඩුවීම			
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය හා අත්තිකාරම්		(1,154,091,422)	(1,704,102,406)
අනෙකුත් වත්කම්		104,627,378	(44,116,479)
		(1,049,464,044)	(1,748,218,885)
මෙහෙයුම් වගකීම් (වැඩිවීම්)/අඩුවීම			
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම් - තැන්පත්කරුවන්ට ගෙවිය යුතු		6,075,785,860	4,674,406,103
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම් - අනෙකුත් ණය හිමියන්ට ගෙවිය යුතු		(1,153,586,832)	(371,051,710)
අනෙකුත් වගකීම්		(9,278,559)	-
		4,912,920,470	4,303,354,393
ආදායම් බද්දට පෙර මෙහෙයුම් කටයුතුවලින් ශුද්ධ මුදල් ප්‍රවාහය		3,535,256,123	1,833,271,015
ගෙවූ ආදායම් බදු		(121,163,775)	(163,771,708)
මෙහෙයුම් කටයුතුවලින් ශුද්ධ මුදල් ප්‍රවාහය		3,414,092,348	1,669,499,307
ආයෝජන කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහය			
ලද ලාභාංශ		28,869,500	21,771,330
දේපල පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද මුදල්		1,192,874	207,650
මූල්‍ය ආයෝජන මිලට ගැනීම		(4,524,499,262)	(2,556,558,579)
දේපල පිරියත සහ උපකරණ මිලට ගැනීම		(14,217,784)	(18,104,855)
මූල්‍ය ආයෝජන විකිණීමෙන් සහ කල්පිරීමෙන් ලද මුදල්		1,114,204,334	908,028,176
ආයෝජන කටයුතුවලින් ලැබූ ශුද්ධ ආදායම (භාවිතා කළ)		(3,394,450,339)	(1,644,656,277)
මුදල් හා මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම)		19,642,009	24,843,030
වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදල් හා සමාන දෑ		108,826,746	83,983,716
වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් හා සමාන දෑ		128,468,755	108,826,746
මුදල් සහ මුදල් හා සමාන දෑ සැසඳීම			
මුදල් සහ කෙටිකාලීන අරමුදල්		195,817,542	121,239,625
බැංකුවලින් ණයට ගැනීම් (අයිරා)		(67,348,787)	(12,412,879)
කාලසීමාව අවසානයේ මුදල් සහ මුදල් හා සමාන දෑ		128,468,755	108,826,746

ගිණුම්කරණ ප්‍රතිපත්ති

1. ආයතනික තොරතුරු

1.1. සාමාන්‍ය තොරතුරු

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව 1931 අංක16 දරන ආඥාපනත මඟින් 1931 දෙසැම්බර් 06 වැනි දින ලංකා රාජ්‍ය උකස් බැංකුව ලෙස ආරම්භ කරන ලදී. ලංකා රාජ්‍ය උකස් බැංකුව හා වර්ෂ 1943 දී පිහිට වූ කෘෂිකාර්මික හා කර්මාන්ත ණය සංස්ථාව ඒකාබද්ධ කරමින් වර්ෂ 1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනත මඟින් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ස්ථාපිත කරන ලදී. බැංකුව 1979 ජනවාරි 1 දින එහි මෙහෙයුම් ආරම්භ කළේය. මෙම බැංකුව බලපත්‍රලාභී විශේෂ බැංකුවක් ලෙස නම්කල අතර 1988 අංක 30 දරණ බැංකු පනතේ විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 1998 අප්‍රේල් 27 දින බලපත්‍රය නිකුත් කරන ලදී.

1.2. ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම් ස්වභාවය

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ප්‍රධාන වශයෙන් නිවාස ණය ලබාදීමේ කටයුතුවල නියැලී සිටී අතර, වර්ධනය වන තරඟකාරිත්වයට මුහුණදීම පිණිස මෑතක සිට සිය කටයුතු විවිධාංගීකරණය කරමින් රථවාහන ණය හා පුද්ගල ණය වැනි අනෙකුත් ණය පහසුකම් ලබාදීමේ කටයුතුවල ද නිරත වෙමින් සිටී.

1.3. අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශය

1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනත, 1988 බැංකු පනත සහ එහි සංශෝධනවල විධිවිධාන සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS සහ LKAS) අනුකූලව බැංකුවේ මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ.

1.4. බලය ලබාදීමේ දිනය

2020 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා බැංකුවේ මෙම විගණනය කළ මූල්‍ය ප්‍රකාශන 2021.09.24 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ගත් තීරණයට අනුව නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලදී.

2020 දෙසැම්බර් 31 වන දිනට බැංකුවේ කාර්ය මණ්ඩල සංඛ්‍යාව 365ක් විය. (2019 දෙසැම්බර් 31 දිනට එම සංඛ්‍යාව 386 ක් විය.)

2. ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් ගිණුම්කරන ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ දී විශේෂයෙන් සඳහන්කර නොමැතිවිට සියලුම කාල පරිච්ඡේද සඳහා අනුගමනය කර ඇත.

2.1 පිළියෙල කිරීමේ පදනම

2.1.1 අනුකූලතා ප්‍රකාශය

1988 අංක 30 දරණ බැංකු පනත හා එහි සංශෝධන වලට අනුව අවශ්‍ය තොරතුරුවලට අනුකූලව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුව (SLFRS සහ LKAS) 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙලකර ඉදිරිපත් කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන මුදල් ප්‍රවාහයේ ඇති තොරතුරු හැර ගිණුම්කරණයේ උපචිත පදනම යටතේ පිළියෙළ කර ඇත. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී අනුමනය කළ ආකෘතිය හා එහි සඳහන් විළිදරව් කිරීම් ද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකුවල වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශය පල කිරීම හා පිළියෙල කිරීම පිළිබඳ නියම කරන ලද විශේෂිත ආකෘතියට අනුව සිදුකර ඇත.

2.1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

බැංකුව එහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ද්‍රවශීලතාවයේ අනුපිළිවෙළට පුළුල්ව ඉදිරිපත් කරයි. හඳුනාගත් වටිනාකම් නිරවුල් කිරීම වෙනුවෙන් නෛතිකව බැඳී ඇති විටක සහ ශුද්ධ අගය පදනමින් නිරවුල් කිරීමට අරමුණක් ඇති විටක දී හෝ වත්කම් උපලබ්ධි කිරීමත් සමඟ වගකීම් නිරවුල් කිරීමත් එක්වර සිදු කරන අවස්ථාවේ දී මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් එකිනෙකට හිලව් කර ඇත. බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් මඟින් විශේෂිතව හෙළිදරව් කිරීම යටතේ සහ කිසියම් ගිණුම්කරණ ප්‍රමිතියක් අර්ථකථනය කිරීමට අනුව අවශ්‍ය හෝ ඉඩ දී ඇති විටක දී හැර මූල්‍ය ප්‍රකාශනවල ආදායම් හා වියදම් එකිනෙකට හිලව් කිරීමක් සිදු කර නොමැත.

සමාන අයිතමවල එක් එක් වැදගත් පන්තිය මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම ඉදිරිපත් කරයි. සමාන නොවන ස්වභාවයේ අයිතම හෝ කාර්යයන් වෙන වෙනම ඉදිරිපත් කරන්නේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - LKAS 01 විසින් අවසර දී ඇත්නම් පමණි.

2.1.3 සැලකිය යුතු ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන්

බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේ ක්‍රියාවලියේ දී, කළමනාකාරිත්වය මඟින් මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගන්නා ප්‍රමාණ තීරණය කිරීමේදී විනිශ්චයන් සහ ඇස්තමේන්තු භාවිතා කර ඇත. අවිනිශ්චිතතාවය මත පදනම් වූ ප්‍රධාන සැලකියයුතු ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන පහත සාකච්ඡාකර ඇති අතර, එවැනි වත්කම් හා වගකීම්වල ධාරණ අගයන් අදාළ සටහන්වල දක්වා ඇත.

ගිණුම්කරණ ප්‍රතිපත්ති (ඉතිරි කොටස)...

2.1.3.1 මූල්‍ය වත්කම් හා වගකීම් වර්ගීකරණය

SLFRS 9 අනුව බැංකුවේ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති, මූල්‍ය වත්කම් විවිධ වර්ගවලට වගීකරණය කිරීමට හා ගණනය කිරීමට අවකාශයක් සපයන අතර පහත සඳහන් නිර්ණායකයන් මත ඒවා ක්‍රමක්ෂය පිරිවැයට, අනෙකුත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට හා ලාභ සහ අලාභ මගින් සාධාරණ අගයට ලෙස දැක්විය හැකි වේ; මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීම සඳහා පිහිටුවා ඇති, ආයතනයේ ව්‍යාපාරික ආකෘතිය

2.1.3.2 මූල්‍ය උපකරණ වල සාධාරණ අගය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තාකර ඇති මූල්‍ය වත්කම් හා වගකීම්වල සාධාරණ අගය ක්‍රියාකාරී වෙළෙඳපළ තුළින් ලබාගත නොහැකිවිට ගණිතමය ආකෘතිවල අඩංගු තක්සේරු ශිල්පීය ක්‍රම උපයෝගීකර ගනිමින් ඒවා තීරණය කරනු ලබයි. මෙම ආකෘති සඳහා යෙදවුම් හැකි අවස්ථාවන්හිදී නිරීක්ෂණය කළ හැකි වෙළඳපළ දත්ත මගින් ලබා ගනී.

2.1.3.3 මූල්‍ය වත්කම්වල හානිකරණ අලාභ

SLFRS 9 සහ LKAS 39 යටතේ සියලුම වර්ගවල මූල්‍ය වත්කම්වල හානිකරණ අලාභ ගණනය කිරීමේදී විශේෂයෙන්ම හානිකරණ අලාභ තීරණය කරන විට අනාගත මුදල් ප්‍රවාහයන් සහ ඇප සුරැකුම්වල වටිනාකම් ඇස්තමේන්තු කිරීමේ හා කාල ගණනය කිරීමේ විනිශ්චයන් අවශ්‍යවේ. ඒ අනුව ආදායම් ප්‍රකාශයේ හානිකරණ අලාභ දැක්විය යුතුද? යන්න තක්සේරු කිරීම සඳහා සෑම වාර්තා කරන දිනකටම බැංකුව වෙන් වෙන් වශයෙන් වැදගත්වන ණය සහ අත්තිකාරම් සමාලෝචනය කරයි. විශේෂයෙන්ම හානිකරන අලාභ තීරණය කරන විට ප්‍රමාණය ඇස්තමේන්තු කිරීමේ දී හා අනාගත මුදල් ප්‍රවාහයන්ගේ කාල ගණනය කිරීමට කළමනාකරණයේ විනිශ්චයන් අවශ්‍යවේ. මෙම ඇස්තමේන්තු, කරුණු කීපයක් මත පදනම්වූ උපකල්පනයන් වන අතර එමනිසා සැබෑ ප්‍රතිඵල වෙනස්විය හැකි වේ. එහි ප්‍රතිඵලයක් ලෙස වෙන්කර ඇති හානිකරණ දීමනාවේ අනාගත වෙනස්කම් ඇතිවිය හැකිය. වෙන් වෙන් වශයෙන් ඇති හානිකරණ ප්‍රතිපාදන හානිකරණය සඳහා වෙන් වෙන් වශයෙන් ඇගයීම් කරන ලද මූල්‍ය වත්කම් සඳහා අදාළවන අතර ලැබීමට අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන අගය කළමනාකරණයේ හොඳම ඇස්තමේන්තු මත පදනම්වේ. මෙම මුදල් ප්‍රවාහයන් ඇස්තමේන්තු කිරීමේදී ණය ගැනුම්කරුගේ මූල්‍ය තත්ත්වය හා ඇප සුරැකුම් ලෙස තබා ඇති වතකමේ ශුද්ධ උපලබ්ධි වටිනාකම පිළිබඳ කළමනාකරණය විනිශ්චයන් සිදු කරයි. සියලුම හානිකරණයට වත්කම් එහි ගුණාත්මකභාවය මත තක්සේරු කරන අතර මුදල් ප්‍රවාහයන්ගේ ගණනය කිරීමේ උපායමාර්ග සහ ඇස්තමේන්තු අයකර ගතහැකි ලෙස සලකනු ලබයි. වෙන් වෙන් වශයෙන් සලකනු නොලබන එකම වර්ගයේ ණය හා අත්තිකාරම් සඳහා වෙන් වෙන් වශයෙන් හානිකරණයවීම් දක්නට නොලැබුණු සහ වෙන් වෙන් වශයෙන් වැදගත්වන වත්කම් කාණ්ඩ සඳහා සාමූහික හානිකරණ ප්‍රතිපාදන සිදුකර ඇත.

SLFRS 9 ට අනුව අපේක්ෂිත ණය හානි ගණනය කිරීම යනු විචල්‍ය යෙදවුම් තෝරාගැනීම සහ ඒවායේ අන්තර් රඳා පැවැත්ම සම්බන්ධයෙන් (underlying) උපකල්පන ගණනාවක් සහිත සංකීර්ණ මාදිලිවල නිමැවුම් (outputs) වේ. ගිණුම්කරණ විනිශ්චයන් සහ ඇස්තමේන්තු ලෙස සලකනු ලබන අපේක්ෂිත ණය හානි ආකෘතිවල මූලික අංගවලට

- ණය අවදානමේ සැලකිය යුතු වැඩිවීමක් සිදුවී තිබේද යන්න ගුණාත්මක තක්සේරු කිරීම සඳහා වන නිර්ණායක සහ එසේනම් ජීව කාලය තුළ අපේක්ෂිත ණය හානි පදනම මත මනිනු ලබන මූල්‍ය වත්කම් සඳහා දීමනා
- ඒවායේ අපේක්ෂිත ණය හානි සාමූහික පදනමක් මත තක්සේරු කරනවිට මූල්‍ය වත්කම් බෙදා වෙන් කිරීම
- විවිධ සංඛ්‍යාත්මක සූත්‍ර සහ යෙදවුම් තේරීම ඇතුළුව අපේක්ෂිත ණය හානි ආකෘති සංවර්ධනය කිරීම
- දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය හා උද්ධමනය වැනි සාර්ව ආර්ථික යෙදවුම් අතර සම්බන්ධතාවය නිර්ණය කිරීම
- පොලී අනුපාත විනිමය අනුපාත සහ විරැකියාව හා පැහැර හැරීමේ සම්භාවිතාව (PDS)
- පැහැර හැරීමේ නිරාවරණය (EAD) හා පැහැර හැරීමේ අලාභ වීම (LGD)
- අපේක්ෂිත ණය හානි (ECL) ආකෘතිවලට ආර්ථික යෙදවුම් ලබාගැනීම සඳහා ඉදිරි දැක්මක් සහිත සාර්ව ආර්ථික අවස්ථා තෝරාගැනීම සහ ඒවායේ විය හැකි බර තැබීම ඇතුළත් වේ.

2.1.4. ආසන්නම රුපියලට දැක්වීම

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත්කිරීමේ දී ශ්‍රී ලංකා ගිණුම් ගිණුම්කරණ ප්‍රමිති LKAS 1 මගින් ඉඩ ලබා දී ඇති පරිදි වෙනත් අයුරකින් දක්වා ඇති ස්ථාන හැර මූල්‍ය ප්‍රකාශන වල ඇති වටිනාකම් ආසන්නම රුපියලට දක්වා ඇත.

ගිණුම්කරණ ප්‍රතිපත්ති (ඉතිරි කොටස)...

2.1.5. තක්සේරු කිරීමේ පදනම

සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පහත සඳහන් අයිතමයන් හැර වෙතිහාසික පිරිවැය පදනම මත මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

i. ලාභ හෝ අලාභ මගින් හඳුනාගන්නා මූල්‍ය වත්කම් හා වගකීම්

ii. සේවකයින්ගේ නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් සඳහා වන වගකීම් නිශ්චිත ප්‍රතිලාභ බැඳීමවල සැලසුම් කරන ලද වත්කම්වල සාධාරණ අගයට වඩා අඩුවෙන් වර්තමාන වටිනාකම අනුව හඳුනාගෙන ඇත.

2.1.6. ප්‍රවර්ථන ව්‍යාපාරය

ප්‍රවර්ථන ව්‍යාපාරයක් ලෙස ඉදිරියටත් කටයුතු කරගෙන යෑමේ හැකියාව පිළිබඳ බැංකුවේ කලමනාකරනය තක්සේරුවක් සිදුකර ඇති අතර ඉදිරි කාලය තෙක් ව්‍යාපාර කටයුතු සිදුකරගෙන යෑම සඳහා අවශ්‍ය සම්පත් ඇති බවට සෑහීමකට පත්වෙයි. ප්‍රවර්ථන ව්‍යාපාරයක් ලෙස ඉදිරියටත් කටයුතු කරගන යෑමේ බැංකුවේ හැකියාව පිළිබඳ සාධාරණ සැකයක් ඇතිවිය හැකි කිසියම් ප්‍රමාණාත්මක අවිනිශ්චිත තාවයක් පිළිබඳව කලමනාකරනය දැනුවත් වී නොමැත. එම නිසා මූල්‍ය ප්‍රකාශන පිලියලකර ඇත්තේ ප්‍රවර්ථන ව්‍යාපාර පදනම මත වෙයි. මෙම තක්සේරු කිරීම් සිදුකිරීමේදී කළමනාකරණය බැංකුවේ ව්‍යාපාර මෙහෙයුම්වලට කොවිඩ්-19 වසංගතයෙන් විය හැකි පසු බැසීම සැලකිල්ලට ගෙන ඇත. ඒ අනුව ප්‍රවර්ථන ව්‍යාපාර පදනම සුදුසු බවට කළමනාකරණය සෑහීමකට පත් වෙයි.

2.1.7. ප්‍රමාණාත්මක බව හා එක්කිරීම්

සමාන අයිතමයන්ගේ සෑම ප්‍රමාණාත්මක පන්තියක්ම මූල්‍ය ප්‍රකාශනයන්හි වෙන් වශයෙන් ඉදිපත්කර ඇත. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සඳහා වන ගිණුම්කරණ ප්‍රමිති LKAS 01 මගින් අවසර දී ඇති පරිදි ප්‍රමාණාත්මක නොවේ නම් සමාන ස්වභාවයේ නොවන අයිතම හා ක්‍රියාකාරකම් වෙන් වශයෙන් ඉදිරිපත් කර ඇත.

2.1.8. සංසන්දනාත්මක තොරතුරු

වත්මන් කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අවබෝධය වැඩි කිරීම සඳහා සහ අන්තර් කාලාන්තර සංසන්දනාත්මක බව වැඩි කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශනවල පෙර කාලසීමාව සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක සහ විස්තරාත්මක තොරතුරු ඇතුළු සංසන්දනාත්මක තොරතුරු අනාවරණය කර ඇත. ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත් කිරීමට අනුගතවීම සඳහා සංසන්දනාත්මක තොරතුරු වඩා ගුණාත්මක ඉදිරිපත් කිරීමක් සඳහා නැවත වගීකරණය කරයි.

2.2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති - මූල්‍ය උපකරණ සඳහා ආදායම් සහ වියදම් හඳුනාගැනීම

2.2.1. පොළී ආදායම සහ වියදම

ආර්ථික ප්‍රතිලාභ බැංකුව වෙත ගලා ඒමට ඉඩ ඇති බව සහ ආදායම විශ්වාසදායක ලෙස මැනිය හැකි බව දක්වා ආදායම් හඳුනාගෙන ඇත. "ආදායම් හා වියදම්" පිළිබඳ විස්තර සටහන් අංක 3 හා 4 හි දක්වා ඇත.

සඵල පොළී අනුපාත ක්‍රමය

ක්‍රමක්ෂය පිරිවැයට තක්සේරු කර ඇති සියලුම මූල්‍ය උපකරණ ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට (LVPL) වර්ගකර ඇති මූල්‍ය උපකරණ සඵල පොළී අනුපාතය (EIR) උපයෝගී කරගනිමින් පොළී ආදායම වාර්තා කරනු ලබයි. SLFRS 9 යටතේ වෙනත් විස්තීරණ ආදායම් මගින් සාධාරණ අගයට තක්සේරු කර ඇති පොළී ලබාගත හැකි මූල්‍ය වත්කම්වල පොළී ආදායම මෙන්ම විකිණීම සඳහා වර්ගීකරණය කර ඇති පොළී ලබාගත හැකි මූල්‍ය වත්කම් හෝ LKAS 39 යටතේ කල්පිරීම තෙක් රඳවාගත් මූල්‍ය වත්කම් ද EIR ක්‍රමය ප්‍රයෝජනයට ගනිමින් වාර්තා කර ඇත. EIR යනු මූල්‍ය උපකරණයේ අපේක්ෂිත ආයු කාලය හරහා ඇස්තමේන්තුගත අනාගත මුදල් ලැබීම් හෝ සුදුසුවූ විට කෙටි කාලසීමාවක් මූල්‍ය වත්කම්වල ශුද්ධ ඉදිරියට ගෙන එන මුදලට නියමිත පරිදි මට්ටම් කරන අනුපාතයයි.

EIR (සහ එම නිසා වත්කමේ ක්‍රමක්ෂය පිරිවැය) ගණනය කරනු ලබන්නේ EIR හි අනිවාර්ය අංගයක් වන අත්පත්කර ගැනීම් ගාස්තු සහ පිරිවැය පිළිබඳ කිසියම් වට්ටමක් හෝ වාරිකයක් සැලකිල්ලට ගනිමිනි. ණය මුදලක අපේක්ෂිත ජීව කාලයට වඩා ස්ථාවර ප්‍රතිලාභ අනුපාතයක හොඳම ඇස්තමේන්තුව නියෝජනය කරන ප්‍රතිලාභ අනුපාතයක් භාවිතා කරමින් බැංකුව පොළී ආදායම හඳුනාගනී. එබැවින් විවිධ කාල සීමාවන් වල අයකළ හැකි පොළී අනුපාතවල බලපෑම සහ නිෂ්පාදනයේ ජීවන චක්‍රයේ අනෙකුත් ලක්ෂණ (පෙර ගෙවීම්, දඩ පොළී සහ ගාස්තු ඇතුළුව) විය හඳුනාගනී. ණය අවදානම හැර වෙනත් හේතූන් මත මූල්‍ය වත්කම්වල මුදල් ප්‍රවාහයන් පිළිබඳ අපේක්ෂාවන් සංශෝධනය කරන්නේ නම් පොළී ආදායමේ වැඩිවීමක් හෝ අඩුවීමක් සමග මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වත්කමේ ඉදිරියට ගෙනයන ශේෂයට ගැලපීම ධන හෝ සෘණ ගැලපීම ලෙස වෙන්කර ඇත. ගැලපීම ආදායම් ප්‍රකාශයේ පොළී සහ ඒ හා සමාන ආදායමක් මගින් පසුව ක්‍රමක්ෂය කරනු ලැබේ.

ගිණුම්කරණ ප්‍රතිපත්ති (ඉතිරි කොටස)...

2.2.2. ලාභාංශ ආදායම

ගෙවීම් ලැබීමට බැංකුවේ හිමිකාරිත්වය තහවුරු කරන අවස්ථාවේදී ලාභාංශ ආදායම හඳුනා ගනු ලබයි. සටහන් අංක 7.

2.2.3. ශුද්ධ වෙළඳ ආදායම

වෙළඳ ක්‍රියාකාරකම්වලින් හටගන්නා ලද ප්‍රතිඵලවලට ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කළ ස්කන්ධ හා ස්ථාවර ආදායම් සුරැකුම්පත්වල ආයෝජනය තුළින් උපලබ්ධි ලාභ හෝ අලාභ ඇතුළත්ය. සටහන් අංක 6.

2.2.4. වෙනත් ආදායම්

වෙනත් ආදායම් උපචිත පදනමින් හඳුනාගනු ලබයි. සටහන් අංක 7.

2.2.5. අනෙකුත් වියදම්

සියළුම අනෙකුත් වියදම් ඒවා දරනු ලැබූ කාලයට අදාළව සහ ඒවායේ සම්බන්ධතාවය අනුව මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගනු ලබයි. ව්‍යාපාරික කටයුතු මෙහෙයවීමේ දී හා කාර්යක්ෂම තත්ත්වයකින් ප්‍රාග්ධන වත්කම් පවත්වාගෙන යෑම සඳහා දරනු ලබන සියලුම වියදම් වර්ෂය සඳහා වන බැංකුවේ ලාභය සේවීමේ දී, ආදායමට අයකර ඇත. වෙනත් වියදම් පිළිබඳ විස්තර සටහන් අංක 10 හි දක්වා ඇත.

2.2.6. SLFRS-15 ගනුදෙනුකරුවන් සමඟ ඇති කොන්ත්‍රාත් වලින් ලැබෙන ආදායම

SLFRS 15 ආදායම හඳුනාගන්නේ ද? කොපමණ ප්‍රමාණයක් සහ කුමන අවස්ථාවේදී ද යන්න තීරණය කිරීම සඳහා විස්තීරණ රාමුවක් ස්ථාපිත කරයි. නව ගුණාත්මක හා ප්‍රමාණාත්මක හෙළිදරව් කිරීමේ අවශ්‍යතා මූල්‍ය ප්‍රකාශන පරිශීලකයින්ට අනාගතය, ප්‍රමාණය කාලය සහ ආදායමේ අවිනිශ්චිතභාවය සහ ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම්වලින් පැන නගින මුදල් ප්‍රවාහයන් අවබෝධ කර ගැනීමට හැකි කිරීම අරමුණු කරයි. ආයතනය විසින් ආදායම හඳුනාගන්නේ කවදාද සහ කුමන මුදල් ප්‍රමාණය ද යන්න තීරණය කිරීමට පියවර පහක ආකෘතියක් යොදාගනු ඇත. ආදර්ශය නිශ්චිතව දක්වා ඇත්තේ, ආයතනයට හිමිකම් ලැබීමට අපේක්ෂා කරන මුදලට භාණ්ඩ හා සේවා ආයතනික පාලනයක් පාරිභෝගිකයකු වෙත පැවරීමේ දී හෝ ආයතයක් ලෙස ආදායම හඳුනාගන්නා ගන්නා බවයි. යම් නිර්නායක සපුරා තිබේ ද යන්න මත පදනම්ව, ආදායම් හඳුනාගනී.

2.3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති - බදු වියදම්

මූල්‍ය සේවා මත වැට් බද්ද ඇතුළුව බැංකුව ආදායම් බදු හා වෙනත් බදු ගෙවීම සඳහා යටත්වේ. මූල්‍ය ප්‍රකාශනවලට අදාළව (ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. SLFRS පිළිගෙන ඒ මත කළ යුතු ගලපීම් පිළිබඳ නිකුත් කර ඇති බදු මාර්ගෝපදේශයට අනුව ඇති අනෙකුත් බදු සහ වර්තමාන බදු හා කල් පසු වූ බදු සඳහා කරනු ලබන මුළු බදු ප්‍රතිපාදන (වෙන් කිරීම්) පිළිබඳ සැලකිය යුතු විනිශ්චයක් අවශ්‍ය විය. බදු අය කිරීම සඳහා වන බදු අය කළ හැකි ලාභය ගණනය කිරීමේ දී බැංකුවේ මූල්‍ය වාර්තා පිළියෙළ කරන අවස්ථාවේ දී බදු නීතිය යොදා ගැනීම පිළිබඳ අර්ථ නිරූපණය කිරීමට අදාළව අවිනිශ්චිතතාවක් පවතී.

බැංකුව ජංගම වත්කම් හා වගකීම් මත විලම්භිත සහ අනෙකුත් බදු අය කිරීම, බදු ගෙවිය යුතු ද යන්න ඇස්තමේන්තු මත පදනම්ව හඳුනා ගෙන ඇත. මෙහි දී අවශ්‍ය බදු ප්‍රතිඵලය මූලික අවස්ථාවේ දී හඳුනාගත් බදු වටිනාකමට වඩා වෙනස් විය. එකී වෙනස්කම් තීරණ ගනු ලැබූ කාලයට අදාළව ආදායමට හා විලම්භිත බදු වටිනාකමට බලපෑමක් ඇති කරන ලදී.

2.3.1. IFRIC 23-ආදායම් බදු ගැලපීම සම්බන්ධයෙන් පවතින අවිනිශ්චිතතාවය

LKAS 12 ආදායම් බදු යෙදවීමට බලපාන ආදායම් බදු ගැලපීමට සම්බන්ධව අවිනිශ්චිතතානයන් ගණනය කිරීමට අර්ථ දැක්වීම පාදකකර ගනී. එය LKAS 12 විෂය පථයට පිටින් ඇති බදු හා ගාස්තු සඳහා අදාල නොවේ. නිශ්චිත බදු ගැලපීම සඳහා අදාල වන දඩ හා පොලිය සම්බන්ධ අවශ්‍යතාවයන් විශේෂයෙන්ම අඩංගු නොවේ. අර්ථදැක්වීම විශේෂයෙන්ම පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරයි.

- ආයතනය අවිනිශ්චිත බදු ගැලපීම් වෙන් වශයෙන් සලකා බලා තිබේද
- බදු අධිකාරීන් විසින් බදු ගැලපීම පරීක්ෂා කිරීම පිළිබඳව ආයතනය විසින් කරන උපකල්පන
- ආයතනයක් බදු අයකළ හැකි ලාභය (බදු පාඩුව) බදු පදනම් භාවිතා නොකළ බදු අලාභ, භාවිතා නොකල බදු බැර ශේෂ සහ බදු අනුපාත තීරණය කරන ආකාරය
- ආයතනයක් කරුණු සහ අවස්ථාවන්හි වෙනස්කම් සලකා බලන ආකාරය. බැංකුව විසින් එක් එක් අවිනිශ්චිත බදු ගැලපීම් වෙන් වෙන් වශයෙන් හෝ වෙනත් අවිනිශ්චිත බදු ගැලපීම් එකක් හෝ කීපයක් සමග සලකා බැලිය යුතුද යන්න තීරණය කරන අතර අවිනිශ්චිතතාවයේ විසඳුම යෝග්‍ය ලෙස පුරෝකථනය කරන ප්‍රවේශය භාවිතා කරයි.

ගිණුම්කරණ ප්‍රතිපත්ති (ඉතිරි කොටස)...

බදු ගැලපම්වල අවිනිශ්චිතතාවයන් හඳුනා ගැනීමේදී බැංකුව වැදගත් විනිශ්චයන් යොදාගනියි. බැංකුව සංකීර්ණ වටපිටාවක ක්‍රියාත්මකවන බැවින් මූල්‍ය ප්‍රකාශන වල බැංකුවේ අර්ථ දැක්වීමෙන් වන බලපෑම එමගින් තක්සේරු කරයි. අර්ථකතනය කිරීම් යොදාගැනීමෙන් පසුව එමගින් අවිනිශ්චිත බදු තත්ත්වයක් තිබේදැයි බැංකුව සලකා බලා ඇත. විවිධ තීන්දු මත බැංකුවේ බදු ගොනු කිරීමේ එම බදු ගැලපීම් සඳහා බදු බලධාරීන් විසින් අභියෝග කළ හැකිවේ. බදු බලධාරීන් විසින් පිළිගනු ලබන ප්‍රකාශන බදු ගැලපීම සඳහා විය හැකි එහි බදු අනුකූලතාවය මත පදනම්ව බැංකු තීරණය කරයි. අර්ථදැක්වීම බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සඳහා බලපෑමක් ඇති නොකරයි. මෙම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත්කර ඇති සියලුම කාලසීමාවන් සඳහා වන ගිණුම්කරණ ප්‍රතිති බැංකුව විසින් අනුකූලව යොදාගෙන ඇත.

2.3.2. රජය විසින් ප්‍රකාශයට පත් කර ඇති ආදායම් බදු නීතිය සඳහා සංශෝධන

2017 අංක 24 දරණ ආදායම් බදු නීතියට යෝජිත සංශෝධන ක්‍රියාත්මක කිරීම පිළිබඳව 2020 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත්කර ඇති 2020 අප්‍රේල් 08 දින දරණ නිවේදනයට අනුව ආයතනික ආදායම් බදු අනුපාතය 28% සිට 24% දක්වා සංශෝධනයකර තිබිණි. එහෙත් සිදුකිරීමට නියමිත නෛතික ප්‍රතිපාදන සහ දේශීය ආදායම් පනතට විධිමත් සංශෝධන සිදුකරන තුරු ආදායම් බදු වගකීම් ගණනය කිරීමේ දී එවැනි සංශෝධන සැලකිල්ලට ගෙන නොමැත. ප්‍රවර්ථන ආදායම් බදු පිළිබඳ විස්තර සටහනක් අංක 11 හි විලිදරව් කර ඇත.

2.3.3. විලම්භිත බදු වත්කම්

අනාගතයේ දී බදු අය කළ හැකි ලාභයන්ට හිලව් කිරීම් වශයෙන් යොදා ගත හැකි අලාභයන්ගේ ප්‍රතිඵලයක් ලෙස හඳුනාගත හැකි බදු අලාභයේ ප්‍රමාණයට විලම්භිත බදු වත්කම් හඳුනාගනී. මෙම විලම්භිත බදු වත්කම් හඳුනා ගැනීමේ දී අනාගත බදු සැලසුම්කරන ක්‍රමෝපායන් සමඟ අනාගත බදු අය කළ හැකි ලාභයේ කාලය සහ මට්ටම මත පදනම්ව විනිශ්චයන්ට එළැඹීම සිදු කිරීම අවශ්‍ය වේ. විලම්බිත බදු පිළිබඳ විස්තර සටහන් අංක 20 විලිදරව් කර ඇත.

2.3.4 මූල්‍ය සේවා මත එකතු කල අගය මත බදු (VAT)

2002 අංක 14 දරණ එකතුකල අගය මත බදු පනතේ 25 අ පරිච්ඡේදය සහ එම පනතට පසුව කරන ලද සංශෝධනයන්ට අනුව එකතුකළ අගය මත බදු (VAT) ගණනය කරනු ලබයි. ආර්ථික පහතවැටීම හා සේවක පාරිශ්‍රමික සඳහා ගැලපීම් සිදුකර ඇති මූල්‍ය සේවා මත ජාතිය ගොඩනැගීමේ බදු හා එකතුකළ අගය මත බදුවලට පෙර මෙහෙයුම් ලාභයෙන් 15% ක් මූල්‍ය සේවා මත වැටි බද්ද සඳහා ගෙවිය යුතු වේ. එකතුකළ අගය මත බදු වියදම් පිළිබඳව විස්තර සටහන් අංක 34 හි දක්වා ඇත.

2.3.5. මූල්‍ය සේවා මත ජාතිය ගොඩනැගීමේ බදු (NBT)

2014 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි මූල්‍ය සේවා මත වැටි බද්ද සඳහා ප්‍රයෝජනයට ගන්නා වටිනාකම් එකතුවෙන් 2% ක් මූල්‍ය සේවා මත ජාතිය ගොඩනැගීමේ බදු, 2019 අංක 9 දරණ ජාතිය ගොඩනැගීමේ බදු පනත අනුව බැංකුව විසින් ගණනයකර ගෙවනු ලබයි. කෙසේ නමුත් 2020 ඔක්තෝම්බර් 12 දිනැති 2020 අංක 3 දරණ ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත මගින් බැංකුව ජාතිය ගොඩනැගීම බද්දෙන් නිදහස් කර ඇත.

2.3.6. මූල්‍ය සේවා මත ණය ආපසු ගෙවීමේ බද්ද (DRL)

2008 අංක 35 දරණ මුදල් පනතට අනුව 2018 ඔක්තෝබර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි සෑම මූල්‍ය ආයතනයකින්ම ණය ආපසු ගෙවීමේ බදු (DRL) අයකරනු ලබයි. මූල්‍ය සේවා සඳහා අදාලවන වටිනාකම් එකතු කිරීමෙන් 7% ක ප්‍රමාණයක් DRL ලෙස ගණනය කරයි. 2020 ඔක්තෝම්බර් 12 දින දරණ 2020 අංක 02 දරණ මුදල් (සංශෝධන) පනත අනුව 2020 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි ණය ආපසු ගෙවීමේ බද්ද (DRL) අවලංගු කර තිබිණි.

2.3.7. ආර්ථික සේවා ගාස්තු (ESC)

2006 අංක 13 දරණ ආර්ථික සේවා ගාස්තු පනතේ ප්‍රතිපාදන හා ඉන්පසු සිදුකළ සංශෝධනයන්ට අනුව බැංකුවේ වගකීම් පිරිවැටුමෙන් (liable turnover) 0.5% ක ප්‍රමාණයක් ගෙවියයුතු වන අතර ගෙවියයුතු ආදායම් බද්දෙන් මෙම ප්‍රමාණය අඩු කළ හැකි වේ. 2020 ඔක්තෝම්බර් 12 දින දරණ 2020 අංක 04 දරණ ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත මගින් 2020 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි ආර්ථික සේවා ගාස්තු අවලංගු කර ඇත.

2.3.8. වගා රක්ෂණ බද්ද (CIL)

2013 අංක 12 දරණ මුදල් පනතේ ප්‍රතිපාදනයන්ට අනුව 2013 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන පරිදි වගා රක්ෂණ බද්ධ (CIL) හඳුන්වා දී තිබූ අතර බදු පසු ලාභයෙන් 1% ක ප්‍රමාණයක් ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ගෙවිය යුතු වෙයි.

ගිණුම්කරණ ප්‍රතිපත්ති (ඉතිරි කොටස)...

2.4. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති - වත්කම් හා වගකීම් හඳුනාගැනීම

2.4.1. සේවක ප්‍රතිලාභ වගකීම් - පාරිතෝෂික

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ පාරිතෝෂික ලැබීම සඳහා බැංකුවේ සියලුම සේවකයෝ සුදුසුකම් ලබති. අවුරුදු 5 ට වඩා වැඩි සේවා කාලයක් සපුරා ඇති අයට සේවය සිදුකර ඇති සෑම වර්ෂයක් වෙනුවෙන්ම සේවය අවසන් කළ හෝ ඉල්ලා අස් වූ මූල්‍ය වර්ෂයේ අවසන් මාසයට අදාළ වන පරිදි දළ වැටුපනෙන් හරි අඩක් 1983 අංක 12 පාරිතෝෂිත ගෙවීමේ පනත යටතේ පාරිතෝෂිත ලබාගැනීමට, විශ්‍රාම යෑමෙන් හැර ඉල්ලා අස් වූ හෝ සේවය අවසන්කල සේවකයින් සුදුසු වෙයි. නිශ්චිත දායකත්වය සැලැස්ම වන පොරොන්දු වූ පාරිතෝෂිත විශ්‍රාම ප්‍රතිලාභ වර්තමාන වටිනාකම ආයුගණක තක්සේරු ක්‍රමය උපයෝගී කරමින් බැංකුව ගණනය කරයි.

සාමාන්‍ය සහ කලින් විශ්‍රාම ගැනීම	වසර තුනක සේවක සේවා කාලයක් සපුරා ඇති ඔහු/ඇය වයස අවුරුදු 55 දී සාමාන්‍ය විශ්‍රාම යෑමට සුදුසුකම් ලබයි. සියලුම සහභාගීවන්නන් වයස අවුරුදු 60 දක්වා විශ්‍රාම ගැනීමේ වයස දීර්ඝ කිරීමට සුදුසුකම් ලබයි.
පොලී පිරිවැය	ප්‍රතිලාභ පියවීමට වසරකට ආසන්න බැවින් සැලසුම් වගකීම් වල වර්තමාන කාලසීමාව තුළ පොලිය හේතුවෙන් පොලී පිරිවැය අපේක්ෂිත වැඩිවීමක් වෙයි.
අරමුදල් සැලසුම්	පාරිතෝෂික වගකීම් බාහිරින් අරමුදල් කරණය නොවේ.
ආයුගණක තක්සේරුව	නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය - පාරිතෝෂික ආයුගණක තක්සේරුව ප්‍රයෝජනයට ගෙන නිශ්චය කර ඇත. ආයුගණක තක්සේරු සඳහා වට්ටම් අනුපාතය, අනාගත වැටුප් වැඩිවීම්, සේවකයින්ගේ පවත්නා සේවා කාලය සහ සේවක මරණ අනුපාතය යනාදිය පිළිබඳ උපකල්පනයන් පදනම් වේ. මෙම බැඳීම්වල දීර්ඝකාලීන ස්වභාවය නිසා එම ඇස්තමේන්තු සැලකිය යුතු අවිනිශ්චිතතාවන්ට යටත් වේ. මේ සඳහා යොදා ගනු ලැබූ උපකල්පනයන් පහත පරිදි වේ.

	2020	2019
පොළී අනුපාතය	8.00%	10.50%
වාර්ෂික වැටුප් වැඩිවීම් අනුපාතය	6.50%	6.50%
විශ්‍රාම ගන්නා වයස	අවුරුදු 55-60	අවුරුදු 55-60

සේවක ප්‍රතිලාභ බැඳීම්වලට අදාළ පාරිතෝෂිත වෙන් කිරීම් පිළිබඳව සටහන් අංක 24 හි දැක්වේ.

2.4.2. සේවක ප්‍රතිලාභ වගකීම් - වෛද්‍ය ප්‍රතිලාභ

වෛද්‍ය ප්‍රතිලාභයන්ගේ ආයුගණක තක්සේරුව පිළිබඳ විස්තර සටහන් අංක 24 හි විමසිදර්ශීකර ඇත. ස්ථිර සේවකයින් හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් සහ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ විශ්‍රාමිකයින් වෛද්‍ය ප්‍රතිලාභ සඳහා සුදුසුකම් ලබන අතර ඔවුන් යෝජනා ක්‍රමය සඳහා දායකවී සාමාජික මුදල් ගෙවා තිබිය යුතුවේ. විශ්‍රාම ගිය සාමාජිකයින්ගේ පවුලේ සාමාජිකයින් විශේෂ අවස්ථාවක් යටතේ ප්‍රතිලාභ සඳහා සුදුසුකම් ලබයි. (විශ්‍රාම ගිය සාමාජිකයන්ගෙන් කිසියම් අයෙකු හෝ ඔහුගේ /ඇයගේ පවුලේ සාමාජිකයෙකු සුදුසුකම් ලබයි)

වෛද්‍ය ප්‍රතිලාභ ආවරණය කිරීම සඳහා ඇති නිශ්චිත ප්‍රතිලාභ සැලසුම සඳහා වන පිරිවැය අරමුදල් ආයුගණක තක්සේරු මත පදනම්ව තීරණය කර ඇත. ආයුගනක තක්සේරු කිරීම වට්ටම් අනුපාතය වෛද්‍ය උද්ධමනය සහ මරණ අනුපාතය පිළිබඳව උපකල්පනයන් පදනම් වී ඇත. මෙම බැඳීම්වල දීර්ඝකාලීන ස්වභාවය නිසාම එම උපකල්පනයන් සැලකිය යුතු අවිනිශ්චිතතාවන්ට යටත් වේ. යොදා ගනු ලැබූ උපකල්පනයන් පහත පරිදි වේ.

	2020	2019
වට්ටම් අනුපාතය	8.00%	10.50%
වෛද්‍ය වියදම් ඉහළයාම	6.50%	6%
සහභාගීත්ව දත්ත (ක්‍රියාකාරී) දිනට සංගනන තොරතුරු	31.12.2020	31.12.2019

ගිණුම්කරණ ප්‍රතිපත්ති (ඉතිරි කොටස)...

ආයුගණක පාඩු / ලාභ හඳුනාගැනීම	ආයුගණක පාඩු / ලාභ වෙනත් විස්තීරණ ආදායම් තුල (OCI) හඳුනාගනු ලබයි.
වත්කම් මත අපේක්ෂිත ප්‍රතිලාභ	සැලසුම කලින් අරමුදල් කරණය වී නොතිබූ නිසා වත්කම් මත අපේක්ෂිත ප්‍රතිලාභ ශූන්‍ය අගයක් ගනියි.
පොලී පිරිවැය	වර්තමාන සේවා පිරිවැය (CSC) සහ නිශ්චිත ප්‍රතිලාභ බැදීම්හි වර්තමාන අගයේ කාල වටිනාකම් පොලි පිරිවැය වේ.
අරමුදල් සැපයීමේ පියවර	වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට බාහිරින් අරමුදල් නොසැපයේ.

2.4.3. නිශ්චිත දායකත්ව සැලසුම

තවද බැංකුව නිශ්චිත දායකත්ව සැලසුමක් ක්‍රියාත්මක කරයි. සේවකයින් බැංකුවට සේවය ලබා දෙන ලද සේවා කාලයට අනුපාතිකව නිශ්චිත දායකත්ව සැලසුමකට අනුව ගෙවිය යුතු දායකත්වය හඳුනා ගනු ලබන අතර එය 'පිරිස් පාලන වියදම' යටතේ වාර්තා ගත කරනු ලබයි. නොගෙවන ලද දායකත්වයන් වගකීමක් ලෙසටම වාර්තා කරනු ලබයි. බැංකුව පහත දැක්වෙන යෝජනා ක්‍රමයන්ට දායක වී ඇත.

2.4.3.1 සේවක අර්ථසාධක අරමුදල

බැංකුව සහ කාර්යය මණ්ඩලය පිළිවෙළින් මාසික දළ වැටුපෙන් (අතිකාල ගෙවීම් හැර) 15% සහ 10% බැගින් අර්ථසාධක අරමුදලට දායක වෙයි. බැංකුවේ අර්ථසාධක අරමුදල සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ අනුමත අරමුදලකි.

2.4.3.2 සේවක භාරකාර අරමුදල

බැංකුව සේවකයින්ගේ දළ මාසික (අතිකාල හැර) වැටුපෙන් 3%ක් අරමුදලට දායක වන අතර එම අරමුදල සේවක භාරකාර අරමුදල් මණ්ඩලය මඟින් කළමනාකරණය කරනු ලබයි. 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ සේවකයින් පාරිතෝෂික අරමුදල් ලැබීමට හිමිකම් කියයි.

2.4.4. කල්බදු

2019 ජනවාරි 01 දින සිට පෙර කාලයේ සිට බලපැවැත්වෙන පරිදි බැංකුව SLFRS 16 කල්බදු යොදාගෙන ඇත. 2019 ජනවාරි 1 සිට, SLFRS 16 කල්බදුවලට අනුව කල්බදු වත්කම් බැංකුව විසින් භාවිතා කිරීමට ඇති දිනයට බැංකුව විසින් කල්බදු භාවිතයට ඇති වත්කම් සහ අනුරූප වගකීමක් ලෙස හඳුනා ගනී. කල්බද්දකින් ඇති වන වත්කම් සහ වගකීම් වර්තන වටිනාකම් පදනමක් මත මූලිකවම අගය කෙරේ. වගකීම්වල පහත සඳහන් කල්බදු ගෙවීම්වල ශුද්ධ වර්තන අගය ඇතුළත් ය.

- කල්බදු දිරිදීමනා ලැබීම් අඩුකළ ස්ථිර ගෙවීම් (අවශ්‍යම ස්ථිර ගෙවීම් ඇතුළුව)
- දර්ශකයක් හෝ අනුපාතයක් මත පදනම් වන විවිධ කල්බදු ගෙවීම මූලිකව ආරම්භක දිනයට දර්ශකය හෝ අනුපාතය භාවිතා කරමින් මනිනු ලබයි
- සුන්බුන් වටිනාකමේ ඇප යටතේ සමූහය විසින් ගෙවීමට ඇති අපේක්ෂිත ප්‍රමාණ
- සමූහය එම මතය ක්‍රියාත්මක කිරීමට සාධාරණව නිශ්චිතනම්, මිලදී ගැනීමේ මතයක් පිළිබඳ ප්‍රායෝගික මිල, සහ
- කල්බදු නියමයන්ගෙන් සමූහය එම විකල්පය ක්‍රියාවට නංවන බව පිළිබිඹු කරයිනම් කල්බදු අවසන් කිරීම සඳහා දඩමුදල් ගෙවීම

කල්බදු ගෙවීම් කල්බද්ද තුළ පොළී අනුපාත භාවිතා කරමින් වට්ටම් කෙරේ. එම අනුපාතය සමූහය තුළ කල්බදු සඳහා පොදුවේ අවස්ථාව වන පහසුවෙන් තීරණය කළ නොහැකිනම්. කල්බදුකරුගේ වර්ධිත ණය ගැනිමේ අනුපාතය භාවිතා කෙරේ.

කල්බදු ගෙවීම් මුල් මුදල සහ මූල්‍ය පිරිවැය අතර වෙන් කෙරේ. එක් එක් කාලසීමාව සඳහා වගකීමේ ඉතිරි ශේෂය මත අඛණ්ඩ ආවර්ථික අනුපාතයක් නිෂ්පාදන කරමින් පොළී මූල්‍ය පිරිවැය කල්බදු කාලය තුළ ලාභය හෝ අලාභයට අයකෙරේ.

2.4.4.1 කල්බදු හඳුනාගැනීම

කාලසීමාවක් සඳහා හඳුනාගත් වත්කමක් පාලනය කිරීමේ අයිතිය ගිවිසුමකින් පැවරෙන්නේ නම් එම ගිවිසුම කල්බද්දකි. එම නිසා ගිවිසුමක මූලාරම්භයේදීම බැංකුව ගිවිසුම හෝ Contains පහත කරුණු ගැන සලකා බලා තක්සේරු කිරීම සිදු කරයි. හඳුනාගත් වත්කමක් පැවතීම, හඳුනාගත් වත්කමේ පාලනය කිරීමට ඇති අයිතිය, හඳුනාගත් වත්කමේ භාවිතයෙන් සියලුම ආර්ථික ප්‍රතිලාභ සැලකියයුතු ලෙස ලබාගැනීමට ඇති අයිතිය, හඳුනාගත් වත්කම භාවිතාව අධීක්ෂණය කිරීමට ඇති ඇති අයිතිය (කෙටි කාලීන ගිවිසුම්, මාස 12 ට අඩු සහ අඩු වටිනාකම් ඇති ගිවිසුම් හැර) SLFRS 16 කල්බදු යටතේ යන්ත්‍රෝපකරණ Contain a lease සඳහා සහ ඉහා මෙහෙයවීම සඳහා බැංකුව ඇතුළත්වී ඇති සියලුම කුලී ගිවිසුම් ඒ අනුව බැංකුව හඳුනාගනී.

භාවිතයට අයිතිය ඇති වත්කම් පහත සඳහන් දෑ ඇතුළත්ව පිරිවැයට මනිනු ලැබේ:

ගිණුම්කරණ ප්‍රතිපත්ති (ඉතිරි කොටස)...

- කල්බදු වගකීමේ මූලික මැනීමේ ප්‍රමාණය
- ලද යම් කල්බදු දිරිදීමනා අඩුකළ ආරම්භක දිනයට හෝ පෙර සිදුකළ යම් කල්බදු ගෙවීම්
- යම් මූලික සෘජු පිරිවැය, සහ
- ප්‍රතිසංස්කරණ පිරිවැය.

භාවිතයට අයිතිය ඇති වත්කම් වත්කමේ ඵලදායී ජීවකාලයේ කෙටි කාලය සහ සරල මාර්ගික ක්‍රමයක් මත කල්බදු කාලය පුරා පොදුවේ ක්ෂය කෙරේ.

කෙටි කාලීන කල්බදු ආශ්‍රිත ගෙවීම් සහ අඩු වටිනාකම් වත්කම්වල සියලුම කල්බදු ලාභය හෝ අලාභය තුළ වියදමක් ලෙස සරල මාර්ගික පදනමක් මත හඳුනා ගනී. කෙටි කාලීන කල්බදු යනු මාස 12 හෝ ඊට අඩු කාලයක් සහිත කල්බදුය. මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 33 යටතේ මුදල් හා කෙටිකාලීන අරමුදල් පිළිබඳ විස්තරයක් ලබා දී ඇත.

2.4.5. මුදල් සහ මුදල් හා සමාන දෑ

මුදල් සහ කෙටිකාලීන අරමුදල්වලට අතැති මුදල් බැංකුවල ඇති ශේෂයන්, බැංකු සමඟ ස්ථාපනයන්, ඉල්ලුම් කළ හැකි මුදල් සහ කෙටිකාලීන දැනුම්දීමක් මත ලබා ගත හැකි මුදල් ද ඇතුළත් වෙයි. මුදල් සහ කෙටිකාලීන අරමුදල් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන් අංක 13 හි දක්වා ඇත.

2.4.6. දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත උපකරණ පිළිබඳ විස්තරයක් සටන් අංක 19 හි ලබා දී ඇත. දේපළ පිරියත හා උපකරණ පිරිවැය හෝ වටිනාකමින් සමුච්චිත ක්ෂයකිරීම සහ සමුච්චිත හානිකරණය අඩු කළ විදිනෙදා නඩත්තු වියදම ඉවත්කළ පසු වටිනාකමට දක්වා ඇත. අපේක්ෂිත ඵලදායී ජීව කාලයෙහි වෙනස්වීම් සුදුසු පරිදි ක්ෂය කිරීම් කාලය හෝ ක්ෂය ක්‍රමය වෙනස් කිරීම මඟින් ගණනය කරන අතර, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් ලෙසට ද හඳුනා ගනු ලබයි.

2.4.6.1. දේපල පිරියත උපකරණ සහ අස්පෘශ වත්කම්වල ප්‍රයෝජනවත් ජීව කාලය

සෑම වාර්තාකරන දිනටම දේපළ පිරියත උපකරණවල ඉතිරි වටිනාකම ප්‍රයෝජනවත් ජීව කාලය හා ක්ෂය කිරීමේ ක්‍රමය බැංකුව සමාලෝචනය කරයි. කලමනාකරණයේ විනිශ්චයන් මෙම වටිනාකම්, අනුපාත හා ක්‍රමවේද ඇස්තමේන්තු කිරීමේදී ප්‍රයෝජනයට ගන්නා අතර එහෙයින් ඒවා අවිනිශ්චිතතාවයන්ට යටත්වෙයි. සෑම වත්කම් කාණ්ඩයක් සඳහාම භාවිත කළ ක්ෂය කිරීමේ ක්‍රම හා අනුපාත පිළිබඳ විස්තර සටහන් අංක 2.4.6.4. හි දැක්වේ.

2.4.6.2. හඳුනාගැනීමේ පදනම

වත්කම හා බැඳුණු අනාගත ආර්ථික ප්‍රතිලාභ බැංකුව වෙත ලැබෙන සහ වත්කමක පිරිවැය පහසුවෙන් අගය කළ හැකි අවස්ථාවේදී දේපළ පිරියත හා උපකරණ හඳුනා ගනී. විදිනෙදා සේවා කිරීමේ පිරිවැය රහිතව දේපළ පිරියත හා උපකරණ පිරිවැයට සඳහන් කරයි.

2.4.6.3. අගය කිරීමේ පදනම

දේපළ පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂයකිරීම අඩුකළ පිරිවැයට සඳහන් කරන අතර, පහත සඳහන් විශේෂිත පදනම සඳහා එය ලබා දේ.

2.4.6.4. ක්ෂයකිරීම

දේපළ පිරියත හා උපකරණ ඒවායේ ඇස්තමේන්තුගත ඵලදායී ජීවකාලය පුරා ඒවායේ සුන්බුන් වටිනාකමට ලියා හැරීමට සරල මාර්ග ක්‍රමය භාවිතා කරමින් ක්ෂයකිරීම ගණනය කරන අතර, වත්කමක් ක්ෂය කිරීම එය භාවිතයට ගන්නා අවස්ථාවේදී ආරම්භ කරයි. ඇස්තමේන්තුගත ඵලදායී ජීවකාලය පහත පරිදි වේ:

වත්කම් වර්ගය	ක්ෂයකිරීමේ අනුපාතය (වාර්ෂිකව)
මෝටර් රථ	25.00% p.a.
ගෘහභාණ්ඩ හා සවිකිරීම්	12.50% p.a.
කාර්යාල උපකරණ	12.50% p.a.
පරිගණක	25.00% p.a.
වෙනත්	12.50% p.a.

කාර්යාල ගොඩනැගිලි පුළුල් කිරීම සඳහා වෙනස් කිරීම හෝ නවීකරණය වෙනුවෙන් දරන පිරිවැය වසර 4 ක් හෝ මූල් කල්බදු කාලය යන දෙකෙන් අඩුකාලයට ක්‍රමක්ෂය කර ඇත.

2.4.6.5. පසුව දරනු ලබන පිරිවැය

දේපළ පිරියත හා උපකරණ යන අයිතමයක කොටසක් අළුත් කිරීම සඳහා දරනු ලබන පිරිවැය, එම කොටස එකතු කිරීමත් සමඟ එහි අනාගත ආර්ථික ප්‍රතිලාභයන් බැංකුවට ප්‍රතිලාභයන් බැංකුවට ගලා එන්නේනම් සහ එහි පිරිවැය පහසුවෙන් අගය කිරීමට ද හැකිනම්. එම අයිතමයේ ධාරණ වටිනාකමකට හඳුනා ගනු ලබයි.

2.4.6.6. යළි ස්ථාපනය කිරීමේ පිරිවැය

දේපළ පිරියත සහ උපකරණවල අනාගත ආර්ථික ප්‍රතිලාභයන් පවත්වාගෙන යෑම සඳහා වන අළුත්වැඩියාවන් සහ නඩත්තුව සහ දරන වියදම එම අවස්ථාවේ දී ආදායම් ප්‍රකාශයට ලියාහරිනු ලබයි.

ගිණුම්කරණ ප්‍රතිපත්ති (ඉතිරි කොටස)...

2.4.6.7. කාරක ප්‍රාග්ධනය

ගොඩනැගිලි ඉදි කිරීම්, විශාල යන්ත්‍ර හා පිරියත සහ පද්ධති සංවර්ධනය, ප්‍රාග්ධනීකරණය අපේක්ෂාව සඳහා සෘජුව දරනු ලබන ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් ඇත. මෙවැනි වියදම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පිරිවැයට සඳහන් කරනු ලබයි.

2.4.6.8. ඉවත් කිරීම

දේපළ පිරියත හා උපකරණ විකිණීම හෝ එම වත්කම් භාවිතයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභයන් බලාපොරොත්තු නොවන විට දී ඉවත්කරයි. එවැනි වත්කම් ඉවත්කිරීමක් මත හට ගන්නා ලාභය හෝ අලාභය (වත්කමෙහි ධාරණ වටිනාකම සහ ශුද්ධ විකුණුම් ආදායම අතර වෙනස ගණනය කළ) වත්කම ඉවත්කරන වර්ෂයේ ආදායම් ප්‍රකාශනය තුළ වෙනත් මෙහෙයුම් ආදායම් ලෙසට හඳුනාගනු ලැබේ. සටන් අංක 19 හි විස්තර විළිදරව් කර ඇත.

2.4.7. අස්පෘෂ්‍ය වත්කම්

බැංකුවේ අනිකුත් අස්පෘෂ්‍ය වත්කම්වල පරිගණක මෘදුකාංගවල වටිනාකම ඇතුලත් වෙයි. පිරිවැය විශ්වාසදායි ලෙස තක්සේරු කලහැකි විටදී සහ එයට සම්බන්ධිත ඇතිවිය හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ බැංකුව වෙත ගලා එන අවස්ථාවේදී අස්පෘෂ්‍ය වත්කමක් හඳුනාගනී.

වෙන් වෙන් වශයෙන් අත්පත් කර ගන්නා ලද අස්පෘෂ්‍ය වත්කම් මූලික හඳුනා ගැනීම මත පිරිවැයට අගය කරනු ලබයි. මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව, අස්පෘෂ්‍ය වත්කම්වල සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානිකරණය අලාභයන් අඩු කළ පිරිවැයට ඉදිරියට ගෙන යනු ලබයි.

අස්පෘෂ්‍ය වත්කම්වල ඵලදායී ජීව කාලය නිශ්චිත හෝ අවිනිශ්චිතව අගය කිරීමක් සිදු කරනු ලබයි. නිශ්චිත ජීව කාලයක් ඇති අස්පෘෂ්‍ය වත්කම් ඵලදායී ජීව කාලය පුරා ක්‍රමක්ෂය කරනු ලබයි. නිශ්චිත ඵලදායී ජීව කාලයක් ඇති අස්පෘෂ්‍ය වත්කමක් සඳහා ක්‍රමක්ෂය කාලසීමාව සහ ක්‍රමක්ෂය ක්‍රමය අඩු වශයෙන් සෑම වර්ෂයක් අවසානයේ දීම සමාලෝචනයට ලක් කරනු ලබයි. අපේක්ෂිත ඵලදායී ජීව කාලය තුළ හෝ වත්කම් සමඟ ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභයන් භාවිතයේ අපේක්ෂිත රාටාවන් හී වෙනස්වීම් සුදුසු පරිදි ක්‍රමක්ෂය කාලසීමාව සහ ක්‍රමක්ෂය ක්‍රමය වෙනස් කරමින් ගණනය කරනු ලැබේ. නිශ්චිත ජීව කාලයක් ඇති අස්පෘෂ්‍ය වත්කම් මත ක්‍රමක්ෂය වියදම වම අස්පෘෂ්‍ය වත්කමෙහි ක්‍රියාකාරිත්වය සමඟ යන වියදම වර්ගීකරණය යටතේ ආදායම් ප්‍රකාශනය තුළ හඳුනා ගනී. පහත පරිදි ඇස්තමේන්තු ගත ඵලදායී ජීව කාලය පුරා ඉතිරි වටිනාකමට අස්පෘෂ්‍ය වත්කම්වල පිරිවැය ලියා හැරීම සඳහා සරල මාර්ග ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය ගණනය කරනු ලැබේ.

අස්පෘෂ්‍ය වත්කම්වල පන්තිය	ඵලදායී ජීව කාලය	ක්‍රමක්ෂය ක්‍රමය
පරිගණක මෘදුකාංගය	අවුරුදු 4	සරල මාර්ග ක්‍රමය

2.4.8. මූල්‍ය නොවන වත්කම්වල හානිකරණය

බැංකුව සෑම වාර්තාකරන දිනයකදීම වත්කමෙහි හානිකරණය පිළිබඳව කිසියම් සලකුණක් තිබේද යන්න පිළිබඳව ඇගයීමට ලක් කරනු ලබයි. කිසියම් සලකුණක් පවතී නම් හෝ වත්කමක වාර්ෂික හානිකරණය පිළිබඳ පරීක්ෂා කිරීමක් අවශ්‍ය වේනම්, බැංකුව වත්කමෙහි අයකර ගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරනු ලබයි. කිසියම් වත්කමක ලැබිය හැකි වටිනාකම වනුයේ වත්කමෙහි හෝ මුදල් උත්පාදන ඒකකය හි සාධාරණ අගයෙන් විකිණීමට දරනු ලබන වියදම සහ එහි පාවිච්චි වන වටිනාකම අඩු කළ පසු අගය වේ. එහි දී වත්කමෙහි ධාරණ අගය හෝ එහි ලැබිය හැකි වටිනාකම ඉක්මවන්නේ නම්, එම වත්කම හානිකරණය වී ඇති බවට සලකනු ලබන අතර එය අය කර ගත හැකි වටිනාකමට ලියා හරිනු ලබයි.

භාවිතය තුළ වටිනාකම් තක්සේරු කිරීමේ දී, මුදලෙහි කාලීන වටිනාකම පිළිබඳ පවත්නා වෙළෙඳපොළ තක්සේරුව සහ වත්කමට නිශ්චිත අවදානම් පිළිබිඹු කරන පෙර බදු වට්ටමක් භාවිතා කරමින්, අනාගත ඇස්තමේන්තු ගත මුදල් ප්‍රවාහයන් වීවායේ වර්තමාන වටිනාකම වට්ටම් කෙරේ. විකිණීම සඳහා දරනු ලබන වියදම් අඩු කළ සාධාරණ අගය තීරණය කිරීමේ දී, සුදුසු තක්සේරු ක්‍රමයක් යොදා ගනු ලබයි. එම ගණනය කිරීම, තක්සේරු කිරීම් පරිපාලිත සමාගම්වල ලැයිස්තුගත කොටස් මිල හෝ වෙනත් පවත්නා සාධාරණ අගය දර්ශකයන් මඟින් මනාව පැහැදිලි වේ.

2.4.9. මූල්‍ය සුරුකුම්

සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවල දී, බැංකුව මූල්‍ය ඇපවීම් ලබා දේ. මූල්‍ය ඇපවීම් අදාළ වාරිකයන් ලැබෙන විට, සාධාරණ අගයට මූල්‍ය ප්‍රකාශනවල (වෙනත් වගකීම් යටතේ) මූලිකවම හඳුනා ගනී. එම මූලික අවස්ථාවේ හඳුනා ගැනීමෙන් අනතුරුව, එක් එක් ඇපය යටතේ බැංකුවේ වගකීම, ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගත් සමුච්චිත ක්‍රමක්ෂය අඩුකළ මුලින් හඳුනාගත් ප්‍රමාණය සහ ඇපයේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවන යම් මූල්‍ය බැඳීම

ගිණුම්කරණ ප්‍රතිපත්ති (ඉතිරි කොටස)...

නිරවුල් කිරීම සඳහා අවශ්‍ය වඩා නිවැරදි ඇස්තමේන්තු වටිනාකම යන දෙකන් ඉහළ අගයට මනිනු ලබයි.

මූල්‍ය ඇපවීම් සම්බන්ධයෙන් ඇති වගකීම්වල කිසියම් වැඩිවීමක් 'ණය අලාභ වියදම' යටතේ ආදායම් ප්‍රකාශනයෙහි වාර්තා කරනු ලබයි. වාරික ලැබීම් 'ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම' ලෙසට සරල මාර්ග ක්‍රමයට වීම ඇපවීම අදාළ වන කාලය පුරා ආදායම් ප්‍රකාශනයට හඳුනා ගනු ලබයි.

2.4.10. වෙන්කිරීම්

පසුගිය සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස බැංකුවට වර්තමාන බැඳීමක් (නෛතික හෝ ගිවිසුම්ගත) ඇති විටක සහ බැඳීම නිරවුල් කිරීමට ආර්ථික ප්‍රතිලාභයක් ඇතුළත් සම්පත් පිටවයාමක් අවශ්‍ය වන විට සහ වගකීමෙහි ප්‍රමාණය විශ්වාසදායී ලෙසට ඇස්තමේන්තු කිරීමක් ද කළ හැකි විට වෙන්කිරීම් හඳුනා ගනියි. කිසියම් වෙන්කිරීමකට අදාළ වියදම ආදායම් ප්‍රකාශනයෙහි කිසියම් ප්‍රතිපූරණයකින් ශුද්ධව ඉදිරිපත් කර ඇත.

2.4.11. මූල්‍ය උපකරණ - මූලික හඳුනා ගැනීම

2.4.11.1. හඳුනා ගැනීමේ දිනය

ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම් සහ ගනුදෙනුකරුවන්ට ගෙවියයුතු ශේෂ අත්හරිමින් මූල්‍ය වත්කම් සහ වගකීම් වෙළෙඳ දිනයට හඳුනා ගන්නා අතර, මෙම දිනය වන්නේ බැංකුව උපකරණයේ ගිවිසුම්ගත විධිවිධානවල කොටස්කරුවෙක් බවට පත්වන දිනයයි. මෙයට ඇතුළත් වන්නේ වෙළෙඳාමේ විධිමත් මාර්ගවන, වෙළෙඳ ස්ථානය තුළ රෙගුලාසියක් හෝ ගිවිසුමක් මගින් පොදුවේ ස්ථාපිත කාලරාමුවක් තුළ වත්කම බෙදා හැරීම අවශ්‍ය මූල්‍ය වත්කම් මිලදී ගැනීම සහ විකිණීමයි. අරමුදල් ගනුදෙනුකරුවන්ගේ ගිණුම්වලට මාරු කරන අවස්ථාවේදී ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම් හඳුනා ගනී. අරමුදල් බැංකුව වෙත මාරු කරන අවස්ථාවේදී ගනුදෙනුකරුවන්ට ගෙවියයුතු ශේෂ බැංකුව හඳුනා ගනී.

2.4.11.2. මූල්‍ය උපකරණයන්ගේ මූලික තක්සේරු කිරීම

මූලික හඳුනා ගැනීමේ දී මූල්‍ය උපකරණයන් වර්ගීකරණය එහි ගිවිසුම්ගත කාලය සහ එම උපකරණය කළමනාකරණය සඳහා ව්‍යාපාර රටාව මත පදනම් වේ. මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වගකීම් ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට වාර්තා කරන, එයට ගනුදෙනු පිරිවැය එකතු කරන හෝ අඩුකරන අවස්ථාව හැර ඒවායේ සාධාරණ අගයට මූලික වශයෙන් අගය කරනු ලබයි. වෙළෙඳ ලැබීම් ගනුදෙනු මිලට අගය කරනු ලබයි. මූලික හඳුනාගැනීමේ දී මූල්‍ය උපකරණ මත සාධාරණ අගය ගනුදෙනු මිලෙන් වෙනස්වන අවස්ථාවක. පහත විස්තර කරන පරිදි බැංකුවදින 1 ලාභය හෝ අලාභය ගණනය කරයි.

2.4.11.3. දින 1 ලාභය හෝ අලාභය

උපකරණයේ ගනුදෙනු මිල ආරම්භයේදී සාධාරණය අගයට වෙනස්වන්නේනම්. සහ සාධාරණ අගය වෙළෙඳපොල ගනුදෙනුවල නිරීක්ෂණය කළ හැකි යෙදවුම් පමණක් භාවිතා කරන තක්සේරු කරණ ශිල්පයක් මත පදනම් වන අවස්ථාවක, බැංකුව ශුද්ධ වෙළෙඳ ආදායම තුළ ගනුදෙනු මිල හා සාධාරණ අගය තුළ වෙනස හඳුනා ගනී. සාධාරණ අගය සමහර යෙදවුම් නිරීක්ෂනය කළ නොහැකි ආදර්ශ මත පදනම් වන අවස්ථාවන්හිදී, ගනුදෙනු මිල හා සාධාරණ අගය තුළ වෙනස සොයා ගන්නා අතර යෙදවුම් නිරීක්ෂනය කළ හැකි බවට පත්වන හෝ උපකරණය ඉවත්කරන අවස්ථාවේදී ලාභය හෝ අලාභය තුළ පමණක් හඳුනා ගනී.

2.4.11.4. මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් තක්සේරු කිරීමේ ප්‍රභේදයන්

වත්කමේ ආයුගණක කෝන්දේසි හා වත්කම් කළමනාකරණය කිරීම සඳහා ව්‍යාපාරික ආකෘතිය මත පදනම්ව සමස්ථ මූල්‍ය වත්කම් බැංකුව වර්ගීකරනය කරයි. තක්සේරු කිරීම්:

- ක්‍රමක්ෂය පිරිවැයට
- වෙනත් විස්තීර්න ආදායම් මගින් සාධාරන අගය - FVOCI
- ලාභ සහ අලාභ මගින් සාධාරන අගය - FVPL

2.4.12. මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම්

2.4.12.1. බැංකුවලින් ලැබියයුතු, ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම් ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය ආයෝජන

බැංකුවලින් ලැබිය යුතු, ගනුදෙනුකරුවන්ට ණය හා අත්තිකාරම් අනෙකුත් මූල්‍ය ආයෝජන ක්‍රමක්ෂය පිරිවැයට පහත සඳහන් කොන්දේසි දෙක සපුරාලන්නේනම් පමණක් බැංකුව අගය කරයි:

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීමට මූල්‍ය වත්කම් දරා ගැනීමේ පරමාර්ථයසහිත ව්‍යාපාර ආදර්ශයක් තුළ දරා ගනී.
- මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත කොන්දේසි හිඟව පවත්නා ප්‍රධාන මුදල මත මුල් මුදල සහ පොළියේ පමණක් වන මුදල් ප්‍රවාහ සඳහා විශේෂ දිනවල ඇති වේ.

මෙම කොන්දේසි පිළිබඳ විස්තර පහත දැක්වේ.

ගිණුම්කරණ ප්‍රතිපත්ති (ඉතිරි කොටස)...

2.4.12.2. ව්‍යාපාර ආදර්ශ තක්සේරුව

බැංකුව එහි ව්‍යාපාර අරමුණු අත්කර ගැනීමට මූල්‍ය වත්කම් සමූහය කළමනාකරණය කරන ආකාරය වඩා හොඳින් පිළිබිඹු කරන මට්ටමකදී එහි ව්‍යාපාර ආදර්ශය තීරණය කරයි.

බැංකුවේ ව්‍යාපාර ආදර්ශය උපකරණයකින් උපකරණය යන පදනම මත තක්සේරු නොකරයි. එකතුකළ කළඹ තුළ ඉහළ මට්ටමකදී කරනු නොලැබුවත්,පහත නිරීක්ෂණය කළ හැකි සාධක මත එය පදනම වේ:

- ව්‍යාපාර ආදර්ශයේ සහ එම ව්‍යාපාර ආදර්ශය තුළ දරන මූල්‍ය වත්කම්වල කාර්යසාධනය අගය කරන සහ ආයතනයේ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයට වාර්තා කරන ආකාරය
- ව්‍යාපාර ආදර්ශයේ සහ කාර්යසාධනයට බලපාන අවදානම් :එම ව්‍යාපාර ආදර්ශය තුළ දරන මූල්‍ය වත්කම්) විශේෂයෙන් එවැනි අවදානම් කළමනාකරණය කරන ආකාරය
- ව්‍යාපාරයේ කළමනාකරුවන්ට ගෙවනු ලබන ආකාරය (නිදසුනක් ලෙස, ගෙවීම කළමනාකරණය කළ වත්කම්වල සාධාරණ අගය හෝ එකතුකළ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහය මත පදනම් වේ)
- විකුණුම්වල අපේක්ෂිත වාර ගණන, වටිනාකම සහ කාලය බැංකුවේ තක්සේරුවේ වැදගත් අංගයකි.

ව්‍යාපාර ආදර්ශ තක්සේරුව නරක සිදුවීම් හෝ පීඩන සිදුවීම් සැලකිල්ලට ගන්නේ නැතිව සාධාරණව අපේක්ෂිත ක්‍රියාදාම මත පදනම් වේ. මූලික හඳුනා ගැනීමෙන් පසු මුදල් ප්‍රවාහ බැංකුවේ මුල් අපේක්ෂාවන්ගෙන් වෙනස් වන ආකාරයකින් මුදා හරින්නේනම්, එම ව්‍යාපාර ආදර්ශය තුළ දරන ඉතිරි මූල්‍ය වත්කම්වල වර්ගීකරණය බැංකුව වෙනස් නොකරයි. නමුත්. ඉදිරියට ගෙනියන අලුතින් උත්පාදිත හෝ අලුතින් මිලදිගත් මූල්‍ය වත්කම් තක්සේරු කිරීමේදී එවැනි තොරතුරු අතුළත් කරයි.

2.4.12.3. SPPI පරීක්ෂණය

වර්ගීකරණ ක්‍රියාවලියේ දෙවැනි පියවරක් ලෙස, SPPI පරීක්ෂණය සපුරා ඇතිද යන්න හඳුනා ගැනීම සඳහා මූල්‍ය උපකරණවල ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ බැංකුව තක්සේරු කරයි. මෙම පරීක්ෂණයේ අරමුණ සඳහා ප්‍රධාන මුදල යන්න මූලික හඳුනා ගැනීමේදී මූල්‍ය වත්කම්වල සාධාරණ අගය ලෙස නිර්වචනය කරන අතර මුල් මුදල මූල්‍ය වත්කමේ (නිදසුනක් ලෙස, ආපසු ගෙවීම හෝ වාරිකය/ වට්ටම ක්‍රමක්ෂය කිරීම ඇත්නම්) පුරා වෙනස් විය හැකිය. ණයදීමේ වැඩපිළිවෙලක් තුළ පොළියේ වඩාත් වැදගත් අංග වන්නේ මුදල සහ ණය අවදානමේ කාල වටිනාකම සඳහා නියමානුකූල ප්‍රතිඝ්ඨාවයි SPPI තක්සේරු කිරීම සිදු කිරීම සඳහා, බැංකුව විනිශ්චයන් යොදා ගන්නා අතර මූල්‍ය වත්කම නම් කරනු ලබන ව්‍යවහාර මුදල සහ පොළී අනුපාතය නියම කරන කාලසීමාව වැනි අදාළ සාධක සලකා බලයි.

මෙයට වෙනස්ව, මුල් ණය දීමේ වැඩපිළිවෙලකට සම්බන්ධ නොවන ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ තුළ අවදානම් හෝ වෙනස්වීම් සඳහා නිරාවරණය අඩුකර ගැනීමකට වඩා හඳුන්වාදෙන ගිවිසුම්ගත නියමයන් හිඟව පවත්නා ප්‍රමාණය මත මුල් මුදල හා පොළිය ගෙවීම සඳහා පමණක් වන ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ඇති නොකරයි. එවැනි අවස්ථාවලදී, මූල්‍ය වත්කම ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට ක්‍රමක්ෂය කිරීම අවශ්‍ය වේ.

2.4.12.4. අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයේදී ණය උපකරණ

පහත සඳහන් කොන්දේසි දෙක සපුරාලන අවස්ථාවේදී අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයේදී ක්‍රමක්ෂයට ණය උපකරණ SLFRS 9 යටතේ නව වර්ගීකරණය බැංකුව යොදා ගනී:

- උපකරණය ව්‍යාපාර ආදර්ශයක් තුළ දරා ගැනීම, හා එහි පමාර්ථය සාමූහික ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහ සහ අලෙවිකරන මූල්‍ය වත්කම් යන දෙවර්ගය විසින් අත්කර ගැනීම.
- මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත නියමයන් හි SPPI පරීක්ෂණය සපුරාලීම

මෙම උපකරණ විශාල වශයෙන් LKAS 39 යටතේ අලෙවිය සඳහා තබා ඇති මූල්‍ය ආයෝජන ලෙස පෙර වර්ගීකරණය කර ඇති වත්කම්වලින් සමන්විත වේ.

අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයේදී ක්‍රමක්ෂයට ණය උපකරණ අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ හඳුනාගත් සාධාරණ අගය තුළ වෙනස්වීම් නිසා ඇතිවන ලාභ හෝ අලාභ සහිත සාධාරණ අගයට පසුව මනිනු ලැබේ. සමාන සුරැකුම්වල බැංකුව එක් ආයෝජනයකට වැඩිපුර දරන අවස්ථාවේදී, ඒවා පෙර පිවිසි පෙර පිටවුම් මත LKAS බැහැර කළ යුතුයයි සලකනු ලැබේ. ඉවත් කිරීම මත, අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ පෙර හඳුනාගත් සමුච්චිත ලාභය හෝ අලාභ අනෙකුත් විස්තරාත්මක ආදායමෙන් ලාභ හෝ අලාභයට නැවත වර්ගීකරණය කෙරේ. 2020 වසරෙන් අවසන් වූ වසර සඳහා වෙනත් විස්තරාත්මක ආදායම් තුළින් සාධාරණ අගයට තක්සේරු කල ණය උපකරණ බැංකුව රඳවාගෙන නොමැත.

ගිණුම්කරණ ප්‍රතිපත්ති (ඉතිරි කොටස)...

2.4.12.5. අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයේදී ස්කන්ධ උපකරණ (FVOCI)

මූලික හඳුනා ගැනීම මත, බැංකුව අවස්ථානුකූලව LKAS 32 යටතේ ස්කන්ධය පිළිබඳ නිර්වචනය සපුරාලන අවස්ථාවේදී එහි ස්කන්ධ ආයෝජන කිහිපයක් අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයේදී ස්කන්ධ උපකරණ ලෙස වෙනස්කළ නොහැකි ලෙස වර්ගීකරණය කිරීම තෝරා ගෙන ඇත. මූල්‍ය උපකරණ: අලෙවිය සඳහා තබා නොමැති අවස්ථාවකදී, එවැනි වර්ගීකරණය උපකරණයක් උපකරණයක් මගින් යන පදනම මත තීරණය කෙරේ.

මෙම ස්කන්ධ උපකරණ මත ලාභ හෝ අලාභ ලාභයට නැවත ප්‍රතිවර්ගීකරණය නොකරයි. උපකරණයේ පිරිවැයේ කොටසක් අයකර ගැනීමක් ලෙස එවැනි ලද මුදල්වලින් බැංකුව ප්‍රතිලාභ ලබන අවස්ථාවේදී, එවැනි ලාභ අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ වාර්තා කරන අවස්ථාව හැර ගෙවීමේ අයිතිය සථාපිත කර ඇති අවස්ථාවේදී අනෙකුත් මෙහෙයුම් ආදායම ලෙස ලාභය හෝ අලාභය තුළ ලාභාංශ හඳුනා ගනී. අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයේදී ස්කන්ධ උපකරණ හානිකරණ තක්සේරුවකට යටත් නොවේ.

2020 වසරෙන් අවසන් වූ වසර සඳහා පිළි රේටින් සමාග මේ සහ ණය තොරතුරු කාර්යාංශයේ ලයිස්තුගත ස්කන්ධ උපකරණ බැංකුව රඳවාගෙන ඇත. සටහන් අංක 18.

2.4.12.6. නිකුත්කළ ණය හා අනෙකුත් ණයටගත් අරමුදල්

මූලික අගය කිරීමෙන් පසු, නිකුත්කළ ණය හා අනෙකුත් ණයටගත් අරමුදල් පසුකාලීනව ක්‍රමක්ෂය පිරිවැයට අගය කෙරේ. ක්‍රමක්ෂය පිරිවැය නිකුත්කළ අරමුදල් පිළිබඳ යම් මට්ටම් හෝ වාරික සහ ඵලදායී පොළී අනුපාතයේ අත්‍යවශ්‍ය කොටසක් වන පිරිවැය සැලකිල්ලට ගනිමින් ගණනය කෙරේ. වගකීමක් සහ ස්කන්ධ සංරචකයක් අඩංගු සංකීර්ණ මූල්‍ය උපකරණයක් නිකුත් කරන දිනයට වෙන් කෙරේ.

2.4.12.7. ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී මූල්‍ය වත්කම් හා වගකීම්

මෙම වර්ගය තුළ මූල්‍ය වත්කම සහ මූල්‍ය වගකීම යනු අලෙවිය සඳහා තබා ඇති සහ මූලික හඳුනා ගැනීම මත කළමනාකරණය විසින් නම්කරන ඇති හෝ SLFRS යටතේ සාධාරණ අගයේදී මැනීමට අනිවාර්යයෙන්ම අවශ්‍ය වන වීවා වේ. කළමනාකරණය පහත සඳහන් නිර්ණායකයක් සපුරාලන අවස්ථාවේ මූලික හඳුනා ගැනීම මත ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට උපකරණයක් නම් කරයි. වීම නම් කිරීම උපකරණයක් උපකරණයක් මගින් යන පදනම මත තීරණය කෙරේ.

- මෙම නම් කිරීම වත්කම් හෝ වගකීම් අගය කිරීමෙන් වෙනත් ආකාරයකින් ඇතිවියහැකි හෝ විවිධ පදනමක් මත ඒ මත ලාභ හෝ අලාභ හඳුනා ගැනීමේ අනුරූප නොවන දෙය තුරන් කරයි නැතිනම් සැලකියයුතු ලෙස අඩු කරයි.

  හෝ

- වගකීම් (සහ LKAS 39 යටතේ 2018 ජනවාරි1 දක්වා වත්කම්) මූල්‍ය වගකීම් සමූහයක (හෝ LKAS 39 යටතේ මූල්‍ය වත්කම් හෝ දෙකම) කොටසක් වන අතර, ලේඛණගත අවදානම් කළමනාකරණය හෝ ආයෝජන ක්‍රමෝපායට අනුකූලව කළමනාකරණය කරන අතර වීවායේ කාර්යසාධනය අගයනු ලබයි.

ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් සාධාරණ අගයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ වාර්තා කරයි. සාධාරණ අගයේ වෙනස්වීම් බැංකුවට අයත් ණය අවදානම් තුළ වෙනස්වීම් නිසා ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී නම්කළ වගකීම්වල සාධාරණ අගය තුළ වෙනස්වීම් හැරදැමීම සමඟ ලාභය සහ අලාභය තුළ වාර්තා කෙරේ. සාධාරණ අගය තුළ එවැනි වෙනස්වීම් අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් ණය සංචිතය තුළ වාර්තා කරන අතර, ලාභය සහ අලාභයට ප්‍රතිවර්ගීකරණය නොකරයි. ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී නම්කළ උපකරණ මත උපයන හෝ දරන පොළිය ඵලදායී පොළී අනුපාතය භාවිතා කරමින් යම් මට්ටම/වාරිකය සහ උපකරණයේ අත්‍යවශ්‍ය කොටසක් වන සුදුසුකම් ලබන ගනුදෙනු පිරිවැය සැලකිල්ලට ගනිමින් පිළිවෙලින් පොළී ආදායම හෝ පොළී වියදම තුළ උපචිත කෙරේ. ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී මැනිම නීතියෙන් අනිවාර්ය වත්කම් මත උපයන පොළිය ගිවිසුම්ගත පොළී අනුපාතය භාවිතා කරමින් වාර්තා කෙරේ. ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී මනිනලද ස්කන්ධ උපකරණවලින් ලාභාංශ ආදායම ගෙවීමේ අයිතිය ස්ථාවර කර ඇති අවස්ථාවේදී අනෙකුත් මෙහෙයුම් ආදායම ලෙස ලාභ සහ අලාභ තුළ වාර්තා කෙරේ.

2020 දෙසැම්බර් 31 දිනට බැංකුව වීකක භාර රඳවාගෙන ඇති අතර ලාභය හෝ අලාභය මගින් සාධාරණ අගයට (FVPL) තක්සේරු කරයි.

2.4.12.8. මූල්‍ය වත්කම් හා වගකීම් නැවත වර්ගීකරණය

ව්‍යාපාර මාර්ගයක් අත්කරගන්නා, බැහැර කරන හෝ අවසන් කරන විශේෂ වාතාවරණයකදී හැර බැංකුව වීවායේ මූලික හඳුනා ගැනීමෙන් පසු එහි මූල්‍ය වගකීම් නැවත වර්ගීකරණය නොකරයි. බැංකුව 2019 සහ 2020 දී එහි මූල්‍ය වත්කම් වර්ගීකරණය කර නොමැත.

ගිණුම්කරණ ප්‍රතිපත්ති (ඉතිරි කොටස)...

2.4.12.9. මූල්‍ය වත්කම් හා වගකීම් ඉවත් කිරීම

2.4.12.9.1. නියමයන් හා කොන්දේසිවල සැලකියයුතු වෙනස්වීම් අනුව ඉවත් කිරීම

බැංකුව ගනුදෙනුකරුවන්ට ණය වැනි මූල්‍ය වත්කමක් ඉවත් කරන්නේ, හානිකරණ අලාභය දැනට වාර්තා කර නොමැති ප්‍රමාණය දක්වා ඉවත් කිරීමක් ලෙස හඳුනාගන්නා වෙනස සමඟ එය අලුත් ණයක් බවට පත්වන පරිදි සැලකියයුතු ප්‍රමාණයට එහි නියමයන් හා කොන්දේසි නැවත සාකච්ඡා කර ඇති අවස්ථාවේදීය. අලුතින් හඳුනාගත් ණයමුදල් අපේක්ෂිත ණය අලාභ මැනීමේ අරමුණ සඳහා 1 අදියර ලෙස වර්ගීකරණය කරනු ලබන්නේ එම ණය POCI වන බවට සලකන්නේනම් පමණි.

අනෙකුත් කරුණු අතර, ගනුදෙනුකරුවන්ට ණයක් හඳුනා ගන්නේද යන්න තක්සේරු කිරීමේදී, බැංකුව පහත සඳහන් සාධක සලකා බලයි:

- ණය මුදලේ ව්‍යවහාර මුදලේ වෙනස
- ස්කන්ධ ලක්ෂණයක් හඳුන්වාදීම
- ඇපයක වෙනස්වීම
- වෙනස්වීම මගින් SPPI නිර්ණායක තවදුරටත් සපුරනු නොලබන උපකරණයක් විය

වෙනස්වීම පසුකාලීනව වෙනස් වන මුදල් ප්‍රවාහවලට හේතු නොවේනම්. වෙනස්වීම ඉවත් කිරීමට හේතු නොවේ. මුල් ඵලදායී පොළී අනුපාතයට වට්ටම් කළ මුදල් ප්‍රවාහ තුළ වෙනස මත පදනම් වී, හානිකරණ අලාභයක් දැනට වාර්තා කර නොමැති ප්‍රමාණයට වෙනස් වීමේ ලාභයක් හෝ අලාභයක් වාර්තා කරයි.

2.4.12.9.2. සැලකියයුතු නවීකරණයකිරීම හැර ඉවත්කිරීම මූල්‍ය වත්කම්

කල් ඉකුත් වූ වත්කම්වලින් මුදල් ගලා ඒම ලබාගැනීමට හිමිකමක් ඇතිවිට මූල්‍ය වත්කමක් (මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් කාණ්ඩයක කොටසක් හෝ අදාලවන පරිදි) ඉවත් කිරීමක් සිදුකරයි. ඉවත්කිරීම සඳහා මාරු කිරීම් ලක්ෂණ හා මූල්‍ය වත්කම මාරුකර තිබේනම් යන අවස්ථා දෙකෙහිදීමදීත් බැංකුව මූල්‍ය වත්කම ඉවත් කරයි.

බැංකුව මූල්‍ය වත්කම මාරුකර ඇත්නම් පමණක්, නැතහොත්

- මූල්‍ය වත්කමකින් මුදල් ගලාඒම ලබාගැනීමට ඇති ගිවිසුම්ගත අයිතිය බැංකුව මාරුකර ඇතිවිටක දී හෝ
- මුදල් ගලාඒම අයිතිය අත්හිටුවා ඇතිවිට එහෙත් pass-through ගිවිසුමක් යටතේ නොවන පක්ෂයකට ප්‍රමාණාත්මක ප්‍රමාදයකින් තොරව ලබාගත් මුදල් ප්‍රවාහය සම්පූර්ණයෙන් ගෙවීමේ අයිතිය පිලිගෙන ඇත.

Pass-through ක්‍රියාමාර්ග යනු ගනුදෙනු වෙයි. එමගින් වත්කමකින් (ආරම්භක වත්කම) මුදල් ගලා ඒම ලබාගැනීමට ඇති ගිවිසුම්ගත අයිතිය බැංකුව අත්හිටුවයි. එහෙත් මෙම මුදල් ප්‍රවාහයන් එකක් හෝ ආයතන වැඩි ගණනකට ගෙවීමට හැකි ගිවිසුම්ගත අයිතිය පහත සඳහන් තත්ත්වයන්ට යෝග්‍යවේ නම් පිලිගනු ලබයි.

- ණයට දුන් මුදලට වෙළෙඳපල අනුපාතයට ඇති උපචිත පොලිය එකතුකර සම්පූර්ණයෙන්ම අයකර ගැනීමට අයිතියක් ඇත. කෙටිකාලීන අත්තිකාරම් හැර මූලික වත්කමින් සමාන වටිනාකමක් ලබාගෙන නොමැති ආනුෂාංගික ලැබීම්කරුවන්හට වටිනාකම් ගෙවීමට බැංකුව බැඳීමක් නොමැත.
- ආනුෂාංගික ලැබීම්කරුවන්හට ඇති සුරැකුම් හැර මූලික වත්කම ඇපයට තැබීමට හෝ විකිණීමට බැංකුවට නොහැක.
- බැංකුව විසින් එකතුකරනු ලබන මුදල් ප්‍රවාහයන් ප්‍රමාණාත්මක ප්‍රමාදයකින් තොරව ආනුෂාංගික ලැබීම්කරුවන් වෙත බැංකුව ප්‍රේෂණය කරයි.

මීට අමතරව රැස්කිරීමේ දිනය හා අනුෂාංගික ලැබීම්කරුවන්ට ප්‍රේෂණය කිරීමට අවශ්‍ය දිනය අතර කාලය තුල දී ඉපයූ පොලිය ඇතුලුව මුදල් හෝ මුදල් සමාන දෑ වල ආයෝජනය කිරීම හැර එවැනි මුදල් ප්‍රවාහයන් ආයෝජනය කිරීමට බැංකුවට අයිතියක් නොමැත. ඉවත්කිරීම සඳහා පැවරීම සුදුසු වත්කම් වක පසෙකින්

- බැංකුව වත්කමේ සියලුම අවදානම් හා ලැබීම් සැලකියයුතු ලෙස මාරුකර ඇතිවිට හෝ
- බැංකුව සැලකියයුතු ලෙස වත්කමේ සියලු අවදානම් හා ලැබීම් මාරුකිරීමක් හෝ රඳවාගැනීමක් සිදුකර නොමැති නමුත් වත්කමේ පාලනය මරුකර ඇත.

පැවරුම් ලාභියාට අසම්බන්ධිත පාර්ශවයකට වත්කම මුළුමනින්ම විකුනා දැමීමට ප්‍රයෝගික හැකියාවක් තිබියයුතු අතර එම හැකියාව පැවරීම අමතර සීමාවලට යටත්කිරීමකින් තොරව බහුපාර්ෂිකව ප්‍රයෝජනයට ගැනීමට හැකිනම් හෝ හැකිවේනම් පමණක් බැංකුව පාලනය පැවරීම සලකා බලයි.

ගිණුම්කරණ ප්‍රතිපත්ති (ඉතිරි කොටස)...

සියලුම අවදානම් හා ලැබීම් සැලකියයුතු ලෙස රඳවා තබා ගැනීමක් හෝ පැවරීමක් බැංකුව සිදු නොකරනවිට හා වත්කමේ පාලනයේ නවතා දැමීම සිදුකර බැංකුවේ සිදුකරගෙන යන මැදිහත්වීමේ ප්‍රමාණයට වත්කම හඳුනාගන්නා අතර එවැනි අවස්ථාවක බැංකුව ආශ්‍රිත වත්කම් ද හඳුනාගනී. බැංකුව රඳවාගෙන ඇති බැඳීම් හා අයිතීන් නිරූපනයවන පදනම මත පවරන ලද වත්කම හා ආශ්‍රිත වගකීම් තක්සේරු කරනු ලබයි.

පවරනලද වටිනාකමේ ඇපයක ස්වරූපය ගන්නා අඛණ්ඩ මැදිහත්වීම වත්කමේ මූලික ඉදිරියට ගෙන ආ වටිනාකමේ අඩු අගයට තක්සේරු කරන අතර බැංකුව ගෙවියයුතු උපරිම වටිනාකම සලකා බැලීම සිදුකරයි.

ප්‍රතිමිලදී ගැනීම් සඳහා බැංකුවට ගෙවීමට අවශ්‍යවන අගයට අඛණ්ඩ මැදිහත්වීම තක්සේරු කරන අතර පවරන ලද වත්කම මත අඛණ්ඩ මැදිහත්වීම ලිඛිත හෝ මිලදී ගැනීම් විකල්පයක ස්වරූපය ගනී. සාධාරණ අගයට තක්සේරු කර ඇති වත්කමක අයිතිය විකිණීමේ දී අස්ථිත්වයේ අඛන්ඩ මැදිහත්වීම පවරන ලද වත්කමේ සාධාරණ අගයේ අඩුවටිනාකමට සීමාවෙයි.

මූල්‍ය වගකීම්

වත්කමක් යටතේ ඇති බැඳීම් නිදහස් කරනු ලැබීම, අවලංගු කිරීම හෝ කල් ඉකුත්වීම සිදුවූ අවස්ථාවක මූල්‍ය වගකීමක් ඉවත්කිරීම සිදුකරයි. එකම ණය ගනුදෙනුකරුවෙකු සැලකියයුතු වෙනසක් සහිත කොන්දේසිවලට යටත්ව පවත්නා මූල්‍ය වගකීමක් අලුත් කිරීම හෝ දැනට පවත්නා වගකීම්වල කොන්දේසි සැලකිය යුතු ලෙසින් අලුත් කිරීමේ දී එවැනි හුවමාරුවක් හෝ අලුත් කිරීමක් ප්‍රාරම්භක වගකීම් ඉවත්කිරීමක් ලෙසට හා නව වගකීමක් හඳුනාගැනීමක් ලෙසද ගැලපීම් කර ඇත. එසේම ප්‍රාරම්භක මූල්‍ය වගකීම්වල ඉදිරියට ගෙන එන ලද වටිනාකම සහ මූලාරම්භක මූල්‍ය වගකීම් යන ගෙවන ලද වටිනාකම අතර වෙනස ලාභ හෝ අලාභවල ගිණුමේ හඳුනාගෙන ඇත.

2.4.12.10. මූල්‍ය වත්කම් හානිකරණය

බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය උපකරණ හඳුනා ගැනීම හා අගයකිරීම පිළිබඳ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRS) අංක 09 ට අනුකූලව, ගනුදෙනුකරුවන්ට සියලුම ණය සහ අත්තිකාරම් සම්බන්ධයෙන් වියහැකි හානිකරණ අලාභ සඳහා වෙන් කිරීම් සිදු කෙරේ. පහත සඳහන් තක්සේරු ශිල්ප ණයවල සාධාරණ අගය ගණනය කිරීමට භාවිතා කළ අතර ඒවා පහත පරිදි වේ.

I වෙන් වෙන් වශයෙන් සිදුකරන හානිකරණ ක්‍රමය

වෙන් වෙන් වශයෙන් හානිකරණ ක්‍රමය ණය සඳහා සිදුකරන අතර, එහිදී මුදල් ආපසු ණය ඉවත්කරන අතර රු.මි.50 වැඩි සියලුම ණය ඇතුළත් කරයි. නැතිනම් ප්‍රාග්ධන පදනමෙන් 0.1%ක් තනි තනිව සැලකියයුතු ලෙස සලකනු ලබයි. තනි තනි හානිකරණ පරීක්ෂණය සඳහා පහසුකම් හානිකරණයේ අරමුණුගත සාක්ෂි ලබාගැනීම මත පදනම් වී තෝරා ගනු ලැබේ.

II සාමූහික හානිකරණ ක්‍රමය

වියහැකි ණය අලාභ සඳහා සාමූහික හානිකරණ වෙන් කිරීම් බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය උපකරණ හඳුනා ගැනීම හා අගයකිරීම පිළිබඳ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRS) අංක 09 ට අනුකූලව සිදු කෙරේ. බැංකුව අපේක්ෂිත ණය අලාභ මූලධර්මයට අනුව සාමූහික හානිකරණ වෙන්කිරීම බැංකුව සිදුකර ඇත. එහිදී වෙන් වෙන් වශයෙන් සිදුකරන හානිකරණය වැදගත් නොවේ.

මූල්‍ය වත්කම්වල හානිකරණය පිළිබඳ විස්තර සටහන් අංක 14 හා 15 හි විලිදරව් කර ඇත.

2.4.12.10.1. අපේක්ෂිත ණය අලාභ මූලධර්මය පිළිබඳ දළ විශ්ලේෂණය

ඉදිරිය දකින අපේක්ෂිත ණය අලාභ ප්‍රවේශයක් සහිතව LKAS 39 හි දරන ලද අලාභ ප්‍රවේශය වෙනුවට SLFRS 9 යොදා ගැනීම මූලිකවම බැංකුවේ ණය අලාභ හානිකරණ ක්‍රමය මූලිකවම වෙනස් කර ඇත. 2018 ජනවාරි 1 සිට, "මූල්‍ය උපකරණ" ලෙස මෙම සෑම කොටසකම සඳහන් කරන ණය බැඳීම් සහ මූල්‍යමය ඇප ගිවිසුම් සමඟ ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට නොදරන සියලුම ණය සහ අනෙකුත් ණය මූල්‍ය වත්කම් සඳහා අපේක්ෂිත ණය අලාභ වෙනුවෙන් අත්තිකාරම බැංකුව වාර්තා කරමින් සිටී. ස්කන්ධ උපකරණ SLFRS 9 යටතේ හානිකරණයට යටත් නොවේ.

මාස 12 අපේක්ෂිත ණය අලාභ යනු ජීවකාල අපේක්ෂිත ණය අලාභයේ කොටස වන අතර එය වාර්තාකරණ දිනයෙන් පසු මාස 12ක් ඇතුළත වියහැකි මූල්‍ය උපකරණයක් මත පැහැර හැරීමේ සිදුවීම් ඇතිවන අපේක්ෂිත ණය අලාභය නියෝජනය කරයි.

ජීවකාල අපේක්ෂිත ණය අලාභ සහ මාස 12 අපේක්ෂිත ණය අලාභ යන දෙකම මූල්‍ය උපකරණවල පාදක කළඹේ ස්වභාවය මත රැඳෙමින් තනි තනි පදනමක් හෝ සාමූහික පදනමක් මත ගණනය කෙරේ. මූල්‍ය වත්කම් කාණ්ඩකරණය සඳහා බැංකුවේ ප්‍රතිපත්තිය සාමූහික පදනමක් මත අගය කර ඇත.

මූල්‍ය උපකරණයක ඉතිරි ජීව කාලය තුළ සිදුවන පැහැර හැරීමේ අවදානම තුළ වෙනස සැලකිල්ලට ගනිමින් මූලික හඳුනා ගැනීමේ සිට මූල්‍ය උපකරණයේ ණය අවදානම සැලකියයුතු ලෙස වැඩිවී තිබේද යන්න පිළිබඳ එක් එක් වාර්තාකරන කාලසීමාව අවසානයේදී තක්සේරුවක් සිදු කිරීමට බැංකුව ප්‍රතිපත්තියක් ස්ථාපිත කර ඇත.

ඉහත ක්‍රියාවලිය මත පදනම් වී, බැංකුව එහි ණය පහත විස්තර කරන පරිදි අදියර 1, අදියර 2, අදියර 3 සහ POCI තුළට කාණ්ඩ කරයි:

ගිණුම්කරණ ප්‍රතිපත්ති (ඉතිරි කොටස)...

අදියර 1	ණය පළමුව හඳුනාගන්නා අවස්ථාවේදී, බැංකුව මාස 12 අපේක්ෂිත ණය අලාභ මත පදනම් වී අත්තිකාරමක් හඳුනා ගනී. අදියර 1 ණය අවදානම වර්ධනය වී ඇති පහසුකම් සහ අදියර 2 සිට නැවත වර්ගීකරණය කර ඇති ණය ඇතුළත්ය.
අදියර 2	ණයමුදලක් ආරම්භයේ සිට ණය අවදානම තුළ සැලකියයුතු වැඩිවීමක් පෙන්නුම්කර ඇති අවස්ථාවක, බැංකුව ජීවකාල අපේක්ෂිත ණය අලාභ සඳහා අත්තිකාරමක් වාර්තා කරයි. අදියර 2 ගිණුම්කරණ ප්‍රතිපත්ති - ඉතිරි කොටසගගග 134 රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ඳවාර්ෂික වාර්තාව 2019 ණයට ණය අවදානම වර්ධනය වී ඇති පහසුකම් සහ අදියර 3 සිට නැවත වර්ගීකරණය කර ඇති ණය ඇතුළත්ය.
අදියර 3	ණය හානිකරණය වී ඇති බවට සලකන ණය (අංක 16 හි සඳහන් පරිදි). බැංකුව ජීවකාල අපේක්ෂිත ණය අලාභ සඳහා අත්තිකාරමක් වාර්තා කරයි.
POCI	මිලදීගත් හෝ උත්පාදිත හානිකරණය වූ ණය (POCI) වත්කම් යනු මූලික හඳුනාගැනීම මත ණය හානිකරණය වන මූල්‍ය වත්කම්ය. POCI වත්කම් මුල් හඳුනාගැනීමේදී සාධාරණ අගයට වාර්තා කරන අතර ණය ගලපන ලද ඵලදායී පොළි අනුපාතයක් මත පදනම් වී පොළි ආදායම පසුකාලීනව හඳුනා ගනී. අපේක්ෂිත ණය අලාභවල පසුකාලීන වෙනසක් සිදුවන ප්‍රමාණයට පමණක් හඳුනාගනී නැතිනම් මුදා හරී.

හිඟව ඇති මුළු ප්‍රමාණය හෝ එයින් කොටසක් අයකර ගැනීමේ සාධාරණ අපේක්ෂාවන් බැංකුවට නොමැති මූල්‍ය වත්කම් සඳහා, මූල්‍ය වත්කමේ දළ ධාරණ අගය අඩු කරනු ලබයි. මෙය මූල්‍ය වත්කම් (අර්ධ වශයෙන්) හඳුනා නොගැනීමක් ලෙස සලකනු ලබයි.

2.4.12.10.2. අපේක්ෂිත ණය අලාභ (ECLs) ගණනය කිරීම

ඵලදායී පොළි අනුපාතයට ආසන්නවීමට වට්ටම් කරන ලද අපේක්ෂිත මුදල් හිඟය මැනීම සඳහා සම්භාවිතාව බරතබනලද ක්‍රියාදාම හතරක් මත පදනම් වී බැංකුව අපේක්ෂිත ණය අලාභ ගණනය කරයි. මුදල් හිඟයක් යනු ගිවිසුමකට අනුකූලව ආයතනයකට ගෙවියයුතු මුදල් ප්‍රවාහ සහ ආයතනය ලබාගැනීමට අපේක්ෂා කරන මුදල් ප්‍රවාහ අතර වෙනසයි. අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේ ශිල්ප පහත කෙටියෙන් දක්වන අතර එහි ප්‍රධාන අංග පහත පරිදි වේ.

PD	පැහැර හැරීමේ සම්භාවිතාව යනු දෙන ලද කාල සීමාවක් තුළ පැහැර හැරීම සිදුවියහැකි බව පිළිබඳ ඇස්තමේන්තුවකි. මූල්‍ය පහසුකම මෙයට පෙර හඳුනා ගෙන නොමැතිනම් සහ තවමත් කළඹ තුළනම්, පැහැර හැරීමක් තක්සේරු කළ කාලසීමාව තුළ විකතරා අවස්ථාවකදී පමණක් සිදුවියහැක.
EAD	පැහැර හැරීමේදී නිරාවරණය යනු බැඳුණු පහසුකම සහ මඟහැරුණු ගෙවීම්වල උපචිත පොළිය මත පහළවැටීම් අපේක්ෂිත ගිවිසුම මගින් හෝ වෙනත් ආකාරයකින් උපලේඛනගත මුල් මුදල සහ පොළිය නැවත ගෙවීම ඇතුළුව වාර්තාකරන දිනයෙන් පසු නිරාවරණ තුළ අපේක්ෂිත වෙනස්වීම් සැලකිල්ලට ගනිමින් අනාගත පැහැරහැරීමේ දිනයක නිරාවරණය පිළිබඳ තක්සේරුවකි.
LGD	අලාභ ලබන පැහැර හැරීම යනු දෙනලද යම් කාලයකදී පැහැර හැරීම සිදුවන අවස්ථාවක ඇතිවන අලාභය පිළිබඳ තක්සේරුවකි. ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ හිඟ සහ යම් ඇප මුදාහැරීම ඇතුළුව ණයකරු ලබාගැනීමට අපේක්ෂා කරන ප්‍රමාණය අතර වෙනස මත එය පදනම් වේ. එය සාමාන්‍යයෙන් පැහැර හැරීමේදී නිරාවරණයෙහි ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශ කරයි.

අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේදී, බැංකුව විසින් මූලික සිදුවීම, හොඳම සිදුවීම සහ නරකම සිදුවීම ලෙස ක්‍රියාදාම තුනක් සලකා බලයි. මේවා එකින් එක එකිනෙකට වෙනස් PDs, EADs සහ LGDs හා බැඳේ. අදාළ වන අවස්ථාවේදී, ණය අයකර ගැනීමේ හැකියාව සහ ඇපවල වටිනාකම හෝ වත්කම විකිණීමෙන් ලබාගතහැකි ප්‍රමාණය ඇතුළුව පැහැර හැරි ණය අයකර ගැනීමට අපේක්ෂා කරන ආකාරය සම්බන්ධයෙන් විවිධ ක්‍රියාදාම පිළිබඳ තක්සේරුවක් ද ඇතුළත් කරයි.

හානිකරණ අලාභ සහ මුදාහැරීම් මූල්‍ය වත්කමේ දළ ධරණ අගයේ ගැලපීමක් ලෙස ගණනය කරන වෙනස්කිරීමේ අලාභ හෝ ලාභ සඳහා ගණනය කර වෙන වෙනම අනාවරණය කෙරේ.

ගිණුම්කරණ ප්‍රතිපත්ති (ඉතිරි කොටස)...

අදියර 1	මාස 12 අපේක්ෂිත ණය අලාභ වාර්තා කරන දිනයෙන් පසු මාස 12 තුළ සිදුවියහැකි මූල්‍ය උපකරණයක් මත පැහැර හැරීමේ සිදුවීම්වලින් ඇතිවන අපේක්ෂිත ණය අලාභ නියෝජනය කරන ජීවකාල අපේක්ෂිත ණය අලාභවල කොටසක් ලෙස ගණනය කෙරේ. මාස 12 තුළ සිදුවියහැකි පැහැර හැරීමක් පිළිබඳ අපේක්ෂාව මත පදනම් වී මාස 12 අපේක්ෂිත ණය අලාභ දීමනාව බැංකුව විසින් ගණනය කරයි. මෙම අපේක්ෂිත මාස 12 පැහැර හැරීමේ සම්භාවිතාවන් පුරෝකථන EAD සඳහා යොදා ගන්නා අතර අපේක්ෂිත LGD වලින් ගුණකර මුල් ඵලදායී පොළී අනුපාතයට ආසන්න කිරීමකට වට්ටම් කරනු ලබයි. ඉහත විස්තර කළ පරිදි මෙම එක් එක් ක්‍රියාදාමය සඳහා මෙම ගණනය කිරීම සිදු කරයි.
අදියර 2	ණයමුදලක් ආරම්භයේ සිට ණය අවදානම තුළ සැලකියයුතු වැඩිවීමක් පෙන්නුම්කර ඇති අවස්ථාවක, බැංකුව ජීවකාල අපේක්ෂිත ණය අලාභ සඳහා දීමනාවක් වාර්තා කරයි. ශිල්ප ක්‍රම විවිධ ක්‍රියාදාම භාවිතය ඇතුළුව ඉහත විස්තරකල දෙයට සමාන වන නමුත් PDs සහ LGDs උපකරණයේ ජීවකාලය තුළ තක්සේරු කෙරේ. අපේක්ෂිත මුදල් හිඟය ඵලදායී පොළී අනුපාතයට ආසන්න කිරීමකට වට්ටම් කරනු ලබයි.
අදියර 3	ණය හානිකරණය වී ඇති බවට සලකන ණය සඳහා. එවැනි ණය සඳහා ජීවකාල අපේක්ෂිත ණය අලාභ බැංකුව හඳුනා ගනී. මෙම ක්‍රමය 100%ට PD සැකසුම සහිත අදියර 2 වත්කම්වලට සමානය.
POCI	POCI වත්කම් යනු මූලික හඳුනාගැනීම මත ණය හානිකරණය වන මූල්‍ය වත්කම්ය. ණය ගලපන ලද ඵලදායී පොළී අනුපාතය මගින් වට්ටම් කළ ක්‍රියාදාම හතර සම්භාවිතා බර තැබීමක් මත පදනම් වී මූලික හඳුනා ගැනීමේ සිට ජීවකාල අපේක්ෂිත ණය අලාභවල සමුච්චිත වෙනස්වීම් පමණක් බැංකුව හඳුනාගනී.

2.4.12.11. අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයට මනින ලද ණය උපකරණ

අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයට මනින ලද ණය උපකරණ සඳහා අපේක්ෂිත ණය අලාභ සාධාරණ අගයේ පවතින මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ මෙම මූල්‍ය වත්කම්වල ධාරණ අගය අඩු නොකරයි. ඒ වෙනුවට, වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබන්නේනම් ඇතිවිය හැකි දීමනාවට සමාන මුදලක් ආදායම් ප්‍රකාශනයට අනුරූප අයකිරීමක් සමඟ සමුච්චිත හානිකරණ ප්‍රමාණයක් ලෙස අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ හඳුනා ගනී. අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ හඳුනාගත් සමුච්චිත අලාභ වත්කම හඳුනා නොගැනීම මත ලාභ හෝ අලාභයට ප්‍රතිවක්‍රිය කෙරේ.

2.4.12.12. මිලදීගත් හෝ උත්පාදිත ණය හානිකරණය කළ මූල්‍ය වත්කම් (POCI)

මිලදීගත් හෝ උත්පාදිත ණය හානිකරණය කළ මූල්‍ය වත්කම් සඳහා, අලාභ දීමනාව තුළ මූලික හඳුනා ගැනීමේ සිට ජීවකාල අපේක්ෂිත ණය අලාභවල සමුච්චිත වෙනස්වීම් පමණක් බැංකුව හඳුනා ගනී.

2.4.12.13. ඉදිරිය දකින තොරතුරු

අපේක්ෂිත ණය අලාභ ආදර්ශය තුළ, පහත කරුණු වැනි ආර්ථික යෙදවුම් ලෙස ඉදිරිය දකින තොරතුරු පිළිබඳ පුළුල් පරාසයක් මත බැංකුව විශ්වාසය තබයි:

- දළ දේශීය නිෂ්පාදිත වර්ධනය
- උද්ධමන අනුපාතය
- පොළී අනුපාත
- විනිමය අනුපාතය
- විරැකියා අනුපාත

අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම සඳහා භාවිතා කරන යෙදවුම් සහ ආදර්ශ මූල්‍ය ප්‍රකාශනවල දිනයට වෙළෙඳපොළේ සියලුම ගතිලක්ෂණ සෑමවිටම ග්‍රහනය කර නොගනී. මෙය පිළිබිඹු කිරීම සඳහා, එවැනි වෙනස්වීම් සැලකියයුතු ලෙස වැදගත් වන අවස්ථාවේ ගුණාත්මක ගැලපීම් හෝ ආවරණ තාවකාලික ගැලපීම් ලෙස අවස්ථානුකූලව සිදු කෙරේ. එමනිසා, බැංකුව පහත සඳහන් ගුණාත්මක සාධක සැකිලල්ට ගනී.

- සාමාන්‍ය LTV
- රජයේ ප්‍රතිපත්ති
- ක්ෂේත්‍රයේ ව්‍යාපාරයේ තත්ත්වය
- නියාමන බලපෑම

2.4.12.14. ඇප තක්සේරු කිරීම

මූල්‍ය වත්කම් මත ණය අවදානම් අවම කිරීම සඳහා, හැකි සෑම අවස්ථාවකදීම බැංකුව ඇප භාවිතා කිරීමට උත්සාහ දරයි. ඇප මුදල්, සුරැකුම්, ණයවර ලිපි/ඇප, නිශ්චල දේපල, ලැබීම්, භාණ්ඩ තොග, අනෙකුත් මූල්‍ය නොවන වත්කම් සහ ජාලකරණ ගිවිසුම් වැනි ණය වර්ධනයන් වැනි විවිධ ආකාරයේ ස්වරූපයක් ගනී. SLFRS 9 යටතේ බැංකුව එහි ණයදීමේ වැඩපිළිවෙල තුළින් පවරාගන්නා ඇප සඳහා බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය වන්නේ LKAS 39 යටතේ බැංකුව තුල පැවති ප්‍රතිපත්තියයි.

2.4.12.15. නැවත අත්කරගත් ඇප

SLFRS 9 යටතේ බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය LKAS 39 යටතේ බැංකුව තුල පැවති ප්‍රතිපත්තියට සමාන වේ. බැංකුවේ ප්‍රතිපත්තිය වන්නේ නැවත අත්කරගත් වත්කමක් එහි අභ්‍යන්තර මෙහෙයුම් සඳහා වඩා හොඳින් භාවිතා කළ හැකිය යන්න හෝ විකිණිය යුතුය යන්න තීරණය

ගිණුම්කරණ ප්‍රතිපත්ති (ඉතිරි කොටස)...

කිරීමයි. එහි අභ්‍යන්තර මෙහෙයුම් සඳහා ප්‍රයෝජනවත්යයි තීරණය කළ වත්කම් ඒවා නැවත අත්කරගත් වටිනාකම හෝ මුල් සුරැකුම් වත්කමේ ධාරණ අගය යන දෙකින් අඩු අගයට ඒවාට අදාළ වත්කම් වර්ගීකරණයට මාරු කෙරේ. විකිණීම වඩාත් හොඳ විකල්පයක් වන බවට තීරණය කරනු ලබන වත්කම් ඒවායේ සාධාරණ අගයට (මූල්‍ය වත්කම්නම්) සහ බැංකුවේ ප්‍රතිපත්තියට සමගාමීව නැවත අත්කර ගත් දිනයට මූල්‍ය නොවන වත්කම් සඳහා විකිණීමේ පිරිවැය අඩුකළ සාධාරණ අගයට අලෙවිය සඳහා තබා ඇති වත්කම්වලට මාරු කරනු ලබයි.

බැංකුවේ සාමාන්‍ය ව්‍යාපාර රටාවට අනුව, බැංකුව විහි පාරිභෝගික කළඹ තුළ දේපළ හෝ අනෙකුත් වත්කම් භෞතිකව නැවත අත්කර නොගන්නා නමුත් පොදුවේ වෙන්දේසියකදී හිඟ ණය නිරවුල් කිරීමට අරමුදල් අයකර ගැනීමට බාහිර නියෝජිතයින් සේවයේ යොදවනු ලබයි. යම් අතිරික්ත අරමුදල් ගනුදෙනුකරුවන්ට/ වගකිවයුත්තන්ට ආපසු ගෙවනු ලැබේ. මෙම ව්‍යවහාරයේ ප්‍රතිඵලයක් ලෙස, නෛතිකව නැවත අත්කරගැනීමේ ක්‍රියාවලීන් යටතේ නේවාසික දේපළ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වාර්තා නොකෙරේ.

2.4.12.16. ලියාහැරීම්

SLFRS 9 යටතේ බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය LKAS 39 යටතේ බැංකුව තුළ පැවති ප්‍රතිපත්තියට සමාන වේ. බැංකුව අයකරගැනීමේ කාර්යය නවතා ඇති අවස්ථාවේදී පමණක් කොටස් වශයෙන් හෝ සම්පූර්ණයෙන්ම මූල්‍ය වත්කම් ලියා හරිනු ලබයි. ලියාහරිනු ලබන මුදල සමුච්චිත අලාභ දීමනාවට වඩා ඉහළ නම්, දළ ධාරණ අගයට අනුව යොදා ගනු ලබන දීමනාවට වකතු කිරීමක් ලෙස වෙනස පළමුව සලකනු ලැබේ. යම් පසුකාලීන අයකර ගැනීම් ණය අලාභ වියදමට බැර කෙරේ.

2.4.13. වාර්තාකරන කාලසීමාවෙන් පසු සිදුවීම්

වාර්තාකරන කාලසීමාවෙන් පසු සියලුම වැදගත් සිදුවීම් සලකා බලා ඇති අතර, සුදුසු පරිදි ගැලපීම් හෝ අනාවරණ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වල සිදු කෙරේ.

2.4.14. රජය හා රජයට අදාළ ආයතන සමඟ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු

LKAS 24 හි 32 පරිච්ඡේදය යටතේ අනාවරණයෙන් නිදහස්වීම බැංකුව තෝරාගෙන නැත.

2.5. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති - මූල්‍ය උපකරණ සඳහා ආදායම් හා වියදම් හඳුනාගැනීම්

2.5.1. පොලි ආදායම

පොළී ආදායම් විස්තර සටහනක් අංක 3 හි දක්වා ඇත.

2.5.2. පොළිය සහ සමාන ආදායම

බැංකුව ණය හානිකරණ වත්කම් හැර මූල්‍ය වත්කම්වල දළ ධාරණ අගයට ඵලදායී පොළී අනුපාත (EIR) ක්‍රමය භාවිතා කරමින් පොළී ආදායම ගණනය කරනු ලබයි. මූල්‍ය වත්කමක් ණය හානිකරණ බවට පත්වන සහ එමනිසාම අදියර 3 ලෙස සලකන අවස්ථාවක, මූල්‍ය වත්කමේ ශුද්ධ ක්‍රමක්ෂය පිරිවැයට ඵලදායී පොළී අනුපාත (EIR) ක්‍රමය යොදා ගනිමින් බැංකුව පොළී ආදායම ගණනය කරනු ලබයි.

ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී අනිවාර්යයෙන් මැනීමට අවශ්‍ය සියලුම වෙළෙඳ වත්කම් සහ මූල්‍ය වත්කම් මත පොළී ආදායම පිළිවෙලින් ශුද්ධ වෙළෙඳ ආදායම සහ ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභ / (අලාභ) තුළ ගිවිසුම්ගත පොළිය භාවිතයෙන් හඳුනා ගනී.

2.5.3. ගාස්තු සහ කොමිස් ආදායම

කොමිස් ආදායම හා වියදම පිළිබඳ විස්තර සටහන් අංක 5 හි දක්වා ඇත.

2.6. 2020.01.01. දින සිට බලපැවැත්වෙන පරිදි LKAS 1 සහ LKAS 8 සඳහා සංශෝධන

2020 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන දැනට ක්‍රියාත්මක වන පහත සඳහන් ගිණුම්කරණ ප්‍රමිතීන්ට සිදුකරන සංශෝධන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සඳහා ප්‍රමාණාත්මක බලපෑමක් සිදුකර නොතිබිණි.

නිර්වචනයේ කිසියම් පැහැදිලි කිරීමක් හා ප්‍රමිතිය හරහා ප්‍රමාණාත්මකභාවයේ නිර්වචනය පෙලගැස්වීමට LKAS 1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ LKAS 8 ගිණුම්කරණ ප්‍රමිති ගිණුම්කරණ ඇස්තමේන්තු හා දෝෂ වෙනස්වීම් වල ප්‍රමාණාත්මක සංශෝධනයක් සිදුකරයි. තොරතුරු ප්‍රමාණාත්මකවන අතර මග හැරීම් හෝ සැඟවීම් විශේෂිත වාර්තාකරණ ආයතනයක් පිළිබඳ මූල්‍ය තොරතුරු සපයන විම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගෙන සාමාන්‍ය අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශන පරිශීලකයින් විසින් ගනු ලබන තීරණ කෙරෙහි සාධාරණ ලෙස බලපෑම් විල්ල කිරීම නව අර්ථකථනය මගින් ප්‍රකාශවෙයි. ප්‍රමාණාත්මක වන අර්ථකථනට සිදුකරන සංශෝධන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සඳහා සැලකිය යුතු බලපෑමක් විල්ල කරන බව අපේක්ෂා නොකරයි.

2.7. නිකුත් කළ නමුත් 2020 දෙසැම්බර් 31 දිනට බලාත්මක නොවූ ප්‍රමිති

SLFRS 16 කල්බදු සඳහා සංශෝධන - කොවිඩ්-19 හා සම්බන්ධ කුලී සහන

කොවිඩ්-19 වසංගතයේ සෘජු බලපෑමේ ප්‍රතිඵලයක් ලෙස පැනනගින කුලී සහන ගණනය කිරීම සඳහා SLFRS 19 කල්බදු නවීකරණය කිරීම පිළිබඳ මගපෙන්වීම්

ගිණුම්කරණ ප්‍රතිපත්ති (ඉතිරි කොටස)...

අදාල කර ගැනීමට සංශෝධන කල්බදු ලබා ගන්නන් සඳහා සහන සපයයි. ප්‍රායෝගික ක්‍රියා මාර්ගයක් ලෙස කොවිඩ්-19 ට අදාල කුලී සහන කල්බදු නවීකරණය කරන කල්බදු ලබා දෙන්නන්ගේ තක්සේරුකර ගැනීමට කල්බදුකරුට නොහැකි වේ. කොවිඩ්-19 ට සම්බන්ධ කුලී සහනවල ප්‍රතිඵලයක් ලෙස ඇතිවන කල්බදු ගෙවීමේ කිසියම් වෙනසක් සඳහා කල්බදුකරු මෙම Election Accounts නිර්මාණය කරන අතර එලෙසම වෙනස කල්බදු නවීකරණය කිරීමක් නොවන්නේ නම් එය SLFRS 16 යටතේ වෙනස සඳහා ගණනය කරයි. සංශෝධන ප්‍රකාශනය බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සඳහා ප්‍රමාණාත්මක බලපෑමක් සිදුකරන බව අපේක්ෂා නොකරයි.

2.8. කොවිඩ්-19 නිසා සිදුවන බලපෑම

කොවිඩ්-19 වසංගත තත්ත්වය ව්‍යාපාරික හා ආර්ථික කටයුතු අඩාල කිරීමට මෙන්ම ගෝලීය හා දේශීය ආර්ථිකයේ අවිනිශ්චිතාවයක් ඇති කිරීමට හේතු වී තිබිණි. ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 වසංගතය ආරම්භවීමෙන් පසුව ව්‍යාපාරික මෙහෙයුම් සිදු කිරීමේදී බැංකුව රජය සහ ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කර තිබූ මාර්ගෝපදේශ සහ උපදෙස් දැඩි ලෙස අනුගමනය කර ඇත ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර තිබූ උපදෙස්වලට සමගාමීව බලපෑමට ලක් වූ ව්‍යාපාර හා පුද්ගලයින් සඳහා බැංකුව තවදුරටත් සහන සපයා තිබිණි. ලබාගත් ණය සඳහා ආපසු ගෙවීමේ කොන්දේසි ලිහිල් කිරීම, සුදුසු ණය නිෂ්පාදන සඳහා සහනදායී පොලී අනුපාත ලබාදීම (ණය සහන කාල සීමාවන්) වැක් වැක් ගාස්තු හා අයකිරීම් කපාහැරීම මෙම සහන කටයුතු වලට ඇතුළත් වේ.

ශ්‍රී ලංකා මහ බැංකුව හා ශ්‍රී ලංකා වරලත් කගණකාධිකාරී ආයතනය නිකුත් කර තිබූ මාර්ගෝපදේශ හා සමගාමීව වාර්තාකරන දිනට උපකල්පනයන් සිදුකිරීම හා පවතින තොරතුරු මත පදනම්ව බැංකුවේ ණය හා අත්තිකාරම් කළඹට කොවිඩ්-19 වසංගතයෙන් සිදුවූ බලපෑම මෙම මූල්‍ය ප්‍රකාශනවල තක්සේරු කර ගැලපීම් සිදුකර ඇත. කෙසේ නමුත් ණය ගැණුම්කරුවන් මෙම ණය සහනයන්ගෙන් ප්‍රයෝජන ගන්නා ආකාරය අනුව සත්‍ය පාඩුව වෙනස් වීමකට හාජනය විය හැකි වේ.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

3. දළ ආදායම

ගිණුම්කරන ප්‍රතිපත්තිය

ආදායම විශ්වාසදායී ලෙස තක්සේරු කිරීමට හැකිවීම සහ ආර්ථික ප්‍රතිලාභ බැංකුවට ගලා ඒම සිදුවිය හැකි ප්‍රමාණයට දළ ආදායම හඳුනාගනී. ආදායම හඳුනාගැනීමට ප්‍රථම විශේෂිත හඳුනාගැනීම් නිර්ණායකයන් ද සැලකිල්ලට ගතයුතු වෙයි.

	2020 රු.	2019 රු.
පොලී ආදායම	6,076,716,152	5,981,510,158
ගාස්තු සහ කොමිස් ආදායම	148,120,735	113,332,608
ශුද්ධ සාධාරණ අගය ලාභ / අලාභ from FA at FVPL	1,875,000	1,840,000
වෙනත් ශුද්ධ මෙහෙයුම් ආදායම්	33,852,096	28,318,619
දළ ආදායම	6,260,563,983	6,125,001,385

4. ශුද්ධ පොලී ආදායම

ගිණුම්කරණ ප්‍රතිපත්තිය සටහන් අංක 2.2.1 හි දක්වා ඇත.

	2020 රු.	2019 රු.
පොලී ආදායම		
බැංකු තැන්පතු (ස්ථාවර + ඉතුරුම් + ගිණුම්	886,811,595	730,365,096
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම්		
- ණය සහ අත්තිකාරම්	5,004,888,109	5,042,348,392
අඩුකළා ණය සහන කාල ලබාදුන් ණයවල වක් දින බලපෑම	(23,483,202)	-
- ණය සහ අනෙකුත් උපකරණ	208,499,650	208,796,670
මුළු පොලී ආදායම	6,076,716,152	5,981,510,158
පොලී වියදම		
බැංකුවලට ගෙවිය යුතු	9,397	27,417
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම්		
- තැන්පත්කරුවන්ට ගෙවිය යුතු	3,806,143,353	3,722,392,841
- ණය සුරැකුම් හිමිකරුවන්ට ගෙවිය යුතු	2,569,178	2,757,535
- අනෙකුත් ණය ගැනුම්කරුවන්ට ගෙවිය යුතු	151,757,839	226,165,075
මුළු පොලී වියදම	3,960,479,767	3,951,342,868
ශුද්ධ පොලී ආදායම	2,116,236,385	2,030,167,290

ශ්‍රී ලංකා රජයේ සුරැකුම් වලින් ශුද්ධ ආදායම

	2020 රු.	2019 රු.
පොලී ආදායම	73,803,782	110,239,073
(අඩුකලා):පොලී වියදම	-	-
ශුද්ධ පොලී ආදායම	73,803,782	110,239,073

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් (ඉතිරි කොටස)...

5 ගාස්තු සහ කොමිස් ආදායම ශුද්ධ

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

කාලයක් තුළ සිදුකළ සේවාවන් සමූහයකින්, කාලයක් තුළ උපචිතව පැවති සහ ගනුදෙනුකාර සේවාවන් සැපයීමෙන් බැංකුව ගාස්තු හා කොමිස් ආදායම උපයාගනී. ගාස්තු හා කොමිස් උපචිත පදනම මත හඳුනාගනී.

	2020 රු.	2019 රු.
ගාස්තු හා කොමිස් ආදායම	148,120,735	113,332,608
ගාස්තු හා කොමිස් වියදම	-	-
ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම	148,120,735	113,332,608
ඇතුලත්වේ		
බැංකු සේවා ගාස්තු - ණය හා අත්තිකාරම්	134,033,283	104,823,332
නෛතික හා තාක්ෂණ ගාස්තු - ණය හා අත්තිකාරම්	341,650	401,260
වෙනත් අයකිරීම්	8,259,464	8,108,016
ණය සහන පොලියෙන් 7% විලම්බිත පොලී ආදායම	5,486,338	-
ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම	148,120,735	113,332,608

6. ලාභ හා අලාභ මගින් සාධාරණ අගයට ඇති මූල්‍ය උපකරණයන්ගේ ශුද්ධ සාධාරණ ලාභය / (අලාභය)

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ලාභ හා අලාභ මගින් සාධාරණ අගයට ඇති මූල්‍ය උපකරණයන්ගෙන් ලද ශුද්ධ ලාභ / (අලාභ) තුළ පොලී ආදායම හැර "ලාභ හෝ අලාභ මගින් හඳුනාගත් මූල්‍ය උපකරණ" සඳහා සියලුම ලාභ හා අලාභ සහ සම්බන්ධිත ලාභාංශය අඩංගුවේ

	2020 රු.	2019 රු.
ලාභ හා අලාභ මගින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම් සඳහා ලාභ	1,875,000	1,840,000
ලාභ හා අලාභ මගින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම් සඳහා අලාභ	-	-
මුළු ගණන	1,875,000	1,840,000

7 වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ)

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ගෙවීම් ලබා ගැනීමට ඇති බැංකුවේ අයිතිය තහවුරු වූ විට, අනිකුත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට තක්සේරුකර ඇති මූල්‍ය වත්කම්වලින් උපයා ගත් ලාභාංශ හඳුනාගනී.

	2020 රු.	2019 රු.
ලාභාංශ ආදායම	28,869,500	21,771,330
විවිධ ආදායම්	4,982,596	6,547,289
වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ)	33,852,096	28,318,619

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් (ඉතිරි කොටස)...

8. ණය සහ වෙනත් අලාභ සඳහා හානිකරණ ගාස්තු / (ප්‍රතිවර්තන)

ගිණුම්කරන ප්‍රතිපත්තිය

මූල්‍ය උපකරණ සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති SLFRS-9 තක්සේරු කරන ලද සියලු මූල්‍ය උපකරණ සඳහා වන හානිකරණ ප්‍රතිපාදනවල වෙනස්වීම් බැංකුව හඳුනාගෙන ඇත. ණය අවදානමේ සැලකිය යුතු වැඩිවීම තක්සේරු කිරීම හා හානිකරණ ගාස්තු තීරණය කරන විට වටිනාකම්, ඇස්තමේන්තු කිරීම හා අනාගත මුදල් ප්‍රවාහයන්ගේ සහ ඇපසුරුකුම්වල කාල නිර්ණය කිරීම සඳහා විශේෂයෙන්ම SLFRS-9 යටතේ ඇති සියලු ප්‍රභේද වල මූල්‍ය වත්කම්වල හානිකරණ පාඩු තක්සේරු කිරීමේ දී විනිශ්චයන් අවශ්‍ය වේ. අදාලකරගත් විනිශ්චයන් මූල්‍ය ප්‍රකාශනයේ සටහන් අංක 16 හි විස්තරකර ඇත.

	2020 රු.	2019 රු.
ක්‍රමක්ෂය පිරිවැයට ඇති මූල්‍ය වත්කම් - ණය හා අත්තිකාරම්		
අදියර 1	94,476,212	13,770,764
අදියර 2	24,501,626	7,740,486
අදියර 3	148,491,725	109,437,584
ක්‍රමක්ෂය පිරිවැයට ඇති අනෙකුත් මූල්‍ය වත්කම්		
අදියර 1	(10,580)	135,598
අදියර 2	2,861,812	443,876
අදියර 3	-	-
එකතුව	270,320,795	131,528,308

9 පුද්ගල වියදම්

ගිණුම්කරන ප්‍රතිපත්තිය

නිශ්චිත දායකත්ව සැලසුම්

බැංකුව පහත සඳහන් නිශ්චිත දායකත්ව සැලසුම ක්‍රියාත්මක කරයි. ලබාදුන් දායකත්වය "පුද්ගල වියදම්" යටතේ වියදමක් ලෙස වාර්තා කර තිබිණි. නොගෙවූ දායකත්වයන් වගකීමක් ලෙස වාර්තා කරයි.

සේවක අර්ථසාධක අරමුදල

2.4.1 හිගිණුම්කරණ ප්‍රතිපත්තිය විස්තර කර ඇත.

සේවක භාරකාර අරමුදල

2.4.1 හිගිණුම්කරණ ප්‍රතිපත්තිය විස්තර කර ඇත.

	2020 රු.	2019 රු.
වැටුප් හා ප්‍රසාද දීමනා	591,969,198	588,537,495
නිශ්චිත දායකත්ව/ ප්‍රතිලාභ සැලසුම්වලට දායකත්වය	85,629,411	85,179,105
නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් සඳහා වෙන් කිරීම	62,938,918	61,609,947
වෙනත්	132,199,278	146,811,495
එකතුව	872,736,805	882,138,042

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් (ඉතිරි කොටස)...

9.1 (විශ්‍රාමික) කාර්ය මණ්ඩලය වෛද්‍යාධාර යෝජනා ක්‍රමය - දායකත්වය

	2020 රු.	2019 රු.
වියදම් ලෙස හඳුනාගත් ප්‍රමාණය	25,846,298	26,525,646

විශ්‍රාමික කාර්ය මණ්ඩල වෛද්‍යාධාර යෝජනා ක්‍රමය බැංකුවේ සියලුම සේවකයින් සඳහා පිහිටුවා ඇත. 2020 දෙසැම්බර් 31 දින වෘත්තීය ආයුගණක සමාගමක් වන Actuarial & Management Consultants (Pvt) Ltd. හි එම්. පූපාලනාදන් මහතා විසින් ආයුගණක තක්සේරුව සිදුකර ඇත. (සටහන් අංක 24 බලන්න.)

9.2 දායකත්වය - පාරිතෝෂික

	2020 රු.	2019 රු.
වියදම් ලෙස හඳුනාගත් ප්‍රමාණය	37,092,620	35,084,300

2020 දෙසැම්බර් 31 දින වෘත්තීය ආයුගණක සමාගමක් වන Actuarial & Management Consultants (Pvt) Ltd. හි එම්. පූපාලනාදන් මහතා විසින් ආයුගණක තක්සේරුව සිදුකර ඇත. (සටහන් අංක 24 බලන්න.)

10. වෙනත් වියදම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

නිශ්චිත ආදායම් අයිතම ඉපයීම සහ දැරූ පිරිවැය අතර සෘජු සම්බන්ධතාවයේ පදනම මත ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ වෙනත් මෙහෙයුම් ආදායම් හඳුනාගනී. වර්ෂයේ ලාභයට ලගාවීමේ දී හා ව්‍යාපාරය කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යෑමේ දී දැරූ සියලුම වියදම් සහ දේපළ පිරියත උපකරණ නඩත්තු කිරීමේදී අයකර ගෙන ඇත. පසුගිය සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස බැංකුව වර්තමාන බැඳීමක් (නෛතික හෝ ව්‍යුහාත්මක) ඇතිවිට අනිකුත් වියදම් වලට අදාල ප්‍රතිපාදන හඳුනාගනී. බැඳීම නිරවුල් කිරීම සඳහා වත්කමින් විය හැකි පිටතට ගලා යෑම් හා සම්බන්ධ ආර්ථික ප්‍රතිලාභ අවශ්‍යවන අතර බැඳීමේ වටිනාකමට විශ්වාසදායක ඇස්තමේන්තු පිළියෙල කල හැකිවේ. දේපළ පිරියත උපකරණ හා අස්පෘශ්‍ය වත්කම් ක්ෂයවීමේ හා ක්‍රමක්ෂය වියදම් අනෙකුත් වියදම් වෙන් කොට ආදායම් ප්‍රකාශයේ මුහුණත දක්වා ඇත.

	2020 රු.	2019 රු.
අධ්‍යක්ෂවරුන්ගේ සංවේතන	2,966,933	2,601,651
විගණකවරුන්ගේ පාරිශ්‍රමික	4,165,250	5,273,734
වෘත්තිය හා නෛතික වියදම්	747,567	1,359,613
කාර්යාල පරිපාලන හා පරිශ්‍ර වියදම්	145,295,101	148,221,814
ප්‍රචාරන සහ ප්‍රවර්ධන වියදම්	3,052,395	7,785,485
රථ වාහන නඩත්තු හා ගමන් වියදම්	12,426,551	7,779,123
සාමාන්‍ය වියදම්	10,650,386	15,918,509
දිස්ත්‍රික් නියෝජිත කොමිස්	-	8,750
වෙනත් අලාභ, බොල් ණය හා ලියා හැරීම්	28,838,238	3,686,529
ශ්‍රී ලංකා මහ බැංකු තැන්පතු රක්ෂණය	38,693,214	32,544,377
වෙනත් වියදම්	67,338,139	61,605,715
ක්ෂයවීම / දේපල පිරියත උපකරණ ක්‍රමක්ෂය	17,589,271	25,988,195
එකතුව	331,763,045	312,773,495

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් (ඉතිරි කොටස)...

වියදම් විස්තර

	2020 රු.	2019 රු.
ප්‍රචාරණ වියදම්	1,354,690	3,219,339
ප්‍රවර්ධන වියදම්	1,697,705	4,566,146
	3,052,395	7,785,485

වෙනත් වියදම් - වෙනත් වර්ග

	2020 රු.	2019 රු.
පරිගණක නඩත්තුව	15,577,392	7,303,332
බැංකු කොමිස්	1,717,911	1,581,565
ප්‍රවෘත්ති පත්‍ර හා වාර ප්‍රකාශන	447,125	556,070
ණය සම්බන්ධ වියදම්	2,657,402	3,751,716
ණය තොරතුරු කාර්යාංශ ගාස්තු	5,042,625	3,931,086
මාර්ගස්ථ මුද්‍රල් රක්ෂණය	27,053	-
ඉන්ධන	2,391,801	2,072,910
රක්ෂණය - මෝටර් රථ වාහන	396,022	524,076
ආයතන සමඟ දායකත්වය	7,953,061	7,763,363
උපදේශන ගාස්තු	3,511,258	3,409,672
ACL වියදම්	1,184,000	1,970,500
වගා රක්ෂණ බදු	4,667,873	2,330,441
තක්සේරුකරුවන්ට ගෙවූ ගමන් ගාස්තු	3,936,666	4,474,625
ආයතනික සමාජ වගකීම	140,000	91,750
නැවත සකස්කල ණය මත ප්‍රාග්ධනික පොලිය	117,960	-
පරිත්‍යාග	-	100,000
වත්කම් ඉවත්කිරීමේ අලාභ	-	86,122
ප්‍රාග්ධන ලියා හැරීම් (උකස් ණය)	11,437,562	11,901,834
ප්‍රාග්ධන ලියා හැරීම් (අර්ථසාධක ණය)	1,438,550	1,343,037
NSB ගාස්තු වියදම් ගිණුම	4,693,878	1,955,782
නොසැසඳූ බැඳීම් පාලන ලියා හැරීම්	-	6,457,833
එකතුව	67,338,139	61,605,715

11. බදු වියදම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ප්‍රවර්තන බදු වියදම් - බදු අනුපාතය 28%

පසුගිය වසර මෙන්ම මෙම වසර වෙනුවෙන් දේශීය ආදායම් බදු කොමසාරිස් ජනරාල් වෙත ගෙවූ හෝ අයකර ගැනීමට අපේක්ෂිත වටිනාකම් ප්‍රවර්ථන බදු වත්කම් හා වගකීම්වල අඩංගුවේ. වටිනාකම් ගණනය කිරීම සඳහා භාවිතා කළ බදු අනුපාත හා බදු නීති වාර්තාකරණ දිනයට බලාත්මක කර තිබූ හෝ බලාත්මක කල ඒවා වෙයි. ඒ අනුව බදු සඳහා ප්‍රතිපාදන, බදු සඳහා ගළපන ලද වර්ෂය සඳහා වන ගිණුම්කරණ ලාභය මත පදනම්ව 2017 අංක 24 දරණ දේශීය ආදායම් බදු පනත හා එහි සංශෝධනයන්ගේ නියමයන් අනුව සටහන් අංක 2.3 දක්වා ඇති අනුපාතයට ගණනයකර ඇත.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් (ඉතිරි කොටස)...

විලම්බිත බදුකරණය-බදු අනුපාතය 28%

වාර්තාකරන දිනට වත්කම් හා වගකීම්වල ඉදිරියට ගෙනඑන ලද අගය හා ඒවා අතර ඇති බදු පදනමේ, වාර්තාකරන දිනට ඇති තාවකාලික වෙනස මත වූ වගකීම් ක්‍රමය අනුගමනය කරමින් විලම්බිත බදු සපයා ඇත. ප්‍රයෝජනයට ගතහැකි බදු අයකල හැකි ලාභ පැවැතීමේ ප්‍රමාණයට විලම්බිත බදු වත්කම්, සියලුම අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් භාවිතා නොකළ ඉදිරියට ගෙන ආ බදු බැර ශේෂ සහ භාවිතා නොකල බදු අලාභ සඳහා හඳුනාගනී.

විලම්බිත බදු වත්කමේ කොටසක් හෝ සම්පූර්ණයෙන්ම භාවිතාවට ගැනීමට ඉඩදීමට ප්‍රමාණවත් බදු ගෙවිය හැකි ලාභයක් තවදුරටත් නොපැවතීමේ ප්‍රමාණයට අඩුකර විලම්බිත බදු වත්කමේ ඉදිරියට ගෙන ආ වටිනාකම සෑම වර්තාකරන දිනකදීම සමාලෝචනයට ලක් කරයි. ඉදිරියේදී තිබිය හැකි බදු අය කළ හැකි ලාභයක් මගින් විලම්බිත බදු වත්කම අයකර ගැනීමට ඉඩ ලබා දීමේ ප්‍රමාණයට හඳුනාගන්නා අතර හඳුනානොගත් විලම්බහිත බදු වත්කම් සෑම වර්තාකරන දිනකදීම තක්සේරු කරයි.

වාර්තාකරන දිනට පසුව පැනවූ හෝ දැනට පනවා ඇති බදු අනුපාත හා බදු නීති මත පදනම්වී වත්කම් උපලබ්ධිවීම හෝ වගකීම් නිරාකරණය කරන විට විලම්බිත බදු වත්කම් හා වගකීම් වර්ෂය තුළදී උපයෝගී කර ගැනීමට අපේක්ෂා කරන බදු අනුපාත උපයෝගී කරගෙන විලම්හිත බදු වත්කම් හා වගකීම් ගණනය කරයි.

ප්‍රවර්ථන බදු වියදම්

	2020 රු.	2019 රු.
ප්‍රවර්ථන වර්ෂය	222,371,439	199,540,377
විලම්හිත බදු වියදම් (බැර)	(6,134,677)	(118,960,119)
එකතුව	216,236,762	80,580,258
බලපවත්නා බදු අනුපාතය	37.80%	16.13%

11.1 බදු වියදම් සැසඳීම

බද්දට පෙර ලාභය / (පාඩුව)	790,276,542	815,905,716
ඉකුත් කාලයේ ප්‍රවර්තන ආදායම් බදු ගැලපීම්		
එකතු කළා: බදු සඳහා අඩු කළ නොහැකි වියදම් / ආදායම්		
අඩුකිරීම් වල බදු බලපෑම	425,175,722	282,061,551
අඩු කළා: බදු සඳහා අඩුකළ හැකි වියදම් වල බදු බලපෑම	(391,420,762)	(393,232,495)
ලාභාංශ	(30,744,500)	(23,611,330)
වර්ෂය සඳහා ගලපන ලද ලාභය	793,287,002	681,123,442
වර්ෂය සඳහා ලාභය මත පදනම් වූ බදු	222,120,361	190,714,563
විලම්හිත බදුකරණයට / බදුකරනයෙන් මාරු කිරීම්	(6,134,677)	(118,960,119)
පසුගිය වර්ෂයේ (අධි) ඌන වෙන්කිරීම්	251,078	8,825,814
කාල පරිච්ඡේදයේ සඳහා බදු වියදම්	216,236,762	80,580,258

11.2 ආදායම් ප්‍රකාශයේ හා වෙනත් විස්තීර්ණ ආදායම්වල ඇති විලම්බිත බදු (බැර) අයකිරීම්වල පහත සඳහන් වෙනස්කම් ඇතුලත් වෙයි.

විලම්හිත බදු

	2020 රු.	2019 රු.
දේපළ පිරියත හා උපකරණ	(5,779,740)	(6,529,482)
සේවක ප්‍රතිලාභ බැඳීම්	125,792,359	109,281,685
හානිකරණ වෙන් කිරීම්	109,185,597	120,158,724
භාවිතය සඳහා අයිතිය ඇති වත්කම්	(1,062,471)	(1,262,252)
ණය සහන වික් දින බලපෑම	6,575,296	-
එකතුව	234,711,041	221,648,675

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් (ඉතිරි කොටස)...

12. අගය කිරීමේ පදනම් මත මූල්‍ය උපකරණ විශ්ලේෂණය - බැංකුව ප්‍රවර්තන - වර්ෂය (2020)

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති SLFRS 9 මගින් නිර්වචනයකර ඇති වර්ගය අනුව මූල්‍ය උපකරණයේ ඉදිරියට ගෙන ආ වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ශීර්ෂය යටතේ පහත සඳහන් පරිදි සාරාංශකර ඇත.

	ක්‍රමක්ෂය පිරිවැයට	ලාභ/ අලාභ තුලින් සාධාරණ අගයට	වෙනත් විස්තීරණ ආදායම් තුලින් සාධාරණ අගයට	රු. එකතුව
වත්කම්				
මුදල් හා මුදල් සමාන දෑ	195,817,542	-	-	195,817,542
බැංකු තැන්පතු	11,811,735,024	-	-	11,811,735,024
ණය සහ අත්තිකාරම්	36,856,886,670	-	-	36,856,886,670
ප්‍රති මිලදී ගැනීම් Reverse Repos	1,434,214,178	-	-	1,434,214,178
භාණ්ඩාගාර බිල්පත්	815,010,484	-	-	815,010,484
භාණ්ඩාගාර බැඳුම්කර	165,589,926	-	-	165,589,926
වීකක භාර	-	21,350,000	-	21,350,000
ලැයිස්තුගත නොකල කොටස්	-	-	5,379,078	5,379,078
මුළු මූල්‍ය වත්කම්	51,279,253,824	21,350,000	5,379,078	51,305,982,902
වගකීම්				
බැංකුවලට ගෙවිය යුතු	67,348,787	-	-	67,348,787
මූල්‍ය වගකීම්				
- තැම්පත්කරුවන්ට ගෙවිය යුතු	45,388,490,392	-	-	45,388,490,392
- ණය සුරැකුම් හිමිකරුවන්ට ගෙවිය යුතු	-	-	-	-
- වෙනත් ණය කරුවන්ට ගෙවිය යුතු	348,093,800	-	-	348,093,800
මුළු මූල්‍ය වගකීම්	45,803,932,979	-	-	45,803,932,979

AC - ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද මූල්‍ය වත්කම්/ වගකීම්

FVPL - ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේ දී මනින ලද මූල්‍ය වත්කම්/ වගකීම්

FVOCI - අනෙකුත් විස්තරාත්මක ආදායමේදී සාධාරණ අගයට මනින ලද මූල්‍ය වත්කම්/ වගකීම්

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් (ඉතිරි කොටස)...

බැංකුව - ඉකුත් වර්ෂය (2019)

	ක්‍රමක්ෂය පිරිවැයට	ලාභ/ අලාභ තුලින් සාධාරණ අගයට	වෙනත් විස්තීරණ ආදායම් තුලින් සාධාරණ අගයට	රු. එකතුව
වත්කම්				
මුදල් හා මුදල් සමාන දෑ	121,239,625	-	-	121,239,625
බැංකු තැම්පතු	7,088,742,435	-	-	7,088,742,435
ණය හා අත්තිකාරම්	35,560,992,158	-	-	35,560,992,158
ණය උපකරණ	65,983,517	-	-	65,983,517
ප්‍රතිමිලදී ගැනීම්	1,385,517,561	-	-	1,385,517,561
භාණ්ඩාගාර බිල්පත්	994,878,307	-	-	994,878,307
භාණ්ඩාගාර බැඳුම්කර	168,803,531	-	-	168,803,531
වීකක භාර	-	19,475,000	-	19,475,000
ලැයිස්තුගත නොකළ කොටස්	-	-	5,379,078	5,379,078
මුළු මූල්‍ය වත්කම්	45,386,157,134	19,475,000	5,379,078	45,411,011,212
වගකීම්				
බැංකුවලට ගෙවිය යුතු	12,412,879	-	-	12,412,879
මූල්‍ය වගකීම්				
- ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	38,872,216,979	-	-	38,872,216,979
- ණය සුරැකුම් හිමිකරුවන්ට ගෙවිය යුත	110,180,822	-	-	110,180,822
- වෙනත් ණය ගැනුම්කරුවන්ට ගෙවිය යුත	1,501,680,631	-	-	1,501,680,631
මුළු මූල්‍ය වගකීම්	40,496,491,311	-	-	40,496,491,311

13. මුදල් සහ මුදල් සමාන දෑ

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

වටිනාකමෙහි නොසැලකියයුතු වෙනස්වීමේ අවදානමට යටත්වන අතැති මුදල්, බැංකුවල ඇති ශේෂ, ඉල්ලූවිට හා කෙටි දැනුම් දීමකින් ලබාගතහැකි මුදල්වල, මුදල් හා මුදල් සමාන දෑ අඩංගුවේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හානිකරණ ගාස්තු අඩුකර මුදල් හා මුදල් සමාන දෑ ක්‍රමක්ෂය පිරිවැයට ඉදිරියට ගෙනැවිත් ඇත. මූල්‍ය උපකරණ සඳහා වන SLFRS 9 අනුව බැංකුවල ඇති ශේෂ, ඉල්ලූවිට හා කෙටි දැනුම් දීමකින් ලබාගත හැකි මුදල් හානිකරණයට යටත් වේ.

	2020 රු.	2019 රු.
අතැති මුදල්	83,476,991	51,038,006
බැංකුවල ඇති ශේෂ	112,340,551	70,201,619
එකතුව	195,817,542	121,239,625

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් (ඉතිරි කොටස)...

14. බැංකුවල ඇති තැම්පතු

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

සාධාරණ අගයේ වැදගත් නොවන මට්ටමේ වෙන්ස්වීමේ අවදානමකට යටත්වන බැංකුවල ඇති තැම්පතු සඳහා, තැම්පත්කර ඇති කෙටිකාලීන තැම්පතු අඩංගුවන අතර කෙටිකාලීන බැඳීම් කලමණාකරනය කිරීම සඳහා බැංකුව ඒවා යොදා ගනු ලබයි. සුදුසු පරිදි හානිකරණය අඩුකර ඒවා මූල්‍ය ප්‍රකාශනයන්හි මුහුණත අගයට හෝ දළ වටිනාකමට වාර්තා කරනු ලබයි. විශේෂ බැංකුවක බාහිර ශ්‍රේණිගත කිරීම මත පදනම්ව මූල්‍ය උපකරණවලට අදාළව SLFRS 9 අනුව හානිකරණ වෙන්කිරීම් බැංකුව ගණනයකර ඇත.

	2020 රු.	2019 රු.
ස්ථාවර තැන්පත්		
ජාතික සංවර්ධන බැංකුව	5,281,921,250	5,472,505,060
ජාතික කිරීමේ බැංකුව	748,722,752	481,358,048
මහජන බැංකුව	1,372,313,231	-
සණස සංවර්ධන බැංකුව	1,710,081,403	541,651,018
ලංකා බැංකුව	1,385,999,614	595,226,980
ඉතුරුම් ගිණුම් - ආයෝජන		
සණස සංවර්ධන බැංකුව	207,125,177	-
ජාතික සංවර්ධන බැංකුව	1,110,421,500	-
දළ එකතුව	11,816,584,927	7,090,741,106

14.1 වර්ෂයතුළ හානිකරණයේ සංචලනය

	2020 Rs.	2019 Rs.
අධියර 1		
2020.01.01 දිනට ආරම්භක ශේෂය	468,813	333,215
ආදායම් ප්‍රකාශනයට අයකිරීම් / (ආපසු ලිවීම්)	(10,580)	135,598
වර්ෂයතුල ලියාහැරීම්	-	-
අනෙකුත් වෙනස්වීම්	-	-
2020.12.31 දිනට අවසාන ශේෂය	458,233	468,813
අධියර 2		
2020.01.01 දිනට ආරම්භක ශේෂය	1,529,858	1,085,983
ආදායම් ප්‍රකාශනයට අයකිරීම් / (ආපසු ලිවීම්)	2,861,812	443,876
වර්ෂයතුල ලියාහැරීම්	-	-
අනෙකුත් වෙනස්වීම්	-	-
2020.12.31 දිනට අවසාන ශේෂය	4,391,670	1,529,859
අධියර 3		
2020.01.01 දිනට ආරම්භක ශේෂය	-	-
ආදායම් ප්‍රකාශනයට අයකිරීම් / (ආපසු ලිවීම්)	-	-
වර්ෂයතුල ලියාහැරීම්	-	-
අනෙකුත් වෙනස්වීම්	-	-
2020.12.31 දිනට අවසාන ශේෂය	-	-
බැංකුවල ඇති තැම්පතු - ශුද්ධ C.	11,811,735,024	7,088,742,434

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් (ඉතිරි කොටස)...

15. ලාභ හෝ අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වත්කම්

	2020 රු.	2019 රු.
ඒකක භාර (NDB)	21,350,000	19,475,000
එකතුව	21,350,000	19,475,000

15.1 විශ්ලේෂණය

	2020 රු.	2019 රු.
ඇප අනුව වර්ග කිරීම		
සුරැකුම් ලෙස තබා ඇති ඇප	-	-
බැඳීම් රහිත දේපළ	21,350,000	19,475,000
දළ එකතුව	21,350,000	19,475,000

16 ක්‍රමක්ෂය පිරිවැය ඇති මූල්‍ය වත්කම් - ණය හා අත්තිකාරම්

ගිණුම්කරන ප්‍රතිපත්තිය

ක්‍රියාකාරී වෙළඳපළේ ලැයිස්තුගතකර නොමැති ස්ථිර හෝ තීරණය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වල ණය හා අත්තිකාරම් අඩංගු වේ. පහත සඳහන් අවස්ථාවන්ට ගැළපේනම් ණය හා අත්තිකාරම් සහ ණය හා අනෙකුත් උපකරණ වැනි මූල්‍ය වත්කම් බැංකුව ක්‍රමක්ෂය පිරිවැයට අගය කරයි:

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් ලබා ගැනීමේ අරමුණින් මූල්‍ය උපකරණ ව්‍යාපාර ආකෘතිය තුළ රඳවා ගැනීම සිදුකරනු ලබයි.
- මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත කොන්දේසි මුදල් ප්‍රවාහය සඳහා විශේෂිත දිනවල ඉහළ යෑමක් සිදුවන අතර ඒවා ගෙවීමට ඇති මූලික වටිනාකමේ මුල් මුදල හා පොලියේ එකම ගෙවීමවේ.

ණය හා අත්තිකාරම්වල බැංකුවලින් හා අනෙකුත් ගනුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු වටිනාකම් අඩංගු වේ. මූලික අගය කිරීමෙන් පසුව ණය හා අත්තිකාරම් පසුව හානිකරණ දීමනාව අඩුකර සඵල පොලී අනුපාතය උපයෝගීකර ගනිමින් ක්‍රමක්ෂය පිරිවැයට ඇගයීම සිදුකරයි. සඵල පොලී අනුපාතයේ අත්‍යවශ්‍ය කොටසක් වන ගාස්තු හා පිරිවැය සහ අත්පත්කර ගැනීමේ දී තිබූ කිසියම් වට්ටමක් හෝ වාරිකයක් සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබයි. ආදායම් ප්‍රකාශනයේ පොලී ආදායමෙහි "ක්‍රමක්ෂය පිරිවැය" අඩංගුවේ. ආදායම් ප්‍රකාශනයේ "ණය හා අනෙකුත් අලාභ සඳහා හානිකරණ ගාස්තුවල" හානිකරණයෙන් පැන නගින අලාභ හඳුනාගනු ලබයි.

	2020 රු.	2019 රු.
දළ ණය හා අත්තිකාරම්	37,983,822,580	36,396,975,304
අධියර 1	26,750,299,799	25,793,379,361
අධියර 2	2,087,873,904	1,915,952,809
අධියර 3	9,145,648,877	8,687,643,134
(අඩු කළා): සමුච්චිත හානිකරණය	1,103,452,708	835,983,146
අධියර 1	247,904,755	153,428,543
අධියර 2	89,207,499	64,705,873
අධියර 3 යටතේ	766,340,454	617,848,730
ණය හා අත්තිකාරම් ශුද්ධ	36,880,369,872	35,560,992,158
අඩු කළා: ණය සහන සහිත ණයවල විකිදින බලපෑම	23,483,202	-
ණය හා අත්තිකාරම් ධාරණ අගය	36,856,886,670	35,560,992,158

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් (ඉතිරි කොටස)...

16.1 විශ්ලේෂණය

	2020 රු.	2019 රු.
නිෂ්පාදන අනුව		
උකස්	9,942,813,267	9,460,622,900
අර්ථසාධක	7,685,291,335	8,282,816,696
රථවාහන	485,400	5,799,377
කාර්ය මණ්ඩල ණය	1,367,929,889	1,234,564,642
පුද්ගල ණය	18,232,060,924	16,648,653,558
වෙනත්	1,136,699,561	1,096,396,335
අඩුකළා-		
එක්දින වෙනස සඳහා දීමනාව - කාර්ය මණ්ඩල ණය	(381,457,796)	(331,878,204)
දළ එකතුව	37,983,822,580	36,396,975,304
ඇප සුරැකුම් අනුව		
සුරැකුම් ලෙස රඳවාගත් ඇප	18,727,951,333	18,798,261,460
වෙනත් ණයවර	19,255,871,247	17,930,592,044
දළ එකතුව	37,983,822,580	36,396,975,304

16.2 වර්ෂය තුළ හානිකරණයේ සංචලනය

අරමුණුගත සාක්ෂි පවතින විට හානිකරණ අලාභයක් දැරීමට සිදු වූ විටදී වත්කමේ ධාරණ අගය හා ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් අතර වෙනස මත පදනම්ව අලාභයේ ප්‍රමාණය ගණනය කරන අතර වත්කමේ ධාරණ අගය අඩුකර වෙන්කිරීම් හිණුමකට අයකරමින් අලාභයේ ප්‍රමාණය ආදායම් ප්‍රකාශයේ දී හඳුනාගනී.

බැංකුවට වෙන් වෙන් වශයෙන් වැදගත්වන මූල්‍ය වත්කම් සඳහා බැංකුව අපේක්ෂිත ණය අලාභ (ECLs) වෙන් වෙන් වශයෙන් තක්සේරු කරයි. වත්කම හානිකරණයට භාජනයවී තිබේ නම් අලාභයේ ප්‍රමාණය ආරම්භක ඵලදායී පොලී අනුපාතයට මූල්‍ය වත්කමේ අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහය වට්ටම් කිරීමෙන් ගණනය කරයි.

සාමූහික හානිකරණ තක්සේරුව

වෙන් වෙන් වශයෙන් තක්සේරුකල මූල්‍ය වත්කම් සඳහා හානිකරණයවීමට අරමුණුගත සාක්ෂි නොපවතින බව බැංකුව තීරණය කරන්නේ නම් වත්කමේ නිෂ්පාදන ලක්ෂණ, සමජාතීය බව මත පදනම්ව සහ සමාන ණය අවදානම් ලක්ෂණ ඇති මූල්‍ය වත්කම් සාමූහික ලෙස හානිකරණය සඳහා තක්සේරු කරයි.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් (ඉතිරි කොටස)...

	2020 රු.	2019 රු.
අධියර 1		
2020.01.01 දිනට ආරම්භක ශේෂය	153,428,543	139,657,779
ආදායම් ප්‍රකාශනයට අයකිරීම් / (ආපසු ලිවීම්)	94,476,212	13,770,764
වර්ෂයතුල ලියාහැරීම්	-	-
2020.12.31 දිනට අවසාන ශේෂය	247,904,755	153,428,543
අධියර 2		
2020.01.01 දිනට ආරම්භක ශේෂය	64,705,873	56,965,387
ආදායම් ප්‍රකාශනයට අයකිරීම් / (ආපසු ලිවීම්)	24,501,626	7,740,486
වර්ෂයතුල ලියාහැරීම්	-	-
2020.12.31 දිනට අවසාන ශේෂය	89,207,499	64,705,873
අධියර 3		
2020.01.01 දිනට ආරම්භක ශේෂය	617,848,730	508,411,145
ආදායම් ප්‍රකාශනයට අයකිරීම් / (ආපසු ලිවීම්)	148,491,725	109,437,584
වර්ෂයතුල ලියාහැරීම්	-	-
2020.12.31 දිනට අවසාන ශේෂය	766,340,454	617,848,730
එකතුව	1,103,452,708	835,983,146

17. මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට - ණය සහ අනෙකුත් උපකරණ

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට - කල් පිරීම දක්වා රඳවා තබාගැනීමට බැංකුවට අභිප්‍රායක් හා හැකියාවක් ඇති නියමකරන ලද හෝ තීරණය කළ හැකි ගෙවීම් හා නියමකරන ලද කල්පිරීමක් ඇති ණය හා අනෙකුත් උපකරණ ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්වේ. මූලික ඇගයීමෙන් පසු ක්‍රමක්ශය පිරිවැයට ඇති මූල්‍ය වත්කම් ණය හා අනෙකුත් උපකරණ හානිකරණය අඩුකර සඵල පොලී අනුපාතය (EIR) භාවිතා කරමින් පසුව ක්‍රමක්ෂය පිරිවැයට අගය කිරීම සිදුකරයි. සඵල පොලී අනුපාතයේ වැදගත් කොටසක්වන ගාස්තු හා අත්පත් කර ගැනීමේ දී කිසියම් වට්ටමක් වාරිකයක් සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබයි. ආදායම් ප්‍රකාශනයේ පොලී සහ සමාන ආදායම් තුළ හානිකරණ ගාස්තු ඇතුළත් වේ. හානිකරණ ගාස්තු යටතේ එවැනි ආයෝජන හෝ හානිකරණයෙන් පැන නගින අලාභය ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලබයි.

	2020 රු.	2019 රු.
භාණ්ඩාගාර බිල්පත්	815,010,484	994,878,307
භාණ්ඩාගාර බැඳුම්කර	165,589,926	168,803,531
ණයකර	-	65,983,517
ප්‍රති විකුණුම්	1,434,214,178	1,385,517,561
දළ එකතුව	2,414,814,588	2,615,182,916

17.1 විශ්ලේෂණය

ඇප අනුව වර්ගකිරීම		
ඇප ලෙස හිලව්කල	-	-
බැඳීම් නොමැති	2,414,814,588	2,615,182,916
දළ එකතුව	**2,414,814,588**	2,615,182,916

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් (ඉතිරි කොටස)...

18. අනෙකුත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

මූල්‍ය වත්කම් සාධාරණ අගය යටතේ ස්කන්ධ හා ණය සුරැකුම් වෙනත් විස්තීර්ණ ආදායම් තුලින් වර්ගීකරණය කර සහ වෙනත් විස්තීර්ණ ආදායම් තුලින් සාධාරණ අගය ලෙස වර්ගීකරණයකර ඇති ස්කන්ධ ආයෝජන උපායමාර්ගික ආයෝජන ලෙස රඳවාගනු ලබයි.
අවිනිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා රඳවා ගැනීමට අදහස් කරන මෙම වර්ගයේ ණය සුරැකුම් වෙළඳපල තත්ත්වයන්ගේ වෙනස්වීමට ප්‍රතිචාර වශයෙන් හෝ ද්‍රවශීල අවශ්‍යතාවයන්ට ප්‍රතිචාරයක් ලෙස අලෙවි කරනු ලබයි.

වෙනත් විස්තීරණ ආදායම තුළින් ස්කන්ධය උපකරණවල සාධාරණ අගය

අලවිය සඳහා රඳවාගෙන නොමැති වෙනත් විස්තීර්ණ ආදායම් තුලින් සාධාරණ අගය යටතේ ඇති ස්කන්ධ ආයෝජනවලින් කොටසක් ස්කන්ධ ලෙස නිර්වචනය කරනවිට LKAS - 32 යටතේ මූල්‍ය උපකරණ ඉදිරිපත්කිරීමේදී බැංකුවට වර්ගීකරණය කිරීමට සිදුවී ඇත. මෙවැනි වර්ගීකරණයන් උපකරණයෙන් උපකරණය පදනම මත තීරණය කරයි.

	2020 රු.	2019 රු.
ලැයිස්තුගත නොකළ කොටස්		
ණය තොරතුරු කාර්යාංශය	4,754,078	4,754,078
ඕවි ශ්‍රේණිගත කිරීම්	625,000	625,000
දළ එකතුව	5,379,078	5,379,078

18.1 විශ්ලේෂණය

ඇප අනුව වර්ගකිරීම		
ඇප ලෙස හිලව්කල	-	-
බැඳීම් නොමැති	5,379,078	5,379,078
දළ එකතුව	5,379,078	5,379,078

19. දේපළ පිරියත උපකරණ

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

හඳුනා ගැනීමේ පදනම

වත්කම සමඟ තිබියහැකි අනාගත ප්‍රතිලාභ බැංකුවට ලබාගැනීම සඳහා වත්කමේ පිරිවැය විශ්වාසදායක ලෙස තක්සේරුකළ හැකිනම් දේපළ පිරියත උපකරණ හඳුනාගනු ලබයි. දේපළ පිරියත උපකරණ වත්කම් අත්පත්කර ගැනීමේ දී කෙලින්ම අදාළවන වියදම් ඇතුළු පිරිවැයට මූලිකවම තක්සේරු කරයි.

තක්සේරු කිරීමේ පදනම

වත්කමක් ලෙස හඳුනාගැනීමට සුදුසුවන දේපළ පිරියත උපකරණ අයිතමයක් මූලිකවම පිරිවැයට තක්සේරු කරනු ලබයි. වත්කම පවරා ගැනීමේදී සෘජුවම අදාළවන වියදම් හා පාඩුව, දරණ වියදම් පිරිවැයට ඇතුළත්වේ. ද්‍රව්‍ය පිරිවැය, සෘජු කම්කරු ගාස්තු, අපේක්ෂිත භාවිතය සඳහා වත්කම ක්‍රියාකාරී තත්ත්වයට පත් කිරීමට සෘජුවම අදාලවන කිසියම් වියදමක්, ගලවා ඉවත් කිරීමේ වියදම්, වීවා ස්ථාපනයකර තිබූ ස්ථානය පිළිසකර කිරීමේ වියදම්, සහ ප්‍රාග්ධනිත ණය ගැනුම් පිරිවැය ස්වයං නිර්මිත වත්කමක අන්තර්ගතවේ. පරිගණක මෘදුකාංග මිලදී ගැනීම පරිගණක හා සම්බන්ධ උපකරණවල අත්‍යවශ්‍ය කොටසක් බැවින් වීවා පරිගනක උපකරණ ලෙස ප්‍රාග්ධනිත කරනු ලබයි.

පිරිවැය මාදිලිය

සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි සහ ඉදිකිරීමේදී හෝ මිලට ගැනීමේදී වී සඳහාවූ කිසියම් අනුශාංගික වියදම් ද ඇතුළු පිරිවැයට වාර්තාකර ඇති සමුච්චිත ක්ෂයවීම් හා යම්කිසි සමුච්චිත හානිකරණ අලාභ අඩුකර ඇති දේපළ පිරියත උපකරණ සඳහා හැර බැංකුව පිරිවැය මාදිලියට අදාලකර ගනී.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් (ඉතිරි කොටස)...

19.1 දේපළ පිරියත උපකරණ

රුපියල් වලින්	මෝටර් රථ	ගෘහභාණ්ඩ සවිකිරීම් හා කාර්යාල උපකරණ	පරිගණක උපකරණ	පරිගණක මෘදුකාංග	එකතුව
2020 (ප්‍රවර්ථන වසර)					
පිරිවැය / සාධාරණ අගය					
2020.01.01 දිනට ආරම්භක ශේෂය	70,798,254	133,822,736	133,410,760	7,055,348	345,087,098
එකතු කිරීම්	-	9,999,824	4,217,960	-	14,217,784
බැහැරකිරීම් / ගැළපීම්	-	(2,371,692)	(332,236)	(2,650,830)	(5,354,759)
ගැළපීම්	-	-			
2020.12.31 දිනට අවසාන ශේෂය	70,798,254	141,450,868	137,296,484	4,404,518	353,950,123
(අඩු කළා): සමුච්චිත ක්ෂය කිරීම					
2020.01.01 දිනට ආරම්භක ශේෂය	70,798,254	87,404,366	123,858,168	6,958,598	289,019,385
වර්ෂය සඳහා අයකිරීම	-	13,017,997	4,474,524	96,750	17,589,271
බැහැරකිරීම් / ගැළපීම්	-	(1,777,605)	(332,236)	(2,650,830)	(4,760,671)
2020.12.31 දිනට අවසාන ශේෂය	70,798,254	98,644,758	128,000,456	4,404,518	301,847,985
(අඩු කළා): හානිකරණ ගාස්තු					
2020.12.31. දිනට ශුද්ධ පොත් අගය	-	42,806,110	9,296,028	-	52,102,138

රුපියල් වලින්	මෝටර් රථ	ගෘහභාණ්ඩ සවිකිරීම් හා කාර්යාල උපකරණ	පරිගණක උපකරණ	පරිගණක මෘදුකාංග	එකතුව
2019 (ප්‍රවර්ථන වසර)					
පිරිවැය / සාධාරණ අගය					
2019.01.01 දිනට ආරම්භක ශේෂය	70,798,254	129,546,278	130,855,448	7,055,348	338,255,328
එකතු කිරීම්	-	9,224,149	8,880,706	-	18,104,855
බැහැරකිරීම් / ගැළපීම්	-	(4,947,691)	(6,325,394)	-	(11,273,085)
2019.12.31 දිනට අවසාන ශේෂය	70,798,254	133,822,736	133,410,760	7,055,348	345,087,098
(අඩු කළා): සමුච්චිත ක්ෂය කිරීම		-			
2019.01.01 දිනට ආරම්භක ශේෂය	70,798,254	79,055,708	117,465,787	6,690,756	274,010,505
වර්ෂය සඳහා අයකිරීම	-	13,002,578	12,717,775	267,842	25,988,194
බැහැරකිරීම්	-	(4,653,919)	(6,325,394)	-	(10,979,313)
ගැළපීම්	-	-			
2019.12.31 දිනට අවසාන ශේෂය	70,798,254	87,404,367	123,858,168	6,958,598	289,019,386
(අඩු කළා): හානිකරණ ගාස්තු	-	-	-	-	-
2019.12.31. දිනට ශුද්ධ පොත් අගය	-	46,418,371	9,552,592	96,750	56,067,712

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් (ඉතිරි කොටස)...

20. විලම්බිත බදු වත්කම් / (වගකීම්)

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

විලම්හිත බදු ගිණුම්කරණ ප්‍රතිපත්තිය සටහන් අංක 11 හි විළිදරව් කර ඇත.

	2020 රු.	2019 රු.
2020.01.01 ආරම්භක ශේෂය	221,648,675	107,451,184
ලාභ / (අලාභ) තුළින් හඳුනාගත්		
- වසර සඳහා අය කිරීම්	6,134,677	118,960,120
වෙනත් විස්තීර්ණ ආදායම්	6,927,689	(4,762,629)
2020.12.31 දිනට අවසාන ශේෂය	234,711,041	221,648,675

21 වෙනත් වත්කම්

	2020 රු.	2019 රු.
ලිපි ද්‍රව්‍ය තොගය	12,995,612	18,197,038
තැම්පතු හා කලින් ගෙවීම්	3,042,427	6,193,643
කලින් ගෙවූ සේවක ණය	381,457,796	331,878,204
ලැබිය යුතු VAT	7,440,500	33,183,621
ලැබිය යුතු NBT	3,603,588	-
ලැබිය යුතු DRL	15,591,023	-
ණය සහන පොලිය මත 7% ක ලැබිය යුතු පොලිය	5,486,337	-
ලැබිය යුතු පොලිය - ජේෂ්ඨ පුරවැසි ස්ථිර තැම්පත්	589,508,675	617,374,536
වෙනත්	85,505,247	171,329,897
එකතුව	1,104,631,205	1,178,156,939

22 බැංකුවලට ගෙවිය යුතු

	2020 රු.	2019 රු.
ණය ගැනීම් (අයිරා)	67,348,787	12,412,879
එකතුව	67,348,787	12,412,879

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් (ඉතිරි කොටස)....

23. ක්‍රමක්ෂය පිරිවැයට ඇති මූල්‍ය වගකීම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

තැම්පත්කරුවන්ට ගෙවිය යුතු මුදල්වල තැන්පතු හා කාල තැන්පතු අඩංගුවේ. මූලික හඳුනාගැනීමෙන් පසුව සළුල පොලී අනුපාත ක්‍රමය උපයෝගී කරගෙන තැන්පතු ඒවායේ ක්‍රමක්ෂය පිරිවැයට තක්සේරු කරයි. තැන්පතු සඳහා ගෙවූ / ගෙවිය යුතු පොලිය පොලී වියදම් යටතේ ආදායම් ප්‍රකාශයේ දී හඳුනාගනු ලබයි.

	2020 රු.	2019 රු.
තැම්පත්කරුවන්ට ගෙවිය යුතු	45,388,490,392	38,872,216,979
බැංකුව විසින් නිකුත්කර ඇති ණය සුරැකුම්	-	110,180,822
වෙනත් ණයට ගැනීම්	348,093,800	1,501,680,632
එකතුව	45,736,584,192	40,484,078,433

23.1 තැම්පත්කරුවන්ට ගෙවියයුතු වටිනාකම් විශ්ලේෂණය

	2020 රු.	2019 රු.
නිෂ්පාදන අනුව		
ඉතුරුම් තැම්පතු	2,262,441,333	1,669,895,646
ස්ථාවර තැම්පතු	41,984,985,100	36,104,411,121
වෙනත් තැම්පතු (යෝජනා ක්‍රම)	1,141,063,959	1,097,910,212
එකතුව	45,388,490,392	38,872,216,979

23.2 වෙනත් ණයට ගැනීම් විශ්ලේෂණය

	2020 රු.	2019 රු.
බැංකු ණය	-	1,202,349,370
AHF	1,110,904	3,540,664
මහ බැංකුවේ ප්‍රතිමූල්‍ය ණය	260,156,083	212,235,156
කල්බදු වගකීම්	86,826,813	83,555,442
එකතුව	348,093,800	1,501,680,632

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් (ඉතිරි කොටස)...

24. සේවක ප්‍රතිලාභ

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වන නිශ්චිත ප්‍රතිලාභ වගකීමෙහි (PVDBO) වර්තමාන අගය ආයුගණක උපදේශණ මගින් පුරෝකථනය කළ ඒකක ණය ක්‍රමය ප්‍රයෝජනයට ගනිමින් බැංකුව තක්සේරු කරයි. මෙම අරමුදලේ ආයුගණක තක්සේරු කිරීම් වට්ටම් කිරීමේ අනුපාතය, බලාපොරොත්තු වන වත්කම් මත ඉපැයීම් අනුපාතය, අනාගත වැටුප් වැඩිවීම් සහ මරණ අනුපාතය ආදිය පිළිබඳ උපකල්පනයන් පදනම්ව ඇත. මෙම සැලසුම්වල දීර්ඝකාලීන ස්වරූපය නිසා එම ඇස්තමේන්තු කිරීම් සැලකියයුතු අවිනිශ්චිතතාවයන්ට ලක් වේ. සියළුම උපකල්පනයන් වාර්තාකරන දිනට යළි ඇගයීමට ලක් කර ඇත. 2020 දෙසැම්බර් 31 දිනට සේවක ප්‍රතිලාභ වගකීම 2020 දෙසැම්බර් 31 දිනට ආයුගණක තක්සේරු වාර්තාව මත පදනම්ව ඇත. එහි අගය කිරීම ඇක්චුවේරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් මඟින් ක්‍රියාවට නංවා ඇත.

	2020 රු.	2019 රු.
පොළී අනුපාතය	8.00%	10.50%
වැටුප් වැඩිවීමේ අනුපාතය	6.50%	6.50%
විශ්‍රාම ගැනීමේ වයස	55-60 years	55-60 years

පාරිතෝෂිතය

	2020 රු.	2019 රු.
පාරිතෝෂිකය සඳහා වෙන් කිරීම		
වර්ෂයේ ආරම්භක ශේෂය	195,531,358	192,331,682
වර්තමාන සේවා වියදම	16,561,827	12,966,157
පොළී වියදම	20,530,793	22,118,143
ප්‍රතිලාභ ගෙවීම්	(18,313,429)	(27,114,159)
ආයුගණක(ලාභ/අලාභ	14,034,971	(4,770,465)
එකතුව	228,345,520	195,531,358

නිශ්චිත ප්‍රතිලාභ වගකීම් හි වර්තමාන අගයේ සංවේදීතාවය විශ්ලේෂණය කිරීම

වෙනස්වූ උපකල්පන (අනෙකුත් සියලුම උපකල්පන නොවෙනස්ව පවතින අතර)	**PV-DBO (රු.)**
වට්ටම් අනුපාතයේ සියයට එක (+1%) ලක්ෂයක වැඩිවීම	211,364,613
වට්ටම් අනුපාතයේ සියයට එක (+1%) ලක්ෂයක වැඩිවීම	248,111,722
වේතන වැටුප් වැඩිවීමේ අනුපාතයේ සියට එක (+1%) ලක්ෂයක වැඩිවීම	249,248,506
වේතන වැටුප් වැඩිවීමේ අනුපාතයේ සියට එක (+1%) ලක්ෂයක වැඩිවීම	210,102,918

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් (ඉතිරි කොටස)...

වෛද්‍යාධාර

	2020 රු.	2019 රු.
වෛද්‍යාධාර සඳහා වෙන්කිරීම		
වර්ෂය ආරම්භයේදී ශේෂය	194,760,373	190,167,950
ප්‍රවර්ථන සේවා පිරිවැය	5,396,459	4,656,332
පොලී පිරිවැය	20,449,839	21,869,314
ආයුගණක (ලාභ) / (අලාභ)	10,706,778	(12,238,922)
ගෙවූ ප්‍රතිලාභ	(10,400,545)	(9,694,301)
එකතුව	220,912,904	194,760,373
සේවක ප්‍රතිලාභ වගකීම් එකතුව	449,258,424	390,291,731

25. වෙනත් වගකීම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

අනිකුත් වගකීම්, ගාස්තු හා වියදම්, බදු ගෙවිය යුතු විසර්ජනය නොවූ නොවූ ගනුදෙනුකරුවන්ගේ ලැබීම්, නිවාඩු සඳහා මුදල් ගෙවීම් සහ වෙනත් වියදම්, ගිණුම්වල සිදුකර ඇති වෙන්කිරීම් තුළ ඇතුළත්වේ. වාර්තාකරන දිනට ගෙවියයුතු ලෙස අපේක්ෂා කරන වටිනාකම් තුළ මෙම වගකීම් වාර්තා කර ඇත.

	2020 රු.	2019 රු.
ගෙවියයුතු බදු	119,284,281	128,672,000
උපචිත වියදම්	59,868,419	55,766,284
වෙනත් වගකීම්	251,287,882	97,478,848
අඩුකලා: ණය පොත්වල ජාතික UR ගැලපීම්	(68,971,423)	-
ආන්තික ගිණුම	82,698,997	90,166,384
ආන්තික ගිණුම-අපද්‍රව්‍ය කළමනාකරණ	12,949,120	2,387,337
ගනුදෙනුකරුවන්ට ආපසු ගෙවීම්-වැසූ ණය මුදල්	72,103,281	59,636,126
එකතුව	529,220,557	434,106,979

25.1 බදු ගෙවියයුතු

	2020 රු.	2019 රු.
ආදායම් බදු	118,534,702	85,127,903
උපයනවිට ගෙවීම් බදු	720,477	6,081,882
WHT ගෙවියයුතු	29,102	10,592,263
NBT ගෙවියයුතු	-	3,263,572
DRL ගෙවියයුතු	-	16,256,759
ESC ගෙවියයුතු	-	7,349,621
ගෙවියයුතු බදු	119,284,281	128,672,000

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් (ඉතිරි කොටස)...

26. ප්‍රකාශිත ප්‍රාග්ධනය / වෙන් කළ ප්‍රාග්ධනය

	2020 රු.	2019 රු.
බලයලත් ප්‍රාග්ධනය	2,000,000,000	2,000,000,000
දායක ප්‍රාග්ධනය	889,812,899	889,812,899

1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ ප්‍රතිපාදනයන්ට අනුව සහ එයට කරන ලද සංශෝධනයන්ට අනුව බලයලත් ප්‍රාග්ධනය රු.බි. 2කි. සහභාගීත්ව ප්‍රාග්ධනය, 1979 ජනවාරි 01 දිනට කෘෂිකාර්මික හා කාර්මික ණය සංස්ථාව පිහිටුවීමට අදාළ කෘෂි කාර්මික හා කාර්මික ණය සංස්ථා ආඥා පනතේ වගන්ති අංක 22 අනුව ලබා දී ඇති අත්තිකාරම් අරමුදල සමන්විත වෙයි. තව ද කෘෂිකාර්මික හා කාර්මික ණය සංස්ථාව යටතේ වන සංචිත සහ 1979 ජනවාරි 01 දිනට ලංකා රාජ්‍ය උකස් බැංකුවට අයත් ණය සංචිතය ද බැංකුවේ ප්‍රාග්ධනයෙන් කොටසක් වෙයි. එය බැංකුවේ ආරම්භක ප්‍රාග්ධනය නියෝජනය කරන අතර එම සියල්ල බැංකුවේ ආරම්භක ප්‍රාග්ධනය සඳහා රජයේ දායකත්ව ප්‍රාග්ධනය බවට පත්ව ඇත.

1979 ජනවාරි 1 දිනට පසුව රජය, බැංකුවේ ප්‍රාග්ධනය සඳහා දායකත්වයක් ලබා දී ඇති අතර එම දායකත්වය සහ ඉහත ඡේදයෙන් සඳහන් කරන ලද ප්‍රාග්ධන යෙදවීම් ද ඇතුලුව යන සමස්ථ ප්‍රාග්ධන යෙදවීම 2020 දෙසැම්බර් 31 දිනට රු. 889,812,899ක් විය.

